# 2022 වාර්ෂික වාර්තාව

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**පේරාදෙණිය, ශ්‍රී ලංකාව**

**වාර්ෂික වාර්තාව පිළිබඳ:**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මඟින් විශ්වවිද්‍යාලය ලද ජයග්‍රහණ පිළිබඳ ආයතනික දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. මෙම වාර්තාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති සම්මත ආකෘතියට අනුව සකස් කර ඇත. විශ්වවිද්‍යාලයේ අදාළ පීඨ, අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක මඟින් සපයන ලද තොරතුරු මෙම වාර්තාවේ ඇතුළත් වන අතර එම තොරතුරු අන්තර්ගතකොට සංඛ්‍යාලේඛන සහ තොරතුරු අංශය විසින් මෙය සම්පාදනය කරන ලදී.

විශ්වවිද්‍යාල වත්මන් ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර දැන ගැනීමට කරුණාකර පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

https://www.pdn.ac.lk/

වැඩිදුර විස්තර දැනගැනීම සඳහා පහත ලිපිනයට විද්‍යුත් ලිපියක් යොමු කරන්න.

statoffice@gs.pdn.ac.lk

**ISSN NO: 2478-1088**
©University of Peradeniya

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය


සමාලෝචිත වර්ෂය iv

## 1. ව්‍යවස්ථාපිත වාර්තාව

1.1 හැඳින්වීම 1
1.2 විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර 3
1.3 කළමනාකරණය සහ ව්‍යුහය 5
1.4 සමස්ත කාර්ය සාධනය 23
1.5 අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන් 51
1.6 අනාගත සැලසුම් 52

## 2. සංඛ්‍යාලේඛන

2.1 ශිෂ්‍යයින් 57
2.2 ශිෂ්‍ය කාර්ය සාධනය 61
2.3 කාර්ය මණ්ඩලය 63
2.4 ආරම්භ කරන ලද නව පාඨමාලා 69
2.5 වෘත්තීය සංවර්ධනය සඳහා ලැබුණු විදේශ සහෘදත්ව ශිෂ්‍යත්ව 69
2.6 පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන 70
2.7 මහජනතාවට දැනුම බෙදා හැරීමේ වැඩසටහන් 71
2.8 ජාතික හා ජාත්‍යන්තර සම්මාන 73

## 3. පීඨ, පශ්චාත් උපාධි ආයතන, පුස්තකාල ජාලය

3.1 කෘෂි විද්‍යා පීඨය 75
3.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය 77
3.3 ශාස්ත්‍ර පීඨය 79
3.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය 80
3.5 ඉංජිනේරු පීඨය 82
3.6 කළමනාකරණ පීඨය 84
3.7 වෛද්‍ය පීඨය 86
3.8 විද්‍යා පීඨය 87
3.9 පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය 89
3.10 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA) 91
3.11 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) 93
3.12 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIMS) 95
3.13 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS) 97
3.14 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල ජාලය 99
3.15 මූල්‍ය වාර්තාව 102
3.16 විගණන කමිටු වාර්තාව 107

## 4. තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව 109

## 5. වාර්ෂික මුල්‍ය ප්‍රකාශන 111

## 6. විගණන වාර්තා

6.1 විගණකාධිපති වාර්තාව 144
6.2 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු 153

# වර්ෂය පිළිබඳ සමාලෝචනය



පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ ආර්ථික පසුබෑම හේතුවෙන් රට තුළ ඇති වූ අර්බුදකාරී තත්ත්වය මධ්‍යයේ වුව ද, නව යටිතල පහසුකම් සංවර්ධනය සහ බඳවා ගැනීම යන අංශ තුළ හැර, පේරාදෙණිය විශ්වවිද්‍යාලය අනෙකුත් ක්ෂේත්‍ර ආශ්‍රිත ව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. 25-30% ත් අතර ප්‍රමාණයකින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මඟින් විශ්වවිද්‍යාල කර්තව්‍යයන් හි නිමැවුම ඉහළ නැංවිය හැකි බව හඳුනා ගැනීම හේතුවෙන් එහිලා ක්‍රමවත් ස්ථාවර ප්‍රගතියක් අත් විය.

පැවති කොවිඩ් වසංගත තත්ත්වයෙන් පසුව, සියලුම අධ්‍යයන වැඩසටහන් භෞතික ආකෘතිය වෙත මාරු කර නියමිත පරිදි විභාග අවසන් කරන ලද අතර, 2022 වසරේ දී උපාධි ප්‍රදාන උත්සව දෙකක් පවත්වන ලදී. එහි දී, සිසු සිසුවියෝ 7020 දෙනෙකු සිය උපාධි සහතික ලබා ගත්හ. දුෂ්කරතා මධ්‍යයේ වුව ද, අධ්‍යයන වැඩසටහන් තුනක් සමාලෝචනය කිරීම මඟින් සහ පුළුල් අභ්‍යන්තර ආයතනික සමාලෝචනයක් පැවැත්වීම මඟින් ගුණාත්මක සංස්කෘතියක් සඳහා වූ විශ්වවිද්‍යාලයේ කැපවීම පුළුල් තලයක් කරා ගෙන යන ලදී.

විශ්වවිද්‍යාලී ය පර්යේෂණ සංස්කෘතිය පුළුල් කිරීම අඛණ්ඩ ව සිදු කෙරිණි. ජාත්‍යන්තර අවබෝධතා ගිවිසුම් 24 ක් අත්සන් කිරීම මඟින් පර්යේෂණ සඳහා වැඩි අරමුදල් ලබා ගැනීම, අභ්‍යන්තර පර්යේෂණ යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම සහ බාහිර සම්බන්ධතා පුළුල් කිරීම යනා දී කරුණු ඉටු සිදු කර ගැනුණි. කීර්තිමත් ලෝක විද්‍යාඥයින්ගෙන් ඉහළ ම 2% අතරට විශ්වවිද්‍යාලීය පර්යේෂකයන් නව දෙනෙකු හඳුනා ගනු ලැබ ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පර්යේෂණ ප්‍රකාශන සහ වාණිජකරණය වැඩි දියුණු වී ඇති අතර, විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ ඉහළ ම ශ්‍රේණිගත උසස් අධ්‍යාපන ආයතනය ලෙස නම් කරනු ලැබ, ලෝක විශ්වවිද්‍යාලවලින් ඉහළ ම 4-5% යන පරාසය තුළ අඛණ්ඩ ව පවතී.

අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මාර්ගගත අන්තර්ජාල නිවාඩු අනුමත කිරීමේ ක්‍රමය, ඇතැම් අංශ ස්වයංක්‍රීයකරණය කිරීම සහ අධ්‍යයන බඳවා ගැනීමේ ක්‍රියාවලිය වැනි එදිනෙදා කාර්යයන් සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතයට ගැනීම වැඩි දියුණු කෙරිණි. අත්‍යාවශ්‍ය මූලික කාර්යයන් කපා හැරීමකින් තොරව විශ්වවිද්‍යාලයේ කටයුතු අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට හැකි විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත බාහිර ප්‍රදාන මාර්ග 94 කින් රුපියල් මිලියන 492ක මුදලක් ලැබුණු අතර ප්‍රදාන කළමනාකරණය විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් ද ස්ථාපිත කර ඇත.

මානව සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම සහ සේවක පිරිස් වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික මානව සම්පත් සංවර්ධන ඒකකයක් පිහිටුවන ලදී. විශ්වවිද්‍යාලීය සෞඛ්‍ය මධ්‍යස්ථානය හරහා සෞඛ්‍ය ආරක්ෂණය සහ මානසික යහපැවැත්ම ලබා දීමේ කටයුතුවල වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී. සිසු සිසුවියන් අතර මානසික රෝග සඳහා ඇති සාමාන්‍ය ප්‍රවණතාවය හේතුවෙන්, වෙන ම ඒකකයක් පිහිටුවන ලද්දේ, උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවා සපයන ආදි විද්‍යාර්ථීන්ගේ සහය ඇති උපදේශන සේවාවක් ද සමඟිනි. තව ද, වයස අවුරුදු 35 ට වැඩි සේවකයින් සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානය මඟින් බෝ නොවන රෝග පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

මහපොළ ශිෂ්‍යත්ව ආධාරයට අමතර ව, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ, ආදි විද්‍යාර්ථීන්ගේ සහ හිතවතුන්ගේ සහය ඇතිව මූල්‍ය දුෂ්කරතා ඇති සිසුන්ට සහය වීමට පරිපාලනය සියලු උත්සාහයන් දැරුවේ ය. ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම වතාවට, විශ්වවිද්‍යාලය තුළ සිසු සිසුවියන් සඳහා අර්ධ කාලීන රැකියා හඳුන්වා දීමට අපේ ආදි විද්‍යාර්ථීහු සහය දැක්වූහ.

"රීග්‍රීන්" හන්තාන ප්‍රතිහරිතකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ හන්තාන කඳුවැටියේ විනාශ වූ ස්ථාන ප්‍රතිසංස්කරණය කර පරිසර පද්ධති සේවා වැඩි දියුණු කිරීමේ අරමුණෙනි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දිශානතිය අරබයා ක්‍රියාකාරකම් කිහිපයක් විශ්වවිද්‍යාලය විසින් හඳුනා ගන්නා ලදී.

2048 වර්ෂ ඉලක්කය සඳහා වන රජයේ දැක්ම සමග විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් සහ සංවර්ධනයන් පෙළගස්වාලීම සඳහා පාලන සභාව දිගු කාලීන සැලසුම් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. යටිතල පහසුකම් සහ මානව සම්පත් අවශ්‍යතා සමඟ සියලු ක්‍රියාකාරී අංශයන්හි නව ඉලක්ක සංවර්ධනය වෙමින් පවතී. දිගු කාලීන සැලැස්මේ ප්‍රධාන අංගයක් වන්නේ, රජය මත විශ්වවිද්‍යාලයේ මූල්‍ය යැපීම අවම කර එය පශ්චාත් උපාධි පර්යේෂණ විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමයි.

2022 විශ්වවිද්‍යාලීය වාර්ෂික වාර්තාව සැකසීමෙහිලා දායක වූ සියලු දෙනා, විශේෂයෙන් ම නියෝජ්‍ය උපකුලපතිවරයා සහ සංඛ්‍යාලේඛන නිලධාරී යනාදීන්ගේ කාර්යභාරය මාගේ අගැයුමට ලක් වන අතර අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින්, පිළිවෙළින්, සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සහභාගිත්වයෙන් පවත්වන ලද තරගයේ දී "හොඳ ම වාර්ෂික වාර්තාව" ලෙස තේරීපත්ව ඊට අදාළ සම්මාන තිළිණය හිමිකර ගත් 2019 සහ 2020 වාර්තාවලට සමාන ඉහළ පිළිගැනීමක් අපගේ මෙවර වාර්තාවට ද ලැබෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ඉදිරි වසර විශ්වවිද්‍යාලයට සම්මානනීය ජයග්‍රහණ අත් වන වසරක් වනු ඇතැයි මම ඉතසිතින් ම ප්‍රාර්ථනා කරමි, ඒ සඳහා අප සියලු දෙනා පසුගිය වසරේ දී මෙන් ම, සුවිශේෂී විශිෂ්ටතා සහිත දස්කම් දක්වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

**මහාචාර්ය එම්.ඩී ළමාවංශ**
**උපකුලපති**

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2022 වාර්ෂික වාර්තාව

## 1. ව්‍යවස්ථාපිත වාර්තාව

### 1.1 හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වනාහි ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටි ප්‍රමුඛත ම උසස් අධ්‍යාපන ආයතනයකි. වර්ෂ 1942 දී මෙරට ප්‍රථම විශ්වවිද්‍යාලය ලෙස ආරම්භ කරනු ලදුව එතැන් පටන් එය ශ්‍රී ලංකාවේ ඉහළ ම ශ්‍රේණිගත ජාතික විශ්වවිද්‍යාලවලින් එකක් ලෙස කීර්තියක් අත්කර ගනිමින් අධ්‍යයන විශිෂ්ටත්වයේ සහ පර්යේෂණ නවෝත්පාදනයේ දීප්තිමත් ආයතනයක් බවට පත් ව ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරම්භක ඉතිහාසය, 1942 වර්ෂයේ දී ශාස්ත්‍ර පීඨය ඇතුළත් ලංකා විශ්වවිද්‍යාලය කොළඹ දී ආරම්භ කිරීම දක්වා දිවයයි. ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ විධිමත් ලෙස පිහිටුවීම සනිටුහන් කරමින් 1952 වර්ෂයේ දී මෙම පීඨය පේරාදෙණියට රැගෙන යන ලදී. විශ්වවිද්‍යාලය මහනුවර නගරයේ සිට කිලෝමීටර් අටක් පමණ දුරින් පිහිටි හෙක්ටයාර් 774ක භූමි වපසරියක් පුරා පැතිරි සුන්දර හා නිස්කලංක පරිසරයක පිහිටා ඇත.

පසුගිය වසර අසූවක කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව සැලකිය යුතු ලෙස පුළුල් වී ඇත. එය පීඨ නවයකින්, අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන හතරකින් (PGIs) සහ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානයකින් සමන්විත වේ. කෘෂිවිද්‍යා, සම සෞඛ්‍ය විද්‍යා, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ, වෛද්‍ය, විද්‍යා, සහ පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යාව ඇතුළු පුළුල් පරාසයක විෂය ධාරාවන් පීඨ මඟින් ආවරණය කරයි. විශ්වවිද්‍යාලය විසින් SLQF මට්ටම් 5 සහ 6 ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩසටහන් 62ක් පිරිනමනු ලබයි. විවිධ අධ්‍යයන මණ්ඩල යටතේ පශ්චාත් උපාධි ආයතන මඟින් ද උසස් උපාධි කමිටු යටතේ පීඨ හෝ පශ්චාත් උපාධි ඒකක මඟින් ද SLQF මට්ටම් 7-12 දක්වා විවිධ විෂය ධාරාවන් ආවරණය වන පරිදි වැඩසටහන් සිය ගණනක් පවත්වනු ලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එය ලද සුවිශේෂී ජාතික කීර්තිය සහ සැලකිය යුතු ජාත්‍යන්තර පිළිගැනීම නිසාවෙන් අභිමානයෙන් පසු වේ. කොවිඩ්-19 ව්‍යාප්තිය අතරතුර, විශ්වවිද්‍යාලය සිය ක්‍රියාකාරකම් වැඩි වශයෙන් පවත්වා ගෙන ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද හොඳ ම වාර්ෂික වාර්තා සඳහා වන සම්මාන ප්‍රදානෝත්සවයේ දී අප විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා විශ්වවිද්‍යාල අතර සමස්ත රන් සම්මානය හිමිවිය. ඵලදායී ව කටයුතු කරමින්, ශ්‍රේණිගත කිරීම් ලබාගනිමින් සහ කීර්තියක් දිනා ගනිමින් විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් සැලකිය යුතු තරගකාරී ප්‍රදාන ද දිනා ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මට්ටමින් පාලක සභාව, සනාතන සභාව සහ උපකුලපති උපදේශක කමිටුව ඇතුළු විවිධ කමිටු හරහා ද පශ්චාත් උපාධි ආයතන මට්ටමින් කළමනාකරණ මණ්ඩල, අධ්‍යයන මණ්ඩල සහ අදාළ අනුකමිටු හරහා ද පීඨ මට්ටමින් පීඨ මණ්ඩල සහ උප කමිටු හරහා ද සෑම විටම එහි මූලික කාර්යයන්හි ගුණාත්මක බව සහතික කර ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් කටයුතු සිදු කිරීමේ දී ඒ සඳහා මධ්‍යම පරිපාලනය යටතේ ඇති මූලික උපකාරක සේවා කිහිපයකින් සහය ලැබේ. විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුබසාධනය සලසන, මූලික සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන සහ ජාතික අවශ්‍යතා සමඟ සමපාත වන මධ්‍යස්ථාන, ඒකක සහ අංශ කිහිපයක් ස්ථාපිත කර ඇත. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU), ව්‍යාපාර සම්බන්ධතා ඒකකය, නවෝත්පාදනය, ඉන්කියුබේෂන් සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය (BLII-TTO), තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA), කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC), මානව අයිතිවාසිකම් අධ්‍යයන මධ්‍යස්ථානය (CSHR) සහ ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය (InRO) මේවායින් කිහිපයක් වේ.

අධ්‍යයන විශිෂ්ටත්වය උදෙසා කැපවීමෙන් කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාවේ හොඳ ම උපාධිධාරීන් බිහි කිරීම සඳහා ප්‍රබල කීර්තියක් දිනා ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පොහොසත් ඉතිහාසයක් ඇත. තත්ත්ව සහතිකය, ජාත්‍යන්තර පිළිගැනීම සහ නවෝත්පාදනය කෙරෙහි විශ්වවිද්‍යාලය දැඩි අවධාරණයෙන් කටයුතු කිරීම නිසා එයට රටේ උසස් අධ්‍යාපනයේ ඉදිරියෙන් ම වැජඹීමට අවකාශ සැලසී ඇත. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් මෙන් ම ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධනය සඳහා වන කැපවීම තුළින් එය ප්‍රමුඛ ජාතික හා ජාත්‍යන්තර ආයතනයක් ලෙස සැලකිල්ලට භාජනය වී ඇත.

# තොරතුරු සැකෙවින්

| ශ්‍රේණිගත කිරීම් | සිසුන් සහ කාර්ය මණ්ඩලය | පර්යේෂණ |
|---|---|---|
| **# 1** THE[1] ඉම්පැක්ට් ශ්‍රේණිගත කිරීම් | | |
| **#1** THE[1] ලෝක ශ්‍රේණිගත කිරීම් | **13731** උපාධි අපේක්ෂක සිසුන් | |
| **#1** **U.S** පුවත් සහ ලෝක වාර්තා ශ්‍රේණිගත කිරීම් | **10646** පශ්චාත් උපාධි සිසුන් | **53** ලැබුණු පර්යේෂණ ආධාර සංඛ්‍යාව (බාහිර පාර්ශවයන්) |
| **#2** QS[2] කලාපීය ශ්‍රේණිගත කිරීම | **882** අධ්‍යයන කාර්ය මණ්ඩලය | **362.64** මිලියන ලැබුණු පර්යේෂණ ආධාරවල වටිනාකම (බාහිර අරමුදල්) |
| **#2** Webometric ශ්‍රේණිගත කිරීම | **58** අධ්‍යයන සහය කාර්ය මණ්ඩලය | **96** පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන ගණන |
| **#3** Greenmetric ශ්‍රේණිගත කිරීම | **2209** අනධ්‍යයන කාර්ය මණ්ඩලය | **74.03** මිලියන පිරිනමන ලද පර්යේෂණ ප්‍රදානවල වටිනාකම |

1. Times Higher Education
2. Quacquarelli Symonds

## 1.2 විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර

### දැක්ම

විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භක වටිනාකම් හා මූලධර්ම මත පදනම් වූ නවෝත්පාදක පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරී වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම මගින් මහජනතාවට සේවය කරමින් ස්වකීය ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට සහ හවුල්කාර පාර්ශ්වවලට අනන්‍ය පරිවර්තනීය අත්දැකීමක් ලබා දීම.

අපගේ

උපාය

මාර්ගය

මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය මතු දැක්වෙන ප්‍රයත්න දරයි.

- දක්ෂතාවලින් හෙබි සිසුන්, සමාජීය වගකීම් සහිත, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී, පරිසරය පිළිබඳ සවිඥානික, පරාර්ථකාමී උපාධිධාරීන් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසෙන පරිදි වෘත්තීය සුරක්ෂිතතාව සහතික කරන බාහිර වැඩසටහන් ද ඇතුළත් ව අසමසම, නව්‍ය හා යෝග්‍ය ඉගෙනුම් හා ඉගැන්වීමේ වැඩසටහන් මාලාවක් සැපයීම

- විශිෂ්ට උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාව, ජාතිය, කලාපය සහ පුළුල් ගෝලීය ප්‍රජාව සඳහා සුවිශේෂී සේවයක් ඉටුකිරීම

- ස්වදේශික හා ප්‍රාදේශික ප්‍රජාවන්ගෙන් ලබන ඉගෙනීම ද සමාජයේ අභිලාෂ, සංස්කෘති සහ හර පද්ධති පෝෂණය කිරීමෙහිලා ඵලදායී ලෙස කටයුතු කරන කාර්ය මණ්ඩලය සහ ආදි ශිෂ්‍යයන් අත්කරගන්නා ජාත්‍යන්තර කීර්ති නාමය ද සහිත ව සිය පර්යේෂණවල ගුණාත්මකභාවය සහ බලපෑම තීව්‍ර කිරීම

- විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජීය ජීවිතය සඳහා සාර්ථක ව සහභාගී වීම උදෙසා සිසුන් සහ ප්‍රජා සාමාජිකයන් සවිබල ගැන්වීම සහ අඛණ්ඩ ව සහාය ලබාදීම හා එමගින් තුලිත හා තිරසාර ගෝලීය සංවර්ධනයක් සඳහා දායක වීම පිණිස ගුණාත්මක නවතාවකින් යුක්ත ව ක්‍රියාත්මක වීම

- ජාතික ඉලක්ක සපුරාලීම සහ ප්‍රධාන හර පද්ධති හා මූලධර්ම පවත්වා ගනු පිණිස අධ්‍යාපනය, පුහුණුව, සහතික කිරීම, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ දැනුම ව්‍යාප්තිය යන කරුණුවල අදාළත්වය සහ දායකත්වය ඉහළ නැංවීම සඳහා සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ම ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග ගැඹුරින් හා අන්‍යෝන්‍ය සුහදතාවකින් යුතු ව අසමසම ලෙස කටයුතු කිරීම

- ලෝකයේ හොඳ ම විශ්වවිද්‍යාල හා සැසඳිය හැකි පරිදි පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහ ඉගෙනුම් ප්‍රතිඵල විශිෂ්ට ලෙස සාක්ෂාත් කර පවත්වා ගෙන යාම

## මෙහෙවර

අධ්‍යාපනය, අධ්‍යයනය සහ පර්යේෂණ මඟින් ද ජාත්‍යන්තර උසස් විශිෂ්ටතා මට්ටම්වල දැනුම බෙදා හැරීම මඟින් ද ජාතික, කලාපීය සහ විශ්ව සමාජ තලවලට දායක වීම

## අපගේ මෙහෙයුම් සන්දර්භය

## අරමුණු

- උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පිළිගැනීමක් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සියලු ම ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය ඉහළ නැංවීම

- ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පවත්නා අවශ්‍යතාවන්ට දායකවන පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම උදෙසා සම්පත් සංවර්ධනය කිරීම

- වැඩිදියුණු කළ සාමූහික පාලන කාර්ය රාමුවක් තුළ පරිපාලන සහ මූල්‍ය කාර්යක්ෂමතාවය තහවුරු කිරීම

- දැනුම පාදක සමාජයක් ගොඩනගනු පිණිස දායකවීම සඳහා අධ්‍යාපන වැඩසටහන් පුළුල් පරාසයකට ප්‍රවිශ්ට වීමට අවකාශ සැලසීම

- අධ්‍යයන කටයුතුවල නියැලීම සඳහා හිතකර සෞන්දර්යාත්මක අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා භෞතික සහ මානව සම්පත් සංවර්ධනය කිරීම

## හරයන්

- ඉගැන්වීම්, ඉගෙනුම් හා පර්යේෂණ කටයුතුවල ඉහළ ප්‍රමිතිය

- අධ්‍යයන නිදහස

- සියලු කටයුතුවල අවංක බව සහ පාරදෘශ්‍යභාවය

- සංස්කෘතික විවිධත්වයට ගරුකිරීම

## 1.3 කළමනාකරණය සහ ව්‍යුහය

### 1.3.1 විශ්වවිද්‍යාලයේ පාලක සභාව 2022

1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24වැනි වගන්තිය මඟින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44වැනි වගන්තිය අනුව පිහිටුවා ඇති විශ්වවිද්‍යාල පාලක සභාව 2022 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| **සභාපති** | උපකුලපති<br>මහාචාර්ය එම්.ඩී ළමාවංශ |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය ටෙරන්ස් මධුජිත් |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| කෘෂි විද්‍යා පීඨය | මහාචාර්ය කේ.එස්.එස් කොඩිතුවක්කු |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ යටවර |
| ශාස්ත්‍ර පීඨය | ආචාර්ය ඊ.එම්.පී.සී.එස් ඒකනායක |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය ඒ.එම් ආටිගල |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය ඩී.එම්.යූ.අයි දිසානායක |
| කළමනාකරණ පීඨය | මහාචාර්ය ඊ.එම්.ඒ.එස්.බී ඒකනායක |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය එම්.වී.ජී පින්ටෝ |
| විද්‍යා පීඨය | මහාචාර්ය ආර්.ජී.එස්.සී රාජපක්ෂ |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පිඨය | මහාචාර්ය පී.ජී.ඒ පුෂ්පකුමාර |

**සභාවෙන් නම් කරන ලද සාමාජිකයන්**

මහාචාර්ය බී.එම්.එස්.එච්.කේ බන්නෙහැක
මහාචාර්ය සී.එස් වික්‍රමගමගේ

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන්**

| | |
|---|---|
| වෛද්‍ය සර්ධා හේමප්‍රිය | ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්තේ මහතා |
| ආචාර්ය සිරිල් විජේසුන්දර | සාලිය ධර්මවර්ධන මහතා |
| මහේන්ද්‍ර විජේපාල මහතා | අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි හිමි |
| මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක | නිහාල් රූපසිංහ මහතා |
| ජී.එස්.ජේ දිසානායක මහතා | යූ.සී කිරිදිගොඩ මහතා |
| ප්‍රසන්න ගුණතිලක මහතා | මහාචාර්ය ඒ.එන් ද එස් අමරතුංග |
| මහාචාර්ය කේ ගුණවර්ධන | |

| | |
|---|---|
| **ලේකම් :- ලේඛකාධිකාරී (වැඩ බලන)** | එම්.ජී.ජේ ධර්මසිරි මිය |

# සංවිධාන ව්‍යුහය




දූ.හා අ.අ.ම - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය
කෘ.ප.උ.ආ - කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
වි.ප.උ.ආ - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මා.ශා හා ස.වි.ප.උ.ආ- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
වෛ.වි.ප.උ.ආ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නි.ලේ. - නියෝජ්‍ය ලේඛකාධිකාරී
නි.මූ - නියෝජ්‍ය මූල්‍යාධිකාරී
නි.අ.වි - නියෝජ්‍ය අභ්‍යන්තර විගණක
ජේ.ස.ලේ- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජේ.ස.මූ - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ජේ.ස.අ.වි - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

ස.ලේ - සහකාර ලේඛකාධිකාරී
ස.මූ - සහකාර මූල්‍යාධිකාරී
ස.අ.වි - සහකාර අභ්‍යන්තර විගණක

# 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල පාලක සභා සාමාජිකයන්

| | |
|---|---|
| නමː | **මහාචාර්ය එම්.ඩී ළමාවංශ** |
| තනතුරː | **උපකුලපති** |
| උපාධිː | MBBSA (රුහුණ), MSA (කොළඹ), PHD (වෙස්ටර්න් ඔස්ට්‍රේලියා විශ්වවිද්‍යාලය), FRCS (එඩින්බරෝ), FCSSL (ශ්‍රී ලංකා), FASI (ඉන්දියා), FCPS (පකිස්තාන්), FAMASI (ඉන්දියා) |
| සභාවට පත් වූ දිනයː | 2021.08.01 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | ශල්‍යකර්ම |
| දරන ලද ප්‍රධාන තනතුරුː | රුසියානු සමූහාණ්ඩුවේ හිටපු ශ්‍රී ලංකා තානාපති 2020/21<br>හිටපු පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව<br>නිර්මාතෘ පීඨාධිපති, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය<br>සභාපති, ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලය<br>සභාපති, සාර්ක් ශල්‍ය සත්කාර සංගමය<br>ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සාමාජික<br>වෛද්‍ය සහ දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජික<br>සාමාජික, කළමනාකරණ මණ්ඩලය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය<br>අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධක බලකා සාමාජික |
| සාමාජිකත්වයන්ː | සාර්ක් ශල්‍ය ප්‍රතිකාර සංගමයේ සභාපති 2020/21<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ සභාපති, 2017<br>ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ මහනුවර පාර්ශවයේ සභාපති<br>සාර්ක් ශල්‍ය ප්‍රතිකාර සංගමයේ මහලේකම්, 2009<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ ලේකම්, 2003<br>මහනුවර වෛද්‍ය සංගමයේ ලේකම් 1996 සිට1997 දක්වා.<br>ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇත, ලියාපදිංචි අංක 8607 - 2025.01.01 දක්වා වලංගු වේ.<br>එක්සත් රාජධානියේ  වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති අතර එය ස්වෙච්ඡාවෙන් තාවකාලික ව අත්හිටුවා ඇත<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ මහනුවර පාර්ශවයේ ලේකම්, 1995 සිට 2000 දක්වා<br>මහනුවර වෛද්‍ය සංගමයේ සභා සාමාජික,1995<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ සභා සාමාජික, 2002-2009 සහ 2017<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ හිටපු සභාපති නියෝජනය කරන සභා සාමාජික, 2018-2020<br>සාර්ක් ශල්‍ය ප්‍රතිකාර සංගමයේ සභා සාමාජික<br>ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ මහනුවර පාර්ශවයේ සභා සාමාජික<br>ජාත්‍යන්තර ළමා අවයව බද්ධ කිරීමේ සංගමයේ සාමාජික බ්‍රිතාන්‍ය අවයව බද්ධ කිරීමේ සංගමයේ සාමාජික<br>ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ යාවජීව සාමාජික<br>ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ යාවජීව සාමාජික<br>මහනුවර වෛද්‍ය සංගමයේ යාවජීව සාමාජික<br>ආමාශ ආන්ත්‍රයික සහ ආහාර ජීර්ණ සමාජයේ යාවජීව සාමාජික<br>පේරාදෙණිය වෛද්‍ය පීඨයේ 2007/2008 ගුරු සංගමයේ සාමාජික<br>මහනුවර වෘත්තීයවේදීන්ගේ සංසදයේ සාමාජික<br>පේරාදෙණිය ශල්‍ය වෛද්‍ය සමාජයේ නිර්මාතෘ |
| ධූර කාලය අවසන්වන දිනයː | 2024.07.31 |
| | |
| නම | **මහාචාර්ය ටෙරන්ස් මධුජිත්** |
| තනතුරː | **නියෝජ්‍ය උපකුලපති** |
| උපාධිː | PhD (කැනඩා), MSc. (කැනඩා), BSc. (Agri.), MI Biology. (ශ්‍රී ලංකා) |
| සභාවට පත් වූ දිනයː | 2021.09.01 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | ආහාර විද්‍යාව සහ තාක්ෂණය |
| දරන ලද ප්‍රධාන තනතුරුː | අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව |
| | අධ්‍යක්ෂ (වැඩ බලන) දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| සාමාජිකත්වයන්ː | ශ්‍රී ලංකා පෝෂණ සංගමයේ සාමාජික |
| ධූර කාලය අවසන්වන දිනයː | 2024.08.31 |
| | |
| නම | **මහාචාර්ය කේ.එස්.එස් කොඩිතුවක්කු** |
| තනතුරː | **පීඨාධිපති/ කෘෂි විද්‍යා පීඨය** |
| උපාධිː | Ph.D. (US), MBA, B.Sc (SP), FIMSL |
| සභාවට පත් වූ දිනයː | 2021.11.14 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | ව්‍යාපාර හා කළමනාකරණය |
| ධූර කාලය අවසන්වන දිනයː | 2024.11.13 |

| | |
|---|---|
| නම | **මහාචාර්ය එම්.ඩී.එම්.එල්.කේ යටවර** |
| තනතුරු: | **පීඨාධිපති/ සම සෞඛ්‍ය විද්‍යා පීඨය** |
| උපාධි: | Ph.D (ජපන්), BVSc. |
| සභාවට පත් වූ දිනය: | 2022.02.26 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | අණුක ජීව විද්‍යාව සහ ජාන විද්‍යාව |
| ධූර කාලය අවසන්වන දිනය: | 2022.02.25 |
| | |
| නම | **ආචාර්ය ඊ.එම්.පී.සී.එස් ඒකනායක** |
| තනතුරු: | **පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය** |
| උපාධි: | BA(ගෞරව) PGDE, MEd, Mphil, PhD |
| සභාවට පත් වූ දිනය: | 2021.10.01 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | අධ්‍යාපන |
| දරන ලද ප්‍රධාන තනතුරු: | අංශ ප්‍රධානී (අධ්‍යාපන) |
| ධූර කාලය අවසන්වන දිනය: | 2024.09.30 |
| | |
| නම | **මහාචාර්ය ඒ.එම්. ආටිගල** |
| තනතුරු: | **පීඨාධිපති/ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය** |
| උපාධි: | BDS(ශ්‍රී ලංකා),MS ඩෙන්ටල් සර්ජරි (කොළඹ), FDSRCS (එංගලන්තය) |
| සභාවට පත් වූ දිනය: | 2021.08.10 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | දන්ත වෛද්‍ය විද්‍යාව සහ මුඛ හා හණුක ශල්‍ය විද්‍යාව |
| දරණ ලද ප්‍රධාන තනතුරු: | මුඛ හා හණුක ශල්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානී |
| සාමාජිකත්වයන්: | ශ්‍රී ලංකා මුඛ හා හණුක ශල්‍ය වෛද්‍යවේදී සංගමය, ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමය, දන්ත වෛද්‍ය හා මුඛදාහ විද්‍යාලය, මහනුවර වෛද්‍ය සංගමය |
| ධූර කාලය අවසන්වන දිනය: | 2024.08.09 |
| | |
| නම | **ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක** |
| තනතුරු: | **පීඨාධිපති/ ඉංජිනේරු පීඨය** |
| උපාධි: | BSc.Eng Hons, PhD |
| සභාවට පත් වූ දිනය: | 2021.10.25 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | ව්‍යුහාත්මක/ සිවිල් ඉංජිනේරු විද්‍යාව |
| දරණ ලද ප්‍රධාන තනතුරු: | අංශාධිපති/ සිවිල් ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය |
| සාමාජිකත්වයන්: | MECSL, MIESL, MSSESL |
| ධූර කාලය අවසන්වන දිනය: | 2024.10.24 |
| | |
| නම | **මහාචාර්ය ඊ.එම්.ඒ.එස්.බී ඒකනායක** |
| තනතුරු: | **පීඨාධිපති/ කළමනාකරණ පීඨය** |
| උපාධි: | BSc. ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව), MBA, PhD |
| සභාවට පත් වූ දිනය: | 2020.08.21 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | ගිණුම්කරණය පිළිබඳ මහාචාර්ය |
| දරණ ලද ප්‍රධාන තනතුරු: | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ඉගෙනුම් සම්පත්, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය<br>අංශාධිපති/ මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයනාංශය<br>අංශාධිපති/ ව්‍යාපාර මූල්‍ය අධ්‍යයනාංශය |
| සාමාජිකත්වයන්: | වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය |
| ධූර කාලය අවසන්වන දිනය: | 2023.08.20 |
| | |
| නම | **මහාචාර්ය එම්.වී.ජී පින්ටෝ** |
| තනතුරු: | **පීඨාධිපති/වෛද්‍ය පීඨය** |
| උපාධි: | MBBS, MD, FRCA, FCARCSI |
| සභාවට පත් වූ දිනය: | 2021.09.12 |
| දරණ ලද ප්‍රධාන තනතුරු: | සභාපති – PCMSAA, ප්‍රධාන මහාචාර්ය - නිර්වින්දන සහ දැඩිසත්කාර අධ්‍යයනාංශය<br>සභාපති - හදිසි ප්‍රතිකාර අධ්‍යයන මණ්ඩලය,ප්‍රධානී - නිර්වින්දන සහ දැඩිසත්කාර වෛද්‍ය විද්‍යාලය |
| ධූර කාලය අවසන්වන දිනය: | 2024.09.11 |
| | |
| නම | **මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ** |
| තනතුරු: | **පීඨාධිපති/විද්‍යා පීඨය** |
| උපාධි: | BSc, (පේරාදෙණිය), MPhil, (පේරාදෙණිය), PhD, (ජපන්) |
| සභාවට පත්වූ දිනය: | 2022.04.07 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රය: | අණුක සහ සෛල ජීව විද්‍යාව |

| | |
|---|---|
| සාමාජිකත්වයන්: | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, රසායන විද්‍යා ආයතනය, ජීව විද්‍යා ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදී විද්‍යාර්ථීන්ගේ සංගමය |
| ධූර කාලය අවසන්වන දිනයः | 2025.04.26 |
| | |
| නම | **මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර** |
| තනතුරු: | **පීඨාධිපති/ පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය** |
| උපාධි: | BVSc, PhD (ලංඩන්) |
| සභාවට පත් වූ දිනයः | 2021.11.01 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයः | පශු ව්‍යාධිවේදය |
| දරණ ලද ප්‍රධාන තනතුරුः | සභාපති, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාව; පශු ඖෂධ පාලන අධිකාරියේ සාමාජික |
| සාමාජිකත්වයන්: | FSLCVS |
| ධූර කාලය අවසන්වන දිනයः | 2024.10.31 |
| | |
| නම | **මහාචාර්ය බී.එම්.එස්.එච්.කේ බන්නැහැක** |
| තනතුරු: | **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය** |
| උපාධි: | BDS |
| සභාවට පත් වූ දිනයः | 2022.10.23 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයः | මානව ව්‍යුහ විද්‍යාව |
| ධූර කාලය අවසන්වන දිනයः | 2022.10.22 |
| | |
| නම | **මහාචාර්ය සී.එස් වික්‍රමගමගේ** |
| තනතුරු: | **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය** |
| උපාධි: | PhD (හවායි විශ්වවිද්‍යාලය) BA (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) |
| සභාවට පත් වූ දිනයः | 2021.02.26 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයः | ඉංග්‍රීසි |
| සාමාජිකත්වයන්: | පොදුරාජ්‍ය මණ්ඩලීය සාහිත්‍ය හා භාෂා අධ්‍යයන සංගමය (ACLALS) |
| ධූර කාලය අවසන්වන දිනයः | 2024.02.25 |
| | |
| නම | **මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක** |
| තනතුරු: | **සම්මානිත මහාචාර්ය** |
| උපාධි: | B.Dev.S (Colombo), PG Diploma (Colombo), MA (Brussels), PhD (Adelaide), FRSA (United Kingdom) |
| සභාවට පත් වූ දිනයः | 2022.07.12 |
| දරන ලද ප්‍රධාන තනතුරුः | කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති |
| ධූර කාලය අවසන්වන දිනයः | 2023.01.15 |
| | |
| නම | **ඉංජිනේරු නිහාල් රූපසිංහ** |
| ධූර කාලය අවසන්වන දිනයः | 2023.01.15 |
| | |
| නම | **මහාචාර්ය කේ ගුණවර්ධන** |
| තනතුරු: | **ප්‍රසව හා නාරිවේදය පිළිබඳ විශේෂඥ** |
| සභාවට පත් වූ දිනයः | 2021.09.22 |
| ධූර කාලය අවසන්වන දිනයः | 2023.09.21 |
| | |
| නම | **යූ.සී කිරිදිගොඩ** |
| තනතුරු: | **නීතිඥ** |
| සභාවට පත් වූ දිනයः | 2020.01.16 |
| සාමාජිකත්වයන්: | සභාපති, මහනුවර නීතිඥ සංගමය |
| ධූර කාලය අවසන්වන දිනයः | 2023.01.15 |
| | |
| නම | **වෛද්‍ය සර්ධා හේමප්‍රිය** |
| තනතුරු: | **මහනුවර ජාතික රෝහල, ප්‍රසව හා නාරිවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය** |
| උපාධි: | MBBS, MD, FSLCOG |
| සභාවට පත් වූ දිනයः | 2021.03.15 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයः | වෛද්‍ය විද්‍යාව - ප්‍රසව හා නාරිවේදය |
| දරණ ලද ප්‍රධාන තනතුරුः | ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජික, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන පරීක්ෂක |
| සාමාජිකත්වයන්: | ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේද විශේෂඥයින්ගේ විද්‍යාලය |
| ධූර කාලය අවසන්වන දිනයः | 2024.03.14 |
| | |
| නම | **මහාචාර්ය සිරිල් විජේසුන්දර** |
| තනතුරු: | **පර්යේෂණ මහාචාර්ය, ජාතික මූලික අධ්‍යයන ආයතනය** |
| උපාධි: | B.Sc., M.Phil., Ph.D. |

| | |
|---|---|
| සභාවට පත් වූ දිනයː | 2020.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | ශාක පරිසර විද්‍යාව, වර්ගීකරණය සහ සංරක්ෂණය, |
| දරන ලද ප්‍රධාන තනතුරුː | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| සාමාජිකත්වයන්ː | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **ඩබ්ලිව්.ජ් මහේන්ද්‍ර විජේපාල මහතා** |
| තනතුරුː | **පළාත් අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය** |
| උපාධිː | B.Sc.(ඉංජිනේරු), CEng, MIE(ශ්‍රී ලංකා), ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා |
| සභාවට පත් වූ දිනයː | 2020.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | සිවිල් ඉංජිනේරු විද්‍යාව |
| දරන ලද ප්‍රධාන තනතුරුː | සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ කඳුරට අංශය. |
| සාමාජිකත්වයන්ː | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජික. |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **සාලිය ධර්මවර්ධන මහතා** |
| සභාවට පත් වූ දිනයː | 2022.02.22 |
| දරන ලද ප්‍රධාන තනතුරුː | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| සාමාජිකත්වයන්ː | ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා 2020 දී කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ විශේෂඥ කමිටුවේ සාමාජික |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **ජේ.සී වර්ණකුල මහතා** |
| තනතුරුː | **වරලත් ගණකාධිකාරී** |
| උපාධිː | BSc ව්‍යාපාර පරිපාලනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| සභාවට පත් වූ දිනයː | 202.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | ගිණුම්කරණය සහ කළමනාකරණය |
| දරන ලද ප්‍රධාන තනතුරුː | ව්‍යාපාරික මණ්ඩලයේ බදු කමිටුවේ ප්‍රධානී,<br>මුදල් අමාත්‍යාංශයේ ජාතික චින්තන මණ්ඩලයේ සාමාජික |
| සාමාජිකත්වයන්ː | ACMA, CQMA(UK), ACMN(SL), ICA, MIPA(AU) |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **මහාචාර්ය එන්.ඒ. ද එස් අමරතුංග** |
| තනතුරුː | **සම්මානිත මහාචාර්ය** |
| උපාධිː | 2020.09.03 |
| සභාවට පත් වූ දිනයː | Maxillofacial සැත්කම් |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | පීඨාධිපති, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය |
| දරන ලද ප්‍රධාන තනතුරුː | වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සභාපති |
| සාමාජිකත්වයන්ː | 2023.09.02 |
| ධූර කාලය අවසන්වන දිනයː | 2020.09.03 |
| | |
| නම | **සමන්ත රත්වත්තේ** |
| තනතුරුː | **ජනාධිපති නීතිඥ** |
| සභාවට පත් වූ දිනයː | 2020.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | නීති |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි හිමි** |
| තනතුරුː | **අනුනායක මහා ස්වාමීන් වහන්සේ - මල්වතු පාර්ශවය** |
| උපාධිː | B.A, B.Ed සාහිත්‍ය චක්‍රවර්ති, ආචාර්ය |
| සභාවට පත් වූ දිනයː | 2020.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | බුද්ධාගම, පාලි |
| දරන ලද ප්‍රධාන තනතුරුː | කුලපති - ගම්පහ දේශීය වෛද්‍ය විද්‍යාලය, |
| සාමාජිකත්වයන්ː | පාලක සභා සාමාජික - භික්ෂු විශ්වවිද්‍යාලය සහ පාලි සහ බෞද්ධ විශ්වවිද්‍යාලය |
| ධූර කාලය අවසන්වන දිනයː | 2023.01.15 |
| | |
| නම | **ප්‍රසන්න ගුණතිලක මහතා** |
| තනතුරුː | **නීතිඥ** |
| සභාවට පත් වූ දිනයː | 2020.01.16 |
| අත්දැකීම් ලබා ඇති ක්ෂේත්‍රයː | නීති |

### 1.3.2 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 2022

1985 අංක 07 දරණ පනතින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ, 46වැනි වගන්තිය ප්‍රකාර ව ස්ථාපිත කරන ලද සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වේ.

**සනාතන සභාවේ සාමාජිකයින් පහත පරිදි වේ.**

| | |
|---|---|
| **සභාපති** | උපකුලපති<br>මහාචාර්ය එම්.ඩී ළමාවංශ |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය ඩබ්ලිව්.එම් ටෙරන්ස් මධුජිත් |

**පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරු**

| | |
|---|---|
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය සී.එම්.බී දෙමටවැව |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ පිටවල |
| මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එස්.ජේ.එස් ද මෙල් |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එස්.ඩී ධර්මරත්න |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| කෘෂි විද්‍යා පීඨය | මහාචාර්ය කේ.ඒස්.එස් කොඩිතුවක්කු |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ යටවර |
| ශාස්ත්‍ර පීඨය | ආචාර්ය ඊ.එම්.පී.සී.එස් ඒකනායක |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය ඒ.එම් ආටිගල |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය ඩී.එම්.යූ.අයි දිසානායක |
| කළමනාකරණ පීඨය | මහාචාර්ය ඊ.එම්.ඒ.එස්.බී ඒකනායක |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය එම්.වී.ජී පින්ටෝ |
| විද්‍යා පීඨය | මහාචාර්ය ආර්.ජී.එස්.සී රාජපක්ෂ |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | මහාචාර්ය පී.ජී.ඒ පුෂ්පකුමාර |

| | |
|---|---|
| **පුස්තකාලයාධිපති** | ආර් මහේෂ්වරන් මහතා |

**අංශ ප්‍රධානීන්**

**කෘෂි විද්‍යා පීඨය**

| | |
|---|---|
| කෘෂි ජීව විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එන්.යූ ජයවර්ධන |
| කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය | මහාචාර්ය එස් කුමාර් |
| කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය එන්.ඩී.කේ දයාවංශ |
| කෘෂි ව්‍යාප්ති අධ්‍යයන අංශය | ආචාර්ය යූ.අයි දිසානායක |
| සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.එම්.සී දේශප්‍රිය |
| බෝග විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය සී.කේ බෙනරගම |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.පී.එන්.පී රාජපක්ෂ |
| පාංශු විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.එස් ධර්මකීර්ති |

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය කේ.එල්.ටී.ඩී ජයවර්ධන |
| හෙදවේද අධ්‍යයන අංශය | ආචාර්ය යූ.ඩබ්ලිව්.එස් රත්නායක |
| භෞතවේද අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.ආර්.ඩබ්.එම්.එස්.අයි වඩුගොඩපිටිය |
| විකිරණ හා විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය | ආචාර්ය යූ.ජේ.එම්.ඒ.එල් ජයසිංහ |

| | |
|---|---|
| ඖෂධවේද අධ්‍යයන අංශය | ආචාර්ය එන්.ආර් අමරසිංහ |
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ටී.පී ගමගෙදර |

**ශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අධ්‍යයන අංශය | එම්.ඒ.එම් යසීර් මහතා |
| පුරාවිද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ජේ.එම්.ඒ ජයවික්‍රම |
| සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය | කේ.එම්.ආර්.එන් කුලතුංග මහත්මිය |
| ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය | මහාචාර්ය ජේ.ජී ශ්‍රී රංජිත් |
| අධ්‍යාපන අධ්‍යයන අංශය | ආචාර්ය කේ.එස්.එච්.එම්.ඩබ්.ඩබ් සෙනෙවිරත්න |
| ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය | ආචාර්ය කේ.ඒ.එන්.එම් කලුගම්පිටිය |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය | ආචාර්ය පී.ආර්.කේ.ඒ විතාරණ |
| ලලිත කලා අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඒ.එස්.බී මන්තිලක |
| භූගෝල විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.ඩබ්ලිව්.ජී රේඛා නියන්ති |
| ඉතිහාස අධ්‍යයන අංශය | ආචාර්ය කේ.එම්.ආර් දසනායක |
| තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය | මහාචාර්ය ටී.එම්.එස්.එස්.කේ යටිගම්මන ඒකනායක |
| නීති අධ්‍යයන අංශය | මහාචාර්ය එන්.ඩී උඩගම |
| දර්ශන අධ්‍යයන අංශය | මහාචාර්ය එච්.ආර්.එන්.පී.කේ හඳගම |
| මනෝවිද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.එස්.ඒ උසූෆ් |
| දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ජී.ඩී.ආර්.යූ අබේරත්න |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | මහාචාර්ය කේ රාහුල හිමි |
| සිංහල භාෂා අධ්‍යයන අංශය | ආචාර්ය එස්.කේ.එම්.ඩී.ඩී ගුණතිලක |
| සමාජ විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එම්.කේ තෝරදෙණිය |
| දෙමළ භාෂා අධ්‍යයන අංශය | මහාචාර්ය එස් ප්‍රිශාන්තන් |

**දන්ත වෛද්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ බන්නෙහැක |
| ප්‍රජා දන්ත සෞඛ්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය ඩබ්.බී.එම්.සී.ආර්.බී වීරසේකර |
| විස්තීරණ මුඛ සෞඛ්‍ය ආරක්ෂණ අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.එම් විජේරත්න |
| මුඛ සෞඛ්‍ය හා පරිදන්ත වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය ඩී ලෙවුකේ බණ්ඩාර |
| මුඛ ව්‍යාධවේද අධ්‍යයන අංශය | මහාචාර්ය බී.එස්.එම්.එස් සිරිවර්ධන |
| කෘතීම දන්ත වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය අයි.පී තිලකුමාර් |
| දන්ත සංරක්ෂණ අධ්‍යයන අංශය | ආචාර්ය ජී.කේ එදිරිසිංහ |
| මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය එන්.එස්.එස් ජයසූරිය |

**ඉංජිනේරු පීඨය**

| | |
|---|---|
| රසායන හා සැකසුම් ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඒ ඉලංගසිංහ |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය ජේ.ජේ විජේතුංග |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.ජී රගෙල් |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය බී.ජී.එල්.ටී සමරනායක |
| ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයන අංශය | කේ.කේ.කේ සිල්වා මහත්මිය |
| ඉංජිනේරු ගණිත විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එස්.පී.සී පෙරේරා |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය ඩී.ඒ.ඒ.සී රත්නවීර |
| නිෂ්පාදන හා කාර්මික ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය පී ගමගේ |

**කළමනාකරණ පීඨය**

| | |
|---|---|
| ව්‍යාපාර මූල්‍ය අධ්‍යයන අංශය | එස් කොඩිතුවක්කු මහත්මිය |
| මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය | ඩබ්.ඒ එදිරිසූරිය මහත්මිය |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ආර්.එම්.සී කුමාරි මෙනවිය |
| අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය | බී.එස් හෙට්ටිආරච්චි මහත්මිය |
| මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.එච් කුරුප්පුගේ |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| ව්‍යුහ විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එච්.ඒ අමරතුංග |
| නිර්වින්දන හා දැඩි සත්කාර අධ්‍යයන අංශය | ආචාර්ය පී.එස්.කේ.නානායක්කාර |
| ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය සී.එන්.ආර්.ඒ අලස් |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ටී.එම්.යූ.එස්.බී තෙන්නකෝන් |
| පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය | මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ.පතිරගේ |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඩී.එච් එදුසුරිය |
| වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඩී.එම්.පී.යූ.කේ රලපනාව |
| වෛද්‍ය විද්‍යා අධ්‍යාපන අංශය | මහාචාර්ය කේ.එන්.මාරඹේ |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය සී.ඩී.ගමගේ |
| ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය | ආචාර්ය සී කන්දඋඩ |
| ළමා රෝග අධ්‍යයන අංශය | ආචාර්ය පී.වී දිසානායක |
| පරපෝෂ විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඩී.එන් අතපත්තු |
| ව්‍යාධවේද අධ්‍යයන අංශය | ආචාර්ය එස් විජේතුංග |
| හිෂග්වේද අධ්‍යයන අංශය | ආචාර්ය එච්.එෆ්.එස් ෆොන්සේකා |
| කායික විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඩබ්ලිව්.ඩී.එම්.ටී.එල් දසනායක |
| මනෝ චිකිත්සක අධ්‍යයන අංශය | ආචාර්ය එච්.ජී.වී.ඩබ්ලිව් විජේසිරි |
| විකිරණ විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ජේ.ජේ.කේ.එච් උඩුපිහිල්ල |
| ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය ඒ.කේ.බී.බී.ටී.බී සමරසිංහ |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| උද්භිත විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය එස්.සී.කේ රුබසිංහගේ |
| රසායන විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය එම්.වයි.යූ ගනේහේනගේ |
| පරිසර හා කාර්මික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය බී.එස් දසනායක |
| භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.එම්.යූ.යූ.බී අමරසිංහ |
| ගණිත අධ්‍යයන අංශය | ආචාර්ය ටී.එච්.කේ.ආර් ද සිල්වා |
| අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයන අංශය | ආචාර්ය එම්.පී.සී.එස් ධනපාල |
| භෞතික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය වී සිවකුමාර් |
| සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එස්.පී අබේසුන්දර |
| සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඩබ්ලිව්.අයි.පී කරුණාරත්න |

**පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය**

| | |
|---|---|
| පශු මූලික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එල්.ජී.එස් ලොකුගලප්පත්ති |
| ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය එම්.එන්.එම් ෆවුසි |
| පශු වෛද්‍ය සායනික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඊ.ආර්.කේ.වී එදිරිමාන්න |
| පශු ව්‍යාධි ජීව විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඒ.ඩබ්ලිව් කළුපහන |
| පශු මහජන සෞඛ්‍ය හා හිෂග්වේද අධ්‍යයන අංශය | ආචාර්ය බී.ආර් ප්‍රනාන්දු |

**අංශ ප්‍රධානීන් නොවන මහාචාර්යවරුන්**

**කෘෂි විද්‍යා පීඨය**

| | |
|---|---|
| මහාචාර්ය ඒ.ආර්.එස්.බී අතාවුද | මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී නිශ්ශංක |
| මහාචාර්ය කේ.එස්.පී අමරතුංග | මහාචාර්ය එස්.ඒ.සී.එන් පෙරේරා |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්.ටී.පී ආරියරත්න | මහාචාර්ය පී.එච්.පී ප්‍රසන්න |
| මහාචාර්ය පී.සී.ජී බණ්ඩාරනායක | මහාචාර්ය ඩී.වී.පී ප්‍රසාද |
| මහාචාර්ය ඩී.එම්.ඩී කොස්තා | මහාචාර්ය බී.ඩී.ආර් ප්‍රසන්ත |
| මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම් කොස්තා | මහාචාර්ය ඩී.කේ.එන්.ජී පුෂ්පකුමාර |
| මහාචාර්ය ඩී.ඒ.එන් ධර්මසේන | මහාචාර්ය ආර්.එම්.සී.පී රාජපක්ෂ |
| මහාචාර්ය ඩබ්ලිව්.එස් දන්දෙණිය | මහාචාර්ය එස් සමිත |

මහාචාර්ය ජේ.පී ඊශ්වර
මහාචාර්ය කේ.එස් හේමචන්ද්‍ර
මහාචාර්ය එච්.එම්.වී.ජී හේරත්
මහාචාර්ය එච්.එම්.ජී.එස්.බී හිටිනායක
මහාචාර්ය එස්.එම්.සී හිමාලි
මහාචාර්ය ඩී.සී.කේ ඉලේපෙරුම
මහාචාර්ය බී.සී ජයවර්ධන
මහාචාර්ය කේ.කේ.එස්.පී කොඩිතුවක්කු
මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී මාරඹේ
මහාචාර්ය බී.ඊ.පී මෙන්ඩිස්
මහාචාර්ය ඒ.ජේ මොහොට්ටි
මහාචාර්ය එම්.අයි.එම් මෝජුඩ්
මහාචාර්ය ජී.එල්.එල්.පී සිල්වා
මහාචාර්ය ඩබ්ලිව්.පී.ආර්.පී ද සිල්වා
මහාචාර්ය ටී සිවනාතවල්
මහාචාර්ය එල්.ඩී.බී සූරියගොඩ
මහාචාර්ය ජේ.කේ විදානආරච්චි
මහාචාර්ය ඩබ්ලිව්.ඒ.යූ විතාරණ
මහාචාර්ය එච්.එල්.ජේ වීරහේවා
මහාචාර්ය ඩබ්.ඒ.පී වීරක්කොඩි
මහාචාර්ය කේ.ඩබ්ලිව්.එල්.කේ වීරසිංහ
මහාචාර්ය එම්.පී.බී විජයගුණවර්ධන
මහාචාර්ය කේ.එම්.එස් විමලසිරි

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

මහාචාර්ය ඒ.සී.එම් ෆාහිම්
මහාචාර්ය එච්.එම්.ටී.යූ හේරත්
මහාචාර්ය ඩී.බී.එම් වික්‍රමරත්න

**ශාස්ත්‍ර පීඨය**

මහාචාර්ය ඒ.එස්.පී අභයරත්න
මහාචාර්ය ඩී.පී.ඩී අමරසේකර
මහාචාර්ය පී.පී.ඒ.ඩබ්ලිව් අතුකෝරල
මහාචාර්ය එම්.අයි.එෆ් අස්මී
මහාචාර්ය ටී.ඩබ්.එම්.ටී.ඩබ් බණ්ඩාර
මහාචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස් බණ්ඩාර
මහාචාර්ය ආර්.එම්.එම් චන්ද්‍රරත්න
මහාචාර්ය ඕ.ජී දයාරත්න බණ්ඩා
මහාචාර්ය ඩී.එම්.එල් දිසානායක
පූජ්‍ය මහාචාර්ය එම් ඥාණානන්ද
මහාචාර්ය ඩී.එන්.බී ගුණවර්ධන
මහාචාර්ය එච්.ඒ.එන්.එම් හෙන්නායක
මහාචාර්ය එච්.එම්.එම් හේරත්
මහාචාර්ය ආර් හෙට්ටිආරච්චි
මහාචාර්ය ඒ.එල්.ටී හේවාවසම්
මහාචාර්ය පී.එම් ජමාහිර්
මහාචාර්ය ආර්.ජී.ඩී ජයවර්ධන
මහාචාර්ය ඩී.ඩී.කේ.එස් කරුණානායක
මහාචාර්ය කේ.එම්.ආර් කරුණාරත්න
මහාචාර්ය ජී.ජී.එස් කුලරත්න
මහාචාර්ය ඩබ්ලිව්.ඒ ලියනගේ
මහාචාර්ය ඒ පරාක්‍රම
මහාචාර්ය එම්.එම්.පී පෙරේරා
මහාචාර්ය ඩබ්ලිව්.එල්.පී පෙරේරා
මහාචාර්ය එම්.ඩබ්.සී.එන්.කේ රඹුක්වැල්ල
මහාචාර්ය එම්.බී රණතිලක
මහාචාර්ය රත්නායක එම් අබේරත්න
මහාචාර්ය ඒ සර්ජුන්
මහාචාර්ය එම්.එස්.එම් සලීම්
මහාචාර්ය පී.ජී.ආර් සරත්චන්ද්‍ර
මහාචාර්ය රෝහණ සෙනෙවිරත්න
මහාචාර්ය ඒ.ජී.එල් සෙනෙහෙවීර
මහාචාර්ය එස් සිවමෝහන්
මහාචාර්ය එස් සිවරාජසිංහම්
මහාචාර්ය එම් සෝමතිලක
මහාචාර්ය ජේ.ජී ශ්‍රී රංජිත්
මහාචාර්ය එස් විජේසන්දිරන්
මහාචාර්ය සී.එස් වික්‍රමගමගේ
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ජී.සී.එස්.එම් වික්‍රමසිංහ
මහාචාර්ය එස්.එන් විජේසිංහ
මහාචාර්ය එන් ඒ විමලසේන

**දන්ත වෛද්‍ය පීඨ**

මහාචාර්ය ඊ.ඒ.පී.ඩී අමරතුංග
මහාචාර්ය ඒ.කේ.එස් අරඹවත්ත
මහාචාර්ය කේ.එස්.එන් ආරියසිංහ
මහාචාර්ය එම්.ඩී.කේ ද සිල්වා
මහාචාර්ය යූ.බී දිසානායක
ආචාර්ය එම්.සී.එන් ෆොන්සේකා
මහාචාර්ය ඊ.එම්.යූ.සී.කේ හේරත්
මහාචාර්ය ආර්.ඩී ජයසිංහ
මහාචාර්ය ආර්.එම් ජයසිංහ
මහාචාර්ය පී.ආර් ජයසූරිය
මහාචාර්ය සී.ඩී නානායක්කාර
මහාචාර්ය බී.ජී.ටී.එල් නන්දසේන
මහාචාර්ය ආර්.ඩබ්ලිව් පල්ලේගම
මහාචාර්ය ජී.ජේ පනාගොඩ
මහාචාර්ය එච්.ආර්.ඩී පීරිස්
මහාචාර්ය එච්.එන්.එස් සොයිසා
මහාචාර්ය ඒ තිලකරත්න
මහාචාර්ය ඩබ්ලිව්.එම් තිලකරත්න
මහාචාර්ය කේ.ඒ වෙත්තසිංහ
මහාචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්.කේ විජේකෝන්

මහාචාර්ය ජේ.ඒ.එම්.එස් ජයතිලක
මහාචාර්ය ජේ.ඒ.සී.කේ ජයවර්ධන
මහාචාර්ය කේ.එම් විජේරත්න

**ඉංජිනේරු පීඨය**

මහාචාර්ය එස්.බී.එස් අබයකෝන්
මහාචාර්ය එස්.ජී අබේරත්න
මහාචාර්ය එම් දන්තුරේබණ්ඩාර
මහාචාර්ය පී.බී.ආර් දිසානායක
මහාචාර්ය ජේ.බී ඒකනායක
මහාචාර්ය එම්.පී.බී ඒකනායක
මහාචාර්ය එම්.ඒ.ආර්.එම් ප්‍රනාන්දු
මහාචාර්ය ජී.එම්.ආර්.අයි ගොඩලියද්ද
මහාචාර්ය එස්.ඩී.ජී.එස්.පී ගුණවර්ධන
මහාචාර්ය ඒ.යූ.ඒ.ඩබ් ගුණවර්ධන
මහාචාර්ය ජී.බී.බී හේරත්
මහාචාර්ය එච්.එම්.වී.ආර් හේරත්
මහාචාර්ය කේ.බී.එස්.එන් ජිනදාස
මහාචාර්ය සී.එස් කල්පගේ
මහාචාර්ය ඩී.ජී.ජී.පී කරුණාරත්න
මහාචාර්ය ඩී.එස්.කේ කරුණාසිංහ
මහාචාර්ය කේ.එම් ලියනගේ
මහාචාර්ය කේ.ජී.එන් නානායක්කාර
මහාචාර්ය කේ.ඩී.ඩබ්ලිව් නන්දලාල්
මහාචාර්ය එල් රාජපක්ෂ
මහාචාර්ය ආර් ශාන්තිනී
මහාචාර්ය කේ.ඒ.එස් සුසන්ත
මහාචාර්ය ඩී.එන් උඩුවාවල
මහාචාර්ය එස්.බී වීරකෝන්

**කලමනාකරණ පීඨය**

මහාචාර්ය ඊ.පී.එම් රාජරත්න
මහාචාර්ය ඩබ්ලිව්.පී.ආර් වික්‍රමරත්න

**වෛද්‍ය පීඨය**

මහාචාර්ය ඒ.එස් අබේගුණවර්ධන
මහාචාර්ය එස් අබේගුණවර්ධන
මහාචාර්ය එස්.බී අදිකාරි
මහාචාර්ය කේ.අයි.සී. ද සිල්වා
මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම් දිසානායක
මහාචාර්ය බී.එන් දිසානායක
මහාචාර්ය ඒ.ඩී ධර්මපාල
මහාචාර්ය ඩී.එච් එදුස්සූරිය
මහාචාර්ය ඩී.එම්.ජී ප්‍රනාන්දු
මහාචාර්ය පී.එච්.පී ප්‍රනාන්දු
මහාචාර්ය කේ.බී ගල්කැටිය
මහාචාර්ය අයි.බී ගවරම්මන
මහාචාර්ය පී.බී හේවාවිතාන
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩී.ආර් ඉද්දවෙල
මහාචාර්ය ඩබ්.ඒ.ටී.ඒ ජයලත්
මහාචාර්ය ඒ ජයසිංහ
මහාචාර්ය එම්.ඩබ්ලිව්.සී.ජේ ජයසිංහ
මහාචාර්ය ඒ.එච්.එච්.එම් ජයවීර
මහාචාර්ය එන්.එස් කළුපහන
මහාචාර්ය ඒ කාරියවසම්
මහාචාර්ය කේ.ඒ.එස් කොඩිකාර
මහාචාර්ය එස්.ටී කුඩගම්මන
මහාචාර්ය පී.වී.ආර් කුමාරසිරි
මහාචාර්ය එස්.ඒ.එම් කුලරත්න
මහාචාර්ය එල්.වී.සී. ලියනපතිරන
මහාචාර්ය යූ.ඒ.බී මැදගම
මහාචාර්ය ආර්.පී මොරෙල්
මහාචාර්ය ආර්.එම් මුදියන්සේ
මහාචාර්ය අයි නානායක්කාර
මහාචාර්ය එෆ් නූර්දීන්
මහාචාර්ය එච්.කේ.අයි පෙරේරා
මහාචාර්ය ඒ.යූ.බී පෙතියාගොඩ
මහාචාර්ය එම්.කේ ප්‍රසාද්
මහාචාර්ය ටී.එන් රාජපක්ෂ
මහාචාර්ය ජේ.ජී.එස් රණසිංහ
මහාචාර්ය එස් රොසයිරෝ
මහාචාර්ය එෆ් සිතික්
මහාචාර්ය එච්.එම්.ඒ සොමිනන්ද
මහාචාර්ය ආර්.එස් තල්ගහගොඩ
මහාචාර්ය ඒ.එන් වඩිසිංහ
මහාචාර්ය ආර් වඩුගේ
මහාචාර්ය වී.එස් වීරසිංහ

**විද්‍යා පීඨය**

මහාචාර්ය සී.එල් අබයසේකර
මහාචාර්ය බී.එම්.එන්.ඩබ්.බී බාලසූරිය
මහාචාර්ය එල්.ආර්.ඒ.කේ බණ්ඩාර
මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ජේ බණ්ඩාර
මහාචාර්ය එස්.එච් බෝයගොඩ
මහාචාර්ය ආර්.එල්.ආර් චන්ද්‍රජිත්
මහාචාර්ය ජේ.ඩබ්ලිව් දමුණුපොල
මහාචාර්ය එච්.එම්.ඩී ප්‍රියන්ත නාමල්
මහාචාර්ය එම්.එම්.ඒ.එන් නවරත්න
මහාචාර්ය ඒ.ඒ.අයි පෙරේරා
මහාචාර්ය ඒ.ඩී.එල්.සී පෙරේරා
මහාචාර්ය ජී.ඒ.ඩී පෙරේරා
මහාචාර්ය එල්.ආර්.කේ පෙරේරා
මහාචාර්ය යූ.ඒ.ජේ පිනිදියආරච්චි

මහාචාර්ය ඩබ්.ඒ.එම් දවුන්ඩසේකර
මහාචාර්ය ඩබ්.ඒ.පී.පී ද සිල්වා
මහාචාර්ය ඒ.එම්.ටී.ඒ ගුණරත්න
මහාචාර්ය සී.වී හෙට්ටිආරච්චි
මහාචාර්ය එච්.එච් ජයසේන
මහාචාර්ය කේ.එම්.ජී.ජී ජයසූරිය
මහාචාර්ය එස්.එච්.පී.පී කරුණාරත්න
මහාචාර්ය එස්.ආර් කොඩිතුවක්කු
මහාචාර්ය එච්.එම්.එස්.පී මඩවල
මහාචාර්ය එම්.ඒ.එස්.පී.කේ මලවිආරච්චි
මහාචාර්ය එස්.එච් බෝයගොඩ
මහාචාර්ය ආර්.එස් රාජකරුණා
මහාචාර්ය ආර්.එම්.ජී රාජපක්ෂ
මහාචාර්ය කේ.බී රණවන
මහාචාර්ය එස්.සී.කේ රූබසිංහ
මහාචාර්ය පී සමරසේකර
මහාචාර්ය අතුල සේනාරත්න
මහාචාර්ය ඒ වික්‍රමසිංහ
මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්.පී විජේකෝන්
මහාචාර්ය ඩී.එම්.ඩී යකන්දාවල
මහාචාර්ය වයි.පී.ආර්.ඩී යාපා
මහාචාර්ය එම්.ඩබ්ලිව්.එස්.කේ යටිගම්මන

**පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය**

මහාචාර්ය ඒ දංගොල්ල
මහාචාර්ය පී.ඒ.බී.ඩී ඇලෙක්සැන්ඩර්
මහාචාර්ය එච්.බී.එස් ආරියරත්න
මහාචාර්ය ආර්.පී.වී.ජේ රාජපක්ෂ
මහාචාර්ය ආර්.එස් කළුපහන
මහාචාර්ය ජී.එස්.පී ද සිල්වා ගුණවර්ධන
මහාචාර්ය එල්.ජේ.පී.ඒ.පී ජයසූරිය
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඒ.පී වනිගසේකර

## සනාතන සභාවේ පීඨ නියෝජිතයන්

**කෘෂි විද්‍යා පීඨය**

ආචාර්ය එස්.පී වැලිගම
ආචාර්ය ඩබ්ලිව්.ඊ.එම්.එල්.ජේ ඒකනායක

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

වෛද්‍ය යූ.ජේ.එම්.ඒ.එල් ජයසිංහ
මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ යටවර
ආචාර්ය එම්.එච්.එෆ් සකීනා
ආචාර්ය එස් කුලතුංග

**ශාස්ත්‍ර පීඨය**

ආචාර්ය එම්.එල්.කේ.සී.කේ.සේනාරත්න
ආචාර්ය එච්.එම්.සී හේරත්
ආචාර්ය ඩී.ඩී.කේ.එස් කරුණානායක
ආචාර්ය රමේෂ් රාමසාමි

**දන්ත වෛද්‍ය පීඨය**

ආචාර්ය එම්.පී පරණගම
ආචාර්ය එච්.එම්.ටී.ඩී.කේ හේරත්

**ඉංජිනේරු පීඨය**

ආචාර්ය බී.ජී.එල්.ටී සමරනායක
ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී ගුණවර්ධන
ආචාර්ය පී.ජේ බිංදුහේවා
ආචාර්ය පී.බී.ජී දිසානායක

**කළමනාකරණ පීඨය**

ඒ.එම්.ඒ.එම්.එස්.එම් බණ්ඩාර මහතා
ආචාර්ය එස් මහේෂ්වරන්
කේ.එච්.එම්.ඒ.ආර් කොලොන්ගහපිටිය මෙනවිය

**වෛද්‍ය පීඨය**

ආචාර්ය ටී.එම්.එස්.එච් ධර්මරත්න
ආචාර්ය එස්.ඩී.අයි නානායක්කාර
ආචාර්ය ඩබ්ලිව්.එම්.ඒ.එස්.බී වාසල
ආචාර්ය එම්.ජී.ඩී.වී.කේ කිරිදාන

**විද්‍යා පීඨය**

ආචාර්ය වී.එන් සෙනෙවිරත්න
ආචාර්ය ජේ.ඒ.සී.පී ජයලත්

**පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය**

ආචාර්ය ආර්.ඒ.සී රබෙල්
ආචාර්ය එල්.ජී.එස් ලොකුගලප්පත්ති
ආචාර්ය ආර්.ආර්.එම්.කේ.කේ විජේසුන්දර
ආචාර්ය ආර්.එම්.එස්.බී.කේ රණසිංහ

**සනාතන සභාවේ ලේකම්**

එම්.ජී.ජේ. ධර්මසිරි මිය - වැඩබලන ලේඛකාධිකාරී

**පාලක සභාවේ අනුකමිටු**

- විගණන සහ කළමණාකරණ කමිටුව
- විනය මණ්ඩලය
- මූල්‍ය කමිටුව
- මූල්‍ය කළමනාකරණ කමිටුව
- දුක්ගැනවිලි කමිටුව
- ඉඩම්, ගොඩනැගිලි සහ නඩත්තු කමිටුව
- ප්‍රසම්පාදන කමිටුව
- කාර්ය මණ්ඩල නේවාසික කමිටුව
- මානව සම්පත් කළමනාකරණ සංවර්ධන කමිටුව
- නඩත්තු කළමනාකරණ කමිටුව
- උපාය මාර්ගික සැලසුම් සහ අධීක්ෂණ කමිටුව

**සනාතන සභාවේ අනුකමිටු**

- අධ්‍යයන සංවර්ධන සහ සැලසුම් කමිටුව
- ඇතුළත් කිරීමේ කමිටුව
- ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ කමිටුව
- පුස්තකාල කමිටුව
- ප්‍රකාශන කමිටුව
- පර්යේෂණ කමිටුව
- ශිෂ්‍යත්ව කමිටුව

**රැස්වීම්**

පාලක සභාව, සනාතන සභාව සහ අනෙකුත් බලධාරීන් 2022 වර්ෂය තුළ පහත පරිදි රැස් වී ඇත.

| රැස්වීම | රැස්වීම් ගණන |
|---|---|
| **පාලක සභා** | **12** |
| **පාලක සභා අනු කමිටු** | |
| විගණන සහ කළමනාකරණ කමිටුව | 06 |
| විනය මණ්ඩලය | 04 |
| මූල්‍ය කමිටුව | 12 |
| මූල්‍ය කළමනාකරණ කමිටුව | 06 |
| දුක්ගැනවිලි කමිටුව | 06 |
| මානව සම්පත් කළමනාකරණ සංවර්ධන කමිටුව | 06 |
| ඉඩම්, ගොඩනැගිලි, සහ නඩත්තු කමිටුව | 10 |
| නඩත්තු කළමනාකරණ කමිටුව | 04 |
| ප්‍රසම්පාදන කමිටුව | 14 |
| කාර්ය මණ්ඩල නේවාසික කමිටුව | 05 |
| උපාය මාර්ගික සැලසුම් සහ අධීක්ෂණ කමිටුව | 08 |
| **සනාතන සභාව** | **12** |
| **සනාතන සභා අනු කමිටු** | |
| අධ්‍යයන සංවර්ධන සහ සැලසුම් කමිටුව | 07 |
| ඇතුළත් කිරීමේ කමිටුව | 05 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ කමිටුව | 03 |
| පුස්තකාල කමිටුව | 04 |
| ප්‍රකාශන කමිටුව | 03 |
| පර්යේෂණ කමිටුව | 04 |
| ශිෂ්‍යත්ව කමිටුව | 06 |
| **පීඨ මණ්ඩල** | |
| කෘෂි විද්‍යා පීඨය | 12 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 14 |
| කලා පීඨය | 15 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 12 |
| ඉංජිනේරු පීඨය | 19 |
| කළමනාකරණ පීඨය | 13 |
| වෛද්‍ය පීඨය | 13 |
| විද්‍යා පීඨය | 10 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 12 |

# විධායක නිලධාරීන් - 2022



## 1.3.3 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයීය විධායක නිලධාරීන්

**සාමාන්‍ය පරිපාලනය**

**ලේඛකාධිකාරී** : එම්.ජී.ජේ ධර්මසිරි මිය (වැඩබලන)

| | |
|---|---|
| අධ්‍යයන ආයතන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>එම්.එල්.ඩබ්.ඕ.එම් කරුණාරත්න මිය<br>සහකාර ලේඛකාධිකාරී<br>ඩබ්ලිව්.එම්.එස්.එන් විජේරත්න මිය |
| මූලධන අංශය | සහකාර ලේඛකාධිකාරී<br>ජේ.පී වෙස්ලි මහතා<br>ව්‍යාපෘති කළමනාකරු<br>ආචාර්ය කේ.ඒ.එස්.ජී.එස් කරුණානායක |
| සංයුක්ත කළමනාකරණ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>ඩී.කේ.කේ නාරම්පනාව මෙනවිය |
| පාලක සභා සහ අධ්‍යයන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>ඩබ්ලිව්.එම්.එම්.එස් විජේසුන්දර මහතා |

| | |
|---|---|
| සාමාන්‍ය සේවා අංශය | නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු<br>එම්.එස්.ඩී මාරසිංහ මිය<br>ඊ.එම්.ජී.එම්.බී ඒකනායක මහතා |
| අභ්‍යන්තර විගණන අංශය | නියෝජ්‍ය අභ්‍යන්තර විගණන<br>එස්.ඩබ් කොඩිතුවක්කු මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක<br>ඒ.ජී.එෆ් ෆස්නා මිය |
| නීති සහ ප්‍රලේඛන අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන)<br>ඩබ්.ඒ.ආර්.සී වික්‍රමසිංහ මිය<br>සහකාර ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන)<br>එම්.කේ.එෆ් ෆවාසා මිය |
| අනධ්‍යයන ආයතන අංශය | නියෝජ්‍ය ලේඛකාධිකාරී<br>එච්.ඒ.ටී.එන් අමරසේන මිය |
| සිසුන් ලියාපදිංචි කිරීමේ අංශය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>පී.එච් ආරියරත්න මහතා |
| ශිෂ්‍ය සේවා අංශය | සහකාර ලේඛකාධිකාරී<br>සී.කේ.කේ රත්නායක මිය |

**පීඨ පරිපාලනය**

| | |
|---|---|
| කෘෂි විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>පී.අයි පතිරණ මිය<br>සහකාර මූල්‍යාධිකාරී<br>එස්.එන්.කේ මිය |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | සහකාර ලේඛකාධිකාරී<br>ඩබ්.එම්.ඩී.කේ ඇතුල්ගම මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br>එම්.ඩී.එස්.එම් රොද්‍රිගු මහතා |
| ශාස්ත්‍ර පීඨය | නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු<br>එම්.එස් රණසිංහ මිය<br>පී.කේ හේරත් මිය<br>සහකාර මූල්‍යාධිකාරී<br>එස්.ඒ.ඩබ්ලිව් චතුරානි මිය |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>ඩබ්ලිව්.එම්.ඒ.ඒ.එන්.එන් පාදෙණිය මිය<br>සහකාර මූල්‍යාධිකාරී<br>ආර්.ඒ.අයි.යූ රණසිංහ මිය |
| ඉංජිනේරු පීඨය | සහකාර ලේඛකාධිකාරී<br>ආර්.ඩී.එස්.එන් රාජපක්ෂ මෙනෙවිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br>බී.එම්.අයි.ඒ.කේ බස්නායක මහතා<br>වැඩමුළු ඉංජිනේරු III ශ්‍රේණිය<br>ඒ.පී.ඩී.එල් අතපත්තු මහතා |
| කළමනාකරණ පීඨය | සහකාර ලේඛකාධිකාරී<br>ඩබ්ලිව්.වී.එල් කුමාර මහතා<br>සහකාර මූල්‍යාධිකාරී<br>පී.ජී.වයි.බී පහලගේ මහතා |

| | |
|---|---|
| වෛද්‍ය පීඨය | සහකාර ලේඛකාධිකාරී<br>එච්.එම්.ඩී.වයි හේරත් මිය<br>නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>එම් ජයරත්න මෙනෙවිය |
| විද්‍යා පීඨය | සහකාර ලේඛකාධිකාරී<br>ඩී.එම්.අයි.එන්.ජේ දිසානායක මෙනවිය<br>සහකාර මූල්‍යාධිකාරී<br>එම්.ජී.ඩී.සී මුහන්දිරම් මිය |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>එස්.එච්.පී.ආර්.එස් ඒකනායක මහතා<br>සහකාර මූල්‍යාධිකාරී<br>ඒ.එන් විජේනායක මිය |

## මූල්‍ය පරිපාලනය

**මූල්‍යාධිකාරී :** ඒ.එම්.එන්.බී අරම්පත් මහතා

| | |
|---|---|
| ආදායම්, අයවැය සහ විගණන විමසුම් | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>යූ.ඩබ් රාජ්මාල් මහතා |
| අවසාන ගිණුම් | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>පී.ඒ.ඩී.සී.ජේ පොන්නම්පෙරුම මහතා |
| දේශීය සැපයුම් | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>ඩබ්.එච්.ඒ.ඩී දිල්රුක්ෂි මිය |
| වැටුප් | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>ඒ.එම්.ආර්.ඒ ප්‍රියශාන්ත මහතා |
| පර්යේෂණ සහ අරමුදල්, ප්‍රකාශන සහ ගබඩා | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>ඩබ්.ඒ.එන්.සී විජේසිංහ මහතා<br>ඒ.අයි සමරහේවා මහතා |
| ගෙවීම් | නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>ඩබ්.ඒ.ජී.ටී.එල්.බී වීරසේකර මහතා |
| විශ්‍රාම ප්‍රතිලාභ සහ ප්‍රාග්ධන ගෙවීම් | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br>ඩී.එස්.සී.පී. කුමාරි මෙනවිය |
| ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය සහ ණය | සහකාර මූල්‍යාධිකාරී<br>ඩබ්.එම්.එච්.එස්.බී වික්‍රමනායක මහත්මිය |
| කළඹ ආයෝජන කළමනාකරණය | සහකාර මූල්‍යාධිකාරී<br>ආර්.එම්.ඩී.ජේ රත්නායක මිය |

## සේවා අංශ

| | |
|---|---|
| සෞඛ්‍ය මධ්‍යස්ථානය | ප්‍රධාන වෛද්‍ය නිලධාරී<br>ආචාර්ය එච්.එම්.සී.එල් හේරත් (වැඩ බලන)<br>වෛද්‍ය නිලධාරී<br>ආචාර්ය එච්.ඒ.ඩී රුවන්ජිත් |
| උද්‍යාන අංශය | උද්‍යාන පාලක (උද්‍යාන පාලක II ශ්‍රේණිය)<br>ඩබ්.එන්.ආනන්ද මහතා |
| නඩත්තු අංශය | වැඩ ඉංජිනේරු III ශ්‍රේණිය<br>ජේ.ඒ.සී.එන් ජයසූරිය මහතා<br>පී.එස් පණ්ඩිතරත්න මහතා |

| | |
|---|---|
| විනයාරක්ෂක අංශය | ප්‍රධාන විනයාරක්ෂක<br>ඩබ්ලිව්.ඒ වේරහැර මහතා<br>නියෝජ්‍ය විනයාරක්ෂක<br>ආර් ගජවීර මහතා |
| ශාරීරික අධ්‍යාපන අංශය | අධ්‍යක්ෂ/ ශාරීරික අධ්‍යාපන<br>එම්.ඩී පාලිත කුමාර මහතා |
| මහජන සම්බන්ධතා අංශය | මහජන සම්බන්ධතා නිලධාරි<br>එම් අබේවික්‍රම මහතා (වැඩබලන) |
| ආරක්ෂක අංශය | ප්‍රධාන ආරක්ෂක නිලධාරි<br>එන්.කේ සූරියබණ්ඩාර මහතා |
| සංඛ්‍යාලේඛන සහ තොරතුරු අංශය | සංඛ්‍යාලේඛන නිලධාරිනි<br>ඒ.ඒ.කේ.යූ අතපත්තු මිය |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | ඉලෙක්ටොනික ඉංජිනේරු III ශ්‍රේණිය<br>එම්.ඒ ගුණරත්න මහතා |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | නියෝජ්‍ය ලේඛකාධිකාරී<br>එස්.සී හේරත් මිය<br>සහකාර ලේඛකාධිකාරී<br>බී.එම්.එස්.එස් පණ්ඩිතරත්න මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br>එස්.එන් කුමුදුනී මිය |
| ප්‍රධාන පුස්තකාලය | සහකාර ලේඛකාධිකාරී/ පුස්තකාල සේවය<br>ඒ.එම්.ඒ.සී සේනාරත්න මිය<br>එල්.පී විතානගේ මහත්මිය |
| තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය | සහකාර ලේඛකාධිකාරී<br>බී.එන්.ජේ ආරියරත්න මිය |

# 2022 වසරේ විශේෂ සිදුවීම්

- 1942 දී ආරම්භ කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය වනාහි පීඨ 09කින්, අධ්‍යයනාංශ 86කින් සහ පශ්චාත් උපාධි ආයතන 04කින් සමන්විත ශ්‍රී ලංකාවේ හොඳ ම, විශාලත ම සහ පුළුල් ම විශ්වවිද්‍යාලය වේ.

- සිසුන් 8,355 දෙනෙකුට විනෝදාශ්වාද සහ සුභසාධන පහසුකම් සලසා දෙමින්, විශ්වවිද්‍යාලය තුළ සුදුසුකම් ලත් සිසුන්ගෙන් 95%ක් සඳහා නවාතැන් සපයමින්, විශ්වවිද්‍යාලය ප්‍රථම උපාධි වැඩසටහන් 62ක් පිරිනමයි.

- 2022 දෙසැම්බර් 31 වන දිනට, ජාත්‍යන්තර සිසුන් 108 ක් ද ඇතුලු විශ්වවිද්‍යාලයේ, පශ්චාත් උපාධි ආයතන සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයෙහි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 32,956 කි.

- ලෝකයේ හොඳ ම විශ්වවිද්‍යාල 1000 අතරට ශ්‍රේණිගත කර ඇති මෙම විශ්වවිද්‍යාලය ටයිම්ස් හයර් එඩියුකේෂන් යුන්වර්සිටි ඇන්ඩ් ඉම්පැක්ට් ශ්‍රේණිගතකිරීම් සහ U.S News and World Report මඟින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් පළමුවන වන ස්ථානයට ද පත් විය.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් නව දෙනකු ලෝක විද්‍යාඥයින්ගෙන් ඉහළ ම 2% අතර සිටින අතර, වෛද්‍ය පීඨයේ මහාචාර්ය කලණ මාදුවගේ, විශිෂ්ටත ම තරුණ පර්යේෂකයා සඳහා වන CVCD විශිෂ්ටතා සම්මානයෙන් පිදුම් ලැබීය.

- විශ්වවිද්‍යාල කාණ්ඩයේ හොඳ ම වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2020 සඳහා වන රන් සම්මානය විශ්වවිද්‍යාලයට හිමි විය.

- ඉංජිනේරු පීඨයේ ESLE කණ්ඩායම 2022 මාර්තු මාසයේ පැවති *Imagine Cup World Final* සඳහා තරග කිරීමට තෝරා ගන්නා ලද අතර පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශයේ ප්‍රකාශන දෙකක් පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ දෙවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICARC) 2022 දී හොඳ ම පත්‍රිකා සඳහා වන සම්මාන දිනා ඇත.

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා පැසිපන්දු කණ්ඩායම පසුගියදා පැවති ජ්‍යෙෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලියේ-2022 ශූරියන් බවට පත් විය.

- මහාචාර්ය ජී.එච්. පීරිස් 2022 මැයි මාසයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා ලෙස පත් කරන ලදී.

- විශ්වවිද්‍යාලය විසින් නව අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් ස්ථාපිත කරන ලදී. 2022 දී අධ්‍යයන කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය සහ ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන ලද අතර, පාලක සභා රැස්වීමට පෙර අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් පරීක්ෂා කිරීමට සහ සංදේශ අධ්‍යයනය කිරීම සඳහා කමිටු පත් කරන ලද.

- පර්යේෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ ව්‍යාපෘති සඳහා බාහිර අරමුදල් ලබාගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාල පර්යේෂණ සහ ප්‍රදාන කාර්යාලය (PURGO) පිහිටුවන ලද අතර, ඉන්දියානු විශ්වවිද්‍යාල සහ ආයතන සමග පර්යේෂණ සහ ශාස්ත්‍රීය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ප්‍රධාන පුස්තකාලයේ ඉන්දියානු මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී.

- විශ්වවිද්‍යාලය සහ එහි ආදි ශිෂ්‍යයන් අතර සබඳතා පවත්වාගෙන යාම සඳහා ආදි ශිෂ්‍ය සම්බන්ධතා කාර්යාලය (ARO-UoP) පිහිටුවන ලදී.

- උපාධිධාරීන් 7,020ක් බිහි කරමින් විශ්වවිද්‍යාලය 2022 වර්ෂයේ දී උපාධි ප්‍රදානෝත්සව දෙකක් පවත්වන ලදී.

- විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන වැඩසටහන් 15ක් සංශෝධනය කරන ලද අතර පර්යේෂණ පැවැත්වීම සහ ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරුව සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් 24ක් ඇති කරගන්නා ලදී. තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස පුළුල් අභ්‍යන්තර ආයතනික සමාලෝචනයක් පවත්වන ලද අතර ජල විෂබීජ නාශක සහ රූමත් ආරක්ෂිත මේද නිෂ්පාදනය සම්බන්ධ නව නිපැයුම් සඳහා 2022 දී පේටන්ට් බලපත්‍ර දෙකක් ලබා ගන්නා ලදී.

- කෘෂි විද්‍යා පීඨයේ මහාචාර්ය කේ.එස්.පී. අමරතුංග මහතා විසින් අධෝරක්ත විශේෂිත තේ වියළන යන්ත්‍රයක්, වී සඳහා කාර්මික පරිමාණයේ ක්ෂණික වාෂ්පකයක් සහ අධෝරක්ත විශේෂිත කෝපි රෝස්ටරයක් ඇතුළත් නව නිෂ්පාදන තුනක් හඳුන්වා දෙන ලදී.

- විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන (URG) සඳහා රුපියල් මිලියන 40ක් ද, බහුවිෂයික පර්යේෂණ සඳහා රුපියල් මිලියන 30ක් ද, ප්‍රථම උපාධි පර්යේෂණ සඳහා රුපියල් මිලියන 10ක් සහ ආධුනික කථිකාචාර්යවරුන් සඳහා මිලියන 10ක් ද වෙන් කර ඇති අතර, ජාත්‍යන්තර සම-සමාලෝචිත සුවිගත සඟරාවල පර්යේෂණ පත්‍රිකා 459ක් සහ ජාතික සඟරා වල පර්යේෂණ පත්‍රිකා 126ක් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම ජයග්‍රහණ සහ ප්‍රයත්නයන් තුළින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ නවෝත්පාදන සහ ප්‍රජා සේවය සඳහා ඇති කැපවීම පිළිබිඹු වන අතර, ලෝක මට්ටමේ උසස් අධ්‍යාපන ආයතනයක් පිළිබඳ අපගේ දැක්ම ඉදිරියට ගෙන යාම පිණිස අපව වඩවඩාත් පොළඹවයි.

## 1.4 2022 වර්ෂයේ සමස්ත කාර්ය සාධනය

### 1.4.1 විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පත්වීම්

- **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපති**

  මහාචාර්ය ජී.එච්. පීරිස් මහතා වසර තුනක කාලයක් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා ලෙස 2022 මැයි මාසයේ දී පත් කරන ලදී. මහාචාර්ය පීරිස් මහතා, 1960 දී භූගෝල විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධියක් සමඟින් ශාස්ත්‍ර පීඨයෙන් උපාධිය ලබා පසු ව, එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් භූගෝල විද්‍යා දර්ශනවේදී උපාධිය ලබා ගත්තේ ය. පසු ව ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සහකාර කථිකාචාර්යවරයකු ලෙස සම්බන්ධ වී වසර 44 ක කාලයක් විශ්වවිද්‍යාලයට සේවය කර ඇත. මහාචාර්ය පීරිස් මහතා, විවිධ රටවල්වල දේශපාලන වෙනස්කම් පිළිබඳ ව පුළුල් පර්යේෂණ සිදු කර ඇත.

- මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.ටී. යටවර මහත්මිය 2022 පෙබරවාරි මස 26 වන දින සිට සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 4 වන පීඨාධිපතිවරයා ලෙස පත් කර ඇත.

### 1.4.2 නව ආයතන

**අධ්‍යක්ෂ මණ්ඩල පිහිටුවීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික හා ගෝලීය සන්දර්භයක් තුළ උසස් අධ්‍යාපන ක්‍රමයේ වෙනස්වන ප්‍රවණතා සමඟ සෑම විටම ගමන් කර ඇත. නැගී එන ප්‍රවණතා සහ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, අධ්‍යයන පුහුණු වැඩසටහන් සහ ක්‍රියාවලීන්හි නව මුලපිරීම් සහ අධ්‍යයන සැලසුම් සහ සංවර්ධනයේ වෙනත් ප්‍රතිසංස්කරණ අනුගමනය කර ඇත. 2022 වර්ෂයේ දී අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය විධි පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාල කවුන්සිලයේ අනුමැතිය ඇති ව නව මූලාරම්භයක් වෙත අවතීර්ණ විය.

**අධ්‍යයන කටයුතු අංශය**

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සංවර්ධනය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යයන කටයුතු අංශය 2022 ජුනි මාසයේ දී පිහිටුවන ලදී. අධ්‍යයන කටයුතු අංශයෙහි මූලික කාර්යභාරය වන්නේ, විස්තීරණ අධ්‍යයන සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී සහ අධ්‍යයන සංවර්ධනය සඳහා ප්‍රමුඛතා හඳුනා ගැනීමේ දී උපකුලපතිවරයාට සහ අධ්‍යයන බලධාරීන්ට සහය වීමයි. තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව සහ ජාත්‍යන්තර කටයුතු කාර්යාලය ඇතුළු විවිධ දෙපාර්තමේන්තු අතර අධ්‍යයන සංවර්ධන කරුණු සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කාර්යය සඳහා ද අධ්‍යයන කටයුතු අංශය වගකිව යුතු ය. අධ්‍යයන කටයුතු අංශයෙහි ප්‍රධාන කාර්යයක් වන්නේ, පශ්චාත් උපාධි ආයතන විශ්වවිද්‍යාල ව්‍යුහය තුළට ඒකාබද්ධ කිරීමේ ක්‍රම ගවේෂණය කිරීමයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සංවර්ධනය, අධ්‍යයන සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිණිස අධ්‍යයන කටයුතු අංශය මෙහෙයවීම සඳහා එම අංශයෙහි ආරම්භක අධ්‍යක්ෂවරයා ලෙස මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර මහතා පත් කරන ලදී. අධ්‍යයන විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ වර්ධනය සඳහා වන විශ්වවිද්‍යාලයේ කැපවීම, අධ්‍යයන කටයුතු අංශය පිහිටුවීම තුළින් පිළිබිඹු වේ.

**ශිෂ්‍ය ආධාර සහ සුබසාධනය සේවා**

2010 ඔක්තෝම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 933 ට අනුව, විශ්වවිද්‍යාලයේ සියලු ශිෂ්‍ය ආධාර සහ සුබසාධනය සේවා ජාලගත කිරීම සඳහා ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය විධි පිළිබඳ කාර්යාලය 2022 වසර තුළ පිහිටුවන ලදී. හවුල් උපයෝගිතා හා සේවා, සෞඛ්‍ය සේවා, සමාජ හා සංස්කෘතික පහසුකම්, සිසුන්ගේ යහපැවැත්ම, දුක්ගැනවිලි නිරාකරණය සහ උපදේශන පද්ධතිය සහ ආරක්ෂාව හා විනය ඇතුළු පුළුල් ක්ෂේත්‍ර හයක් ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය විධි හරහා ආවරණය වෙයි. මහාචාර්ය මනෝජ් පතිරගේ මහත්මිය, ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය විධි අංශයෙහි ආරම්භක අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලද්දේ, මෙම මුලපිරීම සඳහා නායකත්වය දීමට සහ සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන් මාවත පුරාවටම පුළුල් සහයෝගයක් ලැබෙන බව සහතික කිරීම සඳහා ය. ශිෂ්‍ය ආධාර සේවා

සහ සුබසාධනය විධි අංශය පිහිටුවීම මඟින් ශිෂ්‍ය සුබසාධනය ප්‍රවර්ධනය කිරීමට සහ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා වන අපගේ කැපවීම තව දුරටත් අවධාරණය වේ.

**උපදේශන සහ මනෝවිද්‍යාත්මක සහය ඒකකය පිහිටුවීම**

උපදේශන සහ මනෝවිද්‍යාත්මක සහය ඒකකය, අපගේ කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ මානසික අවශ්‍යතා සපුරාලීමේ අරමුණින්, 2022 අගෝස්තු මාසයේ දී පිහිටුවන ලදී. සෞඛ්‍ය මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටා ඇති, උපදේශන සහ මනෝවිද්‍යාත්මක සහය ඒකකය, අපගේ ප්‍රජා සමූහයේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ තැනැත්තන් වෙත, ඔවුන්ගේ අභ්‍යන්තරික මනෝවිද්‍යාත්මක පීඩා පිරික්සා බැලීමක් සහ ඒ සඳහා වූ රහස්‍ය උපදේශන සේවයක් සපයයි. මෙම ප්‍රයත්නයන් මෙහෙයවීමට සහ අපගේ කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට දියුණුව සඳහා අවශ්‍ය සහය ලබා දීම සහතික කිරීම පිණිස උපදේශන සහ මනෝවිද්‍යාත්මක සහය ඒකකයෙ හි පළමු අධ්‍යක්ෂවරිය ලෙස වෛද්‍ය සයුරි පෙරේරා මහත්මිය පත් කර ඇත. අපගේ ජන ප්‍රජාව සඳහා ආරක්ෂිත සහ අනුබලදායී පරිසරයක් නිර්මාණය කිරීම සහ ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් අප සතු කැපවීම, උපදේශන සහ මනෝවිද්‍යාත්මක සහය ඒකකය පිහිටුවීම තුළින් මනාව ඉස්මතු කර දක්වයි.

**විශ්වවිද්‍යාල මුද්‍රණාලය පිහිටුවීම**

2022 දී පේරාදෙණිය විශ්වවිද්‍යාල මුද්‍රණාලය පිහිටුවීමත් සමග විශ්වවිද්‍යාලය සුවිශේෂී සන්ධිස්ථානයක් වෙත පා තැබී ය. 2022 ජූලි මස 30 වන දින, විශ්වවිද්‍යාල පාලක සභාව එහි 518 වැනි රැස්වීමේ දී මෙය අනුමත කරන ලද අතර, නියෝජ්‍ය උපකුලපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් විසින් මෙම මුද්‍රණාලය අධීක්ෂණය කරනු ලැබේ. විශ්වවිද්‍යාලය විසින් කළමනාකරණ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සාමාජිකයින් ලෙස පුස්තකාලයාධිපති ආර්. මහේෂ්වරන් මහතා සහ ශාස්ත්‍ර පීඨයේ මහාචාර්ය ඩබ්ලිව්.ඒ ලියනගේ මහතා පත් කර ගැනිණි. විශ්වවිද්‍යාල මුද්‍රණාලය පිහිටුවීමත් සමඟ විද්වතුන්ට ඔවුන්ගේ අධ්‍යයන පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම සහ පුළුල් ප්‍රේක්ෂක පිරිසක් සමඟ දැනුම බෙදා ගැනීමට වේදිකාවක් සැපයීම විශ්වවිද්‍යාලයේ අරමුණ වන්නේ ය.

**පේරාදෙණිය විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රදාන පිරිනැමීමේ කාර්යාලය පිහිටුවීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රදාන පිරිනැමීමේ කාර්යාලය, විශ්වවිද්‍යාල පර්යේෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂවරයා යටතේ 2022 වසරේ දී පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රදාන පිරිනැමීමේ කාර්යාලයෙහි අරමුණ වනුයේ, ප්‍රදාන ප්‍රවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය ශක්තිමත් කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ කවුන්සිලයෙහි පර්යේෂණ සමුච්චය සමග එම කාර්යය ඒකාබද්ධ කිරීමයි. ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා, විශ්වවිද්‍යාලය විසින් උපාය මාර්ග සහ හවුල්කාරිත්වය සඳහා අර්ධ කාලීන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ද, විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රදාන පිරිනැමීමේ කාර්යාලීය මෙහෙයුම් සඳහා අර්ධ කාලීන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ද පත් කර ඇත. විශ්වවිද්‍යාල පර්යේෂණ හා ප්‍රදාන පිරිනැමීමේ කාර්යාලය පිහිටුවීම මඟින් පර්යේෂකයන්ට පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීම සඳහාත්, වඩාත් සාරවත් විශ්වවිද්‍යාලීය පර්යේෂණ පරිසරයක් උදෙසා පහසුකම් සලසා දීම සඳහාත්, වැඩි අවස්ථා නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

**ප්‍රධාන පුස්තකාලයේ "ඉන්දියානු අංශය" නමින් අංශයක් පිහිටුවීම**

2022 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල කවුන්සිලයේ අනුමැතිය ඇති ව ප්‍රධාන පුස්තකාලය තුළ "ඉන්දියානු අංශය" නමින් අංශයක් ස්ථාපිත කරන ලදී. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇති ව බිහි වූ මෙම මූලාරම්භය, සිසුන් සහ කාර්ය මණ්ඩලය විවිධ සංස්කෘතීන් වෙත නිරාවරණය කිරීමේ කාර්යය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි. ඉන්දියාවේ සහකාර මහ කොමසාරිස් කාර්යාලයෙන් පොත් සහ සඟරා පරිත්‍යාග කිරීමෙන් අනතුරු ව ප්‍රධාන පුස්තකාලය තුළ ඉන්දියානු අංශය පිහිටුවන ලදී. මෙම අංශය පිහිටුවීම තුළින් විශ්වවිද්‍යාල ප්‍රජාවට ඉන්දියාවේ සංස්කෘතිය හා ඉතිහාසය පිළිබඳව ඉගෙන ගැනීමට වැඩි අවස්ථාවන් සලසා දීමට අපේක්ෂා කරන අතර එමඟින් ඔවුන්ගේ අධ්‍යාපනික අත්දැකීම් තව දුරටත් පෝෂිත වනු ඇත.

**ආදි විද්‍යාර්ථීන්ගේ සම්බන්ධතා කාර්යාලය පිහිටුවීම**

ආදි විද්‍යාර්ථීන්ගේ සම්බන්ධතා කාර්යාලය පිහිටුවන ලද්දේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ එහි ආදි ශිෂ්‍යයන් අතර සමීප සබඳතා සහ සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා ය. ආදි විද්‍යාර්ථීන්ට විශ්වවිද්‍යාලය, එහි පීඨ, කාර්ය මණ්ඩලය සහ සිසුන් සමඟ සම්බන්ධ වී වැඩ කටයුතු කිරීමට සම්බන්ධතා මධ්‍යස්ථානයක් ලෙස ආදි විද්‍යාර්ථීන්ගේ සම්බන්ධතා කාර්යාලය සේවය කරයි. පේරාදෙණිය විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථීන්ගේ සම්බන්ධතා කාර්යාලයෙහි මූලික අරමුණ වන්නේ, විශ්වවිද්‍යාලයට සහ එහි ආදි සිසුන්ට ප්‍රතිලාභ ලබා දෙන අධ්‍යාපනික, පර්යේෂණ, ප්‍රජා සේවා සහ සමාජ මුලපිරීම් ප්‍රවර්ධනය කිරීමයි. විශ්වවිද්‍යාලය සහ එහි ආදි විද්‍යාර්ථී සංගම්, ශාඛා සංගම්, කණ්ඩායම් සහ පුද්ගලයන් අතර අර්ථවත් සම්බන්ධතා ඇති කර ගැනීමට සහ පවත්වාගෙන යාමට මෙම කාර්යාලය උත්සුක වෙයි.

**කළමනාකරණ පීඨයේ උසස් අධ්‍යාපනයේ ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ "AHEAD" ගොඩනැගිල්ල විවෘත කිරීම**

උසස් අධ්‍යාපනයේ ව්‍යාප්තිය හා සංවර්ධනය කඩිනම් කිරීමේ "AHEAD" පීඨ සංවර්ධන ප්‍රදාන මඟින් අරමුදල් සපයන "AHEAD" ගොඩනැගිල්ල 2022 දෙසැම්බර් මස 2 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපතිවරයා විසින් විවෘත කරන ලදී. කළමනාකරණ පීඨයේ පිහිටා ඇති මෙම ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාවක්, සුහුරු පන්ති කාමරයක්, දේශන ශාලා දෙකක්, විභාග ශාලාවක් සහ ජීවන කුසලතා මධ්‍යස්ථානය සහ ව්‍යාපාර බීජෞෂණ හා නවෝත්පාදන පරිසර පද්ධති සේවා ඒකකය යන මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වේ. "AHEAD" ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් පෙළගැස්මෙහි සැලකිය යුතු එකතු කිරීමක් වන අතර එය කළමනාකරණ පීඨයේ වර්ධනයට පහසුකමක් වනු ඇත.

**අලුතින් නිම කරන ලද ගොවිපළ සත්ත්ව පශු වෛද්‍ය ශික්ෂණ රෝහල විවෘත කිරීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් 2022 නොවැම්බර් මස 30 වන දින අලුතින් නිම කරන ලද ගොවිපළ සත්ත්ව පශු වෛද්‍ය ශික්ෂණ රෝහල විවෘත කරන ලදී. ගොවිපළ සතුන්ට සහ අශ්වයන්ට ප්‍රතිකාර කිරීම සඳහා කැප වූ මෙම අති නවීනතම පහසුකම, පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා පීඨයට සැලකිය යුතු එකතු කිරීමකි. රට තුළ ඇති මෙබඳු ආකාරයේ එක ම ජාතික රෝහල ලෙස, ගොවිපළ සත්ත්ව පශු වෛද්‍ය ශික්ෂණ රෝහල සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් සහ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙනු ඇත.

**මුඛ පිළිකා පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ රසායනාගාරය විවෘත කිරීම**

දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ පර්යේෂණ රසායනාගාරය 2022 අගෝස්තු මස 3 වන දින විවෘත කරන ලදී. මෙම රසායනාගාරය, මුඛ පිළිකාවේ විවිධ පැතිකඩවල සහයෝගිත්ව පර්යේෂණ පිණිස හැකියාව සලසා දෙනු ඇති අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවවලට ද එය විවෘත වේ.

### 1.4.3 ලෝක ශ්‍රේණිගත කිරීම්

එක්සත් ජනපද ප්‍රවෘත්ති සහ ලෝක වාර්තා කිරීම අනුව, 2022 වර්ෂයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලය හොඳ ම ගෝලීය විශ්වවිද්‍යාල අතරින් 901 වන ස්ථානයට තබා ඇති අතර ආසියාවේ හොඳ ම විශ්වවිද්‍යාල 240 තුළ ද ස්ථානගත කර ඇත. එමෙන් ම එය, ගෝලීය වශයෙන් වන සාමාන්‍ය උපුටා දැක්වීම තුළ සිදු කරන බලපෑම විෂයයෙහි අංක 01 ස්ථානය සහ 1%ක් වූ ලොව පුරා වැඩිපුරම උපුටා දක්වන විශ්වවිද්‍යාල අතර අදාළ ඉහළින් ම උපුටා දැක්වීමේ පත්‍රිකා විෂයයෙහි 55 වන ස්ථානය ද ලබා ඇත.

"Webometrics" ශ්‍රේණිගත කිරීම අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ දෙවන ස්ථානයට සහ ලෝකයේ 1867 වන ස්ථානයට පත් ව ඇත. තව ද, "ග්‍රීන් මෙට්‍රික්" ශ්‍රේණිගත කිරීම අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාතික වශයෙන් 3වන ස්ථානයටත්, ගෝලීය වශයෙන් 296වන ස්ථානයටත් ශ්‍රේණිගත කර ඇත.

"ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම ශ්‍රේණිගත කිරීම" අනුව, (බලපෑම් ශ්‍රේණිගත කිරීම) සහ ලෝක ශ්‍රේණිගත කිරීම අනුව  අප ව ලෝක විශ්වවිද්‍යාල වලින් ඉහළ ම 5% අතරට සහ ශ්‍රී ලංකාවේ ඉහළ ම ස්ථානයට පත් කර තිබේ.

2021/22 කාලය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිළිබඳ ශ්‍රේණිගත කිරීමේ සාරාංශය පහත පරිදි වේ.

| ශ්‍රේණිගත කිරීම | ශ්‍රී ලංකාව | ලෝකය |
|---|---|---|
| ටයිම්ස් උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම | 1 | 301-400 |
| ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම | 1 | 401-500 |
| එක්සත් ජනපද පුවත් සහ ලෝක වාර්තාව<br>(ගෝලීය වශයෙන් සාමාන්‍ය උපුටා දැක්වීමේ බලපෑම් අංශයේ අංක 1) | 1 | 901 |

**ශ්‍රේණිගත කිරීම ශක්තිමත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට කැප වී සිටී. ඒ අනුව, පසුගිය කාලය තුළ දී පියවර රැසක් ගෙන ඇත. එහිලා විශ්වවිද්‍යාලය විසින් ගෙන ඇති පියවර කිහිපයක් පහත සඳහන් වේ.

- **පර්යේෂණ සිදු කිරීමට පර්යේෂකයන් දිරිමත් කිරීම සහ පර්යේෂණ සංස්කෘතිය**
  මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා පහත පියවර ගෙන ඇත.

  - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ 2018/05 අනුව, 4 වන පෙළ සඳහා සුදුසුකම් ඇති පර්යේෂකයන් හඳුනා ගැනීම
  - වාර්ෂික පර්යේෂණ සම්මාන ලබා ගැනීමට අධ්‍යයන පීඨ දිරිමත් කිරීම
  - ඉහළ බලපෑමක් ඇති සඟරාවල පළ කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම
  - විවිධ ක්ෂේත්‍රමය ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම
  - බාහිර අරමුදල් මූලාශ්‍ර ලබා ගැනීම
  - පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළු සහ දැනුවත් කිරීමේ සැසි වාර පැවැත්වීම

- **විශ්වවිද්‍යාල වෙබ් අඩවිය පුනර්ජීවනය කිරීම**

  වසර හතකට වැඩි කාලයකට පෙර සංවර්ධනය කරන ලද වෙබ් අඩවිය නවත ම වෙබ් අඩවි සමඟ සමපාත නොවී ය. එම නිසා, 2021 වර්ෂයේ දී වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය විය. ප්‍රතිව්‍යුහගත කරන ලද වෙබ් අඩවිය මීට මාස තුනකට පමණ පෙර එළිදක්වන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ වෙබ් අඩවිය නිරන්තරයෙන් දෘශ්‍යතාව වැඩි දියුණු කරන අතර ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීමට ද එය උපකාරී වේ. තව ද, "ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම" තුළ සහ "ග්‍රීන් මෙට්‍රික්" ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම සඳහා හොඳින් සංවිධානය වූ සහ යාවත්කාලීන කරන ලද වෙබ් අඩවියක් තිබීම වැදගත් වේ. තව ද, සියලුම ආයතනවල වෙබ් අඩවි සුසංයෝජනය කිරීමට පමණක් පියවර ගෙන ඇත.

- **ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම**

  ශ්‍රේණිගත කිරීම් අංශ හතරක් සඳහා මාස කීපයකට පෙර පහත සඳහන් විද්වතුන් පත් කරන ලදී.
  - ටයිම්ස් උසස් අධ්‍යාපන ශ්‍රේණිගත කිරීම - ආචාර්ය චානක රබෙල් මහතා
  - "කිව් එස්" ලෝක ශ්‍රේණිගත කිරීම - මහාචාර්ය වෙනුර හේරත් මහතා
  - "ග්‍රීන් මෙට්‍රික්" ශ්‍රේණිගත කිරීම - අධ්‍යක්ෂ, පාරිසරික තිරසාරත්වය සඳහා මධ්‍යස්ථානය
  - "වෙබො මෙට්‍රික්ස්" ශ්‍රේණිගත කිරීම - මහාචාර්ය රොෂාන් රගෙල් මහතා

- ගුගල් විද්වත් තොරතුරු කළඹක් පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන ලද අතර ගුගල් විද්වත් තොරතුරු කළඹක් විවෘත කිරීමේ කර්තව්‍යය ප්‍රවර්ධනය කෙරුණි. එසේ ප්‍රොෆයිල් පිටු පවත්වාගෙන නොයන විද්වතුන් කොපමණ සිටිදැයි සොයා බැලීමට සමීක්ෂණයක් ද පවත්වන ලදී.

- අධ්‍යයන කටයුතු සහ වෙනත් ඊට අදාළ අරමුණු සඳහා වෙබ් පිටු විවෘත කරන ලෙස ශිෂ්‍ය සංගම්වලට උපදෙස් දී ඇත. බාහිර පාර්ශව සමග සහයෝගීතාවයෙන් වැඩි උපස්ත සබැඳි ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල වෙබ් වසම තුළ ඔවුන්ගේ වෙබ් අඩවිය ප්‍රවර්ධනය කිරීම අරබයා අදාළ සමාජ සහ සංගම් දිරිමත් කිරීමට තීරණය කර ඇත.

- බ්ලොග් අඩවි නිර්මාණය කිරීම. ජනප්‍රිය සහ වැදගත් මාතෘකා ඔස්සේ බ්ලොග් සටහන් නිර්මාණය කර පවත්වාගෙන යන ලෙස සිසුන්ට දැනුම් දී ඇත.

- රට තුළ සහ ඉන් පිටත වෙසෙන විශ්වවිද්‍යාල ආදි සිසුන් සමඟ සමීප සම්බන්ධයක් ඇති කර ගැනීම

- දෙපාර්තමේන්තු, මධ්‍යස්ථාන සහ ඒකක සඳහා විකි පිටු නිර්මාණය කිරීම. ඩිජිටල් ගබඩාවලට තම ප්‍රකාශන පළකිරීම් ඇතුළත් කිරීමට පර්යේෂකයන් පෙළඹවීම.

- පහසු පරිශීලනය සඳහා සම්මන්ත්‍රණ කාර්යකරන ක්‍රියාදාමයන් විශ්වවිද්‍යාල වෙබ් අඩවියට උඩුගත කිරීම

- පශ්චාත් උපාධි ආයතන විශ්වවිද්‍යාල වෙබ් වසම තුළට ගැනීම

- ජාත්‍යන්තර ගෙවීම් ලබා ගැනීම සඳහා ගෙවීම් ද්වාර පද්ධතියක් නිර්මාණය කිරීම

- තිරසරභාවය පිළිබඳව කමිටුවක් පත් කිරීම.

### 1.4.4 සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සව

**සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය - 2019**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 82 වැනි සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය 2022 පෙබරවාරි මස 22, 23 සහ 24 යන තෙදින තුළ විශ්වවිද්‍යාල ක්‍රීඩාගාරයේ දී සැසි වාර දෙකකින් පැවැත්විණි. මෙම වසරේ දී පීඨ නවයකට සහ පශ්චාත් උපාධි ආයතන තුනකට අයත් උපාධිලාභීන් 3783 දෙනෙක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා අතින් සිය උපාධි (ප්‍රථම උපාධි 2682ක් සහ පශ්චාත් උපාධි 1101ක්) ලබා ගත් හ.

**සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය - 2020**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 83 වැනි සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය 2022 අගෝස්තු මස 30 සහ 31 යන දිනවල පැවැත්විණි. මෙම වසරේ දී පීඨ නවයකට සහ පශ්චාත් උපාධි ආයතන තුනකට අයත් උපාධිධාරීන් 3130 දෙනෙක් සිය උපාධි (පශ්චාත් උපාධි 2505ක් සහ පශ්චාත් උපාධි 625ක්) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපති, මහාචාර්ය ජී.එච්. පීරිස් මහතා අතින් ලබා ගත් හ.

උපාධිලාභීන් අතර කෘෂි විද්‍යා, කලා, සම සෞඛ්‍ය විද්‍යා, දන්ත වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ, වෛද්‍ය, විද්‍යා, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා උපාධිලාභීන් ද, විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, කෘෂි විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් ප්‍රදානය කළ පශ්චාත් උපාධි ලද උපාධිලාභීන් ද වශයෙන් ආචාර්ය උපාධි 26ක් සහ ශාස්ත්‍රපති උපාධි 597 ක් ලබාගත් උපාධිලාභීන් විය. කොවිඩ් 19 වසංගත තත්වයට අදාළ සීමා කිරීම් හේතුවෙන්, උපාධි ප්‍රදානෝත්සවය සැසි වාර හයකින් යුතු ව දින දෙකක් පුරා පැවැත්විණි.

**බාහිර උපාධිලාභීන් සඳහා උපාධි ප්‍රදානෝත්සවය - 2020**

2020 බාහිර උපාධිධාරීන් සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය, 2022 දෙසැම්බර් මස 12 වන දින, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ, මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, එහි බාහිර උපාධිධාරීන් සඳහා සංවිධානය කරන ලද එකොළොස්වන උපාධි ප්‍රදානෝත්සවය මෙය විය. මෙම වසරේ උපාධිධාරීන් 505 දෙනෙකු සහ 69 දෙනෙකු සඳහා පිළිවෙලින් ශාස්ත්‍රවේදී උපාධිය සහ ව්‍යාපාර පරිපාලන උපාධිය පිරිනමන ලදී.

### 1.4.5 ජයග්‍රහණ

**ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ රන් සම්මානය පේරාදෙණිය විශ්වවිද්‍යාලය දෙවන වරට හිමි කර ගනී.**

විශ්වවිද්‍යාල කාණ්ඩයේ හොඳ ම වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2020 සඳහා වන රන් සම්මානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හිමි විය. 2022 දෙසැම්බර් මස 2 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

ශාලාවෙහි පවත්වන ලද වාර්ෂික සමුළුව සහ හොඳ ම වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානෝත්සවය - 2022 උත්සවයේ දී වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ රාජ්‍ය මූල්‍ය අංශය විසින් එම රන් සම්මානය විශ්වවිද්‍යාලය වෙත ප්‍රදානය කෙරිණි.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් නව දෙනෙක් ලෝක විද්‍යාඥයින් අතරින් ඉහළ ම 2% අතරට ඇතුළත් වෙති.**

ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ 2022 සැප්තැම්බර් සංස්කරණයට අනුව එහි ශ්‍රේණිගත කිරීම මත පදනම් වූ ලෝක විද්‍යාඥයින්ගෙන් ඉහළ ම 2% අතරට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් නව දෙනෙක් ඇතුළත් වී ඇත. ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ එල්සීවියර් බීවී ප්‍රකාශන සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද උප ක්ෂේත්‍රයේ සී - ලකුණු හෝ 2% හෝ ඊට වැඩි ප්‍රතිශත ශ්‍රේණියක් අනුව ඉහළ ම විද්‍යාඥයින් 100,000 දෙනා හඳුන්වා දුන් 2022 සැප්තැම්බර් සංස්කරණය දැන් නිකුත් වී ඇත. නව දත්ත පදනමට අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තවත් විද්‍යාඥයින් කීප දෙනෙකු, ඉහළ ම විද්‍යාඥයින් හා සම්බන්ධ 100,000 නිර්ණායක යටතේ සී - ලකුණුවල (ස්වයං-උපුටාගැනීම් සහිත ව සහ රහිත ව) හෝ උප ක්ෂේත්‍රයේ 2% හෝ ඊට වැඩි ප්‍රතිශත ශ්‍රේණියක් මඟින් ග්‍රහණය කරගනු ලබන්නේ ය.

**විශිෂ්ටත ම පර්යේෂකයන් - මහාචාර්ය කලණ මාදුවගේ මහතා**

වෛද්‍ය පීඨයේ ජෛව රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වන මහාචාර්ය කලණ මාදුවගේ මහතා සායනික හා පර්යේෂණාත්මක විෂ විද්‍යාව පිළිබඳව, විශේෂයෙන්, සර්ප විෂ ශරීර ගතවීම පිළිබඳ සායනික, ව්‍යාධි භෞතික විද්‍යාත්මක සහ ප්‍රතිකාර අංශ පිළිබඳ ව, ක්‍රියාකාරී පර්යේෂකයෙකි. ඔහුගේ නමින් විද්‍යාත්මක උපුටා දැක්වීම් දර්ශක සඟරාවල ප්‍රකාශන 56 ක් ඇති අතර විද්‍යාත්මක ප්‍රකාශන පළකිරීම් සඳහා ජනාධිපති සම්මාන 10ක් ඇතුලුව පර්යේෂණ සඳහා වන ජාත්‍යන්තර සම්මාන 6ක් සහ ජාතික සම්මාන 21ක් ඔහු දිනාගෙන ඇත. ඔහුගේ පර්යේෂණ දායකත්වය වෙනුවෙන්, 2016 වසරේ දී වෛද්‍ය, දන්ත, සම සෞඛ්‍ය විද්‍යා සහ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශිෂ්ටත ම තරුණ පර්යේෂකයා සඳහා වූ උපකුලපතිවරයන්ගේ සහ අධ්‍යක්ෂවරයන්ගේ විශිෂ්ටතා සම්මානයෙන් ඒ (CVCD) මහතාට ගෞරව කරන ලදී.

**කථන තරගය - ප්‍රථම සහ තෙවන ස්ථානය**

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද වෛද්‍ය සිසුන් සඳහා වූ කථන තරගයක් 2021 ඔක්තෝම්බර් මාසයේ දී පැවැත්විණි. සියලුම පීඨ නියෝජනය කරමින් පැමිණි තරගකරුවන් අතරින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පවිත අබේකෝන් මහතා සහ ඒ.එම්.ඒ.පී අලහකෝන් මෙනවිය පිළිවෙලින් පළමු සහ තෙවන ස්ථාන දිනා ගැනීමට සමත් විය.

**ඉංජිනේරු පීඨයේ කණ්ඩායමක් "Imagin Cup" කුසලාන 2022 ලෝක අවසන් මහා තරගයේ හොඳ ම කණ්ඩායම් 48 අතරට පැමිණේ.**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විස්තෘත අධීක්ෂිත ඉගෙනුම් සිද්ධිදාම කණ්ඩායම 2022 මාර්තු මාසයේ දී "Imagin Cup" කුසලාන 2022 ලෝක අවසන් මහා තරගයට සහභාගි වීම සඳහා තෝරා ගන්නා ලදී. ඔවුන් තෝරා ගැනුනේ හොඳ ම කණ්ඩායම් 48ක් අතුරිනි.

**පරිගණක ඉංජිනේරු උපාධිධාරීන් හොඳ ම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රිදී පදක්කම ලබා ගනී.**

ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනය විසින් සංවිධානය කරන ලද 2021 වසරේ විශිෂ්ටත ම පර්යේෂණ සම්මාන උළෙලේ දී, විවෘත කාණ්ඩය යටතේ ගැනෙන ජාතික සම්මානයේ අනුශූරතාව, පරිගණක ඉංජිනේරු අංශයට (E/14) අයත් මෑතකාලීන උපාධිධාරීන් වන සඳලි ලොකුගේ මෙනවිය, ශ්‍යාමන් ජයසුන්දර මහතා සහ පුවසුරු ඉහළගෙදර මහතා වෙත තිළිණ කෙරිණි. එකී ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 මාර්තු මස 27වන ඉරිදා දින ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගම් සංවිධානයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

**පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ හා සම්බන්ධ 2 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ හොඳ ම පත්‍රිකා ද්විත්වයට හිමි සම්මාන - 2022**

පරිගණක ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන පළකිරීම් දෙකක්, 2022 පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ හා සම්බන්ධ 2 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ හොඳ ම පත්‍රිකාව සඳහා වන සම්මාන දිනා ගෙන

ඇත. පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ හා සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, 2022 වසරේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද අතර ඊට තාක්ෂණික වශයෙන් සම අනුග්‍රහය දක්වන ලද්දේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ආයතනය විසිනි.

**ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා පැසිපන්දු කණ්ඩායම ශූරියන් බවට පත් විය.**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා පැසිපන්දු කණ්ඩායම පසුගියදා පැවති 2022 ජ්‍යෙෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලිය ජයග්‍රහණය කර 2 වන මට්ටමේ කාණ්ඩයේ ශූරියන් බවට පත් විය. මෙම තරගාවලිය, 2022 ජනවාරි මස 28 සිට 30 වන දින දක්වා මඩකලපුව මියානි පැසිපන්දු විද්‍යායතන සංකීර්ණයේ දී පැවැත්විණි.

### 1.4.6 තත්ත්ව සහතිකය

පවතින අභ්‍යන්තර සමාලෝචන අත්පොත මත සම්පාදනය කරන ලද මූලික ස්වයං ඇගයීම් වාර්තාව අනුව අභ්‍යන්තර ආයතනික සමාලෝචනයක් පවත්වන ලද අතර එය, 2022 මාර්තු 14 සිට මාර්තු 24 වන දින දක්වා පැවැත්විණි. මෙම අත්දැකීම් සහ සමාලෝචන වාර්තාව මත පදනම් ව, විශ්වවිද්‍යාලය සිය සැලසුම් ප්‍රතිශෝධනය කර ඊට සම්බන්ධ වූ සියලුම පුද්ගලයන් සඳහා නිශ්චිත අනුදිෂ්ට නිර්ණායක සහිත ව, අදාළ ස්වයං ඇගයීම් වාර්තා ලේඛන කමිටු නැවත පිහිටුවා ඇත. අභ්‍යන්තර සමාලෝචනය (2022) සඳහා සූදානම් වනු පිණිස තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් පශ්චාත් අභ්‍යන්තර ආයතනික සමාලෝචන පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීම් 05ක් සංවිධානය කරන ලදී. අභ්‍යන්තර ආයතනික සමාලෝචන වාර්තාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි ප්‍රතිශෝධිත නව අභ්‍යන්තර සමාලෝචන අත්පොතෙහි නිර්දේශ කර ඇති හොඳ ම පරිචයන් මත පදනම් ව, විශ්වවිද්‍යාලය අපේක්ෂිත ප්‍රමිතීන් සපුරාලීම සඳහා නව ක්‍රියාකාරකම් ගණනාවක් ආරම්භ කර ඇත.

**උපාධි අපේක්ෂක වැඩසටහන් සමාලෝචන පවත්වන ලදී.**

2022 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් පහත දැක්වෙන වැඩසටහන් සමාලෝචන පවත්වන ලදී.

| උපාධි වැඩසටහන | විශ්වවිද්‍යාලය වෙත පැමිණි දිනය |
|---|---|
| විද්‍යාවේදී සාමාන්‍ය උපාධි වැඩසටහන - විද්‍යාවේදී (සාමාන්‍ය) | සැප්තැම්බර් මස 09 වන දින |
| ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන - විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යා) | සැප්තැම්බර් මස 12 වන දින |
| සංඛ්‍යාලේඛන සහ මෙහෙයුම් පර්යේෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන - විද්‍යාවේදී (සංඛ්‍යාලේඛන සහ මෙහෙයුම් පර්යේෂණ) | දෙසැම්බර් මස 22 වන දින |
| ශාස්ත්‍රවේදී (බී.ඒ.) බාහිර උපාධි වැඩසටහන | දෙසැම්බර් මස 28 සහ 29 යන දින |

**පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන**

- සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය පිළිබඳ සාක්ෂි සපයන දැනට පවත්නා පශ්චාත් උපාධි වැඩසටහන් ලැයිස්තුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අනුමැතිය සඳහා අදාළ සාක්ෂි ද සමඟ 2022.08.15 වන දින තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.

- පශ්චාත් උපාධි ආයතන තුන (එනම්, කෘෂි විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සහ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය) පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ස්වයං ඇගයීම් වාර්තා 03ක් සකස් කිරීම සිදු වෙමින් පවතින අතර, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය ඒ සඳහා පහසුකම් සපයා දෙමින් අදාළ කටයුතු සම්බන්ධීකරණය කරයි.

**වර්ෂය තුළ අනුමත කරන ලද ප්‍රතිපත්ති/ මාර්ගෝපදේශ**

| ප්‍රතිපත්ති/ මාර්ගෝපදේශ | පාලක සභාව අනුමත කළ දිනය |
|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ පොදු උපාධි පැතිකඩ | 2022.06.25 වන දින පැවැති 517 වන රැස්වීම |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය විෂයයෙහි කාර්ය සාධන ඇගයීම් ආකෘති පත්‍රය සහ මාර්ගෝපදේශ සහිත කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය සඳහා වූ සංකල්පීය වැඩ රාමුවක් | 2022.11.27 වන දින පැවැති 522 වන රැස්වීම |
| උපාධි අපේක්ෂක විභාග ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 2022.06.25 වන දින පැවැති 517 වන රැස්වීම |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයට දරාගත හැකි සීමාවේ ශාස්ත්‍රීය නිබන්ධන/ නිබන්ධන/ වැඩ පැවරුම් සහ පර්යේෂණ වාර්තාවල සමානත්වයේ පර්යන්ත මට්ටමක් | 2022.08.24 වන දින පැවැති 520 වන රැස්වීම |
| මාර්ගගත ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.01.29 වන දින පැවැති 512 වන රැස්වීම |
| පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.07.30 වන දින පැවැති 518 වන රැස්වීම |
| ණය හුවමාරුව පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.08.27 වන දින පැවැති 519 වන රැස්වීම |
| සුදුසුකම් ඇගයීම සහ ප්‍රදානය පිළිබඳ සංශෝධිත ප්‍රතිපත්තිය | 2022.11.27 වන දින පැවැති 522 වන රැස්වීම |
| මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.12.30 වන දින පැවැති 523 වැනි රැස්වීම |
| දූරස්ථ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.12.30 වන දින පැවැති 523 වැනි රැස්වීම |
| මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තිය | 2022.12.30 වන දින පැවැති 523 වැනි රැස්වීම |
| විෂයමාලා සංවර්ධනය / සංශෝධනය කිරීම සහ ඊට අනුමැතිය ලබා ගැනීම පිළිබඳ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටිය | 2022.01.29 වන දින පැවැති 512 වන රැස්වීම |
| සබැඳියා පිළිබඳ ගැටුම් ප්‍රකාශ කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටිය | 2022.01.29 වන දින පැවැති 512 වන රැස්වීම |
| විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටිය | 2022.11.27 වන දින පැවැති 522 වන රැස්වීම |

**තත්ත්ව සහතිකායන කණ්ඩායම් පිහිටුවීම**

මූල්‍ය පරිපාලනය සඳහා වෙන ම තත්ත්ව සහතික කණ්ඩායමක් 2022 නොවැම්බර් මාසයේ දී පිහිටුවන ලදී.

**විද්‍යා පීඨයේ වැඩසටහන් සමාලෝචනය**

- ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (විද්‍යාවේදී ව්‍යවහාරික විද්‍යා) උපාධි වැඩසටහන් සඳහා "ඒ " ශ්‍රේණියක් ලැබී ඇත.
- විද්‍යාවේදී සාමාන්‍ය (විද්‍යාවේදී) උපාධි වැඩසටහන සඳහා "බී" ශ්‍රේණියක් ලැබී ඇත.

### 1.4.7 විෂයමාලා සහ වැඩසටහන් සංවර්ධනය

ඒ ඒ ක්ෂේත්‍රයට අදාළ උපාධිධාරීන් බිහි කිරීම සඳහා විෂයමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයට ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇත. ජාතික මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබ, ප්‍රතිඵල පාදක අධ්‍යාපනය හඳාරන්නන් කේන්ද්‍ර කරගත් ඉගැන්වීම් මූලධර්ම දිරිමත් කර බොහෝ වැඩසටහන් සඳහා යොදා ගැනේ. ඒ සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සහ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත. මීට අමතර ව, ප්‍රේරක පුහුණුව හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වැඩසටහන් අතරතුර න්‍යායාත්මක අවබෝධය සහ කුසලතා නිපුණතාවය සලසා දෙනු ලැබේ. ඉල්ලුමක් සහිත උපාධිධාරීන්ගේ නිර්මාණාත්මක පෙළගැස්ම සහ උත්පාදනය සහතික කිරීම සඳහා දේශීය/ජාත්‍යන්තර විශේෂඥයින් ලවා අදාළ ආයතනවල දී විෂයමාලා සැදීමෙහි/ සංශෝධනය කිරීමෙහි සක්‍රීය ව සම්බන්ධවූවන් පුහුණු කර ඔවුනට අවැසි මග පෙන්වීම් කර ඇත.

සමාලෝචිත කාල සීමාව තුළ සිදු කරන ලද විෂය නිර්දේශ / විෂයමාලා සංශෝධන පහත දැක්වේ.

| පීඨය/ පශ්චාත් උපාධි ආයතනය | වැඩසටහන | සනාතන සභාව නිර්දේශ කළ දිනය | කවුන්සිලය අනුමත කළ දිනය |
|---|---|---|---|
| ශාස්ත්‍රීය කටයුතු අංශය | සංකල්ප සටහනේ අරමුණ වූයේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "විෂයමාලා පිළිබඳ මධ්‍ය කණ්ඩායම" පිහිටුවීම මඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සංවර්ධන හා සැලසුම්කරණය ශක්තිමත් කිරීමයි. | 476 - 19.10.2022 | 521 - 29.10.2022 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | විකිරණ චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධ ප්‍රතිශෝධිත විෂය මාලාව. | 474 - 24.08.2022 | 519 - 27.08.2022 |
| කලා පීඨය | සංශෝධිත විෂය මාලාව - බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| | භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුවේ, භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව (භූගෝල විද්‍යා ශාස්ත්‍රවේදී ගෞරව) උපාධි වැඩසටහන සහ භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (භූගෝලීය තොරතුරු විද්‍යා විද්‍යාවේදී ගෞරව) උපාධි වැඩසටහන සම්බන්ධයෙන් දැනට පවත්නා විෂයමාලා සඳහා සුළු සංශෝධන කීපයක් හඳුන්වා දීම. | 478 - 14.12.2022 | 523 - 30.12.2022 |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා යෝජනාව<br>3 අයිතමය යටතේ පහත සංශෝධනවලට යටත් ව තහවුරු කර ඇත. එස් - 133 පිටුවල වැඩසටහන් ඉගෙනුම් වල ප්‍රතිඵල සඳහන් වේ.<br>"උපාධිධාරියා" වෙනුවට "ඩිප්ලෝමාධාරියා" ආදේශ කිරීම සඳහා.<br>(ii), (iii), (iv) සහ (vi) යන විෂයාංක වලින් රසායනාගාර තාක්ෂණය පිළිබඳ නිශ්චිත අරමුණු සපයා දීම සඳහා. | 474 - 24.08.2022 | 519 - 27.08.2022 |
| | පරිගණක හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සඳහා යෝජනාව. | 474 - 24.08.2022 | 519 - 7.08.2022 |
| | උපාධි අපේක්ෂක (බාහිර) උපාධි වැඩසටහනේ පාඨමාලා අන්තර්ගතය සංවර්ධනය කිරීම සඳහා නීර්ණේය නිර්දිෂ්ට. | 474 - 24.08.2022 | 519 - 27.08.2022 |
| | දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා විද්‍යාවේදී උපාධිය පිළිබඳ යෝජනාව. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| ඉංජිනේරු පීඨය | ශ්‍රී ලංකා සුදුසුකම් කාර්යරාමු මාර්ගෝපදේශ මත පදනම් ව, පශ්චාත් උපාධි අවශ්‍යතා සපුරාලීම සඳහා නිෂ්පාදන හා කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා පාඨමාලා හඳුන්වා දීම. | 468 - 17.02.2022 | 515 - 30.04.2022 |
| | ඉංජිනේරු කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි වැඩසටහන සඳහා නව පාඨමාලා සනාතන සභා පත්‍රය එස් ටී /468/8<br>එම් ඊ 635 - ව්‍යාපෘති වල අවදානම, ආරක්ෂාව සහ ආපදා කළමනාකරණය.<br>එම් ඊ 636 - සංඛ්‍යානමය ක්‍රම සහ දත්ත විශ්ලේෂණය | 472 - 15.06.2022 | 519 - 27.08.2022 |
| | සාමාන්‍ය තේරීම් පාඨමාලා හඳුන්වා දීම - එම් ඊ 528: ඉංජිනේරු විද්‍යාව සඳහා චක්‍ර ආර්ථිකය. | | |
| | ඉංජිනේරු කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන සහ නිෂ්පාදන ඉංජිනේරු පශ්චාත් උපාධි වැඩසටහන සඳහා තාක්ෂණික තේරීම් දෙකක් හඳුන්වා දීම. | 475 - 21.09.2022 | 520 - 24.09.2022 |
| | යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නව තාක්ෂණික තේරීම් පාඨමාලා හඳුන්වා දීම. | 476 - 19.10.2022 | 521 - 29.10.2022 |
| කළමනාකරණ පීඨය | මෙහෙයුම් කළමනාකරණයේ අධ්‍යයන විශිෂ්ටත්වය සඳහා ආසියානු රන් පදක්කම දිනූ සික්ස් සිග්මා කළමනාකරණ ආයතනයේ ආචාර්ය මයිකල් ජේ. හැරී මහතාගේ සංශෝධිත යෝජනාව. | 465 - 17.11.2021 | 512 - 29.01.2022 |
| | සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධියක් හඳුන්වා දීමේ යෝජනාව. (සමාලෝචනය කරන්නාගේ අදහස් ඇතුළත් කිරීමෙන් පසුව ඉදිරිපත් කෙරේ.) | 466 - 15.12.2021 | 512 - 29.01.2022 |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ උපාධි වැඩසටහනේ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය සහ මූල්‍ය උපාධි වැඩසටහනේ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය සඳහා යෝජනා. | 474 - 24.08.022 | 519 - 27.08.2022 |
| වෛද්‍ය පීඨය | ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමාව වෛද්‍ය විද්‍යා පීඨයේ සිට පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයට මාරු කිරීමට අවසර ඉල්ලා සිටීම ( දැන් එම ඉල්ලීම අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.) | 465 - 17.11.2021 | 512 - 29.01.2022 |
| | පීඨාධිපති ලැයිස්තුව සහ පීඨ සම්මාන. | 466 - 15.12.2021 | 512 - 29.01.2022 |
| | 2019 වැඩසටහන් සමාලෝචනය - ක්‍රියාකාරී සැලැස්ම (2021 - 2025) - සනාතන සභා පත්‍රිකාව එස් ටී/468/7 | 468 - 17.02.2022 | 515 - 30.04.2022 |
| | අවසන් වෛද්‍ය විද්‍යා විභාගයේ සැත්කම් සඳහා නව ආකෘතිය. | 472 - 15.06.2022 | 519 - 27.08.2022 |
| | වෛද්‍ය විද්‍යා උපාධිය සහ ශල්‍යවේදී උපාධිය සඳහා යොමු කෙරෙන දෙවන, තෙවන සහ අවසාන විභාග සඳහා අදාළ වන යෝජිත සාමාන්‍ය රෙගුලාසි. | 478 - 14.12.2022 | 523 - 30.12.2022 |
| විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා වැඩසටහන 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත කිරීමේ අවශ්‍යතා සඳහා වන සංශෝධනය. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| | පාරිසරික විද්‍යා විෂය මාලාවේ පාඨමාලා දෙකක මාතෘකා නාමය සංශෝධනය කිරීම. | 475 - 21.09.2022 | 520 - 24.09.2022 |
| | නිවර්තන ජෛව විවිධත්වය සහ සංරක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව. | 475 - 21.09.2022 | 520 - 24.09.2022 |
| පශු වෛද්‍ය විද්‍යා පීඨය | පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය සමාලෝචන වැඩසටහන පිළිබඳ පසු විපරම් - මාර්තු 2020 සහ ක්‍රියාකාරී සැලැස්ම. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| | පශු වෛද්‍ය විද්‍යා ඖෂධවේදය අවසාන අධ්‍යයන වාරයේ ඇගයීම (එස් 6) සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටීම. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| | 6 වන අධ්‍යයන වාරයේ සිසුන් (2016/17 කණ්ඩායම) සඳහා මාර්ගගත පාඨමාලා ඇගයීම සිදු කිරීම සඳහා අනුමැතිය ඉල්ලීම. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |
| | ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ වැඩමුළු ප්‍රදාන ලියකියවිලි සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සඳහා අනුමැතිය ඉල්ලා සිටීම. | 476 - 19.10.2022 | 521 - 29.10.2022 |
| කෘෂි විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 1. පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා මාර්ගෝපදේශ සංශෝධනය කිරීම.<br>2. පශ්චාත් උපාධි වලට අදාළ පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා මාර්ගෝපදේශ. | 476 - 19.10.2022 | 521 - 29.10.2022 |
| | 1. කෘෂිකාර්මික ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද නව සහ සංශෝධිත පාඨමාලා.<br>2. බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද නව පාඨමාලා. | 476 - 19.10.2022 | 521 - 29.10.2022 |
| | කෘෂි විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙහි මුදල් ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම. | 477 - 16.11.2022 | 523 - 30.12.2022 |
| විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | පලතුරු සහ එළවළු පසු අස්වනු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධියේ උපාධි වැඩසටහන සඳහා සුළු සංශෝධන. | 467 - 19.01.2022 | 513 - 26.02.2022 |

### 1.4.8 දුරස්ථ ඉගෙනීම

සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල වැඩසටහන් වලට ප්‍රවේශ විය නොහැකි සිසුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා විවෘත සහ දූරස්ථ ඉගෙනුම් වැඩසටහන් ඉදිරිපත් කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව මෙම වැඩසටහන් සංවර්ධනය කර ඒවා ක්‍රියාවට නැංවීම සඳහා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය වගකීම දරයි. මෙම මධ්‍යස්ථානය, අධ්‍යයන ගුණාත්මකභාවය සහ අදාළ ප්‍රදානය කිරීම්වල ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ඊට සිසුන් බඳවා ගැනීම සීමා කරන අතර එහි වැඩසටහන්, අභ්‍යන්තර වැඩසටහන් වලට සමාන වූ අනුමත කිරීමේ ක්‍රියාදාමයට යටත් වේ. 2022 දී, කොරෝනා වසංගතය හේතුවෙන් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය අභියෝගවලට මුහුණ දුන් නමුත්, එහි ඉතිහාසයේ විශාලතම විභාග සංඛ්‍යාව පවත්වා අනෙකුත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් කිරීමට මධ්‍යස්ථානය සමත් විය. විද්‍යුත් පරිවර්තක සහ ඉලෙක්ට්‍රොනික උපකරණ පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහනක් පිරිනැමීම මඟින් ආර්ථික වශයෙන් දරිද්‍රතාවයෙන්

පෙළෙන තරුණයින්ට ආධාර කිරීම සඳහා ප්‍රජා සත්කාරක වැඩසටහනක් ද මධ්‍යස්ථානය විසින් දියත් කරන ලදී.

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන අධ්‍යයන සංවර්ධන කටයුතු**

- පුස්තකාල සහ තොරතුරු සේවා පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන.
- පරිගණක හා විද්‍යුතය පිළිබඳව වලපනේ ප්‍රදේශයේ දී පවත්වන ලද ප්‍රජා සත්කාරක ඩිප්ලෝමා වැඩසටහන.
- නව විද්‍යාවේදී උපාධි වැඩසටහනක් 2022 දී යෝජනා කරනු ලැබ, එම වැඩසටහන දැන් අවසාන අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.
- රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහනක් යෝජනා කරන ලදී.
- ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කරන ලදී.
- දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කර ඇත.

### 1.4.9 ප්‍රජා නියුක්තිය, උපදේශනය සහ ප්‍රවේශය

විශ්වවිද්‍යාලය සිය ප්‍රජා නියුක්තිය, උපදේශනය සහ ප්‍රවේශය මනාව ලේඛනගත කළ ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාපටිපාටි මඟින් මෙහෙයවා ඇති අතර විවිධ පීඨ, දෙපාර්තමේන්තු, මධ්‍යස්ථාන සහ ඒකක හරහා එය ක්‍රියාත්මක කර ඇත. විවිධ වූ විෂය සමගාමී ක්‍රියාකාරකම් මාලාවක් ක්‍රියාවට නංවන අතර ප්‍රජාව සමග කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ආයතන සහය ඊට හිමි වේ. කර්මාන්තය ආශ්‍රිත සම්බන්ධතා ශක්තිමත් කිරීම පිණිස ආයතනයේ ප්‍රජා ප්‍රවේශ අංශ, පර්යේෂණය ප්‍රවර්ධනය කර ව්‍යාප්තිය කෙරෙහි නැඹුරුවක් දක්වන වැඩසටහන් සඳහා පහසුකම් සලසා දෙයි. මෙම ක්‍රියාකාරකම්, විශ්වවිද්‍යාලය සමඟ සමාජය සම්බන්ධ කරන අතර කාර්ය මණ්ඩලය සඳහා අත්දැකීම් ද, සිසුන් සඳහා පුහුණු අවස්ථා ද ලබා දෙයි.

### 1.4.10 පශ්චාත් උපාධි අධ්‍යයනය, පර්යේෂණය, නවෝත්පාදනය සහ වාණිජකරණය

විශ්වවිද්‍යාලයට, එහි පශ්චාත් උපාධි වැඩසටහන්වල ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම ශ්‍රී ලංකා සුදුසුකම් කාර්ය රාමුව අනුව ඊට අදාළ උපාධි ප්‍රදාන සුදුසුකම් සමග සමපාත වන බව සහතික වනු පිණිස ප්‍රතිපත්ති සහ රෙගුලාසි ඇති අතර පශ්චාත් උපාධි ආයතනවල ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම යන කාර්යයන් ද විශ්වවිද්‍යාලය මඟින් විධිමත් කරයි. පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාලය හා කර්මාන්තය ආශ්‍රිත සහයෝගිතාව මීට පෙර සීමා වී පැවති නමුත්, ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, ආසනීකරණ සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය පිහිටුවීමත් සමඟ එහිලා වන සහයෝගිතාව සියලු පීඨ වෙත ව්‍යාප්ත වී ඇත. ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, ආසනීකරණ සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය විසින් අවබෝධතා ගිවිසුම් 9කට පහසුකම් සලසා ඇති අතර නවෝත්පාදන හෙළිදරව් කිරීමේ ආකෘති පත් 24ක් ආකෘති පත් ඊට ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය පේටන්ට් බලපත්‍ර 14ක්, ජාතික පේටන්ට් බලපත්‍රයක්, එක් වෙළඳ ලකුණක් සහ එක් කාර්මික සැලසුම් අයදුම්පතක් දිනා ගනු ලැබ තිබේ. ඔවුන් පේටන්ට් සහයෝගිතා සම්මුති අයදුම්පත් 3ක් ද ඉදිරිපත් කළ අතර "රෙස්පිරෝන් ඒ වී 99 මුව ආවරණ" නමින් නව නිෂ්පාදනයක් වෙළඳ අමාත්‍යාංශය හා සීමාසහිත සරසවි ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම සමග එක් ව ශ්‍රී ලංකා වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. විශ්වවිද්‍යාල සිසුන් අතර සහ මධ්‍යම පළාත තුළ සමාජ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනයෙන් රුපියල් මිලියන 11ක මුදලක් ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, ආසනීකරණ සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය වෙත ලැබිණි. සමාජ ව්‍යවසාය ආසනීකරණ රසායනාගාරයක් එමඟින් සංවර්ධනය කර ගත හැකි විය.

2022 දී පර්යේෂණ සහ සංවර්ධනය සඳහා මුළු ප්‍රතිපාදනඃ

විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන - රුපියල් මිලියන 40
බහුවිධ පර්යේෂණ - රුපියල් මිලියන 30
උපාධි අපේක්ෂක පර්යේෂණ - රුපියල් මිලියන 10
පරිවාස කථිකාචාර්යවරුන් - රුපියල් මිලියන 10

**පර්යේෂණ ප්‍රකාශන (සම්යුරු සමාලෝචිත දර්ශක සඟරා)**

ජාත්‍යන්තර 459
ජාතික 126

**පේටන්ට් බලපත්‍ර : 2022 දී පේටන්ට් බලපත්‍ර දෙකක් (02) ලැබිණි.**

- ජල විෂබීජ නාශකයක් සඳහා මතුපිට වෙනස් කරන ලද ඉල්ලම් මිනිරන් සහ රිදී නැනෝ අංශු වලින් ප්‍රතිබැක්ටීරියා සංයුක්ත ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ක්‍රමයක්. (මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල මහතා, භූ විද්‍යා අධ්‍යයනාංශය)

- පොල් සැකසුම් කර්මාන්තයේ ජනනය වන අතුරු නිෂ්පාදන භාවිතයෙන් රුමේන් ආරක්ෂිත මේදය නිෂ්පාදනය කිරීමේ ක්‍රමයක්. (කෘෂි විද්‍යා පීඨයේ කණ්ඩායමක් විසිනි.) (එම්.බී.පී. මහීපාල මහතා, සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය (0718162491) සහ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය)

**නව නිපැයුම් : මහාචාර්ය කේ.එස්.පී. අමරතුංග මහතා, කෘෂි විද්‍යා පීඨය විසින් නව නිෂ්පාදන 03ක් හඳුන්වා දෙන ලදී.**

- දුර අධෝරක්ත විශේෂ තේ වියළනය
- වී සඳහා කාර්මික පරිමාණයේ (ටොන් 15) ඉක්මන් තැම්බුම් යන්ත්‍රයක් (තැම්බුම් බොයිලේරුවක්)
- දුර අධෝරක්ත විශේෂිත කෝපි බැදීමේ රෝස්ටරය

2022 වසර තුළ පර්යේෂණ සහ ප්‍රදාන සම්බන්ධ අනෙකුත් විශේෂ අවස්ථා පහත දැක්වේ.

**'රෙස්පිරෝන් ඒ වී 99 මුව ආවරණය' සොයා ගනු ලැබුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසිනි:** වෛරස්, රුධිරය හෝ වෙනත් ජලය පාදක වායු අංශු විකර්ෂණය කිරීමට සහ විනාශ කිරීම සඳහා වූ පරිසර හිතකාමී, ජෛව හායනය කළ හැකි, අඩු වියදම් සහ නැවත භාවිතා කළ හැකි මුහුණු ආවරණයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨයේ රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් සකස් කර ඇත. බහුකාර්ය මුව ආවරණයක පළමු ගෝලීය සොයා ගැනීම මෙයයි.

- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 10ක් පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල ජාත්‍යන්තර සංචාර 17කි.
- ජාතික සහ ජාත්‍යන්තර සම්මාන 11කි.
- බහු විනය පර්යේෂණ ප්‍රදාන වාර්ෂික ව රු.මි. 30කි.

**චීන ශ්‍රී ලංකා ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය:** "චීන ශ්‍රී ලංකා ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය" ශ්‍රී ලංකාවේ මහනුවර, පේරාදෙණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද අතර එය ජලය, සෞඛ්‍යය හා පරිසරය ආශ්‍රිත ව සහ ජාතික අභිමතාර්ථයක් සහිත වෙනත් අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් උසස් පර්යේෂණ සිදු කර නව දැනුම බෙදා හැරීම සඳහා එක් ව කටයුතු කිරීම සඳහා පර්යේෂකයන්ට සහ වෘත්තිකයන්ට පහසුකම් සපයයි.

**ලැබුණු ප්‍රදාන (බාහිර අරමුදල්, 2022-2013)**

| | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | 53 | 94 | 100 | 73 | 75 | 96 | 114 | 137 | 129 | 163 |
| වටිනාකම (රු. මි.) | 362.64 | 363.05 | 236.62 | 129.27 | 129.64 | 134.92 | 122.68 | 148.83 | 118.90 | 75.92 |

ලැබුණු ප්‍රදාන (බාහිර අරමුදල්, 2022-2013)



**පිරිනමන ලද විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයන් (2022 - 2013)**

| | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව** | **96** | 64 | 0 | 45 | 53 | 57 | 82 | 0 | 67 | 93 |
| **වටිනාකම (රු. මි.)** | **74.03** | 26.01 | 39.84 | 27 | 30 | 34.4 | 80.17 | 0 | 48.48 | 52.85 |




### 1.4.11 කාර්ය මණ්ඩල සංවර්ධනය

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, සියලු කාණ්ඩවල කාර්ය මණ්ඩල සඳහා නිත්‍ය, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සපයයි.

**විධායක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන**

සහකාර ලේඛකාධිකාරීවරුන් සහ සහකාර මූල්‍යාධිකාරීවරුන් සඳහා වන සාමාන්‍ය හා මූල්‍ය පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, ආයතනික ප්‍රගතිය ඉහළ නැංවීම සඳහා දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා දින පහක වැඩමුළුවක් ලෙස සැලසුම් කර ඇත. විධායක නිලධාරීන්ට තම රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය අංග වන වාර්තා ලිවීම පිළිබඳ නිපුණතාව ඉහළ නංවා ගැනීම, විවේචනාත්මක චින්තනය සහ සන්නිවේදන කුසලතා යනාදිය ද පාඨමාලා අන්තර්ගතය හරහා ඉලක්ක කර ඇත. පුහුණු වැඩසටහනේ අනෙකුත් විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| වැඩසටහන් සම්බන්ධීකාරක: | මහාචාර්ය ඕ.ජී දයාරත්න බණ්ඩා මහතා, හිටපු පීඨාධිපති, කලා පීඨය |
| වැඩසටහන් පහසුකම් සපයන්නා: | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය<br>පුහුණු වැඩසටහනේ සමස්ත සම්බන්ධීකාරක: එච්.ඒ.ටී.එන්. අමරසේන මිය, නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන අංශය |
| ඉලක්කගත අභ්‍යාසලාභීන්: | සියලුම සහකාර ලේඛකාධිකාරීවරුන්, සහකාර මූල්‍යාධිකාරීවරුන් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ ඊට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනවල සහකාර අභ්‍යන්තර විගණකවරුන්. |
| සහභාගිවූවන්ගේ සංඛ්‍යාව: | 27 |
| කාල සීමාව: | 2022 අගෝස්තු 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්ණ කාලීන ව සෑම බ්‍රහස්පතින්දා දින 5කි. |
| ස්ථානීය සම්පත් දායකයන්: | අභ්‍යන්තර සම්පත් |

**කාර්යාල කටයුතු සහ පර්යේෂණ කාර්යයන් සඳහා දත්ත විශ්ලේෂණ සහ දෘශ්‍යකරණය පිළිබඳ පාඨමාලාව**

කාර්ය මණ්ඩල තොරතුරු තාක්ෂණ නිපුණතා ඉහළ නැංවීමේ වැඩසටහනේ උසස් මට්ටම ඉලක්ක කරනුයේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඊට අදාළ කාර්යයට සම්බන්ධ වූ හෝ තොරතුරු තාක්ෂණය මත පදනම් වූ දත්ත දෘශ්‍යකරණය සහ විශ්ලේෂණය භාවිතයෙන් තම කාර්යයේ ගුණාත්මකභාවය වැඩි දියුණුකර ගැනීමේ විභවයක් ඇති සේවක පිරිස ය.

2022 වර්ෂය තුළ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පහත වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### 1.4.12 පාලනය සහ කළමනාකරණය

පාර්ශවකරුවන්ගේ තෘප්තිය සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සහ අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අභ්‍යන්තර යාන්ත්‍රණ ස්ථාපිත කර ඇත. ක්‍රියාපටිපාටි විධිමත් කිරීම සහ ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා නව ආයතනික විධිවිධාන සකස් කර ඇත.

විශ්වවිද්‍යාලය, සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් භාවිතා කර ඇති අතර සිදු වන බලපෑම සහ අවශ්‍යතා මත පදනම් ව අවශ්‍ය සම්පත් වෙන් කරයි. විශ්වවිද්‍යාලය, මානව සම්පත් කළමනාකරණයෙහි ප්‍රතිඵල මත පදනම් වූ කාර්ය සාධනය, විනිවිදභාවය සහ සදාචාරාත්මක හැසිරීම සඳහා කැප වී කටයුතු කළ අතර, විනය සහ දුක්ගැනවිලි හැසිරවීම

| වැඩසටහන | පැවැත් වූ දිනය | ඉලක්ක කණ්ඩායම | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අර්ධ දින වැඩමුළුව | දෙසැම්බර් 31 | මෙහෙයුම් තාක්ෂණික ලේකම්වරුන්ගේ කාර්ය මණ්ඩලය | 37 |
| දැනුවත් කිරීමේ වැඩසටහන | පෙබරවාරි 07 | විනයපාලකවරු | 10 |
| විශ්වවිද්‍යාල ප්‍රමුඛ හා කළමනාකරණය පිළිබඳ සහතික පාඨමාලා ද්වය | පෙබරවාරි සිට අප්‍රේල් දක්වා | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් | 29<br>-<br>28 |
| උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පෙබරවාරි සිට අප්‍රේල් දක්වා<br>අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් | 28<br>27 |
| අධ්‍යාපනික ක්‍රියාකාරකම් සඳහා අනුකාරකයන් පුහුණු කිරීමේ වැඩමුළුව | | ප්‍රදර්ශකයන් | 10 |
| ධාරිතා වර්ධන වැඩසටහන | ඔක්තෝබර් 03 | ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් | 25 |
| ධාරිතා වර්ධන වැඩසටහන | මැයි 09, 23, 24<br>ජූනි 06, 07, 08<br>ජූනි 27, 28, 29<br>නොවැම්බර් 08, 09, 10<br>නොවැම්බර් 28, 29, 30 | කළමනාකරණ සහකාරවරුන් | 25<br>29<br>25<br>27<br>24 |
| භාෂා පුහුණු වැඩසටහන | ජූනි 30<br>ජූලි 07<br>ජූලි 21<br>අගෝස්තු 18 | නියෝජ්‍ය ලේඛකාධිවරුන්<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිවරුන්<br>සහකාර ලේඛකාධිවරුන් | 19 |
| සාමාන්‍ය සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | සැප්තැම්බර් 01, 08, 15, 22, 29 | සාමාන්‍ය හා මූල්‍ය පරිපාලනය සහකාර ලේඛකාධිවරුන්<br>සහකාර මූල්‍යාධිකාරවරුන් | 27 |
| අර්ධ දින පුහුණු වැඩසටහන | ඔක්තෝබර් 27 | පීඨ මට්ටමේ සම්මත මෙහෙයුම් කාර්යපටිපාටි සංවර්ධන කමිටු සාමාජිකයින් | 30 |
| ගැටුම් නිරාකරණය පිළිබඳ වැඩමුළුව | නොවැම්බර් 04 | ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සාමාජිකයන් | 12 |
| උසස් අධ්‍යාපන කළමනාකරණ සහකාරවරුන්ගේ 01 වැනි වාර්ෂික සංසදය | දෙසැම්බර් 08 | 01 වන 02 වන සහ 03 වන ධාරිතා වර්ධන වැඩසටහන් ඉදිරිපත් කිරීම | 20 |

සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුගමනය කර ඇත. පර්යේෂණ සංස්කෘතිය, ජාත්‍යන්තරකරණය සහ ජාතික/ජාත්‍යන්තර ආයතන/සංවිධාන සමඟ සහයෝගිතාව ප්‍රවර්ධනය පිණිස විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇත.

**අධ්‍යයන අංශ ප්‍රධානීන් පත් කිරීම**

- අභ්‍යන්තර ගැටුම් මගහරවා ගනිමින් අධ්‍යයන දෙපාර්තමේන්තු සඳහා ප්‍රධානීන් පත් කිරීමේ ක්‍රියාපටිපාටියක් සභාව විසින් අනුමත කරන ලදී.
- අංශ ප්‍රධානියා පත් කිරීම සහ වගකීම් සම්බන්ධ සියලු කරුණු අධ්‍යයනය කිරීම සඳහා උපකුලපතිවරයා විසින් හිටපු පීඨාධිපතිවරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති අතර, ඔවුන්ගේ වාර්තාව සනාතන සභාවට සහ පාලක සභාවට ඉදිරිපත් කරන ලදී.

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කර්තව්‍යයන් සඳහා වූ කමිටුව**

- 2022 දෙසැම්බර් මස 5 වන දින පැවති 88 වන උපකුලපති උපදේශක කමිටුවේ දී යෝජනා කරන ලද පරිදි, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු විධිමත් කිරීම සහ ඉහළ නැංවීම සඳහා පාලක සභාවේ අනුමැතිය ඇති ව ත්‍රිපුද්ගල මණ්ඩලයක් පත් කරන ලදී.

**ගැටුම් නිරාකරණ කමිටු පිහිටුවීම**

- විශ්වවිද්‍යාල පාලක සභාව විසින් සමහර අධ්‍යයන අංශවල පවතින අභ්‍යන්තර ගැටුම් විසඳීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කළේ ය. (2022.05.28 වන දින පැවති එහි 516 වැනි රැස්වීමේ දී පාලක සභාව තීරණය කළ පරිදි)
- පීඨාධිපතිවරයාගේ මට්ටමින් සමථයකට පත් කිරීමට/ විසඳීමට නොහැකි වූ ගැටුම් උපකුලපතිවරයා වෙත යොමු කරනු ලැබේ.
- විද්වතුන් අතර අන්තර් පුද්ගල මත ගැටුම් විසඳීම සඳහා ද්විස්ථර යාන්ත්‍රණයක්, එකක් පීඨ මට්ටමින් සහ අනෙක, උපකුලපති මට්ටමින්, පහත පරිදි අනුමත කර ඇත.

    1. පීඨ මට්ටමින් සංහිඳියාව.
    2. උපකුලපති මට්ටමින් සංහිඳියාව.

**උසස්වීම් සහ දැන්වීම් පළ කර බඳවා ගන්නා තනතුරු සඳහා වූ ඉලෙක්ට්‍රොනික ආකෘතිය**

- උපකුලපතිවරයාගේ උපදේශක කමිටුව විසින් ගනු ලැබූ තීරණයට අනුව, උසස්වීම් සහ දැන්වීම් පළ කර බඳවා ගන්නා තනතුරු සඳහා වූ ලේඛන භාර ගැනීමේ ආකෘතිය වෙනස් කෙරිණි.

**සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි**

- විශ්විද්‍යාලය විධිමත් ව හා සම්බන්ධීකරණය වූ ආකාරයකින් ක්‍රියාත්මක වීම, ඵලදායිතාව වැඩි කිරීම සහ දෝෂ ඇතිවීමේ අවදානම අවම කිරීම සහතික වනු පිණිස සියලු ක්‍රියාකාරකම් සඳහා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සංවර්ධනය කිරීමට මූලාරම්භක වැඩ පිළිවෙළ යොදා  ඇත.
- පීඨය/ මධ්‍යස්ථානය/ ඒකකය සහ අංශ විසින් සකස් කරන ලද සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සමාලෝචනය කර තහවුරු කිරීම පිණිස කමිටුවක් පත් කරන ලදී.

**කාර්ය සාධන ඇගයීම් ක්‍රම**

සමාලෝචිත වර්ෂය තුළ, කාර්ය මණ්ඩල ඇගයීම් ක්‍රම හරහා කාර්ය මණ්ඩලයේ නිමැවුම්/ ප්‍රතිඵල සහ ත්‍යාග මත පදනම් ව, කාර්ය මණ්ඩල සේවක පිරිස්වල කාර්ය සාධනයට අදාළ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලදී.

**උද්‍යාන අංශයට අනුයුක්ත සේවකයින් ඇගයීම**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අක්කර 150කට අධික භූමි ප්‍රමාණයක් නඩත්තු කරන උද්‍යාන අංශයට අනුයුක්ත හොඳ ම කාර්ය සාධනය සහිත සේවක සේවිකාවන් ඇගයීම සඳහා සහතික පත් ප්‍රදානය කිරීමේ උත්සවයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ඔක්තෝබර් මස 24 වන දින පවත්වන ලදී.

**කාර්ය මණ්ඩල විශිෂ්ටතා සම්මානය - 2022**

- ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ තාක්ෂණික හා ප්‍රාථමික ශ්‍රේණි යටතේ විශ්වවිද්‍යාලයේ සියලුම අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය වෙතින් කරන ලද අයදුම්පත් කැඳවීමෙන් අනතුරු ව, 2023.01.02 වන දින පැවති ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ඉහළ ම ලකුණු ලබාගත් සේවකයින් 27 දෙනෙකුට සම්මාන තිළිණ ප්‍රදානය කෙරිණි.
- සෑම සේවක වර්ගීකරණයකින් ම තෝරාගත් හොඳ ම සේවකයාට මුදල් ත්‍යාග පිරිනමන ලදී.

**කාර්ය මණ්ඩල තොරතුරු තාක්ෂණ නිපුණතා ඉහළ නැංවීමේ වැඩසටහන - 1 වන මට්ටම**

- සේවකයින් 23 දෙනෙකු සඳහා 2023.01.02 වන දින සහතික ප්‍රදානය කරන ලදී.

**අධ්‍යයන නොවන කොන්ත්‍රාත් සහ අර්ධ කාලීන පදනම මත අධ්‍යක්ෂ පත්වීම්**

- 2022 සඳහා අනධ්‍යයන කොන්ත්‍රාත් පත්වීම් 67 කට ආසන්න සංඛ්‍යාවක් සහ අර්ධ කාලීන අධ්‍යක්ෂ පත්වීම් 24ක් සිදු විය.

**විශ්වවිද්‍යාල සභා මට්ටමින් සිදු වූ නව ආරම්භයන්**

- නව න්‍යාය පත්‍ර විෂයාංකයක් යටතේ, "උපායමාර්ගික සැලසුම් - පේරාදෙණිය විශ්වවිද්‍යාලය" යන කාරණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලීය අනාගත සංවර්ධන කාර්යයන් සහ පශ්චාත් උපාධි ආයතනවල සහ මධ්‍යස්ථානවල පීඨාධිපතිවරුන්/ අධ්‍යක්ෂවරුන් විසින් කරනු ලබන ඉදිරිපත් කිරීම් සාකච්ඡා කිරීම සඳහා මාසික ව පවත්වනු ලබන විශ්වවිද්‍යාල සභා රැස්වීම්වල දී පැය දෙකක කාලයක් වැය කෙරේ.

**විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කරන ලද විශේෂ කමිටු**

- **අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් පරිශීලනය කිරීම සඳහා පාලක සභාවේ අනු කමිටුවක් පත් කරන ලදී.**

  අවබෝධතා ගිවිසුම් කඩිනම් කර ඒවායේ ප්‍රමාද වළක්වා ගැනීම සඳහා, ඒවා සභාවට ඉදිරිපත් කිරීමට පෙර අධ්‍යයන අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රියාවලිය යුහුසුළු කිරීම අරබයා එකී අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් පරිශීලනය කිරීම පිණිස පාලක සභාව විසින් කමිටුවක් පත් කරන ලදී.

- **සභා සංදේශ පරිශීලනය කිරීම සඳහා නීති කමිටුවක් පත් කරන ලදී.**

  සිද්ධියේ/ සිද්ධීන්වල ස්වභාවය සැලකිල්ලට ගනිමින්, සභා රැස්වීමට පෙර සංදේශ මනාව අධ්‍යයනය කර කවුන්සිලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වෙන ම නීති කමිටුවක් පත් කරන ලදී.

**වෙනත් නව ආයතන**

**මානව සම්පත් සංවර්ධන ඒකකයක් පිහිටුවන ලදී.**

මානව සම්පත් සංවර්ධන ඒකකය පිහිටුවන ලද්දේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිපූර්ණ සංවර්ධනය අරමුණු කර ගනිමිනි. නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයෙකුගේ පරිපාලනය යටතේ මෙම ඒකකය විධිමත් ලෙස ස්ථාපිත කරන ලදී. මෙම ඒකකය සඳහා අර්ධ කාලීන පදනමින් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබේ.

**ස්වයංක්‍රීයකරණයේ ප්‍රයත්න**

සියලු විශ්වවිද්‍යාල කාර්යයන් ස්වයංක්‍රීයකරණය වෙමින් පවතී. ව්‍යවසාය සම්පත් පැකේජය සාර්ථක ව සංවර්ධනය කර ස්ථාපනය කර ඇත. 2022 සඳහා සියලු මූල්‍ය දත්ත ඇතුළත් කර ඇත. 2023 වර්ෂයට අදාළ සටහන් ඇතුළත් කිරීම් හොඳින් සිදුවෙමින් පවතී. තව දුරටත්, ඇතැම් කාර්ය මණ්ඩල පුහුණු කටයුතු, දෝෂ නිරාකරණ කටයුතු සහ ගෙවීම් හා වැටුප් ලේඛන යනාදියේ ද්විත්ව ආකාර සැකසුම් කටයුතු අඛණ්ඩ ව සිදු කෙරේ.

වාහන කළමනාකරණ පද්ධතිය, ශිෂ්‍ය කළමනාකරණ පද්ධතිය, නිවාඩු කළමනාකරණ පද්ධතිය සහ ශාලා වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක ව පවතී. විශ්වවිද්‍යාලය සඳහා නේවාසිකාගාර කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම සිදු වෙමින් පවතී. මෙම ක්‍රමය සමග සියලුම උපාධි අපේක්ෂකයින්ට ස්මාර්ට් හැඳුනුම්පත් ලබා දෙනු ඇත.

උසස්වීම් සහ දැන්වීම් පළ කර බඳවා ගන්නා තනතුරු සඳහා ඉලෙක්ට්‍රොනික අයදුම්පත්‍ර ආකෘතියක් ස්ථාපිත කර ඇත. තව ද, වැඩබලන පීඨාධිපතිවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කරන ලදී.

**2022 දෙසැම්බර් මස 31 වන දිනට බඳවා ගැනීම්, විශ්‍රාම ගැන්වීම්, ඉල්ලා අස්වීම් සහ මියගිය කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය**

| | අධ්‍යයන | අධ්‍යයන සහය | අනධ්‍යයන | එකතුව |
|---|---|---|---|---|
| බඳවා ගැනීම් | 44 | 00 | 09 | 53 |
| විශ්‍රාම ගැන්වීම් | 16 | 00 | 49 | 65 |
| ඉල්ලා අස්වීම් | 32 | 02 | 17 | 51 |
| මියගිය තැනැත්තන් | 01 | 00 | 00 | 01 |
| එකතුව | | | | 170 |

**කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම**

පුහුණු කිරීම සහ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම මඟින්, එක් එක් කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම උදෙසා ප්‍රයත්න දරනු ලැබේ. පාලක සභාවේ අනුමැතිය ඇති ව කළමනාකරණ ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා සකස් කර ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති 14ක් සනාතන සභාව විසින් අනුමත කරන ලදී. තවද, විශ්වවිද්‍යාලය, ස්වකීය පාලනය සහ කළමනාකරණය නංවාලීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගෙන ඇත.

- අනාගත දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා නායකත්ව පුහුණුව.
- දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කාර්ය කටයුතු වැඩි දියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.
- අධ්‍යයන සහ අනධ්‍යයන යන අංශය දෙකම සඳහා ගැටුම් නිරාකරණ කමිටු පිහිටුවීම.
- සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සකසා ඇත.
- වඩාත් ඵලදායී කාර්ය සාධන ඇගයීම් පද්ධති සංවර්ධනය කිරීම.
- හොඳ ම කාර්ය සාධනය සහිත පුද්ගලයන් හඳුනා ගනිමින් භූමි අලංකරණ අංශයට අනුයුක්ත සේවක සේවිකාවන් ඇගයීම.
- කාර්ය මණ්ඩල විශිෂ්ටතා සම්මානය - 2022.

### 1.4.13 උපාය මාර්ගික සැලැස්ම

**උපායමාර්ගික සැලැස්ම 2022-2026**

ප්‍රධාන ඉලක්ක හයක් යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනාගත දිශානතිය වෙනුවෙන් අවධානය යොමු කරන ලද අරමුණු සහ ක්‍රියාකාරකම්, විශ්වවිද්‍යාලයේ 2022 - 2026 උපාය මාර්ගික සැලැස්ම මඟින් ගෙන හැර දක්වයි. 2022 - 2026 කාල සීමාව සඳහා විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා උපකුලපතිවරයා විසින් කමිටුවක් ද පත් කරනු ලැබ ඇත. 2022.07.30 වන දින පැවති පාලක සභාවේ 518 වන රැස්වීමේ දී 2022 - 2026 උපායමාර්ගික සැලැස්ම අනුමත කර ඇත.

**ක්‍රියාකාරී සැලැස්ම - 2022**

2022 වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්ම, 2022.06.25 වන දින පැවති සිය 517 වන රැස්වීමේ දී සභාව විසින් අනුමත කරනු ලැබ ඇත. එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා 2021.12.14 වන දිනැති අංක 01/2021 දරන මුදල් චක්‍රලේඛ ලිපියට අනුව මූල්‍යාධිකාරී වෙත ඉදිරිපත් කර ඇත.

### 1.4.14 පීඨ සහ පශ්චාත් උපාධි ආයතන විෂයෙහි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය

විශ්වවිද්‍යාලය විසින් සියලුම පීඨවල සහ පශ්චාත් උපාධි ආයතනවල ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳව විශ්ලේෂණයක් සිදු කරනු ලැබ ඇත. ඒ පිළිබඳ සාරාංශය වාර්තා වූයේ, පහත දැක්වෙන ආකාරයෙනි. විශ්වවිද්‍යාලය, එහි පවතින දුර්වලතා මැඩලීමට සහ බාහිර තර්ජන උපක්‍රමශීලී ව මැඩපැවැත්වීමට බොහෝ ශක්තීන් සොයා දැන ගෙන ඇත. ඒවා මනාව විශ්ලේෂණය කර කාර්ය නියුක්තියෙහි යොදවා ඇත. උපාය මාර්ග සැලසුම් කරනු ලබන්නේ, දුර්වලතා සහ තර්ජන ජය ගැනීම සඳහා මෙන් ම අවස්ථා තුළින් ප්‍රයෝජන සලසා ගැනීම සඳහා ය.

## ශක්තීන්

- කාලාන්තරයක් තිස්සේ සුපරීක්ෂිත පරිපාලන කළමනාකරණ පද්ධතියක් සහිත සම්පත් බහුල, මානව ව්‍යුහගත සහ ප්‍රගමනීය රාජ්‍ය විශ්වවිද්‍යාලයකි.
- ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වූ ප්‍රවීන හා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් හා අධ්‍යයන පීඨ නවයක් සහ පශ්චාත් උපාධි ආයතන හතරක් සහිත බහු විෂයික විශ්වවිද්‍යාලයකි.
- ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලන මානව ව්‍යුහගත විෂයමාලා සහිත බහුවිධ පරාසයක උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් වේ.
- කාලාන්තරයක් තිස්සේ සුපරීක්ෂිත විෂයමාලා අනුමත කිරීමේ ක්‍රියාවලිය, විෂයමාලා තුළට නවීන මූලධර්ම හා ප්‍රවේශ අන්තර්ගත කිරීම පිණිස වග බලා ගනියි.
- වැටුප් ගෙවීම, නඩත්තු කටයුතු කිරීම සහ සමහර ප්‍රාග්ධන වැඩ සඳහා රාජ්‍ය අරමුදල් ලබා ගත හැකි වීම.
- බහු සංස්කෘතික හා බහු භාෂා ඉගෙනුම් සහ ජීවන පරිසරයක් සහිත රටේ පැරණිත ම විශ්වවිද්‍යාලය ලෙස අත් කර ගෙන ඇති උරුමය සහ ජාත්‍යන්තර/ දේශීය මට්ටමින් ලබා ඇති කීර්තිය.
- ඉඩම් සන්තක ව තිබීම හේතුවෙන් ඉගෙනීම, පර්යේෂණය සහ භෞතික ව්‍යාප්තිය සඳහා විස්තීර්ණ යටිතල පහසුකම් පැවතීම.
- මානව ස්ථාපිත අධ්‍යයන උපදේශක පද්ධතිය, සෞඛ්‍ය සේවා පද්ධතිය සහ ශිෂ්‍ය උපදේශන හා විනය කටයුතු ක්‍රමය.
- පර්යේෂණ ප්‍රදාන සහ සහයෝගිතාව ආකර්ෂණය කර ගනු පිණිස ලොව සුපතළ ශ්‍රේණිගත විශේෂඥයින් සිටීම සහ ප්‍රමාණවත් භෞතික සම්පත් තිබීම.
- සමාජයේ බලගතු තනතුරුවල සිටින දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් විද්‍යාර්ථීන් සමඟ මනා අනුබලතාවයකින් කටයුතු කරන ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයක් සිටීම.

## දුර්වලතා

- නවාතැන් ඇතුලුව සමහර ආයතන සඳහා ප්‍රමාණවත් භෞතික පහසුකම්, සම්පත් සහ මූල්‍ය පහසුකම් නොමැති වීම.
- අරමුදල් උත්පාදනයේ සීමිත බව සහ අධික ව රාජ්‍ය අරමුදල් මත යැපීම.
- වැඩිදුර පුහුණුව, සංවර්ධනය සහ ජාත්‍යන්තර නිරාවරණය සහ පර්යේෂණ අත්දැකීම් අවශ්‍ය සැලකිය යුතු තරුණ පිරිසක් අධ්‍යයන කාර්ය මණ්ඩලවල සිටීම.
- කාර්ය මණ්ඩලය සඳහා නිසි කාර්ය සාධන ඇගයුම් ක්‍රමවේදයක් නොමැති වීම සහ මනා කාර්ය සාධනයක් වෙනුවෙන් දිරි දීමනා ලබා දීම සඳහා ත්‍යාග/ ඇගයුම් පද්ධතියක් නොමැති වීම.
- පවත්නා වැඩසටහන්, සම්පත් සහ විශේෂඥතාව පිළිබඳ ව ප්‍රමාණවත් පරිදි ප්‍රචාරණයක් නොමැති වීම.
- ප්‍රමාණවත් නොවන විද්‍යුත් ඉගෙනුම් පහසුකම් සහ Wi-Fi පහසුකම්, අධ්‍යයන කළමනාකරණ පද්ධති භාවිතය සීමා සහිත වීම සහ සංයෝජිත/ මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම් සීමා සහිත වීම.
- ශිෂ්‍ය බහුතරයට වැඩ කරන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීමට ඇති නොහැකියාව.
- ඩිජිටල්කරණය, ඩිජිටල් ලේඛනාගාරය සහ ස්වයංක්‍රීයකරණය සීමා සහිත වීම.
- අනුරේඛීය/ රැකියාදායක අධ්‍යයන සහ නව විෂයමාලා සංවර්ධනය පිණිස ශාස්ත්‍රීය සොයාගැනීම් ඒකාබද්ධ කිරීම් ප්‍රමාණවත් නොවීම.
- විදේශීය සිසුන්/ විද්වතුන්/ පර්යේෂකයන් සඳහා ප්‍රමාණවත් අනුබලයක් සහ පහසුකම් නොමැති වීම සහ විදේශීය සිසුන් ආශක්ත කර ගැනීම පිණිස යෝග්‍ය වැඩසටහනක් නොමැති වීම.

## අවස්ථා

- ව්‍යවසායක අවස්ථා ආකර්ශනය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික පිහිටීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලද සුදුසුකම් (පේරාදෙණිය සන්නාමය) සඳහා ඉහළ පිළිගැනීමක් තිබීම.
- විශ්වවිද්‍යාලයේ ඇතැම් විෂයයන් සමත් උපාධිධාරීන් සඳහා ඇති ඉල්ලුම වැඩි වීම.
- ගාස්තු අය කරන වැඩසටහන් සහ සේවා සඳහා ඉල්ලුම වැඩි වීම.
- ගුණාත්මක තත්ත්වයේ උසස් අධ්‍යාපනය සඳහා ඇතැම් අංශ කෙරෙහි ඇති ඉල්ලුම වැඩි වීම.
- පශ්චාත් කොවිඩ් අන්තර්ජාල මාර්ගගත යුගය තුළ සහ ඉන් පසු ව මාර්ගගත සහ දුරස්ථ ඉගෙනීම සඳහා ඉල්ලුම වැඩි වීම.
- අධ්‍යාපනයට මුදල් යෙදවීමට දෙමාපියන්/ ශිෂ්‍යයන් සූදානම් ව සිටින කාල පරිච්ඡේදයක් තිබීම.
- පර්යේෂණ/ අධ්‍යයන වැඩසටහන්/නව නිපැයුම්/ පුහුණු අවස්ථා/ හුවමාරු වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කිරීමට පිළිගත් විදේශීය ආයතනවල උද්යෝගයක් පැවතීම.
- සමාජ ආර්ථික කටයුතු සඳහා කාන්තාවන්ගේ වැඩි සහභාගීත්වයක් පැවතීම.
- රටේ සේවා අංශයේ වර්ධනය (පූර්ව කොවිඩ්) සහ අධ්‍යාපනයේ සහ නව නිපැයුම්වල අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා දේශීය කර්මාන්ත සමඟ ඇති විය හැකි සහයෝගිතාවය.

## තර්ජන

- උසස් අධ්‍යාපනය සඳහා රාජ්‍ය අරමුදල් ලබා දීම අඩු කිරීම.
- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල සහ නව රාජ්‍ය විශ්වවිද්‍යාලවල ව්‍යාප්තිය.
- සමහර විෂයයන් පිළිබඳ උපාධිධාරීන් සඳහා ඇති ඉල්ලුම අඩුවීම.
- පරිපාලන අවශ්‍යතා සඳහා සහය වනු පිණිස වසර 45ක් පැරණි විශ්වවිද්‍යාල පනතේ පවත්නා සීමා.
- සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ රඳවා ගැනීම දුෂ්කර බවට පත් කරන විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර ව පවත්නා වඩා හොඳ අවස්ථා/පැකේජ/ වැටුප් යනාදිය.
- දුර්වල ආර්ථික වර්ධනය, ඉහළ උද්ධමනය, දරිද්‍රතාවය හා සිසු සිසුවියන්ට උපකාර කිරීමට දෙමාපියන්ට ඇති නොහැකියාව සහිත රටේ පීඩාදායක ආර්ථික තත්ත්වය.
- බාහිර දේශපාලන නොසන්සුන්තාව/ දේශපාලන බලපෑම ශිෂ්‍ය ප්‍රජාවට බාධාවක් වීම හා විශ්වවිද්‍යාල තුළ ගනු ලබන චේතිත බැඳියා සහිත තීරණ.
- ඉහළ යන විරැකියාව සහ උපාධිධාරීන්ගේ ඌන රැකියා නියුක්තිය, උපාධිධාරීන් නොවන්නන් රැකියා සඳහා බඳවා ගැනීම හා ඊට පුහුණු කිරීම සහ අඩු දැනුමක් සහිත පැහැදිලි තාක්ෂණික කුසලතා සඳහා ඉල්ලුම වැඩි වීම.
- තොරතුරු තාක්ෂණ/ දත්ත/ අන්තර්ජාල මාර්ගගත සේවා භාවිතයට අදාළ අධික පිරිවැය.
- රාජ්‍ය විශ්වවිද්‍යාල/ අධ්‍යයන වැඩසටහන් සම්බන්ධයෙන්, විශේෂයෙන්, තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර, සෘණාත්මක මහජන මතයක් වර්ධනය වීම.

### 1.4.15 ප්‍රාග්ධන ආයෝජන - 2022

ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 110කි.
පුනරුත්ථාපන කටයුතු සහ ප්‍රාග්ධන වත්කම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 65කි.
ස්ථාවර වත්කම් අත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 60කි.

### 1.4.16 යටිතල පහසුකම්

විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනයේ ඉලක්කය වනුයේ, සිසුන්ට, පීඨයට සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂිත, සුවපහසු සහ ක්‍රියාකාරී පරිසරයක් සැපයීම උදෙසාත්, උසස් තත්ත්වයේ අධ්‍යාපනය සහ පර්යේෂණය සලසා දීමේ විශ්වවිද්‍යාලීය මෙහෙවරට සහය වීම උදෙසාත් කටයුතු ඉටු කර දීමයි. යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමෙන්, විශ්වවිද්‍යාලයකට එහි සමස්ත තරගකාරිත්වය වැඩි දියුණු කළ හැකි අතර තව තවත් සිසුන්, පීඨ සහ අරමුදල් ආකර්ෂණය කර ගැනීමට ඊට පුළුවන.

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති 15ක් සාර්ථක ව නිම කරන ලදී. ඉදිකරන ලද ගොඩනැගිලි දැන් ඒවායේ ප්‍රතිලාභීන්ට භාවිත කළ හැකි තත්ත්වයේ පවතී.

**නිම කරන ලද ප්‍රාග්ධන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති - 2022**

| අංකය | කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්තුවේ ප්‍රදානිත වටිනාකම රු. (වැට් බදු සහිත) | නිම කළ දිනය |
|---|---|---|---|---|
| 1 | සීඩබ්./කොන්/2011/910 | අතුරු වෛද්‍ය සායනික ගොඩනැගිල්ල ඉදිකිරීම (2 වන අදියර). | 528,248,425.53 | 15-10-2022 |
| 2 | සීඩබ්./කොන්/2013/1040 | ප්‍රධාන සැලසුම් සංවර්ධනය - කෘෂි විද්‍යා පීඨය 2 වන අදියර. | 379,953,000.00 | 20-05-2022 |
| 3 | සීඩබ්./කොන්/2015/1139 | ගොවිපළ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයනාංශය සඳහා දැනට පවතින ගොඩනැගිල්ලට කරන දිගු කිරීම සඳහා යෝජිත ඉදිකිරීම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම. | 97,870,750.00 | 24-11-2022 |
| 4 | සීඩබ්./කොන්/2015/1151 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨය සඳහා සත්මහල් නව ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම. | 456,928,796.20 | 05-07-2022 |
| 5 | සීඩබ්./කොන්/2016/1219 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුවේ දැනට පවතින ගොඩනැගිල්ලට යෝජිත දිගුව ඉදිකිරීම. | 74,697,223.14 | 09-12-2022 |
| 6 | සීඩබ්./කොන්/2016/1217 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැනට පවතින විද්‍යා පීඨ පරිපාලන ගොඩනැගිල්ල සඳහා යෝජිත දිගුව. | 54,823,835.00 | 19-05-2022 |
| 7 | සීඩබ්./කොන්/2018/1384 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යෝජිත ස්මයිල් ට්‍රේන් ක්ලෙෆ්ට් මධ්‍යස්ථානය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය. | 9,025,130.75 | 15-02-2022 |
| 8 | සීඩබ්./කොන්/2019/1417 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල නැවත රැහැන්ගත කිරීම, විද්‍යා පීඨය. | 6,930,846.00 | 27-04-2022 |
| 9 | සීඩබ්./කොන්/2019/1418 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය නැවත රැහැන්ගත කිරීම. | 13,241,880.00 | 30-03-2022 |
| 10 | සීඩබ්./කොන්/2019/1421 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයේ අඛණ්ඩ අධීක්ෂණ ඒකකය/ පශු වෛද්‍ය ශික්ෂණ රෝහල සංවර්ධනය කිරීම. | 3,852,900.00 | 13-12-2022 |
| 11 | සීඩබ්./කොන්/2019/1426 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පැරණි භූ විද්‍යා ගොඩනැගිල්ලේ වැසිකිළි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සහ පිළිසකර කිරීම. | 3,360,744.00 | 04-04-2022 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | සීඩබ්./කොන්/2019/1428 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන විද්‍යා ගොඩනැගිල්ල දීර්ඝ කිරීම සහ පිළිසකර කිරීම, 3 වන අදියර. | 5,920,459.25 | 21-03-2022 |
| 13 | සීඩබ්./කොන්/2020/1438 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයේ පශු වෛද්‍ය ඉගැන්වීම් ගොවිපළ සඳහා යෝජිත නව ගොඩනැගිල්ල - පශු වෛද්‍ය ශික්ෂණ රෝහලේ කිරි ශීත කිරීමේ කාමරය, විදුලි කාමරය, ගබඩා කාමරය සහ කාර්යාල කාමරය ඉදිකිරීම. | 6,578,520.84 | 26-01-2022 |
| 14 | සීඩබ්./කොන්/2020/144 6 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ මාවලවත්ත පිහිටි පශු සම්පත් ක්ෂේත්‍ර ස්ථානයේ තාරා මත්ස්‍ය ඒකාබද්ධ ඒකකය. | 2,581,880.40 | 18-02-2022 |
| 15 | සීඩබ්./කොන්/2016/1263 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යෝජිත උරුම ගොඩනැගිලි පිළිසකර කිරීම (විජේවර්ධන ශාලාව). | 204,468,871.16 | 10-12-2022 |
| | | | **1,845,122,518.27** | |

## 1.4.17 "AHEAD" ව්‍යාපෘතිය

සමාලෝචිත වර්ෂයේ දී, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨයට අනුයුක්ත ව සිටි මහාචාර්ය රුවන් ඩී. ජයසිංහ මහතා, තම සේවා කාලය 2022 මැයි මස 1 වන දින සිට අදාළ ව්‍යාපෘති කාල සීමාව අවසන් වන තෙක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස සේවා අලුත් කිරීමක් ලබා නොකඩවා එම තනතුරෙහි සේවයේ නිරත විය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ සහ සියලුම ඕ ටී එස් කාර්ය මණ්ඩලයේ සේවක පිරිස්වල සේවා කාලය ද, ඔවුන්ගේ අදාළ සේවා කාලය අවසන් වූ දින සිට, 2023 ජුනි මස 30 වන දින දක්වා දීර්ඝ කර ඇත.

දන්ත වෛද්‍ය විද්‍යා සහ ඉංජිනේරු පීඨ සඳහා දෙන ලද උපකරණ ප්‍රදානය දැනටමත් අවසන් කර ඇති අතර පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයට අදාළ ප්‍රදානය අවසන් වෙමින් පවතී. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ (රු. 92,700,000) සහ කළමනාකරණ පීඨයේ (රු. 34,992,000) ඉදිකිරීම් ව්‍යාපෘති 02ක් අවසන් කර ඇති අතර, අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ගොඩනැගිලි භාර දෙනු ලැබ, ඒවා දැනට අදාළ පීඨවල පරිහරණය පිණිස යොදවා ඇත. ඉංජිනේරු පීඨයේ පර්යේෂණ හා නවෝත්පාදක මධ්‍යස්ථානය යටතේ ඇති සියලුම ක්‍රියාකාරකම් ද සමාලෝචිත වර්ෂය තුළ නිම කර ඇත. විද්‍යා පීඨයට ප්‍රදානය කරන ලද තොරතුරු තාක්ෂණ ප්‍රදානය යටතේ සියලුම ප්‍රසම්පාදන පිරිනමා ඇති අතර, එයින් සියලුම භාණ්ඩ මිලදී ගනු ලැබ, එහි ඉදිකිරීම් කටයුතු 02ක වැඩ දැනට අවසන් වෙමින් පවතී. සියලුම ප්‍රදාන හා සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

| ප්‍රදානය | පීඨය/ අධ්‍යයනාංශය | සමුච්චිත වියදම (2022 දෙසැම්බර් 31 දක්වා) | වැය වූ මුළු මුදල (2022 දෙසැම්බර් 31 දක්වා) |
|---|---|---|---|
| **ICE** | | | |
| **ABC** | කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය - කෘෂි විද්‍යා පීඨය | 31,651,505.94 | 249,524.00 |
| **SCI** | විද්‍යා පීඨය | 31,345,543.07 | 3,353,780.22 |
| **VET** | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 39,342,173.11 | 37,500.00 |
| | | **102,339,222.12** | **3,640,804.22** |
| **DOR** | | | |
| **VTCS** | කෘෂි විද්‍යා පීඨය | 30,714,221.56 | 3,853,006.92 |
| **GEO** | භූ විද්‍යා අධ්‍යයනාංශය - විද්‍යා පීඨය | 35,118,992.32 | 1,858,600.12 |
| **CROP** | බෝග විද්‍යා අධ්‍යයනාංශය - කෘෂි විද්‍යා පීඨය | 35,438,022.09 | 1,466,684.70 |
| **ENG** | ඉංජිනේරු පීඨය | 37,064,770.70 | 304,252.08 |
| **ART** | කලා පීඨය | 6,373,512.21 | 0 |
| **CVL** | සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය - ඉංජිනේරු පීඨය | 32,822,347.47 | 1,116,000.00 |
| | | **177,531,866.35** | **8,598,543.82** |
| **RIC** | | | |
| **ENG** | ඉංජිනේරු පීඨය | 43,815,573.72 | 5,443.20 |
| **SCI** | විද්‍යා පීඨය | 34,738,459.66 | 3,992,580.25 |
| | | **78.554.033.38** | **3.998.023.45** |
| **ELTAELSE-FAC.** | | | |
| **AGRI** | කෘෂි විද්‍යා පීඨය | 97,234,197.03 | 17,569,140.02 |
| **MGT** | කළමනාකරණ පීඨය | 77,640,393.42 | 5,529,212.00 |

| | | | |
|---|---|---|---|
| **ARTS** | කලා පීඨය | 64,744,380.40 | 24,583,328.10 |
| **SCI** | විද්‍යා පීඨය | 85,947,059.79 | 16,333,378.60 |
| | | **325,566,030.64** | **64,015,058.72** |
| **AHS-Senaka Bibile** | සේනක බිබිලේ ගොඩනැගිල්ල සඳහා යෝජිත දීර්ඝ කිරීම | 77,772,698.48 | |
| **ELTAELSE-DEP.** | | | |
| **CROP** | බෝග විද්‍යා අධ්‍යයනාංශය - කෘෂි විද්‍යා පීඨය | 13,862,685.08 | 1,167,936.79 |
| **SOIL** | පාංශු විද්‍යා අධ්‍යයනාංශය - කෘෂි විද්‍යා පීඨය | 10,103,958.68 | 5,814,440.72 |
| **SOCIO** | සමාජ විද්‍යා අධ්‍යයනාංශය - කලා පීඨය | 17,571,024.68 | - |
| **OPM** | මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයනාංශය - කළමනාකරණ පීඨය | 10,028,712.75 | 626,872.00 |
| | | **51,566,381.19** | **7,609,249.51** |
| **RA1-EQPGran** | ඉංජිනේරු පීඨය | 23,851,846.27 | 0 |
| **UBL** | විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධනය | 5,723,365.39 | 567,328.95 |
| **RA1- Dental Science** | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 19,963,767.20 | 0 |
| **MIE-ResultAr** | නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ල - GDP ඉංජිනියරින් | 72,993,497.69 | |
| **Additional Intake** | | 210,405,605.26 | |
| **RA1-EQPGran** | භූ විද්‍යා අධ්‍යයනාංශය | 6,770,599.54 | 13,219,250.00 |
| **RA1-EQPGran** | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 13,914,651.98 | 396,300.00 |
| **RA1- Dental Science** | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 20,000,000.00 | 0 |
| **IT** | කලා පීඨය | 26,375,486.25 | 14,036,790.25 |
| **OTS OFFICE EQUIPMENT** | | 29,000.00 | |
| **HRD** | | 117,950,672.07 | |
| **OTS STAFF PAYMENT** | | 17,723,387.40 | |
| **RA1-EQPGran** | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | | 12,923,102.00 |
| **එකතුව** | | **1,349,032,111.21** | **129,004,450.92** |

### 1.4.18 වෘත්තීය මාර්ගෝපදේශය

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සිසුන්ට ඔවුන්ගේ නිපුණතා අවබෝධ කර ගැනීමට සහ තම රැකියා නියුක්තිය සඳහා අත්‍යවශ්‍ය කුසලතා වර්ධනය කිරීම සඳහා සුදුසු, වෘත්තීය පියවරයන් සැලසුම් කිරීම අරබයා ඔවුන් පුහුණු කිරීමට උපකාර කරයි. යෝජිත විශේෂිත උපදේශන ඒකකය විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කරන තෙක් 2022 වර්ෂය තුළ, එම ඒකකය, සිසුන් වෙත මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ සිය සේවාවන් දීර්ඝ කර ඇත.

**2022 වර්ෂය තුළ සිදු කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ ක්‍රියාකාරකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 934 ප්‍රකාර ව 1 වන සහ 2 වන වසර සිසුන් සඳහා වෘත්තීය සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පිරිනමන ලදී.
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූලික මුදල් ප්‍රදාන යොදා ගනිමින් උපාධි ව්‍යවසාය 13ක් පිහිටුවන ලදී.
- ශිෂ්‍ය වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම සඳහා "වී ලීඩ්" නමැති ශිෂ්‍ය සමාජය පිහිටුවන ලදී.
- උපාධි අපේක්ෂකයින් සඳහා කෙටි කාලීන රැකියා අවස්ථා ලබා දීම සඳහා වැඩ කරන ශිෂ්‍ය සහයක වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.
- සිසුන්ට මනෝවිද්‍යාත්මක උපදේශන ලබා දී ඇත.
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ ෆෙස්බුක් පිටුවෙහි කාර්මික සහ උපාධි අධ්‍යයන අවස්ථා පිළිවෙළින් 670ක් සහ 32ක් පිළිබඳව දැන්වීම් පළ කරන ලදී.
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සම්බන්ධයෙන් යූටියුබ් නාලිකාව වෙත සම්මන්ත්‍රණ හයක් උඩුගත කරන ලදී.
- උපාධි අපේක්ෂකයින් සඳහා තනි පුද්ගල උපදේශන 188ක් ලබා දී ඇත.

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූලික මුදල් ප්‍රදාන යොදා ගනිමින් උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති අරබයා පහසුකම් සලසා දෙන ලදි.

### 1.4.19 ජාත්‍යන්තර කටයුතු

2022 වර්ෂය තුළ, පහත සඳහන් කාර්යයන් විශ්වවිද්‍යාලය විසින් එහි ජාත්‍යන්තර සබඳතා කාර්යාලය හරහා සිදු කර ගනු ලැබ ඇත.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා කාර්යාලය ජපානය, ඉන්දියාව, ජර්මනිය, බංග්ලාදේශය, රුසියාව, ඕස්ට්‍රේලියාව සහ එක්සත් ජනපදය වැනි විවිධ රටවල ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් 16ක් අත්සන් කිරීම සඳහා පහසුකම් සලසා ඇත.
- විදේශීය ආයතන සමඟ සහයෝගිතා වැඩසටහන් ආරම්භ කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර දූත සංචාර 12ක් සහ අන්තර්ජාල අතථ්‍ය රැස්වීම් 30ක් පවත්වන ලදී. ජාත්‍යන්තර සබඳතා කාර්යාලය විසින් උසස් අධ්‍යාපන අවස්ථා හා ශිෂ්‍යත්ව අවස්ථා සලසා දෙන ලද අතර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය තුළ "Erasmus +" වැනි වැඩසටහන් පිළිබඳ තොරතුරු ප්‍රචලිත කිරීමෙහිලා සහය විය.
- සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අධ්‍යයනය, පර්යේෂණය, අරමුදල්කරණය සම්බන්ධයෙන් සහ සහයෝගීතා අවස්ථා පිළිබඳ හඳුන්වා දීම සඳහා ජාත්‍යන්තර සබඳතා කාර්යාලය විසින් වැඩමුළු 25ක් සංවිධානය කරන ලදී.
- ජාත්‍යන්තර සහයෝගිතා පුළුල් කිරීම, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ප්‍රවර්ධනය කිරීම සහ ගෝලීය අධ්‍යාපන අවස්ථා සඳහා සිසුන් නිරාවරණය කිරීම යන අරමුණු පෙරදැරි ව විවිධ තානාපති කාර්යාල සමඟ අත්වැල් බැඳ ගනිමින් 2022 ජාත්‍යන්තර සතිය සඳහා සත්කාරකත්වය පිරිනමන ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙ හි පූර්ණ කාලීන ජාත්‍යන්තර උපාධි අපේක්ෂකයින් 44 දෙනෙකු සහ ජාත්‍යන්තර පශ්චාත් උපාධි සිසුන් 64 දෙනෙකු සිටී.

**2022 වර්ෂයේ දී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්**

| විශ්වවිද්‍යාලය/ පීඨය | කාර්ය භූමිකාව | සහයෝගිතා නියෝජිතායතනය | රට |
|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | කුන්මිං උද්භිද විද්‍යා ආයතනය සහ මිසූරි උද්භිද උද්‍යානය | චීනය, එක්සත් ජනපදය |
| | දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තිත කෘෂි ආහාර පද්ධතිය<br>තිරසාර ආහාර සහ කෘෂි කර්මාන්තය සඳහා ජෛව ආර්ථිකය<br>ආහාර සහ කෘෂිකර්මය සඳහා ජෛව විවිධත්ව සහ පරිසර පද්ධති සේවා | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂි විද්‍යා සංවිධානය | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂි විද්‍යා සංවිධාන නියෝජිත, මාලදිවයින සහ ශ්‍රී ලංකාව |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | සහයෝගී පර්යේෂණ<br>ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | බංග්ලාදේශ සෞඛ්‍ය වෘත්තීයවේදී ආයතනය | බංග්ලාදේශය |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | මැලේසියාවේ සරවක් විශ්වවිද්‍යාලය | මැලේසියාව |
| කලා පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | නිව් ඉන්ග්ලන්ඩ් විශ්වවිද්‍යාලය | ඕස්ට්‍රේලියාව |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | සහයෝගී පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීමේ අවස්ථා හඳුනා ගනිමින් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සහ සිසුන් හුවමාරු කර ගැනීම. | සවීතා දන්ත වෛද්‍ය විද්‍යාලය | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | අයිපීඑස් ඇකඩමි, ඉංජිනේරු විද්‍යා ආයතනය, ඉන්දෝර් | ඉන්දියාව |
| | අධ්‍යාපනය සහ පර්යේෂණ පිළිබඳ ලිපි ලේඛන, ශාස්ත්‍රීය ප්‍රකාශන සහ අධ්‍යයන තොරතුරු හුවමාරු කර ගැනීම. මෙය, අදාළ පාර්ශවවල පවත්නා ආයතන නීති රීති වලට අනුකූල ව සහ අදාළ රටවල් දෙකේ නීතිමය රාමුව තුළ සිදු කළ යුතු ය. | පිළිකා පර්යේෂණ - මැලේසියාව, සුබං ජය | මැලේසියාව |
| ඉංජිනේරු පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | අයිඅයිටී, බොම්බාය | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | අයිඅයිටී, ගුවහටි | ඉන්දියාව |

| | | | |
|---|---|---|---|
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ෆ්ලෙන්ස්බර්ග් ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය | ජර්මනිය |
| | ඒකාබද්ධ පර්යේෂණ, පර්යේෂණ ද්‍රව්‍ය හුවමාරුව, කාර්ය මණ්ඩල හුවමාරුව, විෂයමාලා සංවර්ධනය, ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය, ලුබෙක් | ජර්මනිය |
| | ඉංජිනේරු විද්‍යාපති ද්විත්ව උපාධි වැඩසටහන | ඕලු විශ්වවිද්‍යාලය | ෆින්ලන්තය |
| | පීඨ සාමාජිකයින් සහ පර්යේෂණ විද්වතුන් හුවමාරු කර ගැනීම සහ සහයෝගීතා පර්යේෂණ | භාරත් උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | මීජෝ විශ්වවිද්‍යාලය | ජපානය |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ඉන්දියානු තාක්ෂණ ආයතනය, මද්‍රාසිය | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ඉන්දියානු තාක්ෂණ ආයතනය, රූර්කි | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ඉන්දීය තාක්ෂණ ආයතනය, දිල්ලි | ඉන්දියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | මොස්කව් මෙට්රොපොලිටන් ගවර්නන්ස් යූරි ලුෂ්කොව් විශ්වවිද්‍යාලය | රුසියාව |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ඉන්දියානු තාක්ෂණ ආයතනය, ගුවාහටි | ඉන්දියාව |
| කළමනාකරණ පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | ටොන් ඩක් තං විශ්වවිද්‍යාලය | වියට්නාමය |
| වෛද්‍ය පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | කනෙක්ටිකට් විශ්වවිද්‍යාලය | එක්සත් ජනපදය |
| විද්‍යා පීඨය | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | නිගාටා විශ්වවිද්‍යාලය | ජපානය |
| | ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරුව | යුනෙස්කෝ | |

## 2022 වසරේ දී පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

| වැඩසටහන / තේමාව | සංවිධානය | පවත්වන ලද දිනය |
|---|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර හෙද පර්යේෂණ සැසිය - 2022 | හෙදවේද අධ්‍යයනාංශය | ජූනි 16 - 17 වන දින |
| 10 වන ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව | කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | ජනවාරි 27 වන දින |
| විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | අගෝස්තු 06 වන දින |
| කෘෂි විද්‍යාව පිළිබඳ 9 වැනි ජාත්‍යන්තර සමුළුව (ඇග්‍රිකෝ) - 2022 | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය සමඟ අධ්‍යයන සහයෝගීතාවය සහිත ව කෘෂි විද්‍යා පීඨය | අගෝස්තු 11 - 12 වන දින |
| 31 වන ආසියානු ආර්ථික සම්මන්ත්‍රණය සහ ශිෂ්‍ය සමුළුව | කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, කෘෂි විද්‍යා පීඨය, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, ජපානයේ සාගා විශ්වවිද්‍යාලය, ලෝක ආර්ථික හා දේශපාලන ආයතනය, චීන සමාජ විද්‍යා ඇකඩමිය, චීනය, තායිලන්තයේ කසෙට්සාට් විශ්වවිද්‍යාලය සහ දකුණු කොරියාවේ වොන්නම් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගය සහිත ව | නොවැම්බර් 11 වන දින |
| ජාත්‍යන්තර උපාධි අපේක්ෂකය මූල්‍ය පර්යේෂණ සමුළුව - 2022 | ශ්‍රී ලංකා මූල්‍ය සංගමය විසින් සංවිධානය කරනු ලැබ, ව්‍යාපාර මූල්‍ය අධ්‍යයනාංශය විසින් සත්කාරකත්වය දැරිණි. | නොවැම්බර් 25 වන දින |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සම්මේලනය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ඔක්තෝබර් 28, 29, 30 වන දින |
| වාර්ෂික සම්මේලනය | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නොවැම්බර් 18 වන දින |
| තිරසාර සංවර්ධනය සහ පශ්චාත් කොවිඩ් අභියෝග සඳහා විද්‍යා අධ්‍යාපනය | විද්‍යා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | අගෝස්තු 06 වන දින |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්මේලනය 2022 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දෙසැම්බර් 16 වන දින |

2022 වසර තුළ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර පිළිබඳ තොරතුරු

| පීඨය | වැඩසටහනේ නම | රට | පැමිණි ගණන |
|---|---|---|---|
| කෘෂි විද්‍යා | ගෞරවනීය ආගන්තුක මහාචාර්ය (මහාචාර්ය ඇලිස්ටෙයාර් හෙදරින්ටන්) | එක්සත් රාජධානිය | 1 |
| | ආරාධිත දේශනය (සහකාර මහාචාර්ය කයිලාස් අහිරේ) | ඉන්දියාව | 1 |
| | ගෞරවනීය බාහිර කථිකාචාර්ය (ආචාර්ය ශුංසුකේ කුරිහාර) | ජපානය | 1 |
| සම සෞඛ්‍ය විද්‍යා | භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය | ඉන්දියාව | 1 |
| | වැඩමුළුව | ඉන්දියාව | 1 |
| | අඩු හා මධ්‍යම ආදායම් ලබන රටවල ඖෂධවල ගුණාත්මක භාවිතය ඉහළ නැංවීම සඳහා අන්තර් වෘත්තීකවේදී සහයෝගීතාව | ඕස්ට්‍රේලියාව | 2 |
| දන්ත වෛද්‍ය විද්‍යා | සායනික භාවිතයේ දී මූලික විද්‍යාවන් ඒකාබද්ධ කිරීම | නවසීලන්තය | 1 |
| ඉංජිනේරු | "කාබන් ග්‍රහණය, උපයෝජනය සහ ගබඩා කිරීමේ ශිල්ප විධි සහ පවතින නිශ්චිත ව්‍යුහයන් සඳහා ඒවා යොදා ගැනීම" පිළිබඳ සම්මන්ත්‍රණය | ජපානය | 1 |
| වෛද්‍ය විද්‍යා | ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ විද්‍යාලයේ සාමාජිකයින් සහ ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා දෙමුහුන් මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණයක් ලෙස රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ අධි පුපුරණ ද්‍රව්‍ය ආශ්‍රිත මරණ පිළිබඳ හමුදා අධිකරණ වෛද්‍ය ව්‍යාධිවේදය සහ පශ්චාත් මරණ පරීක්ෂණ පිළිබඳ වැඩමුළුව | බෙල්ජියම | 1 |
| | ආහාර ගැනීමේ අක්‍රමිකතා, ඉගෙනීමේ ආබාධ කළමනාකරණය සහ ලිංගික චිකිත්සාව පිළිබඳ යාවත්කාලීන වැඩමුළුව | ඕස්ට්‍රේලියාව | 2 |
| | වෛද්‍ය අනුරූපණකරණය | එක්සත් රාජධානිය | 1 |
| විද්‍යා | රත්න විද්‍යාව | ස්විට්සර්ලන්තය | 1 |
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වාර්ෂික සම්මේලනය | | |
| | වාර්ෂික සම්මේලනය | නෙදර්ලන්තය | 1 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වාර්ෂික සම්මේලනය | එක්සත් රාජධානිය | 1 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වාර්ෂික පර්යේෂණ සම්මේලනය - 2022 | නෝර්වේ | 2 |

## 1.4.20 ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධනය

### වැඩ කරන ශිෂ්‍ය සහයක වැඩසටහනක් සහ ඊට විශේෂිත අරමුදලක් පිහිටුවීම

විවිධ අංශවල උපාධි අපේක්ෂකයින් සඳහා අර්ධකාලීන රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා ක්‍රියාකාරී ශිෂ්‍ය සහකාර වැඩසටහන පිහිටුවන ලදී. සිසුන්ට මසකට උපරිම පැය 20ක් සඳහා පැයකට වැටුප් ගෙවන අතර, ඒ සඳහා වෙන ම අරමුදලක් පිහිටුවා ඇත.

### සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පහසුකම්

විශ්වවිද්‍යාලය අභ්‍යන්තර උපාධි අපේක්ෂක ජනගහනයෙන් 65%කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සපයන අතර කාර්ය මණ්ඩලය සඳහා ශාලා 23ක් සහ නිල නිවාස 412ක් ඇත. විජේවර්ධන ශාලාවේ නඩත්තු කටයුතු අවසන් කර භාර දුන් අතර සිසුන්ගේ නවාතැන් සඳහා වෙන ම වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී. ජයතිලක ශාලාවේ සහ විජේවර්ධන ශාලාවේ ගොඩනැගිලි අංශ දෙකක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර සිසුන්ට නවාතැන් ගැනීම සඳහා පවරන ලදී. ජේම්ස් පීරිස් සහ අරුණාචලම් ශාලා ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත.

### ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන ක්‍රම පද්ධති පිහිටුවීම

ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය පද්ධති සම්බන්ධීකරණය කිරීම සඳහා ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය කාර්යාලයක් පිහිටුවන ලදී. අදාළ අංශ, ඒකක සහ ක්‍රියාකාරී ක්‍රම පද්ධති මඟින් සිදු කරනු ලබන කටයුතු

මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධනය උපදේශක මණ්ඩලය ඇති කරන ලදී.

**කාර්ය මණ්ඩල සුබසාධනයය සහ යහජීවනය පිළිබඳ උපදේශක කමිටුවක් පිහිටුවීම**

විශ්වවිද්‍යාලය එහි කාර්ය මණ්ඩලයේ සුබසාධනයය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්ය මණ්ඩල සුබසාධනය සහ යහජීවන උපදේශක කමිටුව පිහිටුවන ලදී. කාර්ය මණ්ඩල සුබසාධනයය සහ යහපැවැත්ම සඳහා සැලැස්මක් සකස් කිරීම සහ එය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා කමිටුව මාසික ව රැස්වේ. අදාළ විශ්වවිද්‍යාල ආයතනවල සුබසාධනය සහ යහජීවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා මග පෙන්වීම සහ අධීක්ෂණය කිරීම ද එමගින් සිදු කරයි. කාර්ය මණ්ඩල සුබසාධනය ප්‍රතිපත්ති ද සැලකිල්ලට ගනු ලබන අතර, සුබසාධනය සහ යහජීවන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයෙන් ප්‍රතිපෝෂණ ලබා ගනී. මාසික රැස්වීම්වල දී, සාමාජිකයින් තම අංශ විසින් සිදු කරන ලද සුබසාධනය සහ යහජීවන ක්‍රියාකාරකම් පිළිබඳව යාවත්කාලීන කරයි. කමිටුවේ සාර්ථකත්වය මත සුබසාධනය සහ යහජීවන කාර්යාලය පිහිටුවීම සලකා බලනු ලැබේ.

**සිසුන් සඳහා ශිෂ්‍යත්ව**

මහාචාර්ය වී. ගුණවර්ධන මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීම සඳහා ශ්‍රී ලංකා රු. මිලියන 20ක් පරිත්‍යාග කර ඇත. ශිෂ්‍යත්ව සඳහා අරමුදල් සැපයීම පිණිස එහි පොලියෙන් 80%ක් යොදා ගනිමින් එම අරමුදල විවිධ පීඨ අතර බෙදා දෙන ලදී.

**විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සමීපත ම පවුලේ සාමාජිකයන් සඳහා යුහුසුළු ශල්‍ය සේවා**

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සමීපත ම පවුලේ සාමාජිකයන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විවිධ අංශවල රැඳී සිටින කාලය අවම කිරීම සඳහා වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය විසින් ඔවුන් සඳහා කඩිනම් ශල්‍ය සේවා යෝජනා කරන ලදී.

**රුධිර පීඩනය මැනීමේ වැඩසටහන**

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සමීපත ම පවුලේ සාමාජිකයන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විවිධ අංශවල රැඳී සිටින කාලය අවම කිරීම සඳහා වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය විසින් ඔවුන් සඳහා කඩිනම් ශල්‍ය සේවා යෝජනා කරන ලදී.

**අග්‍රහාර රක්ෂණ ක්‍රමය**

ජාතික රක්ෂණ භාර අරමුදල හා සම්බන්ධ ව විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා රක්ෂණ ක්‍රමයක් ප්‍රදානය කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. 2022 දෙසැම්බර් මස 31 වන දින වන විට, මෙම යෝජනා ක්‍රමය සඳහා සේවකයින් 2299 (70%) ක් ලියාපදිංචි වී ඇති අතර 2022 වසර සඳහා සාමාජිකයින් 120 ක් අලුතින් යෝජනා ක්‍රමයට සම්බන්ධ වී ඇත.

**දුක්ගැනවිලි කමිටුව**

විශ්වවිද්‍යාලයේ දැනට සේවයෙහි නිරත ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සාමාජිකයින් සහ මෑතක දී විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් වෙත නව පත්වීම් ලබා දෙමින් දුක්ගැනවිලි කමිටුවේ සංයුතිය පුළුල් කරන ලදී. විශ්වවිද්‍යාල පාලක සභාව, එකී කමිටු සාමාජිකත්වය සඳහා එහි සංයුතිය අනුමත කළේ, දුක්ගැනවිලි කමිටුවේ නීර්ණේය විෂය නිර්දිෂ්ට පරීක්ෂා කිරීමෙන් පසුව ය.

**1.4.21 ශාරීරික සුවතා අධ්‍යාපනය**

2019 සහ 2020 යන වර්ෂ සඳහා වර්ණ සම්මාන උළෙල 2022 සැප්තැම්බර් මස 19 වන දින, ඉංජිනේරු පීඨයේ ඊ.ඕ.ඊ. පෙරේරා රඟහලේ දී පවත්වන ලදී. ක්‍රීඩකයන් 145 දෙනෙකු සහ ක්‍රීඩිකාවන් 70 දෙනෙකු, ඔවුන් ජාතික

හා ජාත්‍යන්තර වශයෙන් දැක් වූ ජයග්‍රහණ වෙනුවෙන් විශ්වවිද්‍යාල වර්ණ ලබා ගත් අතර ක්‍රීඩකයෝ 141 දෙනෙකු සහ ක්‍රීඩිකාවෝ 76 දෙනෙකු සිය ජයග්‍රහණ සඳහා අර්ධ වර්ණ ලබා ගත්හ.

ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ තනි බලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශයට හිමි වන අතර, ශිෂ්‍ය ජනගහනයේ ශාරීරික හා මානසික සෞඛ්‍යය වැඩි දියුණු කිරීම මෙන් ම තම ජීවිත කාලය පුරා ම ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා සිසුන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ද පවතී. විශ්වවිද්‍යාලය, එහි සිසුන් සඳහා තරගකාරී ක්‍රීඩා 26ක් සහ විනෝදාත්මක ක්‍රීඩා පහක් තරග බිමට ගෙන එයි.

වසර පුරා, ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් ක්‍රීඩා කණ්ඩායම් සඳහා පෝෂණය, ශාරීරික යෝග්‍යතාවය සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් සමඟින් සියලුම ක්‍රීඩා විෂයන් සඳහා නිතිපතා පුහුණු සැසි පවත්වයි. වෛද්‍ය පීඨයට සම්බන්ධ වෙමින් ව්‍යායාම හා ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව ද සාර්ථක ව පවත්වන ලදී. ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන ශාරීරික අධ්‍යාපන උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දේශන මාලා සහ ප්‍රායෝගික සැසි ලබාදෙමින් ස්වකීය දායකත්වය එම අධ්‍යයනාංශය විසින් ලබා දී ඇත. මීට අමතර ව, සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 01 සහ 03 යන වසරවල භෞත චිකිත්සක කණ්ඩායම් සඳහා පුනරුත්ථාපන අභ්‍යාස පැවැත්වීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවේ සහය සැලසිණි.

**ක්‍රීඩා ඉසව්**

- අන්තර් පීඨ නවකයන්ගේ ක්‍රීඩා තරගාවලිය 2022 දී සාර්ථක ව පවත්වන ලදී.
- අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා ශූරතාවලිය සඳහා හොඳ ම දස්කම් දක්වන ක්‍රීඩකයින් තෝරා ගැනීම පිණිස 2022 අන්තර් පීඨ ක්‍රීඩා තරගාවලිය පවත්වන ලදී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2022 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ 6 වැනි ස්ථානයට පත් විය.
- පිරිමි කණ්ඩායම සමස්ත 4 වන ස්ථානය සහ කාන්තා කණ්ඩායම සමස්ත 6 වන ස්ථානය ලබා ගැනීමට සමත් විය.
- අන්තර් විශ්වවිද්‍යාල පැසිපන්දු ශූරතාවලිය - 2022 සඳහා විශ්වවිද්‍යාලය සත්කාරකත්වය දැක්වීය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එක් චෙස් ක්‍රීඩකයෙක් 2022 ආසියා-ඕෂනියා විශ්වවිද්‍යාල චෙස් ශූරතාවලියේ දී ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කළේ ය.
- 2019 සහ 2020 යන වර්ෂ සඳහා වර්ණ ප්‍රදානය කිරීමේ උත්සවය පවත්වන ලදී.

**1.4.22 සෞඛ්‍ය සේවා**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශක්තිමත් අධ්‍යයන වැඩසටහන් සහ පර්යේෂණ මුලපිරීම් සඳහා ප්‍රසිද්ධියක් උසුලන ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛත ම විශ්වවිද්‍යාලයක් වේ. බෝ නොවන රෝග පිළිබඳ විශ්වවිද්‍යාලීය වැඩසටහන මඟින් වෛද්‍ය, මහජන සෞඛ්‍ය, වසංගත රෝග සහ මූලික විද්‍යාව ඇතුළු විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්, බෝ නොවන රෝග වල බලපෑම අවම කිරීමේ පොදු ඉලක්කයක් කරා වැඩ කිරීම උදෙසා එක් කරයි. මෙම රෝගවලට පාදක වන හේතු සහ අවදානම් සාධක වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම සහ නව මැදිහත්වීම් හා ප්‍රතිකාර පරීක්ෂා කර බැලීම සහ සෞඛ්‍ය සම්පන්න හැසිරීම් ප්‍රවර්ධනය කිරීම පිණිස දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහන් සැපයීම මෙම ව්‍යායාමයෙහි ලා ඇතුළත් විය.

**1.4.23 පරිසරය සුරැකීමේ ක්‍රියාකාරකම්**

- ලෝක පරිසර දිනයේ දී ප්‍රමුඛ පෙළේ විද්වතුන්, පර්යේෂකයන් සහ රජයේ වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් "හරිත නගර සැලසුම් කිරීම" පිළිබඳ අන්තර්ජාල වෙබ් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
- පරිසර කළමනාකරණ පද්ධති පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීම සහ ඒවා නඩත්තු කිරීම සඳහා කළ යුතු දෑ පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා පාරිසරික කළමනාකරණ පද්ධති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කලා පීඨයේ සහ කළමනාකරණ පීඨයේ දී පවත්වන ලදී.
- පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය පරිසර හානියට දායක වන තත්ත්වයන් හඳුනා ගැනීමට සහ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට පීඨ මට්ටමේ පාරිසරික කළමනාකරණ කමිටු සමඟ කටයුතු කළේ ය.

- විශ්වවිද්‍යාලය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යය වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා දහන යන්ත්‍රයක් මිලදී ගැනීමට පාරිසරික තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය නිර්දේශ කළේ ය.

### 1.4.24 සමාජයට සහ ජාතික සංවර්ධනයට දායක වීම

- ප්‍රධාන සායනික විෂයන් ආවරණය කරමින් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ තෘතීයික සත්කාරක සේවය විශ්වවිද්‍යාලය විසින් සපයනු ලබන අතර, සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල ළමා රෝග සත්කාර සපයයි.
- දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල වෙත දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම රෝගීන් යොමු කෙරෙන මධ්‍යස්ථානයක් වන අතර, පශු වෛද්‍ය ශික්ෂණ රෝහල දිවයිනේ එවැනි එක ම රෝහල වේ.
- ඉගැන්වීම හා පුහුණුව සඳහා පමණක් නොව ප්‍රජාව වෙත සේවා සැපයීම පිණිසත්, රැකියා අවස්ථා සලසා දීම පිණිසත් විශ්වවිද්‍යාල ගොවිපළවල් හතරක් යොදා ගැනේ.
- කර්මාන්ත ක්ෂේත්‍රය සඳහාත්, රෝගීන් සහ පර්යේෂණ අරමුණු සඳහාත් පරීක්ෂණ පහසුකම් සපයන රසායනාගාර විශ්වවිද්‍යාලය සතු ව ඇත.
- පාසල් ළමුන් සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගනිමින් අධ්‍යාපනය සහ කුසලතා පුහුණු කිරීම් අළලා බාහිර වැඩසටහන් පවත්වනු ලැබේ.
- පළපුරුදු අධ්‍යයන කාර්ය මණ්ඩලය ජාතික වශයෙන් කමිටු සභාපතිවරුන් සහ බලගතු සංවිධානවල නායකයින් ලෙස සේවය කරයි.

### 1.4.25 සමාජ සේවා

- "හන්තාන ප්‍රතිහරිතකරණයඃ හායනයට පත් භූමි ප්‍රතිස්ථාපනය" නමැති ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ජෛව විවිධත්වය, කාබන් ප්‍රතිග්‍රහණය, ජල පෝෂණය සහ පාංශු ආරක්ෂණය වැනි පරිසර පද්ධති සේවා වැඩි දියුණු කිරීම අරබයා ශ්‍රී ලංකාවේ පාරිසරික වශයෙන් ආරක්ෂිත හන්තාන ප්‍රදේශයේ හායනය වූ ඉඩම් හෙක්ටයාර 2ක් ප්‍රතිසංස්කරණය කිරීමයි.
- විද්‍යා පීඨය සහ විශ්වවිද්‍යාල මධ්‍යස්ථානයේ පරිසර තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ අධ්‍යයනාංශය සහ ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සහයෝගයෙන් යුතු ව මෙම ව්‍යාපෘතිය සංවිධානය කරන ලදී.
- ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ, දේශීය ගස් විශේෂවල පැළ 620ක් හායනයට පත් වූ හන්තාන බිම් පෙදෙසෙහි හෙක්ටයාර 1ක භූමි ප්‍රමාණයක් තුළ රෝපණය කරන ලදී.
- විශ්වවිද්‍යාල ප්‍රජාව, වන සංරක්ෂණ අධ්‍යයනාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා පරිසර විද්‍යා සංගමය සහ ප්‍රාදේශ වාසි ජනතාව නියෝජනය කරමින් ස්වේච්ඡා සේවකයන් 120 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

## 1.5 අසාර්ථකත්වයන් සහ සාධාරණීකරණයන්

- **කාර්ය මණ්ඩල සේවා සෝදාපාළුව සහ අරමුදල් කප්පාදුව**
  ආර්ථිකය තුළ සිදු වූ පසුබෑම හේතුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් කීප දෙනෙක් විදේශ රැකියා අපේක්ෂාවෙන් විශ්වවිද්‍යාලය හැර ගිය හ. මීට අමතර ව, නව කාර්ය මණ්ඩල බඳවා නොගැනීමට රජය ගෙන ඇති තීරණය නිසා තත්ත්වය තව දුරටත් නරක අතට හරවමින් උපාධි පාඨමාලා වැඩසටහන් පැවැත්වීම දුෂ්කර බවට පමුණුවා ඇත.

- **යටිතල පහසුකම් සංවර්ධනය**
  2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍ය බාධා සහ විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින රෙගුලාසි හේතුවෙන් සිදු නොවූ අතර එය විශ්වවිද්‍යාල අධ්‍යයන වැඩසටහනේ සඵලතාවය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කළේ ය.

- **අධ්‍යයන වැඩසටහන් සහ විභාග ප්‍රමාද වීම**
  කොවිඩ් - 19 වසංගතය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් 2022 වර්ෂය සඳහා නියමිත අධ්‍යයන වැඩසටහන් සහ විභාග ප්‍රමාද විය. අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත දේශන පවත්වන ලද අතර, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ලෙස අධ්‍යයන වාර අවසන් විභාග පවත්වන ලදී.

- **බාධාවට පත් පර්යේෂණ ක්‍රියාකාරකම්**
  සිසුන් සඳහා වූ පර්යේෂණ කටයුතු වලට කඩින් කඩ බාධා ඇති වූ අතර එය, උපාධි නිමැවුම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය.

- **සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා අරමුදල් නොමැතිකම**
  ප්‍රාග්ධන වැඩ සඳහා අතිරේක බඳවා ගැනීම් යටතේ වෙන් කරන ලද අරමුදල්, වැඩි ශිෂ්‍ය ප්‍රමාණයක් ඇතුළත් කර ගැනීමට සරිලන යටිතල පහසුකම් සහ පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් තවමත් ලැබිය යුතු ව පවතී.

- **සේවක සංඛ්‍යාවට අදාළ තනතුරු අනුමත කිරීම ප්‍රමාද වීම**
  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ජාත්‍යන්තර සබඳතා කාර්යාලයට ඊට අවශ්‍ය කාර්ය මණ්ඩලයේ සේවක තනතුරු ලබා ගැනීමට නොහැකි විය.

- **යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමාද වීම**
  ඉඩ පහසුකම් පිළිබඳ පවත්නා උග්‍ර ගැටලු විසඳීම සඳහා 2018 වසරේ දී කළමනාකරණ පීඨයේ වර්ග අඩි 60,000 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා වූ නමුත් අමාත්‍ය මණ්ඩල මට්ටමේ දී එම අරමුදල් යෝජනාව ප්‍රතික්ෂේප විය. සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීම සහ නව උපාධි පාඨමාලා පිරිනැමීම සඳහා ප්‍රධාන පීඨ සැලැස්ම ක්‍රියාත්මක කිරීම මෙමගින් ප්‍රමාද වී ඇත.

- **ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීම**
  සියලු "AHEAD"(උසස් අධ්‍යාපන පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම කඩිනම් කිරීමේ) ප්‍රදාන යටතේ ලැයිස්තුගත කර ඇති, නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් අවසන් කරන ලද ඇතැම් ප්‍රසම්පාදන කටයුතු, මිල ඉහළ යාම, රජය විසින් පනවන ලද ආනයන සීමා කිරීම්, විදේශ මුදල් අගය ඉහළ යාම සහ රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අවලංගු කිරීමට සිදු විය.

- **නවෝත්පාදක නිපැයුම්වල වාණිජකරණය ප්‍රමාද වීම**
  "AHEAD" ප්‍රදාන යටතේ විවිධ පීඨවල බොහෝ ප්‍රදානලාභීන් විසින් නිපද වූ නව නිපැයුම් වාණිජකරණය කිරීම, සමාලෝචිත වර්ෂය තුළ ඊට අදාළ ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැත.

- **ආයතනික සහ වැඩසටහන් සමාලෝචනය කල් තැබීම**
  කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සංශෝධිත ආයතනික සමාලෝචන අත්පොත නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2021 දී පැවැත්වීමට නියමිත ආයතනික සමාලෝචනය කල් දමා ඇත. ඉංජිනේරු විද්‍යාවේදී උපාධි වැඩසටහන පිළිබඳ සමාලෝචනය ද මේ නිසා කල් දැමීමට සිදු වී ඇත.

- **දීර්ඝ සේවා කාල වෙනුවෙන් සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවය කල් දැමීම**
  විශ්වවිද්‍යාලයේ වසර 25, 30, 35 සහ 40 යනා දී කාල පරිච්ඡේද මුළුල්ලේ සේවය කළ අනධ්‍යයන සේවක සේවිකාවන් වෙනුවෙන් දීර්ඝ සේවා කාල සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවය මූල්‍යමය අවහිරතා මත නොපැවැත්විණි.

## 1.6 අනාගත සැලසුම්

- ස්වයං අගැයුම් වාර්තා සහ ඊට අදාළ සාක්ෂි 2023 මාර්තු මස 31 වන දිනට ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරයි. 2021 දී පැවැත්වීමට නියමිත ව තිබූ ආයතනික සමාලෝචනය කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සහ සංශෝධිත ආයතනික සමාලෝචන අත්පොත සැකසීමේ ප්‍රමාදය හේතුවෙන් කල් දමන ලදී. ස්වයං ඇගයීම් වාර්තාව හා ඊට අදාළ සාක්ෂි පිළියෙළ කිරීම සඳහා නිර්ණායක 10 ක් යටතේ කමිටු 10ක් පත් කෙරේ.

- අයවැය සීමා කිරීම් හේතුවෙන් විශ්වවිද්‍යාල අනධ්‍යන සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය අත්හිටුවීමට සිදු වේ. අනධ්‍යයන තනතුරු පුරප්පාඩු 293ක් ඇත. (2023.12.31 වන දිනට සේවකයන් 45 දෙනෙකු විශ්‍රාම ගැනීම ද සහිත ව) කෙසේ වෙතත්, සීමා ඉවත් කළ වහා ම බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වනු ඇත.

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් එල්ල කළ අවිනිශ්චිත ආර්ථික පරිසරය හේතුවෙන් 2022 වර්ෂයේ දී යටිතල පහසුකම් ආශ්‍රිත මිල දී ගැනීම් කීපයක ප්‍රමාද වීම් ආයතනය අත් වින්දේ ය. මෙම ගැටලු බොහොමයක් විසඳෙමින් පවතින අතර 2023 දී අදාළ මිල දී ගැනීම් සම්පූර්ණ කිරීමට අපට හැකි වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

- දීර්ඝ කාලීන තිරසාරත්වය සඳහා කාර්යක්ෂමතාව සහ සේවා තත්ත්වය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. තිරසාර සංවර්ධන ප්‍රතිපත්තිවලට අනුකූල ව පරිසර හානිය ආරක්ෂා කිරීම හා අවම කිරීම සඳහාත්, ඒ පිළිබඳව සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහාත් සියලු උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතු ය.

- විශ්වවිද්‍යාලයේ සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා රැකියා ස්ථානයේ සිට ම ලබන සේවාස්ථ පුහුණුවක අවම වශයෙන් එක් සැසියක්වත් ලබා දීමට සැලසුම් කර ඇත.

- බහුවිධ විෂයික සහ බහු ආයතනික පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම උදෙසා දේශීය හා විදේශීය ප්‍රදාන සඳහා අයදුම් කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කරනු ලැබේ.

- ආරක්ෂාව සහතික කිරීම සඳහාත්, පොත් තොග සම්බන්ධයෙන් කලින් කල කෙරෙන සත්‍යාපන ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහාත් රේඩියෝ සංඛ්‍යාත හඳුනා ගැනීමේ විධික්‍රමය පුස්තකාලය තුළ හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

- 2023 නොවැම්බර් මස අග භාගයේ දී, ජාත්‍යන්තර සබඳතා කාර්යාලය විසින් "IPURSE" නමැති වැඩසටහනට සමගාමී ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ “පේරාදෙණිය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර සතිය” සංවිධානය කරනු ලබයි. මෙය, බොහෝ ජාත්‍යන්තර හවුල්කරුවන් ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමටත්, සහයෝගිතාව පුළුල් කර ගැනීමටත්, එකිනෙක ආයතන අතර අධ්‍යයන අවස්ථා වර්ධනය කර ගැනීමටත්, ජාත්‍යන්තර තලය තුළ පර්යේෂණ සහයෝගිතා පුළුල් කර ගැනීමටත් එකට ඒකරාශී වන මහඟු අවස්ථාවක් වනු ඇත.

- අදාළ සියලු අංශ, කාර්ය මණ්ඩලය සහ සිසුන් සම්බන්ධීකරණය කරමින් හරිත විශ්වවිද්‍යාල සංකල්පය ආරම්භ කර පවත්වා ගෙන යාම.

- විශ්වවිද්‍යාලය සඳහා අරමුදල් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා පශ්චාත් උපාධි වැඩසටහන්, උපදේශන කටයුතු සහ පර්යේෂණ පුළුල් කිරීමට සැලසුම් කීපයක් ගෙන ඇත.

- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙළඳපල මත පදනම් වූ නව තේමාත්මක උපාධි වැඩසටහන් හඳුන්වා දීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. 2023 දී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පහත සඳහන් උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.
    - ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
    - මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන

- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2023 දී පහත දැක්වෙන පාඨමාලා ඉදිරියට ගෙන යාමට ද අරමුණු කර ගනු ලැබ ඇති අතර, ඒවා තවමත් විශ්වවිද්‍යාලය තුළ සමාලෝචනය කෙරෙමින් අදාළ පාර්ශව අතර හුවමාරු මට්ටමේ පවතී.
    - මුඛ වෛද්‍ය විද්‍යාව සහ මුඛ විකිරණවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය - සමාලෝචන හුවමාරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත.
    - වෛද්‍ය රසායනාගාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය - අධ්‍යයන සංවර්ධන සහ සැලසුම් සම්පාදන කමිටුව වෙත යවා ඇත.
    - මහජන සෞඛ්‍ය පරිපාලන විද්‍යාපති උපාධිය - මෙම උපාධි වැඩසටහන සංවර්ධනය කර චීන සිසුන්ට පිරිනමනු ලැබේ,

- කළමනාකරණ පීඨය නව උපාධි පාඨමාලා පහක් සඳහා අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරයි: ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය, මූල්‍යකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය, සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධිය සහ ව්‍යාපාර විශ්ලේෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය.

- මානසික ව පීඩිත තත්වයන් සහිත සිසුන් සඳහා අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම.

- විශ්වවිද්‍යාලය සඳහා උද්‍යාන අලංකරණය පිළිබඳව ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම.

- 2023 වර්ෂය අවසන් වන විට, කඩ  කිරීම් පිළිබඳ ලිපි ගොනු "ශුන්‍ය" තත්වයට ගෙන ඒම සඳහා, ඉතා පැරණි ගිවිසුම් කඩ කළ අයගේ ලිපිගොනු සියල්ල ඉවත් කිරීමටත්, ගිවිසුම් කඩකරන්නන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂය විශ්වවිද්‍යාලයට අයකර ගැනීමටත් කටයුතු කෙරේ. (ප්‍රමාද වැඩ රාජකාරි නිම කිරීම)

- විශ්වවිද්‍යාලයට සැලකිය යුතු ආදායමක් ගෙන දෙන විශ්වවිද්‍යාල ආගන්තුක නිවාස, ලාභ ලබන ස්ථාන බවට පත් කිරීම.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියාපටිපාටි නංවාලීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම හා බැඳි පද්ධති සහ පාලන විධි සමාලෝචනය කර ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම හරහා ස්වකීය පරමාර්ථ තවදුරටත් පුළුල් කිරීමට විගණන හා කළමනාකරණ කමිටුව සැලසුම් කරයි. තව ද, අභ්‍යන්තර විගණන අංශයට එහි කාර්යයන් හා කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටු කිරීම පිණිස මානව සම්පත් සඳහා වූ ප්‍රතිපාදන වැඩි කරන ලෙස ද ඉල්ලීමක් කෙරේ.

- ලොව මොනයම් හෝ ස්ථානයක සේවය කළ හැකි නායකත්ව ගුණාංග සහිත කායික ව හා මානසික ව සමබර උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා සියලුම පීඨ ඉලක්ක කර ගනිමින් ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ නිර්විෂයානුබද්ධ විෂයන් හඳුන්වා දීමට ශාරීරික අධ්‍යාපන අංශය සැලසුම් කරයි.

- කාන්තාවන් 600 දෙනෙකු වෙනුවෙන් පහසුකම් සැලසිය හැකි නේවාසිකාගාරයක් ඉදිකිරීමට ස්ථානයක් හඳුනා ගෙන ඇති අතර, ඒ සඳහා පත්කළ කමිටුව හරහා ඊට අදාළ කටයුතු කඩිනමින් ඉටු කරනු ඇත.

- දියේ ගිලීම වැළැක්වීම සහ ආරක්ෂිත පිහිනුම් ශිල්පීය ක්‍රම ඉලක්ක කර ගනිමින් හෙදවේද අධ්‍යයනාංශය සහ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ මූලික පියවරක් ලෙස හෙදවේද අධ්‍යයනාංශයට අනුබද්ධ තුවාල වැළැක්වීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට සැලසුම් කිරීම.

- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා වූ ජංගම සායනයක් පිහිටුවීමට සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයනාංශය සැලසුම් කරයි.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේද අධ්‍යයනාංශය, ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- ප්‍රජා ගුවන් විදුලි නාලිකාවක් ආරම්භ කිරීම.

- විශ්වවිද්‍යාලය සඳහා තිරසාර සැලැස්මක් සකස් කිරීම.

- සිසුන්, කාර්ය මණ්ඩලය සහ ප්‍රජාව සමග නිර්මාණාත්මක වැඩ බෙදා ගැනීම සඳහා කලා පීඨයේ පීඨ දිනයක් සංවිධානය කිරීම. උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සම්පූර්ණ කරන ලද සිසුන්ට මේ සඳහා ආරාධනා කෙරෙනු ඇත.

- දෙවන වසර හැර අනෙකුත් සියලුම සිසුන් සඳහා නේවාසික නවාතැන් පහසුකම් ලබා දීමට බලාපොරොත්තු වන අතර, සෑම ශාලාවකම ආබාධිත සිසුන් සඳහා ප්‍රමාණවත් කාමර පහසුකම් ඇති කිරීම.

- **සිදු කෙරෙමින් පවත්නා තත්ත්ව සහතිකායන කටයුතු**

  - විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති සකස් කර සනාතන සභා අනුමැතිය සඳහා යොමු කෙරේ.
  - තත්ත්ව සහතිකායනය තුළ ශිෂ්‍ය සහභාගිත්වය පිළිබඳ ප්‍රතිපත්තිය.
  - අධ්‍යයන පුහුණු කටයුතු හුවමාරුව පිළිබඳ ප්‍රතිපත්තිය.
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙ හි රහස්‍යතා ප්‍රතිපත්තිය.
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙ හි සමාජ මාධ්‍ය ප්‍රතිපත්තිය.
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙ හි තොරතුරු, සන්නිවේදන සහ තාක්ෂණ ප්‍රතිපත්තිය.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති යටතේ සැදෙමින් පවත්නා සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි**

  සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පාලක සභාව අනුමත කළ විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති 16ක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

- **සිදු කෙරෙමින් පවත්නා වෙනත් තත්ත්ව සහතිකායන කටයුතු**

  - අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම පද්ධතියක් ස්ථාපිත කිරීම.

  - ශිෂ්‍ය ප්‍රඥප්තිය සංවර්ධනය කිරීම.

  - ඉගැන්වීමේ සමපදස්ථ ඇගයීම/නිරීක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

  - "පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ සමපදස්ථ නිරීක්ෂණ පිළිවෙත් පිළිබඳ සමාලෝචනය" සහ "ඉගැන්වීම් ආකාරය පිළිබඳ සමපදස්ථ නිරීක්ෂණය" යන මැයෙන් වූ ලේඛන සනාතන සභාවට ඉදිරිපත් කිරීමට නියමිත ය.

  - නව අධ්‍යයනාචාර්යවරුන් සඳහා අභිමන්ත්‍රණ වැඩසටහනක් සංවර්ධනය කිරීම.

  - විවිධ වර්ගයේ පරීක්ෂකවරුන්ගේ රාජකාරී සහ වගකීම් නිර්වචනය කිරීම, ඔවුන්ගේ විෂය නිර්ණේය නිර්දිෂ්ට සහ ප්‍රමාණනය.

  - උපදේශනය සඳහා වූ විශ්වවිද්‍යාල ක්‍රියා පිළිවෙත් පිළිබඳ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම.

  - පර්යේෂකයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රකාශන පළකිරීමේ ආචාර ධර්ම සංවර්ධනය කිරීම.

  - අධ්‍යයන වාරයකට අදාළ තක්සේරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම වාර්තා කිරීම (අධ්‍යයන වාර තක්සේරු වාර්තාව) සඳහා ආදර්ශ සකස් කර එය, අධ්‍යයන සංවර්ධන හා සැලසුම් සම්පාදන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

  - වැඩසටහන්වල පිරිවිතර ආදර්ශ සංවර්ධනය.

  - පශ්චාත් උපාධි විභාග සඳහා සුවිශේෂී විභාග පටිපාටි සංවර්ධනය.

  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා උපාධි අපේක්ෂක විභාග අත්පොතක් සකස් කිරීම.

| විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන 2020-2022 | | | |
|---|---|---|---|
| | 2020 | 2021 | 2022 |
| **පොදු කරුණු** | | | |
| පීඨ සංඛ්‍යාව | 9 | 9 | 9 |
| පශ්චාත් උපාධි ආයතන සංඛ්‍යාව | 4 | 4 | 4 |
| අධ්‍යයනාංශ සංඛ්‍යාව | 83 | 83 | 86 |
| විශ්වවිද්‍යාලයේ භූමි ප්‍රමාණය | හෙක්ටයාර 774 | හෙක්ටයාර 774 | හෙක්ටයාර 774 |
| | අක්කර 1912.6 | අක්කර 1912.6 | අක්කර 1912.6 |
| **ශිෂ්‍යයින්** | | | |
| උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් | | | |
| වාර්ෂික බඳවාගැනීම් | 3100 | 3231 | 3275 |
| පළමු වසර සඳහා නව ඇතුළත් කිරීම් | 3052 | 3444 | 3439 |
| මුළු සිසුන් | 11280 | 12265 | 13731 |
| උපාධි නිමැවුම | 2597 | 2555 | 2194 |
| පශ්චාත් උපාධි සිසුන් | | | |
| නව ඇතුළත් කිරීම් | 2236 | 2080 | 2207 |
| මුළු සිසුන් | 9495 | 9891 | 10646 |
| පශ්චාත් උපාධි නිමැවුම | 899 | 1152 | 1043 |
| දර්ශනශූරී/වෛද්‍ය විද්‍යා ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 273 | 310 | 294 |
| දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 940 | 1085 | 1006 |
| බාහිර පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 7136 | 8379 | 8019 |
| **කාර්ය මණ්ඩලය** | | | |
| මුළු ස්ථිර කාර්ය මණ්ඩලය | 3179 | 3217 | 3167 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 879 | 908 | 900 |
| අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය | 59 | 60 | 58 |
| විධායක කාර්ය මණ්ඩලය | 69 | 69 | 69 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 2172 | 2180 | 2140 |
| ආචාර්ය උපාධිය සහිත අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | 464 | 496 | 499 |
| ශාස්ත්‍රපති, දර්ශනපති, දර්ශනශූරී උපාධි සඳහා ඉගෙනුම් ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලය | 129 | 159 | 76 |
| **වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම** | රු.මිලි | රු.මිලි | රු.මිලි |
| පුනරාවර්තන | 7,737.01 | 7,760.79 | 8,007.83 |
| ප්‍රාග්ධන | 988.72 | 982.50 | 238.5 |
| මුළු ප්‍රතිපාදන වෙන් කිරීම | 8,725.74 | 8,743.29 | 8,246.33 |
| විශ්වවිද්‍යාලයේ වත්කම් | | | |
| ජංගම වත්කම් | 2,605.99 | 3,395.35 | 3,598.74 |
| ජංගම නොවන වත්කම් | 24,025.18 | 24,212.28 | 28,883.55 |
| මුළු වත්කම් | 26,631.17 | 27,607.63 | 32,482.29 |
| පර්යේෂණ ආධාර ලැබීම් | 236.62 | 363.05 | 492.34 |
| ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව ලාභීන්ගේ සංඛ්‍යාව | 1246 | 2312 | 2150 |
| මහපොළ ශිෂ්‍යත්ව ලාභීන්ගේ සංඛ්‍යාව | 6215 | 5120 | 5731 |
| සිසුන් සඳහා මුළු පිරිවැය | 0.76 | 0.76 | 0.74 |
| **වෙනත්** | | | |
| විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම | | | |
| ටයිම්ස් උසස් අධ්‍යාපනය | #01(401-500) | #01(401-500) | #01(401-500) |
| QS විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම | #01(801-1000) | #02(1000+) | #02(1001-1200) |
| නේවාසිකාගාරවල සම්පූර්ණ ධාරිතාව | 8590 | 8075 | 8355 |

## පීඨ අනුව ශිෂ්‍යයින් බඳවාගැනීම

**කෘෂි විද්‍යා**



**1165**

**සම සෞඛ්‍ය විද්‍යා**



**777**

**ශාස්ත්‍ර**



**4571**

**දන්ත වෛද්‍ය විද්‍යා**



**468**

**ඉංජිනේරු**



**2180**

**කළමනාකරණ**



**668**

**වෛද්‍ය**



**1337**

**විද්‍යා**



**2137**

**පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා**



**434**

මුළු විදේශ උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව: 44 (වෛද්‍ය පීඨය)

මුළු බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව (දූ.අ.අ.ම): 8019

# 2. සංඛ්‍යාලේඛන

## 2.1 ශිෂ්‍යයින්

### 2.1.1 උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්

| පීඨය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | අධ්‍යයන සහය කාර්ය මණ්ඩල සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | බිහිකළ උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා** | කෘෂි තාක්ෂණය හා කළමනාකරණ විද්‍යාවේදී (විශේෂ උපාධිය) | 766 | 111 | - | 125 | 252 |
| | සත්ත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධිය | 210 | | | | |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධිය | 189 | | | | |
| **සම සෞඛ්‍ය විද්‍යා** | ඖෂධවේද | 117 | 64 | 1 | 66 | 167 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී | 115 | | | | |
| | හෙදවේද විද්‍යාවේදී | 191 | | | | |
| | භෞත චිකිත්සක විද්‍යාවේදී | 153 | | | | |
| | විකිරණ චිකිත්සක විද්‍යාවේදී | 201 | | | | |
| **ශාස්ත්‍ර** | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 1482 | 185 | 1 | 88 | 903 |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | 2138 | | | | |
| | වාණිජවේදී | 79 | | | | |
| | නීතිවේදී | 248 | | | | |
| | අධ්‍යාපනවේදී | 262 | | | | |
| | භූගෝලීය තොරතුරු විද්‍යා විද්‍යාවේදී උපාධිය | 216 | | | | |
| | සමාජ ක්‍රියා පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 146 | | | | |
| **දන්ත වෛද්‍ය** | දන්ත වෛද්‍යවේදී උපාධිය | 468 | 61 | 1 | 153 | - |
| **ඉංජිනේරු** | ඉංජිනේරු | 2180 | 123 | 4 | 191 | - |
| **කළමනාකරණ** | ව්‍යාපාර පරිපාලනය | 668 | 45 | - | 24 | 159 |
| **වෛද්‍ය** | වෛද්‍ය විද්‍යාව | 1337 | 129 | 2 | 215 | 206 |
| **විද්‍යා** | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 760 | 118 | 3 | 128 | 371 |
| | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 977 | | | | |
| | විද්‍යාවේදී (ගණනය කිරීම් හා කළමනාකරණය) | 163 | | | | |
| | විද්‍යාවේදී (සංඛ්‍යාන හා මෙහෙයුම් පර්යේෂණ) | 231 | | | | |
| **පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යාව** | පශු වෛද්‍යවේදී | 434 | 46 | - | 76 | 64 |
| **පුස්තකාලය** | | - | 18 | 3 | 101 | - |
| **වෙනත්** | | - | - | 43 | 1042 | - |
| **එකතුව** | | **13731** | **900** | **58** | **2209** | **2122** |

| | අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් | | |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | එකතුව |
| කෘෂි විද්‍යා | 385 | 780 | 1165 |
| සම සෞඛ්‍ය විද්‍යා | 224 | 553 | 777 |
| ශාස්ත්‍ර | 787 | 3784 | 4571 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | 145 | 323 | 468 |
| ඉංජිනේරු | 1631 | 549 | 2180 |
| කළමනාකරණ | 230 | 438 | 668 |
| වෛද්‍ය | 554 | 783 | 1337 |
| විද්‍යාව | 990 | 1141 | 2131 |
| පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යාව | 135 | 299 | 434 |
| එකතුව | 5081 | 8650 | 13731 |




2022 වසර සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය බඳවා ගැනීම් ස්ත්‍රී පුරුෂ භාවය සහ අධ්‍යයන ක්ෂේත්‍රය අනුව සිදු වූ ආකාරය වගුවේ දැක්වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව 13,731ක් වූ අතර ඉන් 5,081ක් පිරිමි සිසුන් සහ 8,650ක් ශිෂ්‍යාවන් විය.

පොදුවේ ගත්කල එක් එක් අධ්‍යයන ක්ෂේත්‍රය සඳහා බඳවා ගන්නා ශිෂ්‍යාවන් සංඛ්‍යාව පිරිමි සිසුන්ට වඩා වැඩි ය. ඒ අනුව වැඩි ම ශිෂ්‍යාවන් ප්‍රතිශතයක් සිටින අධ්‍යයන ක්ෂේත්‍රය කලා (82.8%) වන අතර, පිරිමි සිසුන් වැඩිම ප්‍රතිශතයක් සිටින අධ්‍යයන ක්ෂේත්‍රය ඉංජිනේරු (74.8%) වේ.



## 2.1.2 ප්‍රථම උපාධි අපේක්ෂක වැඩසටහනේ දේශීය සිසුන් බඳවා ගැනීම්

| පීඨය | උපාධි පාඨමාලාව | වි.වි.ප්‍ර.කො. බඳවා ගැනීම් වර්ෂය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2020/21 | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 | |
| කෘෂි විද්‍යා | කෘෂි තාක්ෂණය හා කළමනාකරණ විද්‍යාවේදී | 205 | 206 | 189 | 166 | - | - | 766 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී | 53 | 46 | 48 | 42 | - | - | 210 |
| | සත්ත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී | 74 | 61 | 42 | 33 | - | - | 189 |
| සම සෞඛ්‍ය | ඖෂධවේදී | 33 | 28 | 27 | 29 | - | - | 117 |
| | වෛද්‍ය රසායනගාර විද්‍යා විද්‍යාවේදී | 31 | 26 | 27 | 31 | - | - | 115 |
| | හෙදවේද විද්‍යාවේදී | 50 | 48 | 48 | 45 | - | - | 191 |
| | භෞත චිකිත්සක විද්‍යාවේදී | 51 | 34 | 36 | 32 | - | - | 153 |
| | විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සක විද්‍යාවේදී | 68 | 49 | 43 | 41 | - | - | 201 |
| ශාස්ත්‍ර | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 965 | 297 | 220 | | - | - | 1482 |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | 0 | 748 | 602 | 788 | - | - | 2138 |
| | වාණිජවේදී | 0 | 27 | 21 | 31 | - | - | 79 |
| | නීතිවේදී | 74 | 70 | 50 | 54 | - | - | 248 |
| | අධ්‍යාපනවේදී | 0 | 99 | 90 | 73 | - | - | 262 |
| | භූගෝලීය තොරතුරු විද්‍යා විද්‍යාවේදී උපාධිය | 93 | 74 | 49 | 0 | - | - | 216 |
| | සමාජ ක්‍රියා පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 50 | 48 | 48 | 0 | - | - | 146 |
| දන්ත වෛද්‍ය | දන්ත වෛද්‍යවේදී උපාධිය | 123 | 117 | 77 | 74 | 77 | - | 468 |
| ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | 455 | 480 | 414 | 415 | 416 | - | 2180 |
| කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී | 174 | 170 | 163 | 161 | - | - | 668 |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යාව | 238 | 235 | 205 | 205 | 205 | 205 | 1293 |
| විද්‍යා | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී | 217 | 202 | 176 | 165 | - | - | 760 |
| | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී | 279 | 231 | 238 | 229 | - | - | 977 |
| | විද්‍යාවේදී - ගණනය කිරීම් හා කළමනාකරණය | 0 | 67 | 49 | 47 | - | - | 163 |
| | විද්‍යාවේදී - සංඛ්‍යාන හා මෙහෙයුම් පර්යේෂණ | 82 | 64 | 46 | 39 | - | - | 231 |
| පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යාව | පශු වෛද්‍යවේදී | 109 | 82 | 91 | 72 | 80 | - | 434 |
| එකතුව | | 3424 | 3509 | 2999 | 2772 | 778 | 205 | 13687 |

## 2.1.3 ප්‍රථම උපාධි අපේක්ෂක වැඩසටහනේ විදෙස් සිසුන් බඳවාගැනීම්

| පීඨය | පාඨමාලාව | වි.වි.ප්‍ර.කො. බඳවාගැනීම් වර්ෂය | | | | | | එකතුව |
නියුරෝ කෙයා ව්‍යාපෘතිය යටතේ හෙද විද්‍යා අධ්‍යයනාංශය විසින් දේශීය වැඩමුළුවක් හා ජාත්‍යන්තර වැඩමුළු දෙකක් සාර්ථක ව පවත්වා ඇත. තව ද, ආචාර්ය එම්.එච්.එෆ් සකීනා 2021 පෙබරවාරි 03 දින සිට ඖෂධවේදය පිළිබඳ මහාචාර්යවරියක් ලෙස උසස් කරන ලදී. එමෙන් ම හෙදවිද්‍යා අධ්‍යයනාංශයේ ඒ.ආර්.එම්.ඒ.යූ රත්නායක සහ ආචාර්ය ටී.ජී.එන්.එස් ගුණරත්න පිළිවෙලින් 2022 ජනවාරි 27 සහ 2022 ජුනි 04 දින සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කරන ලදී. තව ද, විකිරණවේද/විකිරණ චිකිත්සක අංශයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු තම දර්ශනපති උපාධි සාර්ථක ව නිම කර ඇති අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට 4 මට්ටමේ පර්යේෂණ සම්මානයක් පිරිනමන ලදී. හෙද විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්ත කථිකාචාර්ය (පරිවාස) ඊ.එම්.ජේ.එස්.කේ. ඒකනායක මෙනවිය මැලේසියාවේ සරවක් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙද උපාධි පාඨමාලාවේ ශාස්ත්‍රපති උපාධිය සාර්ථක ව සම්පූර්ණ කර ඇත. හෙද විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්ත කථිකාචාර්ය (පරිවාස) බී.එම්.සී රත්නායක, ප්‍රමාණාත්මක පර්යේෂණ ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර ඇත. කථිකාචාර්ය ආර්.එම්.ඒ චාමිකා මෙනවිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ මනෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කළා ය. හෙද විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්ත ව සේවය කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.එම්.එස්.ඩී පතිරණගේ මහතාට 2022 වසරේ දී විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානයක් හිමි විය.

## 3.3 ශාස්ත්‍ර පීඨය



**ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක**
**පීඨාධිපති**

**හැඳින්වීම**

2022 වර්ෂයේ දී, ශාස්ත්‍ර පීඨය සඳහා නවක සිසුන් 1182ක් බඳවා ගන්නා ලද අතර, ඉන් 74ක් නීතිවේදී උපාධිය සඳහාද, 93ක් භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහාද (GIS) සහ 50ක් සමාජ වැඩ උපාධිය සඳහා (BSW) බඳවා ගන්නා ලදී. 2022 වසරේ දී සිසුන් 1050ක් ශාස්ත්‍ර පීඨයෙන් උපාධිධාරීන් ලෙස පිටව ගියහ. ඒ අතරින් විශේෂ උපාධි ලබාගත් සිසුන් සංඛ්‍යාව 668ක් (ශාස්ත්‍රවේදී ගෞරව - 503, වාණිජවේදී - 36, අධ්‍යාපනවේදී - 82, නීතිවේදී උපාධිය -47ක් වන අතර, සාමාන්‍ය උපාධි ලබාගත් සිසුන් සංඛ්‍යාව 234කි.

**2022 වර්ෂයේ දී ඉටුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

- සත්මහල් ගොඩනැගිල්ල පවරා ගැනීම.
- නවක වදය වැළැක්වීම, අවිහිංසාව, සියලු පහසුකම් භාවිත කිරීමට සමාන ප්‍රවේශයක් සහතික කිරීම සහ අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම යන ප්‍රතිඥාව සහතික කිරීම.
- පීඨයට ඊජිප්තු තානාපතිවරයාගේ පැමිණීම.
- අලුතින් බඳවාගත් ශාස්ත්‍රඥයින් සඳහා අධ්‍යයන හා මූල්‍ය පරිපාලන උපදේශන වැඩසටහන් හතරක් පැවත්වීම.
- ශාස්ත්‍ර පීඨයේ 70 වැනි සැමරුම. එම සැමරුම වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහනක් පැවත්වීම.
- පීඨ සාමාජිකයින් අතර IncEdu ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම.
- IncEdu ව්‍යාපෘතිය මඟින් SNRU සඳහා උපකරණ සහ මෘදුකාංග ලබා ගැනීම.

**ජයග්‍රහණ**

- දෙපාර්තමේන්තු මට්ටමේ වාර්ෂික විෂයමාලා සමාලෝචන සාකච්ඡා පැවැත්වීම.
- ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් පදනම් කරගත් ඉගැන්වීම දිරිමත් කිරීම.
- අධ්‍යයනාංශ/ ඊ පුස්තකාල/ ගබඩා සංවර්ධනය කිරීම.
- පීඨ වෙබ් අඩවිය සහ වි.ප්‍ර.කො.ස අත්පොත යාවත්කාලීන කිරීම.
- විදේශ විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාවය සඳහා අවබෝධතා ගිවිසුම්වලට එළඹීම.
- නීති අධ්‍යයනාංශය සඳහා වැඩිදියුණු කළ ශිෂ්‍ය පහසුකම් (ආබාධිතයින් සඳහා ප්‍රවේශ පහසුකම් ඇතුලු ව) සහිත නව ගොඩනැගිල්ලක් ලබාගැනීමට කටයුතු කිරීම.
- ආදි සිසුන්ගේ සහභාගීත්වයෙන් සිසුන් සඳහා දෙපාර්තමේන්තු මට්ටමේ වෘත්තීය මාර්ගෝපදේශන සැසි සංවිධානය කිරීම.
- පීඨ විෂයමාලා සංවර්ධන සහ අධීක්ෂණ කමිටුවක් පිහිටුවීම.
- අධ්‍යයනාංශ ශිෂ්‍ය සංගමය යටතේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම.
- පීඨයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ මගපෙන්වීම ඇති ව සියලුම අධ්‍යයනාංශවල ප්‍රමිතිගත ලිපිගොනු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රජාවගේ මනෝ සමාජීය යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම (මනෝවිද්‍යා අධ්‍යයනාංශය)
- තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයක් ස්ථාපිත කිරීම.

සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකු අධිශිෂ්‍යත්ව සහ සම්මාන ලබා ගත් අතර වසර තුළ පහත සඳහන් දෑ සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

- ජගම්තුරු ආර්ථිකයක සිට නිදහස් ආර්ථිකය දක්වා - මහාචාර්ය ඕ.ජී. දයාරත්න බණ්ඩා, ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය.
- ඉතිහාසය හා ඉතිහාසකරණය - මහාචාර්ය එන්. ඒ.විමලසේන, ඉතිහාස අධ්‍යයනාංශය.
- "uBuntu" හරහා ගෝලීය පුරවැසිභාවය, සාමය සහ හවුල් ජීවිතය සඳහා සංසන්දනාත්මක අධ්‍යාපනය" වෙළුම් සංස්කාරක - මහාචාර්ය ටී. එම්. එස්. කේ යටිගම්මන ඒකනායක
- යුරිපිඩීස්ගේ "අවුලිස් ඉපිජිනියා" නැමැති කෘතිය හැඳින්වීම සහ විවරණ සහිත ව පුරාණ ග්‍රීක භාෂාවෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම - මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ජී.සී.එස්.එම් වික්‍රමසිංහ, සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශය.

## 3.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය



**මහාචාර්ය ඒ.එම්. ආටිගල**
**පීඨාධිපති**

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය සහ දන්ත (ශික්ෂණ) රෝහල ඉගැන්වීම්, පර්යේෂණ සහ රෝගී සත්කාරක ක්‍රියාකාරකම් සඳහා සහය ලබා දෙන අතර මෙ මඟින් දන්ත වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කරනු ලබයි. මෙම පීඨය අධ්‍යයනාංශ 8කින් සමන්විත වේ. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගයෙන් යුතුව දන්ත වෛද්‍ය විශේෂඥයින් පුහුණු කිරීම සහ අනෙකුත් දන්ත සහායක පුද්ගලයින් පුහුණු කිරීම පීඨයේ අනෙකුත් කාර්යයන් වේ. දන්ත වෛද්‍ය විද්‍යා පීඨය/ දන්ත (ශික්ෂණ) රෝහල රෝගී සත්කාර සේවාව සඳහා තෘතීයික යොමු කිරීමේ මධ්‍යස්ථානයක් වන අතර එහි පහසුකම් වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා විෂයන් හදාරන සිසුන් විසින් ද භාවිත කරනු ලැබේ. ඉගැන්වීම් සහ සේවා කාර්යයන්වලට අමතර ව, මෙ මඟින් සැලකිය යුතු පර්යේෂණ ව්‍යාපෘති දේශීය හා විදේශීය සහයෝගීතා ව්‍යාපෘති ලෙස සිදු කෙරේ. 2022 වර්ෂයේ දී ඩිජිටල් විද්‍යාගාරය රොටරි සමාජයේ අරමුදල්වලින් ආරම්භ කරන ලදී. දන්ත කාර්මික ශිල්පී පුහුණුව සඳහා දන්ත සහයක පුහුණු පාසල් රසායනාගාරය ආරම්භ කරන ලදී. තව ද, නව ස්මයිල් ට්‍රේනින් ගොඩනැගිල්ල 2022 දී විවෘත කරන ලදී. දන්ත වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන ඒකකයේ සම්මන්ත්‍රණ ශාලාව මාර්ගගත සැසි පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම්වලින් සමන්විත ය. ඉන්දියාවේ සවීතා දන්ත වෛද්‍ය විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අනුව 2022 වසරේ 2020/21 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 123ක් (57%ක වැඩිවීමක්) ඇතුළත් කර ගන්නා ලෙස දන්ත වෛද්‍ය පීඨයට නියම කෙරිණි. නව විෂය මාලාව යටතේ පළමු සිසුන් කණ්ඩායම 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර ඔවුන් මෙම වසරේ දී දන්ත වෛද්‍ය විද්‍යාවේදී පාඨමාලා සම්පූර්ණ කරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සහ රට තුළ පවතින මූල්‍ය බාධාවන් හේතුවෙන් උපාධි අපේක්ෂකයින් සඳහා වන විෂය මාලාවට යම් යම් වෙනස්කම් සිදු කරන ලදී.

### 2022 වර්ෂයේ දී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

**ප්‍රථම උපාධි වැඩසටහන**

- අධ්‍යයන වැඩසටහන සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් වූ 123 දෙනෙකු ලියාපදිංචි කරන ලදී.
- 9 වන සහ 10 වැනි අධ්‍යයන වාරයේ ඉගැන්වීමට පහසුකම් සැලසීම සඳහා අලුතින් පිහිටුවන ලද අධ්‍යයනාංශයක් වන විස්තීරණ මුඛ සෞඛ්‍ය රැකවරණ අධ්‍යයනාංශය රජය විසින් ගැසට් කරන ලදී.
- වසර 5ක වැඩසටහනට අදාළ විෂය මාලාව යටතේ 1 වන 10 වැනි සමාසික විභාග (අවසාන විභාගය) සාර්ථක ව පවත්වන ලදී.
- ප්‍රථම උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය පවත්වන ලදී.
- සිසුන් සඳහා අධ්‍යයන උපදේශනය ආරම්භ කරන ලදී.
- සෑම සමාසිකයකට ම අදාළ ව පීඨාධිපතිගේ ශිෂ්‍ය ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී.
- අංක 978 දරණ වි.ප්‍ර.කො.ස චක්‍රලේඛය අනුව ලකුණු නැවත පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.

### ජයග්‍රහණ

- වසර 5කට අදාළ විෂයමාලාවේ 1 වන කණ්ඩායම අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමත් සමඟ නව විෂය මාලාව යටතේ 2015/2016 ශිෂ්‍ය කාණ්ඩායමේ 09 සහ 10 වැනි සමාසික සාර්ථක ව පවත්වන ලදී.
- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අන්තර්ජාලය හරහා පවත්වනු ලැබූ සියලුම අධ්‍යයන වැඩසටහන් භෞතික ව නැවත ආරම්භ කරන ලදී.
- පිටවීමේ සමීක්ෂණ මෙවලමක් (උපාධි සමීක්ෂණයක්) සංවර්ධනය කරන ලද අතර එ මඟින් නොවැම්බර් මාසයේ දී පිට වූ පස් අවුරුදු විෂයමාලාවේ පළමු කණ්ඩායමෙන් දත්ත රැස් කරන ලදී.
- විෂයමාලා කමිටුව විසින් උපාධි අපේක්ෂක විෂයමාලා සමාලෝචනය නිතිපතා සිදු කරනු ලබයි.
- 2020/2021 කණ්ඩායම සඳහා අත්පොත ප්‍රකශයට පත් කරන ලදී.
- "Mirror and Probe" නමින් යුත් සිසු සඟරාව නැවත ආරම්භ කරන ලදී.
- තේරීම් නිරීක්ෂණ වැඩසටහන් සඳහා තෝරාගත් සිසුන් දෙදෙනෙක් සහභාගී වූහ.

- විභාග අංශය වෙන ම ස්ථානයක ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.
- දැනුම සොයා යාම පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලද අතර, දන්ත වෛද්‍ය විද්‍යාවේදී විෂය මාලාවේ අනාගත සංශෝධන කිරීම් සඳහා නිර්දේශ සහිත ව අවසාන ප්‍රතිඵල විෂයමාලා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
- කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම පිළිබඳ වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදී.
- යාවත්කාලීන මූඩල් අනුවාදයක් සමගින් ඩෙන්ට් මූඩල් අඩවිය සාර්ථක ව නැවත ආරම්භ කිරීම සහ ගූගල් හරහා තනි පුරණය වීම ඒකාබද්ධ කිරීම.
- DS 5204 පාඨමාලාව යටතේ 10 වැනි සමාසිකයේ අවසාන වාර විභාගයේ සංරචකයක් ලෙස E-portfolio assessment ප්‍රථම වරට මූඩල් පැවරුම් හරහා ආරම්භ කරන ලදී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාල සහ සන්නිවේදන සේවා ඒකකය විසින් සංවිධානය කරන ලද "මූඩ්ල් පද්ධති පරිපාලනය" පාඨමාලාව සාර්ථක ව නිම කිරීම
- දන්ත ශල්‍ය සහයකයින් සඳහා මූලික සහතිකපත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම.
- මයිඩෙන්ටිස්ට් සමාගමේ තිබෙන ඔවුන්ගේ රෝගීන් පිළිබඳ දත්ත ගබඩාව පීඨයට ලබා ගැනීම සම්බන්ධයෙන් එම සමාගම සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී.
- ප්‍රදේශයේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා ඔවුන් සඳහා සේවාස්ථ පුහුණුවක් ආරම්භ කරන ලදී.

**පශ්චාත් උපාධි**

- දන්ත වෛද්‍ය විද්‍යාවේ ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිණිස වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී.
- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් පශ්චාත් උපාධි වැඩසටහන සම්පූර්ණ කරන ලදී.
- පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා නව අධ්‍යයන සාමාජිකයින් පස් දෙනෙක් ලියාපදිංචි වී ඇත.
- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු දන්ත වෛද්‍ය විද්‍යාපති පුහුණු වැඩසටහනේ විදේශ පුහුණුව සඳහා සුදුසුකම් ලබා ගෙන ඇත.

**පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම**

- පරිවාසකාලයේ පසුවන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන මූලික හඳුන්වාදීමේ වැඩසටහන සම්පූර්ණ කරන ලදී.
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ පැවති නායකත්ව පුහුණුව සඳහා අධ්‍යයන සාමාජිකයින් හය දෙනෙක් සහභාගී වූහ.

**පර්යේෂණ**

- 2022 දී අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ ප්‍රකාශන 30ක් (දේශීය සහ විදේශීය දහයක්) පළ කරන ලදී.
- දන්ත වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යා සිසුන්ගේ උපාධි පර්යේෂණ කටයුතු සඳහා සංසන්දනාත්මක මානව ජීව විද්‍යා පර්යේෂණ රසායනාගාරයේ සහ ස්වභාවික නිෂ්පාදන පර්යේෂණ රසායනාගාරයේ දී පහසුකම් සපයන ලදී.
- පීඨ පර්යේෂණ සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී.
- මුඛ පිළිකා පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා ස්ථාපිත කළ නව උපකරණ සහිත රසායනාගාරය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- මැලේසියා පිළිකා පර්යේෂණ ආයතනය සහ CROC හි නියෝජිත සහ ඉංජිනේරු පීඨය අතර තොරතුරු අනාවරණය නොකිරීමේ ගිවිසුම අත්සන් කරන ලදී.

**උසස්වීම්**

පහත අධ්‍යයන සාමාජිකයින් කුසලතා මත මහාචාර්ය තනතුරට උසස් කරන ලදී.

- ආචාර්ය ආර්.එම් ජයසිංහ, ආචාර්ය එන්.එස්.එස් ජයසූරිය, ආචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්.කේ විජේකෝන්, මහාචාර්ය එච්.එන්.එස් සොයිසා ඖෂධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදී.
- ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ සභාපති ලෙස වෛද්‍ය ජේ.ඒ.වී.පී ජයසිංහ තේරී පත් විය.
- ආචාර්ය පී.වී.කේ.එස් හෙට්ටිආරච්චි සහ ආචාර්ය ඩී ලෙව්කේ බණ්ඩාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණියට උසස් කරන ලදී.
- ආචාර්ය ආර් අංගම්මන, ආචාර්ය කේ.එම්.සී.පී කුමාරි සහ ආචාර්ය බී.එම්.සී.ඒ බණ්ඩාරනායක යන සාමාජිකයන් තිදෙනා කථිකාචාර්ය තනතුරුවල ස්ථිර කරන ලදී.
- එම්.ආර්.ඩී.එම් සේනානායක මහත්මිය ප්‍රධාන තාක්ෂණ නිලධාරී තනතුරට උසස් කරන ලදී. ඇය දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ මෙම තනතුරට පත් වූ පළමු සාමාජිකයා වේ.

**නව පත්වීම්**

- නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු බඳවා ගන්නා ලදී

**විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්**

- අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙක් විශ්‍රාම ගියහ. එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු තනතුරෙන් ඉල්ලා අස්විය.

## 3.5 ඉංජිනේරු පීඨය



**ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක**
**පීඨාධිපති**

### 2022 වර්ෂය පිළිබඳ දළ විශ්ලේෂණයක්

රටේ සාමාන්‍ය ජනතාව සහ විශේෂයෙන් ම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ සිසුන් කොවිඩ්-19 වසංගතය හමුවේ අවශ්‍ය එන්නත් ලබා ගැනීම හේතුවෙන් එහි ව්‍යාප්තිය අඩුවීමත් සමඟ 2022 ජනවාරි මස සිට සිසුන් භෞතික ව විශ්වවිද්‍යාලයට ගෙන්වා ගැනීමට හැකි විය. භෞතික ව පැමිණි පළමු කණ්ඩායම වූයේ E19 කාණ්ඩයේ පළමු වසරේ 2 වන අධ්‍යයන වාරයේ සිසුන් විය. ඉන් අනතුරු ව අවසන් වසරේ සිටි E16 කණ්ඩායමේ ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් විය. E18 කණ්ඩායමේ 4 වන අධ්‍යයන වාරයෙහි අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අඛණ්ඩ ව සිදු කරන ලද අතර E17 කණ්ඩායමේ ශිෂ්‍යයෝ ප්‍රධාන වශයෙන් කාර්මික පුහුණුවෙහි යෙදී සිටියහ. මීට අමතර ව, 2020 වර්ෂයේ දී උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත ව සිටි නවකයින්, මාර්ගගත හඳුන්වාදීමේ වැඩසටහන සඳහා 2022 පෙබරවාරි මස මුල දී පීඨයට ඇතුළත් කරන ලදී. ඒ අනුව, මුළු වසර පුරාවට ම, රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව, සිවිල් ඉංජිනේරු විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව, නිෂ්පාදන හා කාර්මික ඉංජිනේරු විද්‍යාව සහ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන විශේෂ පාඨමාලා හයේ ම කණ්ඩායම් පහකින් සහ පළමු වසර කණ්ඩායම්වලින් පීඨයේ කටයුතු ක්‍රියාත්මක විය.

### 2022 වර්ෂයේ දී ඉටුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් සහ ඇතැම් කණ්ඩායම් මාර්ගගත විභාග සඳහා පෙනී සිටීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඇති වූ පසුබෑම මගහැරීම සඳහා පීඨය විසින් 2022 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා භෞතික ක්‍රමවේදය ඔස්සේ ප්‍රධාන විභාග 11ක් පැවැත්වීමට සැලසුම් කළේ ය. එම ඇතැම් විභාග වසර දෙකකට වඩා ප්‍රමාද වී තිබූ බැවින් සිසුන්ට එම විභාග සඳහා සූදානම් වීම සඳහා සැලකිය යුතු අධ්‍යයන නිවාඩුවක් ලබා දීම අවශ්‍ය විය. කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් ඉක්බිති ව වර්ධනය වූ ආර්ථික අර්බුදය මෙම ක්‍රියාකාරකමට දැඩි ලෙස බලපෑවේය.

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී, අධ්‍යයන වර්ෂය සම්පූර්ණ කිරීම සඳහා ඊළඟ අධ්‍යයන වාර කාණ්ඩ පහ ම ආරම්භ කරන ලදී. 2022 ඔක්තෝම්බර් සිට 2023 ජනවාරි දක්වා මෙම අධ්‍යයන වාර මාලාව සාපේක්ෂ වශයෙන් බාධාවන්ගෙන් තොර ව ක්‍රියාත්මක වූ අතර එය අවසන් වීමට ආසන්න ව ඇති බව හා විභාග පැවැත්වීමට නියමිත බව වාර්තා කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි. තව ද, 2022 සහ 2021 වසරවල උපාධි ලැබූ සිසුන් සඳහා අවස්ථාව සලසමින් උපාධි ප්‍රදානෝත්සව දෙකක් 2022 වර්ෂය තුළ පවත්වන ලදී. ඒ අනුව E14 සහ E 15 කණ්ඩායම්වල සිසුන් 400කට අධික සංඛ්‍යාවක් මෙහි දී උපාධිය ලබා ගන්නා ලදී.

2022 වර්ෂය තුළ පීඨය සිය පශ්චාත් උපාධි වැඩසටහන් බොහොමයක් අඛණ්ඩ ව පවත්වාගෙන යාමට කටයුතු කළේය. කොවිඩ්-19 තත්ත්වය සහ වසර තුළ පැවති ගමනාගමන දුෂ්කරතා හේතුවෙන්, විභාග ඇතුලු ව බොහෝ වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී. පශ්චාත් උපාධි ඩිප්ලෝමා, විද්‍යාපති, ඉංජිනේරුපති, සහ ඉංජිනේරු විද්‍යාපති උපාධි සඳහා සඳහා ප්‍රමුඛ වන පීඨය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් ඉතා ඵලදායී වෘත්තීය සංවර්ධන වැඩසටහන් වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් පවතී. ප්‍රධාන වශයෙන් ම ඉහත සඳහන් කළ පරිදි පැවති මූලික දුෂ්කරතා හේතුවෙන් වසර තුළ වැඩසටහන් 12න් අටක් පමණක් ප්‍රචාරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම පාඨමාලා හැදෑරීමට බඳවා ගත් මුළු සිසුන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, පසුගිය වසරවල මෙම පාඨමාලා හැදෑරූ නමුත් තම පර්යේෂණ කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වූ සිසුන් කිහිප දෙනෙක් 2022 වසර තුළ උපාධිය සම්පූර්ණ කළහ. ඒ සඳහා ඔවුන්ගෙන් ඇතැමෙකුට තම සාමාන්‍ය රැකියාවෙන් යම් නිදහස් කාලයක් ලැබුණු අතර ඇතැමෙක් විදේශ රැකියා ලබාගැනීමේ සහ සංක්‍රමණයවීමේ අපේක්ෂාවෙන් මෙම සුදුසුකම සපුරාගැනීමට ගැනීමට උනන්දු වූහ. තව ද, කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින දුර්වල රැකියා අපේක්ෂාවන් හේතුවෙන් 2022 වසර තුළ දී දර්ශනපති සහ දර්ශනශූරී යන පර්යේෂණ පදනම් වූ උපාධි හැදෑරීමට ලියාපදිංචි වූ පූර්ණ කාලීන පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව ද වැඩිවූයේ සුළු වශයෙනි. ඕස්ට්‍රේලියාවේ RMIT විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධ වී පවත්වනු ලබන ආචාර්ය උපාධි වැඩසටහන, 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. සිසුන් 18 කට ආසන්න සංඛ්‍යාවක් ආයතන දෙකේ ම ඒකාබද්ධ අධීක්ෂකවරුන් සමඟ සිය පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබූ අතර දර්ශනශූරී උපාධි දෙකක් සම්පූර්ණ කරන ලදී.

**ජයග්‍රහණ**

ඉහත සඳහන් කළ පරිදි, මේ වන විට භෞතික වශයෙන් ශිෂ්‍ය කණ්ඩායම් පහක් මෙම පීඨයේ ඉගෙනුම් කටයුතුවල නිරත ව සිටින අතර එම ප්‍රමාණය සාමාන්‍යයෙන් සිටින 1660ක සිසුන් සංඛ්‍යාවට සාපේක්ෂ ව සිසුන් 2180කි. මෙය 30% කට වඩා වැඩිවීමකි. අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මකභාවයට හානියක් නොවන පරිදි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන ඉදිරියට ගෙන යාමට අවශ්‍ය පහසුකම් ඔවුන් සියලු දෙනාටම ලබා දීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි. තව ද, 2022 වර්ෂය තුළ AHEAD ව්‍යාපෘති ප්‍රදානය යටතේ නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා ඉදිකරනු ලබන නව තෙමහල් ගොඩනැගිල්ලේ අදාළ ඉදිකිරීම් කටයුතු මිලියන 125ක මුදලකින් ක්‍රියාත්මක වන අතර විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ තෙමහල් ගොඩනැගිල්ලේ පුළුල්කිරීමේ කටයුතු මිලියන 365ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. අරමුදල් සපයා ගැනීමේ දැඩි දුෂ්කරතාවය සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් මුල් කාලසටහනට අනුව මෙම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි විය. විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉදිකිරීම් නිම වෙමින් පවතින අතර, රසායනාගාර උපකරණ මෙම ගොඩනැගිල්ලට ගෙන ගොස් නැවත ස්ථාපනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

පීඨයේ ආදි ශිෂ්‍ය සංගමය විසින්, ආර්ථික අර්බුදයට පෙර ඇස්තමේන්තු කළ රුපියල් මිලියන 8.5ක වියදමින් ඊ.ඕ.ඊ පෙරේරා රඟහල සඳහා නව ආලෝකකරණ පහසුකම් සැපයීමේ කර්තව්‍යය මේ වසරේ නිම කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා අරමුදල් සැපයීම 1981 කණ්ඩායම විසින් සිදු කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් එම සංගමයේ ඕස්ට්‍රේලියාවේ නිව් සවුත්වෙල් ශාඛාවෙන් ලැබුණු අරමුදල්වලින් පීඨ පුස්තකාලය අසල 24/7 අධ්‍යයන කාමරයක් ඉදිකිරීම ද නිම කරන ලදී.

පීඨයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආදි ශිෂ්‍යයන් ලබා දුන් නොයෙකුත් සහයෝගයන් වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය වෙත මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. 2022 වර්ෂය තුළ පීඨ සාමාජිකයින් කිහිප දෙනෙකු සිය උසස් තත්ත්වයේ පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිළිගැනීමට ලක් විය.

මහාචාර්ය ජනක ඒකනායක සහ ආචාර්ය හිමාල් සුරවීර ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් අඛණ්ඩ ව තෙවැනි වසර සඳහාත් ඔවුන්ගේ විශේෂඥතා ක්ෂේත්‍රයේ ඉහළ ම පර්යේෂකයන් 2% අතර සිටිනා පර්යේෂකයින් ලෙස හඳුනාගෙන ඇත. තව ද, කාර්ය මණ්ඩලයේ 15කට ආසන්න පිරිසකට ඔවුන් විසින් අදාළ ක්ෂේත්‍ර සඳහා ලබා දෙන ලද දායකත්වය ඇගයීමට ලක් කරමින් 2018 සහ 2020 වසර සඳහා පීඨ පර්යේෂණ විශිෂ්ටතා සම්මාන ප්‍රදානය කිරීමේ චාම් උත්සවයක් පීඨයේ දී පැවැත්විණි. ප්‍රධාන වශයෙන් යුරෝපය, චීනය, කැනඩාව සහ ඉන්දියාවෙන් මෙන් ම දේශීය ව ජාතික විද්‍යා පදනම සහ ජාතික පර්යේෂණ සභාව වෙතින් පර්යේෂණ ප්‍රදාන කිහිපයක් හරහා ලද මූල්‍ය අනුග්‍රහය ඇති ව මෙම කාර්යයන්වලින් සමහරක් සිදු කරන ලදී. මෙම වසරේ ලබා ගත් අරමුදල්වල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 1000කට ආසන්න වේ. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළ ලද නව ප්‍රදාන ප්‍රමාණය ඉතා අඩු මට්ටමක විය.

ඉදිකිරීම් කර්මාන්තය ප්‍රායෝගික ව බිඳ වැටී තිබියදීත් ඉංජිනේරු පීඨයේ වාණිජ හස්තය වන ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය පිළිගත හැකි මට්ටමකින් කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ සිය කටයුතු කරගෙන යයි. යෝජිත මහනුවර උමං ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වන පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය 2021 දී අඛණ්ඩ ව සිදු කරන ලදී.

සියලුම අධ්‍යයනාංශ විසින් තම පශ්චාත් උපාධි සහ ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘති හරහා ලබාගත් දැනුම බෙදා හැරීම සඳහා මාර්ගගත වැඩසටහන් පවත්වන ලදී. නැවත ප්‍රතීතනය කළ යුතු අධ්‍යයනාංශ පහෙන්, සිවිල් ඉංජිනේරු සහ රසායනික හා ක්‍රියාවලි ඉංජිනේරු යන අධ්‍යයනාංශ දෙකක ඔවුන්ගේ WA/IESL ප්‍රතීතන ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එම අධ්‍යයනාංශ දෙක සඳහා ම 2024 වර්ෂය දක්වා පූර්ණ ප්‍රතීතනය ලැබුණි.

## 3.6 කළමනාකරණ පීඨය



**මහාචාර්ය ඊ.එම්.ඊ.එස්.බී ඒකනායක**
**පීඨාධිපති**

### හැඳින්වීම

2015 වසරේ ආරම්භ කරන ලද කළමනාකරණ පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලාබාලත ම පීඨය වේ. එහි පැවැත්ම වසර හතක කාලයකට පසුව කළමනාකරණ පීඨය නිසි පරිදි ස්ථානගත වී ඇති නමුත් එහි වර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ දී දැඩි අවධානයක් ඒ සඳහා අවශ්‍ය වේ. පවත්නා සම්පත් සීමාවන් මධ්‍යයේ වුව ද, පීඨය සිය භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සමත් වී ඇති අතර ම සිසුන්ට උසස් තත්ත්වයේ උපාධිධාරීන් බවට පත් කිරීම සඳහා ඵලදායී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම පිණිස කාර්ය මණ්ඩලය පුහුණු කිරීමටත් සමත් වී ඇත.

කොවිඩ්-19 වසංගතයෙන් අනතුරු ව 2022 වර්ෂයේ දී පීඨය සිය වර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරකම් කඩිනම් කරන ලදී. අලුතින් ඉදිකරන ලද AHEAD ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාවකින්, සුහුරු පන්ති කාමරයකින්, දේශන ශාලා දෙකකින්, විභාග ශාලාවකින් සහ ජීවිතය සඳහා නිපුණතා මධ්‍යස්ථානය සහ ව්‍යාපාර ඉන්කියුබේෂන් සහ නවෝත්පාදන පරිසර පද්ධති සේවා ඒකකය යන මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වන අතර එය පීඨයේ අධ්‍යයන වැඩසටහන් පහසු කරනු වස් ස්ථාපිත අගනා සම්පතක් වනු ඇත. තව ද, පීඨය එහි තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ආචාර්ය උපාධි අධ්‍යයන වැඩසටහනකට සහභාගී වීම සඳහා වඩාත් සුදුසු විදේශීය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට සහය වීම පිණිස "The Journey to PhD" වැඩසටහන දියත් කළේය.

තව ද පීඨය විසින්, බඳවා ගන්නා ලද නවක සිසුන් සඳහා පුළුල් සූදානම් කිරීමේ වැඩසටහනක්, අධ්‍යයන උපදේශන වැඩසටහනක් සහ උපාධි අපේක්ෂකයින්ට ඉහළ ම අධ්‍යයන කාර්ය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා සමපදස්ථ-උපකාර ඉගෙනුම් (PAL) වැඩසටහනක් හඳුන්වා දී ඇත. එපමණක් නොව, පීඨය විසින් විශාල ප්‍රජාවකට, විශේෂයෙන් අ.පො.ස. (උ/පෙළ) සිසුන් සහ ගුරුවරුන් වෙත සිය සේවාවන් ලබාදීම සඳහා කළමනාකරණ අධ්‍යාපන ඒකකය ස්ථාපිත කර ඇත. ඉහත සඳහන් ක්‍රියාකාරකම් හැරුණු විට පීඨය සිය 2022 වාර්ෂික අධ්‍යයන දින දර්ශනයට අනුකූල ව එහි අධ්‍යයන වැඩසටහන්, කර්මාන්ත සහයෝගීතා සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට කටයුතු කළේ ය. වසංගතය අවසානයේ දී අධ්‍යයන කටයුතු පවත්වා ගෙන යාම සඳහා උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් යන දෙපිරිසම නැවත මෙම පරිශ්‍රයට කැඳවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පීඨය එහි අධ්‍යයන වැඩසටහන් නියමිත අධ්‍යයන වාරයට අනුකූල ව අන්තර් ක්‍රියාකාරීත්වයෙන් යුතු ව පවත්වන ලදී. සමස්තයක් වශයෙන් ගත්කල, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨය කළමනාකරණ අධ්‍යාපනයේ ඉහළ ම ප්‍රමිතිය කරා ළඟා වෙමින් සමාජයට විශාල වටිනාකමක් එක් කරමින් අඛණ්ඩ ව ක්‍රියාත්මක වෙමින් පවතී.

### ජයග්‍රහණ

#### පීඨ මට්ටමේ ජයග්‍රහණ

- AHEAD ප්‍රදාන යටතේ ලැබී ඇති වර්ග අඩි 6,000 ගොඩනැගිල්ල ඉදිකිරීම නිම කරන ලදී.

#### අධ්‍යයන ජයග්‍රහණ

- AHEAD ප්‍රදාන යටතේ ව්‍යාපාර දත්ත විශ්ලේෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම.

- පහත සඳහන් TOT වැඩසටහන් ක්‍රියාත්මක කිරීම: වෘත්තීය සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි SAGE 300, සහ මුල් අවදියේ පසුවන වෘත්තීය ශාස්ත්‍රඥයින්ගේ ශාස්ත්‍රීය ලිවීමේ කුසලතා වර්ධනය කිරීම, වෘත්තීය සැලසුම් සහ උපදේශනය.

- නව සිසුන් බඳවා ගැනීම සඳහා පෙර සූදානම් වීමේ වැඩසටහනක් සකස් කිරීම.

- උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීය ආධාරක කාර්ය රාමුව සහ සීමාවාසික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සැන්ඩ්බොක්ස් කන්සල්ටන්සි සර්විසස් (පුද්) සමාගම, හියුමන් රිසෝර්ස් ප්‍රොෆෙෂනල්ස් සමාගම සහ ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ සංගමය සමඟ අවබෝධතා ගිවිසුම් (MoU) අත්සන් කරන ලදී.

**පර්යේෂණ සහ ප්‍රකාශන**

- ජාතික සහ ජාත්‍යන්තර සඟරාවල පර්යේෂණ පත්‍රිකා 20ක් ප්‍රකාශයට පත් කරන ලද අතර ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා/සාරාංශ 25ක් ඉදිරිපත් කරන ලදී. (පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ප්‍රකාශිත/ඉදිරිපත් කරන ලද)

- "කළමනාකරණ උපාධි අපේක්ෂක සීමාවාසික සහ පර්යේෂණ සම්මන්ත්‍රණය - 2022" සංවිධානය කරන ලදී.

- "පේරාදෙණිය කළමනාකරණ සමාලෝචනය" නමින් යුත් කළමනාකරණ පීඨයේ වාර සඟරාවේ II වන වෙළුමේ II වන කලාපය පළ කිරීම.

- පීඨයේ ක්‍රියාකාරී ලිපි මාලාවේ I වෙළුම - 2021 පළ කිරීම.

**සම්මන්ත්‍රණ/ වැඩමුළු/ පුහුණු වැඩසටහන්**

- සිසුන්ගේ (උදා: විෂය ධාරා, පර්යේෂණ සහ සීමාවාසික පුහුණුව) සහ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ (උදා. පර්යේෂණ, ධාරිතා ගොඩනැගීම) ඉලක්ක කර ගනිමින් වැඩමුළු, සම්මන්ත්‍රණ සහ අනෙකුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් 125කට අධික ප්‍රමාණයක් පවත්වන ලදී.

- සිසුන් මුහුණ දෙන දුෂ්කරතා මඟහරවා ගැනීම සහ ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම වැඩිදියුණු කිරීම පිණිස සිසුන්ට උපකාර කිරීම සඳහා ශිෂ්‍ය උපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි සංවිධානය කරන ලදී.

- කර්මාන්ත උපදේශකයෙකු සමඟ සම්බන්ධ වීමට සිසුන්ට ඉඩ සලසමින් කර්මාන්ත උපදේශන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

**ජාත්‍යන්තර සහයෝගිතා**

- සිසුන් සහ කාර්ය මණ්ඩල සංචලනය ප්‍රවර්ධනය කිරීම සහ සහයෝගීතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා රුසියාවේ මොස්කව් මෙට්‍රොපොලිටන් ගවර්නන්ස් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

- කෙටි කාලීන ශිෂ්‍ය සංචලතා වැඩසටහන - FALL, 2022 යටතේ ජපානයේ සයිටමා විශ්වවිද්‍යාලය වෙත සිසුන් තිදෙනෙකු යවන ලදී.

**ශිෂ්‍ය ජයග්‍රහණ**

- සීමාසහිත කැපිටල් එලයන්ස් සමාගම විසින් සංවිධානය කරන ලද "Finatic" 2022 අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟයට අවසන් වසරේ සිසුන් සහභාගී වූ අතර ඔවුන් එහි අනුශූරයන් බවට පත් විය.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද "Fusecura 22" අන්තර් විශ්වවිද්‍යාල අභියෝගතා කුසලානයට සිසුන් හතර දෙනෙකු සහභාගී වූ අතර එහි දී ඔවුන්ට දෙවන අදියර ජයග්‍රහණය හිමි විය.

## 3.7 වෛද්‍ය පීඨය



**මහාචාර්ය එම්.වී.ජී. පින්ටෝ**
**පීඨාධිපති**

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකාවේ වෛද්‍ය උපාධි අපේක්ෂකයින් පුහුණු කරන ප්‍රමුඛත ම ආයතනයක් වන අතර, මෙම පීඨයට වාර්ෂික ව සිසුන් 208-253ක් (දේශීය 238ක් සහ විදේශීය 15ක් ) බඳවා ගනී. පීඨය විසින් 2022 වසරේ දී වෛද්‍ය උපාධි අපේක්ෂක කණ්ඩායම් හයක් සඳහා සුවිශේෂී අධ්‍යයන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. 2022 දී සිසුන් 1337ක් අධ්‍යයන පාඨමාලාවේ නියැලුන අතර ඒ සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය නිලධාරීන් 128ක් එක් ස්ථිර අධ්‍යයන සහය කාර්ය මණ්ඩලය නිලධාරියෙක්, ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරීන් දෙදෙනෙක්, ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 215ක් සහ සායනික පුහුණුව සඳහා ව්‍යාප්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් 115ක් සේවය සැපයූහ.

### ජයග්‍රහණ

**අධ්‍යයන වැඩසටහන**

කොවිඩ්-19 නිසා එල්ල වූ බාධා සහ අනෙකුත් අවහිරතා මධ්‍යයේ වුව ද ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පෙර නොවූ විරූ උත්සාහයන් සහ කැපවීම හේතුවෙන් 2022 වසර තුළ දී අපට අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට හැකි විය. වෛද්‍ය විද්‍යාවේදී පොදු අවසාන විභාගය 14/15 කණ්ඩායම සඳහා මාර්තු මස (නියමිත සිසුන් සඳහා) සහ අගෝස්තු (නැවත වරක් පෙනී සිටින සිසුන් සඳහා) පැවැත්විණි. විභාගයට පෙනී සිටි සිසුන් 214 දෙනෙකුගෙන් 196 දෙනෙකු සාර්ථක ව විභාගය සමත් විය. 15/16 ශිෂ්‍ය කණ්ඩායම සඳහා අධ්‍යයන වැඩසටහන අඛණ්ඩ ව පවත්වන ලද අතර, 2023 පෙබරවාරි මාසයේ දී සිසුන් පොදු බහුවරණ ප්‍රශ්න විභාගය වෙත යොමු කිරීමට අපට හැකි විය. සියලුම විභාග සැලසුම් කළ පරිදි පැවැත්විණි. සෞඛ්‍ය රෙගුලාසි අනුගමනය කරමින් සායනික පුහුණුව සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා ද ඇතුළු ව පුනරීක්ෂණ පන්ති සහ ප්‍රයෝගික ක්‍රියාකාරකම් භෞතික වශයෙන් ශිෂ්‍ය සහභාගීත්වය සහිත ව පැවැත්වීය. අද වන විට, උපාය මාර්ගික වැඩසටහනේ කිසිදු පසුබෑමක් සිදු වී නොමැත. සැලකිය යුතු ප්‍රමාණයක වූ අඩු පාඩු මඟ හරවා ගනිමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ උපදෙස් අනුව තවත් වෙනස්කම් බොහොමයක් සිදු කරමින් නව බඳවා ගැනීම් සිදු කළ සිසුන් සඳහා වසර පහකින් යුත් වෛද්‍ය විද්‍යාවේදී වැඩසටහන සම්පූර්ණ කිරීමට පීඨය කටයුතු කරමින් සිටී.

පීඨය සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ප්‍රතිපෝෂණ ලබා ගනිමින් සිසුන්ගේ ප්‍රායෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩ ව කටයුතු කළේ ය. විෂයමාලා සංශෝධනය 2023 දී අවසන් වීමට නියමිතය.

**යටිතල පහසුකම් සංවර්ධනය**

පැරා සායනික ගොඩනැගිල්ලේ II අදියර සම්පූර්ණ කරන ලදී. ශිෂ්‍ය ආපන ශාලාවේ නාන කාමර ප්‍රතිසංස්කරණය කිරීම නිම කරන ලදී. ඇතැම් අධ්‍යයනාංශ සහ පරිපාලන ගොඩනැගිල්ල තීන්ත ආලේප කරන ලදී.

**පර්යේෂණ**

පේරාදෙණිය වෛද්‍ය විද්‍යාල වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය (PeMSARCz22) 2022.09.30 දින ශිෂ්‍ය හා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 දෙනෙකුට 2021 සඳහා පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්ව සම්මාන පිරිනමන ලදී.

**විෂය බාහිර ක්‍රියාකාරකම්**

සිසුන් විෂය බාහිර ක්‍රියාකාරකම් රැසකට සහභාගී විය. එනම් වෙසක් පහන් කූඩුව නිර්මාණය කිරීම, භක්ති ගී, නත්තල් කැරොල්, තෛපොංගල් උත්සවය, සහ අවුරුදු සැමරුම් සංස්කෘතික උත්සව සහ අන්තර් පීඨ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, ආඛ්‍යාන තරඟ, විවාද තරඟ, පොත් ප්‍රකාශන, සංගීත හා නැටුම් සහිත කුසලතා සංදර්ශන ආදිය පැවැත්වීම. ඔවුන් විසින් ජාතික හා ජාත්‍යන්තර සම්මාන රැසක් දිනා ගන්නා ලදී. කාර්ය මණ්ඩලය, සිසුන් සහ දෙමාපියන් අරමුදල් රැස් කළ අතර අවශ්‍යතා ඇති සිසුන්ට විද්‍යුත් උපාංග, ශිෂ්‍යාධාර යෝජනා ක්‍රම සහ ශිෂ්‍යත්ව ලබා දුන්නේය. පීඨ ශිෂ්‍යත්ව කමිටුව හරහා සිසුන්ට ශිෂ්‍යත්ව 125ක් පිරිනමන ලදී.

**අනෙකුත් ජයග්‍රහණ**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ප්‍රතිතනය ලෝක වෛද්‍ය අධ්‍යාපන සම්මේලනයේ සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද අවම ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. පීඨය විසින් මේ වන විට මෙම නිර්ණායක නවය ම සතුටුදායක ලෙස සපුරා ඇත.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම, ගැටලු මත පදනම් වූ ඉගෙනීම සහ තනි හොඳම ප්‍රතිචාර සහ උචිත පුළුල් බහුවරණ ප්‍රශ්න ගොඩනැගීම, ඉගැන්වීමේ පිළිබඳ සමපදස්ථ නිරීක්ෂණ සහ අත්දැකීම් හුවමාරුකර ගැනීම ආදී අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඇතැම් වැඩසටහන් තුළ ඇතුළත් විය.

## 3.8 විද්‍යා පීඨය



**මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ**
**පීඨාධිපති**

**හැඳින්වීම**

සියලුම අධ්‍යයන කටයුතු නියමිත පරිදි මාර්ගගත ව සහ පුද්ගල සහභාගීත්වය ඇති ව සිදු කරන ලද අතර 2016 ශිෂ්‍ය කණ්ඩායමේ අධ්‍යයන කටයුතු සාර්ථක ව නිම කරන ලදී. විද්‍යා කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී ඒකකය (SIIC) කර්මාන්ත ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාලය අතර සබඳතා ශක්තිමත් කරන ලද අතර, විද්‍යා අධ්‍යාපන ඒකකය (SEU) විසින් දැනුම බෙදා හැරීම සඳහා වැඩසටහන් රාශියක් පවත්වන ලදී. බොහෝ අධ්‍යයනාංශ නව උපාධි වැඩසටහන්/ පාඨමාලා හඳුන්වාදීමේ කර්තව්‍යයක නියැලී සිටින අතර ඇතැම් වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්** - නව ක්ෂුද්‍ර ජීව විද්‍යා ගෞරව (MIC) උපාධිය, ජෛව වෛද්‍ය විද්‍යා ගෞරව (BMS) උපාධිය සහ දත්ත විද්‍යා ගෞරව උපාධිය යන උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කරන 19 සහ 20 ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ගෞරව උපාධි වැඩසටහන්වල සංශෝධිත විෂයමාලා ක්‍රියාත්මක කරන ලදී.

**ජයග්‍රහණ**

මානව සම්පත් කළමනාකරණ සංවර්ධනය පිණිස පුරප්පාඩු වූ අධ්‍යයන සේවක තනතුරු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. මෙහි දී රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණ, සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා සහ සත්ත්ව විද්‍යා යන අධ්‍යයනාංශ සඳහා අයදුම්කරුවන් තෝරා ගන්නා ලදී. අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්/ වැඩමුළු සාර්ථක ව නිම කරන ලදී. පිළිවෙළින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සහ තොරතුරු තාක්ෂණ ආයතනය විසින් විකිරණ සේවකයන් සඳහා පවත්වන ලද විකිරණ ආරක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් සහ ද්‍රව්‍යමය විශේෂීකරණය සඳහා විශ්ලේෂණාත්මක උපකරණ පිළිබඳ දින 2ක වැඩමුළුවක් තාක්ෂණ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් සම්පූර්ණ කරන ලදී. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද "ප්‍රමුඛ සහ කළමනාකරණ විශ්වවිද්‍යාල" යන මැයෙන් වූ වැඩසටහන සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් අට දෙනෙක් සහභාගී වූහ.

**සම්මාන සහ පර්යේෂණ ප්‍රකාශන** - මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ මහතාට විද්‍යාව ප්‍රවර්ධනය සඳහා වූ ජපන් සංගමයේ (JSPS) පර්යේෂණ සඳහා (කෙටි කාලීන) ආරාධිත සාමාජිකත්වය හිමි විය. මහාචාර්ය එස්.එච්.පී.පී කරුණාරත්න, ස්විට්සර්ලන්තයේ ජිනීවා හි (2022 සැප්තැම්බර් 6 සිට 10 දක්වා) පැවති එක්සත් ජාතීන්ගේ පරිසර ව්‍යාපෘතියේ (UNEP) 9 වන DDT විශේෂඥ කණ්ඩායම් රැස්වීම සඳහා විශේෂඥ සාමාජිකයෙකු ලෙස සහභාගී විය. එක්සත් ජනපද ගුවන් හමුදාව විසින් මහාචාර්ය ආර්.එම්.ජී රාජපක්ෂ වෙත ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයක් පිරිනමන ලදී.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය විසින් සංවිධානය කරන ලද 2022 අන්තර් විශ්වවිද්‍යාල පර්යේෂණ තරගය, E2 (රසායනික විද්‍යා) අංශයේ සම්මාන දහයෙන් පළමු සහ දෙවන සම්මානය ඇතුළු ව සම්මාන හතරක් විද්‍යා පීඨය විසින් දිනා ගන්නා ලදී. තව ද සිසුන් අන්තර් විශ්වවිද්‍යාල විවාදය තරගයට සහ මිනිත්තු 1ක ඉදිරිපත් කිරීමේ තරගට සහභාගී වී ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලදී. 2022 වර්ෂය තුළ, පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සුවිගත සඟරා 131ක්, සුවිගත නොකළ සඟරා 25ක් සහ සම්මන්ත්‍රණ ක්‍රියාකාරකම්වල පර්යේෂණ ලිපි 156ක් ප්‍රකාශයට පත් කරන ලදී.

**සම්මන්ත්‍රණ සහ අනෙකුත් වැඩසටහන්** - "ඉන්ස්පයර්", "FUTURA", සහ "Diaspores of Pera", නම් වූ ගණිත සංවාද මාලාව සහ ගණිත වැඩසටහන් ඉතිහාසය යටතේ වෙබිනාර්/සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. මෙයට අමතර ව, ආචාර්ය හෙන්රි තෘප් (ඇමරිකා එක්සත් ජනපදය) සහ ආචාර්ය ෂිර්වෙල් ස්ටැනිස්ලාන් (ඇමරිකා එක්සත් ජනපදය) යන අය සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පීඨය වෙත පැමිණිය හ. විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි "AKALANA" CHEMSOC යනා දී වශයෙන් වූ විවිධ වැඩසටහන් කිහිපයක් පැවැත්වීමෙන් පීඨයේ සමාජ සහජීවනය සහ සාමය ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන ලදී .

පොළොන්නරුව රාජකීය විද්‍යාලයේ සහ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ අ.පො.ස. (උ.පෙළ) සහ (සා.පෙළ) සිසුන් සඳහා විද්‍යා කඳවුරු දෙකක් විද්‍යා අධ්‍යාපන ඒකකය (SEU) මඟින් පැවැත්විණි. තව ද, විද්‍යා අධ්‍යාපන ඒකකය විසින් තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා.පෙළ) විද්‍යා ගුරුවරුන් 50 දෙනෙකු සඳහා එක්දින පුහුණු වැඩසටහනක් සහ අ.පො.ස (උ/පෙළ) විද්‍යා/ගණිත සිසුන් සඳහා විද්‍යා ප්‍රායෝගික වැඩසටහන් 17ක් විද්‍යා

අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ දී (SERC) පවත්වන ලදී. සංඛ්‍යාලේඛන කවය විසින් මැදමහනුවර විජයබා විද්‍යාලයේ සාමාන්‍ය පෙළ සිසුන් සඳහා විද්‍යා හා ගණිත වැඩමුළුවක් පවත්වන ලදී. 2022 වසර තුළ දී විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය විසින් සිසුන් සඳහා වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම මෙන් ම ඔවුන්ගේ ඉදිරි වෘත්තීන් සඳහා ඔවුන් සූදානම් කිරීම පිණිස වැඩමුළු අටක් සහ පුහුණු සැසි කිහිපයක්, ක්‍රමෝපා, මෙවලම් සහ ශිල්පීය ක්‍රම සහිත ව සාර්ථක ව පවත්වන ලදී. කාර්මික පුහුණු වැඩසටහන් හරහා උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික ස්ථානගත කිරීම් සිදු කරනු පිණිස ද විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය විසින් පහසුකම් සපයන ලදී. සාර්ථක ව පැවැත්වුණු කර්මාන්ත දිනය තුළින් උපාධිධාරී සිසුන්ට සහ මෑතකාලීන ව උපාධියලත් උපාධිධාරීන්ට රැකියා සඳහා අවස්ථා විවර විය.

**යටිතල පහසුකම් සංවර්ධනය** - රසායන විද්‍යා අධ්‍යයනාංශයේ නව ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන ලද අතර නව රසායන විද්‍යා ශ්‍රවණාගාරය විවෘත කරන ලදී. ගණිත දේශන ශාලාව නවීකරණය කරන ලද අතර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා M4 දේශන කාමරය සුහුරු පන්ති කාමරයක් බවට පරිවර්තනය කරන ලදී. අනුක ජෛව්‍ය විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයනාංශයේ දැනට පවතින රසායනාගාරයක් සෛල හා පටක රෝපණ රසායනාගාරයක් බවට පරිවර්තනය කරන ලදී. සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශයේ දැනට පවතින තවත් රසායනාගාරයක් ජෛව විද්‍යා රසායනාගාරයක් බවට පරිවර්තනය කරන ලදී. දේශන ශාලා දෙකක් හැර භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ විද්‍යාගාරවල විදුලි රැහැන් යළි තතැඳුම් කිරීම අවසන් කරන ලදී. ඊට අමතර ව, භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ තාරකා විද්‍යා සහ වායුගෝලීය විද්‍යාගාරයක්, ශ්‍රව්‍ය දෘශ්‍ය මැදිරියක්, විකිරණ භෞතික විද්‍යාගාරයක් සහ ශිෂ්‍ය සාකච්ඡා කාමරයක් ද ස්ථාපිත කරන ලදී.

**අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම්** - වැඩසටහන් සමාලෝචනයේ දී ව්‍යවහාරික විද්‍යා සහ විද්‍යාපති උපාධි පාඨමාලා සඳහා පිළිවෙලින් "A"සහ "B" ශ්‍රේණි හිමි විය. අතිරේක බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම පිණිස ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතින අතර, පීඨය වෙත රු.7,970,340.00 වටිනා භාණ්ඩ ප්‍රදානය කෙරුණි.

ගණිත අංශයේ අධ්‍යයන සාමාජිකයින් විසින් ගණිතය, සහ සංඛ්‍යාලේඛන සහ මෙහෙයුම් පර්යේෂණය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහන් සඳහා හොඳ ම දක්ෂතා දැක් වූ උපාධිධාරියාට හිමි රන් පදක්කම් දෙකක් දිනා ගන්නා ලදී. වර්ෂය තුළ විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය විසින් උපයා ඇති මුළු ආදායම රුපියල් 675,000 ඉක්මවයි. විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය විසින් පළමු වරට බාහිර ආයතනයක් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් පවත්වන ලද අතර එ මඟින් රුපියල් 20,000ක ආදායමක් උපයා ගන්නා ලදී. තව ද, විද්‍යා කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය විසින් ජපානයේ සීමා සහිත සූරියා සමාගම, සහ සීමා සහිත ශ්‍රී ලංකා ඩුවර් ඉනොවේටිව් ටෙක්නොලොජීස් (පුද්) සමාගම සමඟ සහයෝගීතාව සඳහා අභිලාශය ප්‍රකාශ කිරීමේ ලියවිල්ලක් අත්සන් කරන ලදී.

## 3.9 පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය



**මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර**
**පීඨාධිපති**

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය (FVMAS) ශ්‍රී ලංකාවේ පශු වෛද්‍යවරුන් බිහි කරන එක ම උසස් අධ්‍යාපන ආයතනය වේ. පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය අධ්‍යයනාංශ පහකින් සමන්විත වන අතර එවා මූලික පශු වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, පශු වෛද්‍ය ව්‍යාධි ජීව විද්‍යා අධ්‍යයනාංශය, පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය සහ ඖෂධවේද අධ්‍යයනාංශය, පශු වෛද්‍ය සායනික විද්‍යා අධ්‍යයනාංශය සහ ගොවිපළ සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යයනාංශය නම් වේ. පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය ජාත්‍යන්තර පශු වෛද්‍ය අධ්‍යාපන පරාමිතීන් සමඟ සමපාතවනු පිණිස එහි විෂය මාලාව 1991 සහ 2000 අතර කාලයේ විධිමත් සංශෝධනවලට භාජනය විය. වර්තමානයේ ක්‍රියාත්මක වන, ජාත්‍යන්තර ව පිළිගත් පශු වෛද්‍ය උපාධි වැඩසටහන් පවත්වා ගනිමින් සත්ත්ව සෞඛ්‍ය සඳහා වූ ලෝක සංවිධානය (OIE) නවසීලන්තයේ මෙසී විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ ව ක්‍රියාත්මත කරන වැඩසටහන යටතේ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධි පාඨමාලාව වසර හතරේ සිට පහ දක්වා දීර්ඝ කරමින් 2020 දී වඩාත් ම සුවිශේෂී විෂයමාලා සංශෝධනයක් සිදු කරන ලදී. කර්මාන්ත පදනම් කරගත් බාහිර පත්වීම් සහිත ව සහ දේශන රහිත ව අවසන් වසර ක්‍රියාත්මක වීම මෙම නව විෂය මාලාවේ ප්‍රධාන ලක්ෂණයකි. දැනට වාර්ෂික සිසුන් බඳවා ගැනීම එක් කණ්ඩායමකට සිසුන් 130කි. පීඨය විසින් එහි ශික්ෂණ රෝහල්, ශික්ෂණ ගොවිපළ සහ ජංගම පශු වෛද්‍ය සේවා සහ රසායනාගාර සේවා හරහා මහජනතාවට සුවිශේෂී සේවාවක් සපයනු ලබයි. තව ද, දේශීය හා විදේශීය අරමුදල් සපයන ආයතන මගින් අරමුදල් සපයන ශක්තිමත් සහ බහුවිධ පර්යේෂණ වැඩසටහනක් පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය තුළ ක්‍රියාත්මක වේ. පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය විසින් සත්ත්ව ප්‍රජනනය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් දෙකක් (MVetRepro සහ MVSc) සහ දර්ශනපති සහ දර්ශනශූරී යන පර්යේෂණ උපාධි පිරිනමනු ලබයි. පශු වෛද්‍ය උපාධිධාරීන්ගේ වර්තමාන සේවා නියුක්තිය 100% ක් වන අතර, ඔවුහු සත්ත්ව සෞඛ්‍ය හා නිෂ්පාදනය, පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය, ශාස්ත්‍රීය සහ පර්යේෂණ කටයුතු සම්බන්ධ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල දේශීය හා විදේශීය වශයෙන් සේවයේ යෙදී සිටිති. උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමේ රජයේ නියෝගයට සමගාමී ව, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය විසින් ප්‍රතිපත්තිමය වශයෙන්, කාර්ය මණ්ඩලය, උපකරණ, ගෘහ භාණ්ඩ හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අමතර අරමුදල් ලැබීමට යටත් ව 2019/2020 බඳවා ගැනීමේ සිට කණ්ඩායමකට බඳවා ගැනීම 130 දක්වා වැඩි කිරීමට එකඟ වී ඇත.

### ජයග්‍රහණ

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය විසින් 2015/2016, 2016/2017, 2017/2018, 2018/2019 සහ 2019/2020 ශිෂ්‍ය කාණ්ඩායම් සඳහා සිය අධ්‍යයන වැඩසටහන භෞතික ව පවත්වා ගෙන යනු ලැබීය. 2020/2021 ශිෂ්‍ය කණ්ඩායම සඳහා මාර්ගගත දිශානති වැඩසටහන (PREVET I, II සහ III) 2022 ජුනි 4 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2022 ඔක්තෝබර් දක්වා පැවතිණි. අනතුරු ව අපගේ ඉතිහාසයේ ප්‍රථම වතාවට සති හයක පශු වෛද්‍ය ක්‍රමවේදය පිළිබඳ ප්‍රායෝගික පෙර හුරු (Pre-Vet Exposure) වැඩසටහනක් පවත්වන ලද අතර එහි දී 2020/2021 ශිෂ්‍ය කණ්ඩායම ප්‍රායෝගික ව පශු වෛද්‍යවරුන්ගේ භූමිකාවට පළමුවරට අවතීර්ණ විය. මෙම සිසුන් සිය අත්දැකීම් මාර්ගගත ක්‍රමවේද මගින් ඉදිරිපත් කරනු ලැබීය. 2015/2016 කාණ්ඩායමේ සිසුන් 2022 මාර්තු මාසයේ දී ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කළ අතර, නැවත වරක් විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගේ විභාග ද අවසන් කරන ලදී. මේ වන විට ඔවුහු සිය අනිවාර්ය මාස 6ක සීමාවාසික පුහුණුවට සහභාගී වෙමින් සිටිති. අනෙකුත් සියලුම කණ්ඩායම්වල අධ්‍යයන වැඩසටහන් නියමිත පරිදි අඛණ්ඩ ව පවත්වන ලදී. 2022 දෙසැම්බර් 31 වන විට, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය භෞතික වශයෙන් ශිෂ්‍ය කණ්ඩායම් හතරකින් සමන්විත වූ අතර තවත් ශිෂ්‍ය කණ්ඩායමක අධ්‍යයන කටයුතු 2023 ජනවාරි 10 දින ආරම්භ කිරීමට නියමිත ව ඇත. පශු වෛද්‍ය උපාධි අපේක්ෂකයින්ට ගොවිපළ සතුන් පිළිබඳ සිය සායනික කුසලතා වර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය පුහුණු කටයුතුවල නියැලීමට අත්‍යවශ්‍ය අංගයක් ව පැවති පශු වෛද්‍ය ශික්ෂණ රෝහල පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් විසින් 2022 නොවැම්බර් 30 වන දින විවෘත කරන ලදී. 2023-2025 සඳහා පශු වෛද්‍ය විද්‍යාල පිළිබඳ ආසියානු සංගමයේ (AAVS) විධායක සභාවේ දකුණු ආසියානු පශු වෛද්‍ය විද්‍යාල නියෝජනය කිරීම සඳහා පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය තෝරා ගන්නා ලදී. පීඨය සඳහා පොදු ඉගැන්වීම් සංකීර්ණයක් ඉදිකිරීම සඳහා විකල්ප ස්ථානයක් ලබාගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

2022 වර්ෂයේ මුල් භාගය වන විට පැවැති ගමන් බාධක මධ්‍යයේ වුව ද පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයෙහි පශ්චාත් උපාධි වැඩසටහන් බාධාවකින් තොර ව අඛණ්ඩ ව පවත්වාගෙන ගිය අතර සිසුන් 65 දෙනෙකු පශු වෛද්‍යපති පශ්චාත් උපාධි (Theriogenology) වැඩසටහන සම්පූර්ණ කරන ලදී. තව ද සිසුන් 60 දෙනෙකු ඒ සඳහා අලුතෙන් ලියාපදිංචි විය. වසර තුළ දී, දර්ශනපති උපාධි දෙකක් සහ එක් දර්ශනශූරී ආචාර්ය උපාධියක් පමණක් සම්පූර්ණ කර ඇති අතර, ඒ සඳහා බඳවා ගැනීම පසුගිය වසරේ මෙන් යහපත් නොවීය. අධ්‍යයන කාර්ය මණ්ඩලය වසර තුළ දේශීය හා විදේශීය ආයතන විසින් අරමුදල් සපයන ලද සිය පර්යේෂණ කටයුතු අඛණ්ඩ ව කරගෙන ගියේ ය. පර්යේෂණ ව්‍යාපෘති සහ ජාත්‍යන්තර වැඩමුළු පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින්ට IAEA, UK පර්යේෂණ සහ නවෝත්පාදන, ICGEB, විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව සහ විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන ආයතනය යන ආයතන වෙතින් ප්‍රදාන පිරිනමා ඇත. 2022 වර්ෂය තුළ දී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු සහ තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ජාත්‍යන්තර වැඩමුළුවලට සහභාගී වී විදේශයන් හි (තායිලන්තය, පකිස්තානය, ඔස්ට්‍රියාව සහ ඔස්ට්‍රේලියාව විද්‍යාත්මක සංචාරයක නියැලී ඇත. මී ගව නිෂ්පාදනය සහ බෝ කිරීම වැඩිදියුණු කිරීම සඳහා IAEA තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කරන ලද සංකල්ප සටහන ඔවුන් විසින් පිළිගත් අතර, එම නියෝජිතායතනය සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් වසර තුළ සමපදස්ථ-සමාලෝචන පත්‍රිකා 25ක් ප්‍රකාශයට පත් කරන ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය ආදි ශිෂ්‍ය සංගමය (VAAP) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් වසර තුළ දී මූල්‍ය දුෂ්කරතා ඇති සිසුන්ට අඛණ්ඩ ව සහය දක්වනු ලැබීය. විදේශයන් හි වෘත්තීය කටයුතුවල නියැලෙන පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් විසින් තෙවන සහ අවසාන වසර උපාධි අපේක්ෂකයින් සඳහා බොහෝ මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදී.

සිසුන් විසින් විෂය බාහිර ක්‍රියාකාරකම් කිහිපයක් අන්තර්ජාලය හරහා සිදු කරන ලදී. වනජීවී සහ සොබාදහම් ඡායාරූප ශිල්පී ශිෂ්‍ය සංගමය එහි වාර්ෂික මහා සභා රැස්වීම දෙසැම්බර් මාසයේ දී පවත්වන ලද අතර, පූර්ව කමිටුව දෙසැම්බර් මාසයේ දී "වනජීවී වෙළඳාම සහ ජෛව විවිධත්ව සංරක්ෂණයට ඉන් එල්ලවන බලපෑම්" යන මැයෙන් වෙබිනාර් වැඩසටහනක් සංවිධානය කළේ ය. විශ්වවිද්‍යාලයේ සත්ත්ව සුබසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සිසුන් විසින් සංගමයක් ද පිහිටුවා ඇත.

## 3.10 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය



**මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව**
**අධ්‍යක්ෂ**

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනය ලෙස කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතන 1979 අංක 9 දරණ ආඥාපනත යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කරන ලදී. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ පශ්චාත් උපාධි මට්ටමින් කෘෂි කර්මාන්තය තුළ රටේ ධාරිතා සංවර්ධනය කිරීම සහ රටේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කෘෂිකාර්මික අංශයට සරිලන පරිදි නිසි පුහුණුව ලත් විද්‍යාත්මක පිරිස් බිහි කිරීමයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දශක හතරකට ආසන්න කාලයක් මෙම ජාතික අවශ්‍යතාවය පෙරදැරි ව සේවය සලසා ඇති අතර එය රටේ සහ කලාපයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා වන අංගසම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් සහ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත්ව තිබේ.

වර්තමානයේ, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) මාර්ගෝපදේශ යටතේ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පාඨමාලා කාර්යය (SLQF 9) මඟින් විද්‍යාපති උපාධි වැඩසටහන් (ව්‍යාපාර පරිපාලනපති උපාධිය ඇතුළු ව) 30ක් පවත්වනු ලබන අතර පාඨමාලා කාර්යය සහ පර්යේෂණ (SLQF 10) මඟින් විද්‍යාපති උපාධි වැඩසටහන් (ව්‍යාපාර පරිපාලනපති උපාධිය ඇතුලු ව) 30ක් පවත්වනු ලබයි. තව ද, අධ්‍යයන මණ්ඩල 11 යටතේ පර්යේෂණ උපාධි (දර්ශනපති, දර්ශනශූරී) උපාධි වැඩසටහන් ද පවත්වනු ලබයි. විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාතික හා ජාත්‍යන්තර ආයතන, පෞද්ගලික අංශයේ ආයතන ආදියේ පුළුල් ඉගැන්වීම් හා පර්යේෂණ අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයක් විසින් සියලුම පාඨමාලා සහ වැඩසටහන් පාහේ පවත්වනු ලබන බැවින් කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉගැන්වීමේ කාර්යයෙහි ලා සුවිශේෂී වේ. අති නවීන තාක්ෂණයෙන් සමන්විත කෘෂි විද්‍යා

පීඨයේ අංග සම්පූර්ණ විද්‍යාගාර හරහා වැඩි වශයෙන් ප්‍රායෝගික දැනුම හා පුහුණුව ලබා දීම සිදු කෙරේ. වර්තමානයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අවධානය යොමු වී ඇත්තේ අධ්‍යයන දැනුම ලබා දීමට පමණක් සීමා නොවී වැඩි පර්යේෂණ සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා ය. පසුගිය වසර 45ක කාලපරිච්ඡේදය තුළ, විවිධ උපාධි අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී ආයතනය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, එය ආරම්භයේ සිසුන් 19ක සිට මේ වන විට වාර්ෂික ව 500 කට අධික සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීම දක්වා වර්ධනය වී තිබේ. මේ වන විට ආයතනය විසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක පශ්චාත් උපාධිධාරීන් 6000 කට අධික ප්‍රමාණයක් බිහි කර කර ඇත. බොහෝ විදේශීය උපාධිධාරීන් මේ වන විට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි සම්පූර්ණ කර ඇති අතර දැනට තායිලන්තයේ සහ මාලදිවයිනේ සිසුන් ඔවුන්ගේ පර්යේෂණ උපාධි අධ්‍යයන කටයුතුවල නියැලී සිටිති. සමාජයේ පුළුල් පිරිසක් සඳහා අධ්‍යයන පහසුකම් සැලසීම පිණිස කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විද්‍යාපති උපාධි පාඨමාලා 4ක් ඉතා සාර්තක ව කොළඹ අගනුවර උපාධි පැවැත්වීමට කටයුතු කර ඇත. සමහර ආචාර්ය උපාධි ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ එක් ව ප්‍රදානය කෙරේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වයත් සහ අනතුරු ව ඇති වූ ඉන්ධන සහ ආර්ථික අර්බුදයත් සමඟ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය භූමි පරිශ්‍රයේ ඉගැන්වීමේ ක්‍රමවේදය අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කිරීමට සහ ඇගයීම් සිදු කිරීමට කඩිනමින් වෙනස් කළේ ය. සියලුම නිබන්ධන ආරක්ෂක විභාග ප්‍රමාදයකින් තොර ව මාර්ගගත සහ දෙමුහුන් ක්‍රම භාවිතා කර අවසන් කරන ලදී. වර්තමානයේ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විසින් අවශ්‍ය ප්‍රායෝගික පන්ති, ක්ෂේත්‍ර චාරිකා සහ විභාග සමගින් සියලුම වැඩසටහන් මාර්ගගත ව ඉදිරිපත් කරන අතර නවීන තාක්ෂණික පදනම් වූ යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග හඳුන්වා දෙමින් අඛණ්ඩ ව අනාගතයේ දී කටයුතු කිරීමට සැලසුම් කරයි.

2022 වර්ෂය තුළ, අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 511ක් ලියාපදිංචි කර ඇති අතර, ඒවායේ විස්තර පහත පරිදි වේ.

විද්‍යාපති - 461
ව්‍යාපාර කළමනාකරණපති - 29
දර්ශනපති - 10
දර්ශනශූරී - 8
අනියම් - 3

**ජයග්‍රහණ**

**ආචාර්ය ඒ.ඩබ්ලිව්.ආර් ජෝකිම් අනුස්මරණ සම්මානය**

2001 වසරේ ආරම්භ කරන ලද ආචාර්ය ඒ.ඩබ්ලිව්.ආර්. ජෝකිම් අනුස්මරණ සම්මානය, අවසාන අධ්‍යයන වර්ෂයේ දී සම්පූර්ණ විභාගය සාර්ථක ලෙස අවසන් කරමින් ඉහළ ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගනු ලබන දක්ෂත ම ශිෂ්‍යයාට පිරිනමනු ලැබේ. පහත ශිෂ්‍යයාව ඇයගේ උපාධි වැඩසටහන සඳහා ඉහළ ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය 4.00ක් ලබා ගනු ලැබූ අතර 2022 නොවැම්බර් 25 වන දින පැවති 34 වන වාර්ෂික සමුළුවේ දී ඇයට මුදල් ත්‍යාගයක් පිරිනමන ලදී.

| නම | අධ්‍යයන මණ්ඩලය | උපාධි වැඩසටහන |
|---|---|---|
| ඩබ්.ඩී.ඊ.පී.ඒ විතාන | පාංශු විද්‍යාව | පාරිසරික පාංශු විද්‍යාව පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධිය |

**පසුබෑම්**

පද්ධතිය අතථ්‍ය ක්‍රමවේදයකට පරිවර්තනය කිරීම සඳහා මාර්ගගත වේදිකා සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් කටයුතු කළ ද රටේ ආර්ථික තත්ත්වය සෑම අංශයකට ම බලපාන බැවින් සැලසුම් කර තිබූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කල් දැමීමට සිදු විය. තව ද, සිසුන්ගේ පර්යේෂණ කටයුතු කඩින් කඩ ඇණහිට ඇති අතර එ මගින් උපාධිධාරීන් බිහි කිරීම කෙරෙහි සෘණාත්මක බලපෑමක් එල්ල කර ඇත.

## 3.11 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය



**මහාචාර්ය එස්.ජේ.එස්. ද මෙල්**
**අධ්‍යක්ෂ**

### දළ විශ්ලේෂණය

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ව උසස් අධ්‍යාපනය සහ පුහුණු ලබා දීම මෙන් ම එම ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩිදියුණු කිරීම උදෙසා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24ඒ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ආඥාපනතක් මඟින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වසරේ දී ස්ථාපිත කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පර්යේෂණ හා නිර්මාණශීලි චින්තනයේ මෙන් ම සමාජ මෙහෙවර පිළිබඳ සංවේදීතාවයකින් හෙබි විචාරශීලි හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගුණ කිරීමට කැප වූ විද්වතුන් බිහි කිරීමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වීම මෙම ආයතනයේ ඉලක්කය වේ.

ආයතනය මේ වන විට (1) පශ්චාත් උපාධි ඩිප්ලෝමා, (2) පාඨමාලා මඟින් ශාස්ත්‍රපති උපාධි, (3) පාඨමාලා සහ පර්යේෂණ මඟින් ශාස්ත්‍රපති උපාධි සහ (4) දර්ශනපති හා දර්ශනශූරී වැනි පර්යේෂණ උපාධි පවත්වයි. මෙම වැඩසටහන්වල විෂය ක්ෂේත්‍රයන්ට අරාබි, පුරා විද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව/ ව්‍යවහාරික ආර්ථික විද්‍යාව, අධ්‍යාපන, ඉංග්‍රීසි භාෂාව, ලලිත කලාව, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාම් අධ්‍යයනය, නීතිය, කළමනාකරණය, පාලි භාෂාව, දර්ශනය, ශාරීරික අධ්‍යාපනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, හා දෙමළ භාෂාව ඇතුළත් වේ. තව ද, ආයතනය විසින් ප්‍රජා සංවර්ධනය සහ සැලසුම්කරණය, සංවර්ධන පරිචය, පාරිසරික කළමනාකරණය, මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදය, ජාත්‍යන්තර සබඳතා, සමාජ වැඩ සහ තිරසාර සංචාරක ව්‍යාපාරය යන අන්තර් විෂයීක/ බහු විෂයීක/ වෘත්තීය ක්ෂේත්‍රයන් හි පශ්චාත් උපාධි වැඩසටහන් පවත්වනු ලබයි. තව ද ආයතනය ශ්‍රම බලකාය තුළ නිශ්චිත කුසලතා ගොඩනැගීම සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් ද පවත්වයි. මෙම අධ්‍යයන වැඩසටහන් ආයතනයේ අධ්‍යයන මණ්ඩල පහ විසින් පවත්වනු ලබන අතර, සමස්ත කළමනාකරණය සහ මෙහෙයවීම කළමනාකරණ මණ්ඩලයේ මට්ටමින් සිදුවේ.

### 2022 වර්ෂයේ ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්/ ලැබූ ජයග්‍රහණ

2022 වර්ෂයේ දී, සියලුම පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා සිසුන් බඳවා ගන්නා ලද සිසුන් ප්‍රමාණය 874ක් විය. මනා සුදුසුකම් ලත් සම්පත් දායකයින් 180ක් පමණ බාහිර ඉගැන්වීම් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය ලෙස මෙම ආයතනයට සම්බන්ධ වී සිටින අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ශාස්ත්‍ර පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ වෙති. 2022 දී සිසුහු 991ක් මෙම ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන් සම්පූර්ණ කළහ. වසංගතයේ දිගුකාලීන අවශේෂ බලපෑම සහ පසු ව පැන නැගුන ආර්ථික අර්බුදයේ පූර්ණ බලපෑමෙන් එල්ල වූ බොහෝ අභියෝග මධ්‍යයේ වුව ද 2021 දෙසැම්බරයේ සිසුන් බඳවා ගැනීමෙන් ආරම්භ වූ අධ්‍යයන වර්ෂය 2022 දෙසැම්බර් මාසයේ දී සාර්ථක ව නිම කළ බව සටහන් කිරීමට හැකි වීම පිළිබඳව අපි විශේෂයෙන් සතුටු වෙමු. පන්ති කාමර තුළ පහසුකම් ඇති කිරීම සහ මාර්ගගත ඉගැන්වීම් මාදිලිය සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන් සතු ව පැවති පූර්ව අත්දැකීම් අවශ්‍ය අවස්ථාවන්හි දී මාර්ගගත සහ භෞතික ක්‍රම අතර බාධාවකින් තොර ව මාරුවෙමින් අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇත.

පර්යේෂණ නිමැවුම සම්බන්ධයෙන් ගත් කල, 2022 වර්ෂයේ දී විද්‍යාපති ශිෂ්‍යයින් 14ක් සහ දර්ශනශූරී ශිෂ්‍යයින් 5ක් සිය අධ්‍යයන වැඩසටහන් සම්පූර්ණ කර ඇත. වසරේ සිදු වූ විශේෂ කර්තව්‍යයක් වූයේ 2022 දෙසැම්බරයේ භෞතික ව පුද්ගල සහභාගීත්වයෙන් පවත්වන ලද පර්යේෂණ සම්මේලනයයි. මෙය ආයතනයේ පර්යේෂණ සිසුන්ට ඔවුන්ගේ දැනට ක්‍රියාත්මක ව පවතින හෝ සම්පූර්ණ කරන ලද කාර්යයන් ඉදිරිපත් කිරීමට ලැබුණ අවස්ථාවක් විය. ප්‍රධාන වශයෙන් ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් විසින් විසින් සකසන ලද පත්‍රිකා 65ක් පිළිගෙන ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ රාජකීය නෝර්වීජියානු තානාපති

කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධානී හිල්ඩ් බර්ජ් හැන්සෙන් මැතිණිය වෙත සත්කාර කිරීමට ලැබීම පිළිබඳව අපි සතුටු වෙමු.
2022 වසර තුළ දී අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAC) මෙහෙයුම් මඟින්, 2022-23 සඳහා වූ ආයතනික සමාලෝචනය පිළියෙළ කිරීම සහ 2023-2027 ඉදිරි පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. අදාළ ලිපි ලේඛන ක්‍රමානුකූල ව එකතු කිරීමේ සහ ගොනු කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය මෙයට ඇතුළත් වේ. අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ සම්බන්ධීකාරකගේ මගපෙන්වීම යටතේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ ලේකම්වරයෙකු පත් කරන ලද අතර එ මඟින් මෙම කාර්යය වඩා පහසු කර ඇත.

2022 වර්ෂය තුළ දී, ආයතනය විසින් එහි සාමාන්‍ය පරිපාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වා ගෙන යන ලදී. කොන්ත්‍රාත් පදනම මත අතිරේක සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීම, රැකියා ලැයිස්තුවල දක්වා ඇති පරිදි පරිපාලන හා මූල්‍ය වගකීම් පැවරීමට සහ පැවරී ඇති රැකියා සහ වගකීම් ඵලදායී ලෙස ඉටුකිරීම පිළිබඳ අධීක්ෂණය කිරීමට සහ පරීක්ෂා කිරීමට ආයතනයට උපකාර වී ඇත.

2022 වර්ෂයේ දී, ආයතනය විදේශ විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ මෙන් ම දේශීය ආයතන වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සහ පළාත් පාලන ආයතන සමඟ සිය සහයෝගිතාව අඛණ්ඩ ව පවත්වා ගෙන ගියේ ය. මෙම සහයෝගිතා කාර්යයන්ට (1) අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය සමඟ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය සංචලනය, සහ මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදය පිළිබඳ පර්යේෂණ සහයෝගීතාවයක් යටතේ පොත් ප්‍රකාශනය, (2) ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීම් කටයුතු සඳහා උපකරණ මිල දී ගැනීම, බෙල්ජියමේ Vrije විශ්වවිද්‍යාලය විසින් තවත් විශ්වවිද්‍යාල හයක් සම්බන්ධ කර ගනිමින් මෙහෙයවනු ලබන ජාතික සම්මන්ත්‍රණයක් සම සංවිධානය කිරීම සහ ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ පුහුණු ව්‍යාපෘතියක වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය, (3) මහජන කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා කැනඩා රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන NLEAP ව්‍යාපෘතිය යටතේ ජාතික භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම, (4) අධ්‍යාපන අමාත්‍යාංශය සහ යුනිසෙෆ් ආයතනය අතර ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මකවන ප්‍රාථමික අධ්‍යාපනයේ බහු මට්ටමේ ඉගැන්වීම් (MLT) ප්‍රවේශය පිළිබඳ ධාරිතා ගොඩනැගීම සහ විෂයමාලා සංවර්ධනය යන කටයුතු ඇතුළත් විය.

ආයතනික සංවර්ධනයට ආයතනික සැලැස්ම මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, සනාතන සභාව/පාලක සභාව අනුමත ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ක්‍රියා පටිපාටි සකස්කිරීම කිරීම යන කටයුතු ද ඇතුළත් විය.

**පාඨමාලාව අනුව සිසුන් බඳවා ගැනීම,2018-2021**

| පාඨමාලාව | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| **සහතික පත්‍ර පාඨමාලාව** | 8 | -- | -- |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා** | 89* | 147* | 768 |
| **ශාස්ත්‍රපති/ අධ්‍යාපනපති/ සංවර්ධන කාර්යයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව** | 575 | 381* | 95 |
| **දර්ශනපති** | 238 | 146 | 06 |
| **දර්ශනපති** | 24 | 31 | 05 |
| **එකතුව** | **934** | **705** | **874** |

**වැඩසටහන සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව 2018-2021**

| පාඨමාලාව | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| **සහතික පත්‍ර පාඨමාලාව** | 6 | 2 | | | | |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා** | 36 | 53 | 85 | 344 | 110 | 504 |
| **ශාස්ත්‍රපති/ අධ්‍යාපනපති/ සංවර්ධන කාර්යයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව** | 191 | 384 | 83 | 128 | 112 | 246 |
| **දර්ශනපති** | 140 | 98 | 16 | 3 | 8 | 6 |
| **දර්ශනශූරී** | 10 | 14 | 1 | 1 | 4 | 1 |
| **එකතුව** | **383** | **551** | **185** | **476** | **234** | **757** |

## 3.12 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය



**මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න**
**අධ්‍යක්ෂ**

### 2022 වර්ෂය පිළිබඳ දළ විශ්ලේෂණයක්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24a (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2019 අංක 2141/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

2022 වර්ෂයේ දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් අධ්‍යක්ෂක, සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී, තාවකාලික පර්යේෂණ සහකාර, කළමනාකරණ සහකාර සහ කාර්මික නිලධාරී යනුවෙන් අනුමත සේවක තනතුරු හයක් (6) ඇති කරන ලදී. මහාචාර්ය සමත් ඩී ධර්මරත්න මහතා අධ්‍යක්ෂවරයා ලෙස 2021 සැප්තැම්බර් 01 වන දින පත් කරන ලද අතර ඔහු විසින් 2021 සැප්තැම්බර් 02 දින ධූරයේ වැඩ භාර ගන්නා ලදී. අධ්‍යක්ෂවරයා පත් කරන විට ආයතනය පිහිටුවීමට ස්ථානයක් නොවීය. එනමුත් ආයතනය පිහිටුවීම සඳහා ගැටඹේ පැරණි පොලිස් ස්ථාන ගොඩනැගිල්ල ලබා ගැනීමට අධ්‍යක්ෂවරයා සමත් විය. ඔහු 2022 මාර්තු මාසයේ දී තාවකාලික පර්යේෂණ සහකාර සහ කළමනාකරණ සහකාර සමග මෙම ගොඩනැගිල්ලට පැමිණ රාජකාරි ඇරඹුවේය.

රටේ උද්ගත වූ ආර්ථික හා සමාජීය අර්බුදයත් සමඟ බඳවා ගැනීම් සිදු කිරීම සම්බන්ධයෙන් රට තුළ මතු වූ අභියෝගාත්මක වාතාවරණය හේතුවෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා නව නිලධාරීන් බඳවා ගැනීම ප්‍රමාද විය. එබැවින්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් ලබා දෙන ලද වැඩබලන සහකාර ලේඛකාධිකාරීවරයෙකු සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ලබාදෙන ලද වැඩබලන නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙකු සමඟින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ක්‍රියාත්මක විය.

අධ්‍යක්ෂවරයා පත් කරන විට අනුමත සේවක සංඛ්‍යාව පැවතීම අත්‍යවශ්‍ය වුව ද, ඔවුන්ට වැටුප් ගෙවීමට තිබූ නොහැකියාව මත තාවකාලික සේවක සංඛ්‍යාවක් පත් කිරීමට පවා නොහැකි විය. උපකුලපති, වෛද්‍ය පීඨයේ පීඨාධිපති, මූල්‍යාධිකාරී සහ ලේඛකාධිකාරී යන අයගේ සහයෝගය, දිරිගැන්වීම් සහ අභිප්‍රේරණය හේතුවෙන්, 2022 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරන ලදී.

### 2022 ප්‍රධාන ක්‍රියාකාරකම්

2022 ජනවාරි මාසයේ දී වෛද්‍ය පීඨයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත කළමනාකරණ සහකාරවරයෙකු නිදහස් කරන ලදී.

2021 සැප්තැම්බර් මාසයේ දී වෛද්‍ය පීඨයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත අර්ධකාලීන සහකාර ලේඛකාධිකාරීවරයෙකු සහ සහකාර මූල්‍යාධිකාරීවරයෙකු ලබා දෙන ලදී.

වෛද්‍ය පීඨය මඟින් තාවකාලික පර්යේෂණ සහකාරවරයෙකු සඳහා කාර්ය මණ්ඩලයේ අවකාශ ලබා දී ඇති අතර, 2021 දෙසැම්බර් මාසයේ දී ඒ සඳහා පුද්ගලයෙකු තෝරාගෙන රාජකාරි භාර ගන්නා ලදී.

2022 පෙබරවාරි මාසයේ දී සනාතන සභාව විසින් කාර්ය සහයකයෙකු වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කර එවන ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මිලියන දෙකක ණයක් ලබා දෙන ලදී. අධ්‍යක්ෂවරයාගේ වැටුප පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලබාගත් ණය මුදලින් ගෙවන ලදී. එම ණය මුදලින් අධ්‍යක්ෂවරයාට ඩෙස්ක්ටොප් පරිගණක, දෙකක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීමට හැකි විය.

වෛද්‍ය පීඨය විසින් මේස දෙකක්, පුටු තුනක්, සහ කබඩ් හතරක් ප්‍රදානය කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ භාවිතය සඳහා පරිගණකය වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය විසින් ලබා දෙන ලදී.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් කළමනාකරණ මණ්ඩලය වැනි තීරණ ගැනීමේ ආයතනවල රැස්වීම් නිතිපතා පවත්වන ලද අතර ඔවුන්ගේ උපදෙස් සහ අනුමැතිය අනුව තීරණ ගන්නා ලදී. තාවකාලික පර්යේෂණ සහකාර සේවක සංඛ්‍යාව 2022 ජුනි වන විටත් කළමනාකරණ සහකාර සේවක සංඛ්‍යාව 2022 දෙසැම්බර් වන විටත් පුරවා ඇත.

තව ද, අධ්‍යයන මණ්ඩලයේ සමාරම්භක රැස්වීම් 2022 දී පැවැත්විණි. වෛද්‍ය විද්‍යාවේ පහත සඳහන් එක් එක් සුවිශේෂ විෂය ක්ෂේත්‍ර සඳහා ආයතනය විසින් අධ්‍යයන මණ්ඩල පිහිටුවා ඇති අතර, අධ්‍යයන මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත

කොමිෂන් සභාව විසින් ඉගැන්වීම් සහ පුහුණුව අනුමත කිරීමට අදහස් කෙරේ.

- සායනික විද්‍යාව
- මූලික වෛද්‍ය විද්‍යාව
- ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව
- සෞඛ්‍ය විද්‍යාව

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව 2022 දෙසැම්බර් මාසයේ දී රැස්විය.

ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති යන උපාධි දෙකක වැඩසටහන් 2023 ජනවාරි මාසයේ දී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පිළිවෙළින් 2022 ජූලි සහ ඔක්තෝම්බර් මාසවල දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ලිපි යවන ලදී.

2022-2026 උපායමාර්ගික සැලැස්ම, 2022, 2023 ක්‍රියාකාරී සැලැස්ම, 2023 ප්‍රසම්පාදන සැලැස්ම සහ 2022 වාර්ෂික වාර්තාව පිළියෙල කරන ලදී.

**ජයග්‍රහණ**

ගැටඹේ පැරණි පොලිස් ස්ථාන ගොඩනැගිල්ලේ ආයතනය පිහිටුවීමට අධ්‍යක්ෂවරයා සමත් විය.

අධ්‍යක්ෂක, සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී, තාවකාලික පර්යේෂණ සහකාර, කළමනාකරණ සහකාර සහ කාර්මික නිලධාරී යනුවෙන් අනුමත සේවක තනතුරු හයක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතු ව පවතී.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පහත පුරප්පාඩු පුරවන ලදී.

- අධ්‍යක්ෂ
- කළමනාකරණ සහකාර
- පර්යේෂණ සහකාර.

## 3.13 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය



**මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල**
**අධ්‍යක්ෂ**

### හැඳින්වීම

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික ආයතනයකි. වර්තමානයේ ශිෂ්‍යයින් 2750කට ආසන්න සිසුන් ප්‍රමාණයක් විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි වේ. විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට අදාළ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය යන කාර්යයන් සිදු කිරීම හා එතුළින් උපාධිධාරී අධ්‍යයන කටයුතු ඉහළනැංවීම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ජාතියේ රාජ්‍ය හා පුද්ගලික අංශයේ පවතින ඉල්ලුම සපුරාලනු පිණිස විද්‍යාපති, දර්ශනශූරි, දර්ශනපති උපාධි වැඩසටහන් මෙන් ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා ද ප්‍රදානය කරනු ලබයි. පර්යේෂණ වැඩසටහන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ හෝ අදාළ පර්යේෂණ ආයතනයක් තුළ සිදු කිරීම සඳහා ප්‍රතිපාදන පවතී. මෙම ආයතනයේ බොහෝමයක් පර්යේෂණ වැඩසටහන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සහ අනෙකුත් පීඨ මෙන් ම රටේ වෙනත් ආයතන සමඟ සහයෝගීතාවයෙන් පවත්වනු ලබයි. මෙහි ශිෂ්‍ය ගහනය විද්‍යා විෂය ධාරාවේ විවිධ ක්ෂේත්‍ර හදාරන දේශීය සහ විදේශීය සිසුන්ගෙන් සමන්විත වේ. ඊට අමතර ව කෙටි පාඨමාලා හා වැඩමුළු වැනි ව්‍යුහාත්මක පුහුණු වැඩසටහන් ද නිරන්තරයෙන් පවත්වයි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම වැඩසටහන් විද්‍යා අධ්‍යාපනය ඇතුලු සියලුම විද්‍යා ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අධ්‍යයන මණ්ඩල 11ක් හරහා පවත්වනු ලබයි. මෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨ නවයෙන් මෙන් ම වෙනත් විශ්වවිද්‍යාලවලින්, ආයතන හා කර්මාන්ත ක්ෂෙත්‍රයෙන් කැඳවා ගනු ලබයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට හා රාජ්‍ය/පුදගලික අංශයේ ආයතනවලට උපදේශන සේවාවන් ද ලබාදෙනු ලබයි. ජාත්‍යන්තර ආයතන සහ රාජ්‍ය ආයතන සමඟ එක් ව විවිධ ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩසටහන් මෙන් ම සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘති ද දියත්කොට ඇත. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව ඇතුලු සම්මන්ත්‍රණ සහ සමුළු දෙස් විදෙස් සහභාගීවන්නන්ගේ අධ්‍යයන සහයෝගීතාවෙන් සිදු කරනු ලබයි. මෙම ආයතනය එහි කැපවීමෙන් කටයුතු කරන මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලය හරහා සිය පාර්ශවකරුවන් වෙනුවෙන් කාර්යක්ෂම සේවාවන් ලබාදෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය අවුරුදු කිහිපය තුළ ජාත්‍යන්තරකරණය වෙනුවෙන් දරන ලද ප්‍රයත්නයන් වඩාත් ශක්තිමත් වී ඇත. විද්‍යාත්මක හා පර්යේෂණ ක්ෂේත්‍රයෙ හි ආසියාවේ හොඳ ම පශ්චාත් උපාධි ආයතනය බවට පත්වීම පිළිබඳ එහි දැක්ම ඉදිරියේ දී සාක්ෂාත් කරගැනීම ආයතනයේ අපේක්ෂාව වේ.

### ජයග්‍රහණ

**පර්යේෂණ ක්‍රියාකාරකම් - සම්මාන, ප්‍රකාශන සහ පර්යේෂණ ප්‍රදාන**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අනුබද්ධ විද්වතුන්/ විද්‍යාඥයින් විසින් සිදු කරන ලද කාර්යයන් හි ප්‍රතිඵල වශයෙන් පර්යේෂණ ප්‍රකාශන පිළියෙල වී ඇති අතර, ඉන් ඇතැම් ප්‍රකාශන විද්‍යුත් සඟරා ඇතුලු ජාත්‍යන්තර සඟරාවල ද දේශීය සඟරාවල ද පළ වී තිබේ. මීට අමතර ව, විද්‍යාඥයින් විසින් සම්මන්ත්‍රණ වල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් මත පදනම් ව සාරාංශ ද ප්‍රකාශයට පත් කර ඇත. පාරිසරික ගැටලු පිළිබඳ ජාත්‍යන්තර සඟරාව (IJEI) නිකුත් කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, එළිදැක්වීමේ උත්සවය 2023 ජනවාරි මාසයේ දී පැවැත්විණි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පර්යේෂණ ප්‍රදාන 10ක් පිරිනැමීමට සහ විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන දෙකක් සඳහා මූල්‍ය ආධාර ලබා දීමට කටයුතු යොදා තිබුණි.

**සමුළු සහ කෙටිකාලීන වැඩසටහන්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සම්මන්ත්‍රණ සහ සේවාස්ථ පුහුණු වැඩසටහන් ඇතුලු ව 2022 වර්ෂයේ දී කෙටි කාලීන වැඩසටහන් හයක් පවත්වන ලදී. එසේ 2022 දී පවත්වන ලද සම්මන්ත්‍රණ/ සමුළු නම්: "සංවේදී ආවේගයන්" නමින් වූ ස්නායු විද්‍යාව පිළිබඳ වැඩමුළුවක්, විද්‍යා අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක්, ගණිත අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම පිළිබඳ වැඩමුළුවක්, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සම්මේලනය (RESCON) 2022, විද්‍යාත්මක රචනය පිළිබඳ වැඩමුළු සහ විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව

සහ ජාත්‍යන්තර පර්යේෂණ සංවිධානය සමඟ ඒකාබද්ධ ව පවත්වන ලද වැඩමුළු සහ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එහි තරුණ පර්යේෂණ සංසදයේ සාමාජිකයින් අතර පවත්වන ලද මිනිත්තු 3 නිබන්ධන තරඟ වේ. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් දේශීය කර්මාන්ත සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා උපදේශන සේවා ද සපය යි.

**මානව හා භෞතික සම්පත් සංවර්ධනය**

**මානව සම්පත්**

ඉල්ලා අස් වූ ස්ථිර/තාවකාලික සාමාජිකයින් සඳහා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරක් 2022 දී පුරවන ලදී.
විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්ගේ විවිධ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත දුක්ගැනවිලි පිළිබඳ කමිටුවක් ස්ථාපිත කරන ලදී.

**භෞතික සම්පත්**

ආයතනයේ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා WDXRF උපකරණය මිල දී ගෙන ඇති අතර, අභ්‍යන්තර හා බාහිර විද්‍යාඥයින් සඳහා සේවාව සපයනු ලැබේ. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් උපාධි හා පශ්චාත් උපාධි සිසුන්ට පහසුකම් සැලසීම සඳහා විද්‍යා පීඨයට පරිගණක 19ක් පරිත්‍යාග කරන ලදී. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දත්ත විද්‍යා ඒකකය අලුතින් ස්ථාපනය කරන ලද ඉහළ කාර්ය සාධනයක් සහිත සර්වරයක් සමඟින් වැඩිදියුණු කරන ලද අතර, නව සර්වර 4ක් ක්‍රියාත්මක කිරීමත් සමඟ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු විය.

**නව විද්‍යාපති වැඩසටහන්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2022 දී අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනක් සහ විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනක් (ICT) හඳුන්වා දෙන ලදී. නව විද්‍යාපති වැඩසටහන් 05 සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සූදානම් කරමින් පවතී.

- ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන
- ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන
- ව්‍යවහාරික භූ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන
- මූල්‍ය ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන
- සමුද්‍ර විද්‍යා සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන

## 3.14 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල ජාලය



**ආර්. මහේෂ්වරන් මහතා**
**පුස්තකාලයාධිපති**

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය ලංකා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පුස්තකාලය ලෙස 1921 වසරේ කොළඹ දී ආරම්භ කරන ලද අතර අනතුරු ව 1952 වසරේ දී එය පේරාදෙණියට ගෙන එන ලදී. ඉන් පසු 1960 වර්ෂයේ දී එය වර්තමානයේ ස්ථාපිත කොට තිබෙන පරිශ්‍රයට ගෙන එන ලදී. පේරාදෙණියට ගෙන ඒමෙන් අනතුරු ව ප්‍රධාන පුස්තකාලය කෘෂි විද්‍යා, සම සෞඛ්‍ය, දන්ත, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා හා පශු වෛද්‍ය විද්‍යා යන ශාඛා පුස්තකාල හතකින් සමන්විත පුස්තකාල ජාලයක් බවට සංවර්ධනය වී ඇත. මෙහි නවවන ශාඛා පුස්තකාලය කෘෂි විද්‍යා පීඨයට අයත් මහඉලුප්පල්ලම උපමණ්ඩපයට අනුයුක්ත කොට ඇති අතර අනෙකුත් ශාඛා පුස්තකාල අදාළ පීඨයන්හි ම පිහිටා ඇත.

නවගලහ පාරේ කලා රඟහල පිවිසුම පසු කර දකුණු දෙසට වන සනාතන සහා ගොඩනැගිල්ල දෙසට ගමන් කිරීමෙන් ප්‍රධාන පුස්තකාලයට පිවිසිය හැකිය. පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාල ජාලය ශ්‍රී ලංකාවේ පැරණිත ම හා විශාලත ම විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතියයි. පුස්තකාලයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු http://www.lib.pdn.ac.lk/About_us/general_info/general_info.html යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

**ජයග්‍රහණ**

**තොග සත්‍යාපනය**

සම සෞඛ්‍ය විද්‍යා, දන්ත, ඉංජිනේරු, කෘෂි විද්‍යා හා කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පුස්තකාලවල තොග සත්‍යාපනය සාර්ථක ව සිදු කර එම වාර්තා අදාළ බලධාරීන්ට ලබා දී ඇත. ප්‍රධාන පුස්තකාලයේ තොග සත්‍යාපනය ද බොහෝදුරට අවසන් ව ඇත.

**පුස්තකාල හා තොරතුරු අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව පාඨමාලාව**

පුස්තකාල සහ තොරතුරු අධ්‍යයන ඩිප්ලෝමා වැඩසටහන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ සහයෝගීතාවයෙන් සහ පහසුකම් සහිත ව සාර්ථක ව පවත්වනු ලබන අතර, පළමු කණ්ඩායමේ පාඨමාලා අවසන් වීමට ආසන්න ව පවතී. මෙම පාඨමාලාව භාෂා මාධ්‍ය තුනෙන් ම පවත්වනු ලැබේ. (දෙමළ මාධ්‍ය සිසුන් 130, සිංහල මාධ්‍ය සිසුන් 27 සහ ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් 6)

**විදුලි රැහැන් යළි ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය**

ප්‍රධාන පුස්තකාලයේ විදුලි රැහැන් යළි ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී සාර්ථක ව අවසන් කරන ලදී. මෙ මඟින් පුස්තකාල ගොඩනැගිල්ලේ සහ එහි අඩංගු වත්කම්වල ආරක්ෂාව සහතික කෙරේ.

**තල් කොළ අත්පිටපත් සංරක්ෂණය**

ශ්‍රී ලංකාවේ දෙවන විශාලත ම තල් කොළ පුස්තක එකතුව වන ප්‍රධාන පුස්තකාලයේ ඇති තල් කොළ පුස්තක එකතුව කළු මැදීමේ ක්‍රියාවලිය අපගේ පුහුණු කාර්ය මණ්ඩලය විසින් සාර්ථක ව සිදු කරනු ලැබේ.

**යුනෙස්කෝ ලෝක උරුමය - මහාවංශ පුස්කොළ අත් පිටපත**

දැනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ තබා ඇති "මහාවංශයේ" (මහා වංශකථාවේ) පැරණි සහ මුල් තල් කොළ පත්‍ර පිටපතක් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඒකාබද්ධ ව යුනෙස්කෝ ලෝකයක් උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනා කර ඇත.

**සංසරණ මොඩියුලය සක්‍රිය කිරීම**

ප්‍රධාන පුස්තකාලයේ පාඨක සේවා අංශය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ ශාස්ත්‍ර පීඨයේ පළමු වසර සිසුන් සඳහා ස්වයංක්‍රීය සංසරණ පහසුකම් සැපයීම ආරම්භ කර ඇත.

**කෞතුකාගාරය සඳහා නව ස්ථානය**

ප්‍රධාන පුස්තකාල නව ගොඩනැගිල්ලේ බිම් මහලේ කෞතුකාගාරයක් සඳහා ස්ථානයක් වෙන් කර ඇත. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර කෞතුකාගාරය සහ පුස්කොළ එකතුව මෙම විශේෂිත ප්‍රදේශයේ මහජන ප්‍රදර්ශනය සඳහා ස්ථානගත කර ඇත. මෙම ස්ථානය වායු සමීකරණ, සුදුසු ආලෝකකරණය සහ අනෙකුත් පහසුකම්වලින් සමන්විත වේ.

**ප්‍රදර්ශන සීමා ප්‍රදේශය**

අවශ්‍ය සියලු පහසුකම් සහිත ව ප්‍රධාන පුස්තකාල නව ගොඩනැගිල්ලේ බිම් මහලේ චිත්‍ර සහ/හෝ වෙනත් ප්‍රදර්ශන පැවැත්වීම සඳහා සුවිශේෂී ඉඩක් වෙන් කර ඇත. මෙම අවකාශය අනාගතයේ දී කලාගාරයක් ලෙස ද භාවිතා කළ හැක.

**එක් වහලක් යට විශේෂ පොත් එකතුවක්**

පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා බොහෝ විශේෂ පුස්තක එකතු ප්‍රධාන පුස්තකාලයේ නව ගොඩනැගිල්ලේ පස්වන මහලේ තබා ඇත.

**මානව පුස්තකාල වැඩසටහන**

පුස්තකාල ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට ගනිමින් මානව පුස්තකාල සංකල්පය සාර්ථක ව ක්‍රියාත්මක කර ඇත.

**විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුස්තක එකතුවක් සහ ස්ථානයක්**

බ්‍රේල් පොත් එකතුවක් සහ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා සුවිශේෂී ස්ථානයක් දැන් ප්‍රධාන පුස්තකාලයේ පැරණි ගොඩනැගිල්ලේ (පැරණි ලංකා කාමරය) බිම් මහලේ පිහිටා ඇත.

**නව ලංකා කාමරය**

ප්‍රධාන පුස්තකාලයේ නව ගොඩනැගිල්ලේ 2 වැනි මහලේ වඩාත් ඉඩකඩ සහිත ස්ථානයකට ලංකා කාමරය මාරු කර ඇත.

# මූල්‍ය සුවිශේෂිතා 2022

| | | |
|---|---|---|
| රු. 10,194.4 මිලි. මෙහෙයුම් ආදායම | රු. 8,007.8 මිලි. රජයේ ප්‍රදාන | රු. 240.9 මිලි. AHEAD ව්‍යාපෘති ප්‍රදාන |
| රු. 423.37 මිලි. අභ්‍යන්තර ව උත්පාධිත ආදායම් | රු. 9,198.5 මිලි. මෙහෙයුම් වියදම් | රු. 7,217.4 මිලි. පුද්ගල පඩිනඩි |
| රු. 1,981.1 මිලි. අනෙකුත් වියදම් | රු. 32,482.2 මිලි. මුළු වත්කම් | රු. 3,598.7 මිලි. ජංගම වත්කම් |
| රු. 28,883.5 මිලි. ජංගම නොවන වත්කම් | රු. 0.74 මිලි. මුළු ඒක ශිෂ්‍ය පිරිවැය | |

# විගණන සහ මූල්‍ය වාර්තා

## 3.15 මූල්‍ය වාර්තාව



**ඒ.එම්.එන්.බී. අරම්පත් මහතා**
**මූල්‍යාධිකාරී**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලන අංශය මුදල් කළමනාකරණය, මූල්‍ය සැලසුම්කරණය සහ අයවැයකරණය, භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය කළමනාකරණ වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සබඳතා, පශ්චාත් උපාධි ක්‍රියාකාරකම් ඇතුළු ස්වයං මූල්‍ය කටයුතු, ජාත්‍යන්තර සහ දේශීය පර්යේෂණ ප්‍රදාන සහ ශිෂ්‍යත්ව කළමනාකරණය, ආයෝජන කළඹ, ආයතනික ව්‍යාපෘති මූල්‍යකරණය, පූර්ණ රාජ්‍ය පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන සහ විශ්වවිද්‍යාලය හරහා ජනනය කරන ලද ආදායම යටතේ සිසුන්ගේ ශිෂ්‍යත්ව කළමනාකරණය සහ මූල්‍යකරණය වැනි මූල්‍ය කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කරයි.

### මෙහෙයුම් ව්‍යුහය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලන අංශයේ ප්‍රධානත්වය පූර්ණ කාලීන නිලධාරියෙකු වන මූල්‍යාධිකාරී විසින් දරනු ලබන අතර 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් ඔහුට ප්‍රදානය කළ හෝ පනවා ඇති හෝ පවරනු ලබන බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම ඔහු විසින් සිදු කළ යුතු ය. විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු අතර, නීතිරීති මගින් නියම කර ඇති පරිදි සහ ආකාරයෙන් එහි ගිණුම් පවත්වාගෙන යා යුතු ය. විශ්වවිද්‍යාල අරමුදල්වල භාරකාරත්වය ඔහු සතු වේ.

පහත දැක්වෙන උප අංශ දොළහ (12) මගින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලනය මධ්‍යගත ව ක්‍රියාත්මක කරනු ලබන අතර ඊට අමතර ව නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් සහ සහකාර මූල්‍යාධිකාරීවරුන් යටතේ මූල්‍ය පරිපාලන ශාඛා දහයේ (10) පීඨ නවයේ (09) සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ (බාහිර උපාධිය) මූල්‍ය කටයුතු සිදු කරනු ලබයි.

- ගිණුම් සහ වාර්තා අංශය
- ශිෂ්‍ය සේවා සහ සුබසාධන අංශය
- වැටුප් සහ වේතන අංශය
- ආදායම් අංශය
- ගෙවීම් සහ අයවැය පාලන අංශය
- ප්‍රසම්පාදන අංශය
- පර්යේෂණ, අරමුදල් සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් අංශය
- විශ්‍රාම ප්‍රතිලාභ අංශය
- ආයෝජන කළඹ කළමනාකරණ අංශය
- ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය ණය සහ පරිපාලන අංශය
- ගබඩා කළමනාකරණ සහ ස්ථාවර වත්කම් අංශය
- මධ්‍යස්ථානවල විදේශ සැපයුම් සහ මූල්‍ය අංශය

### ව්‍යවසාය සම්පත් සැලසුම්

බොහෝ ආයතන තම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ කළමනාකරණය කිරීමේ අපේක්ෂාවෙන් ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති ක්‍රියාත්මක කරයි. ව්‍යවසාය සම්පත් සැලසුම් යනු ව්‍යාපාරයක් විසින් දෛනික මූල්‍ය සහ අනෙකුත් මෙහෙයුම් ක්‍රියාවලි සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා භාවිත කරන මෘදුකාංග හෝ පද්ධතියකි. ගබඩා පාලනය කළමනාකරණය, ශිෂ්‍ය සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව ආදී කේවල ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීමට සහ සරල කිරීමට එය භාවිත කළ හැක. ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය සාමාන්‍යයෙන් ඕනෑම ආයතනයක මෙහෙයුම්වල සියලුම අංග ආවරණය කරන අතර පොදුවේ ගත් කල එ මගින්, ඒකාබද්ධ පද්ධතියක්, පොදු දත්ත සමුදායක්, තත්‍ය කාලීන මෙහෙයුම්, යෙදුම් සහ සංරචක හරහා පොදු පරිශීලක ප්‍රවේශ සපයනු ලබයි. ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට මාරුවීම/ හඳුන්වා දීම මගින් කඩදාසි භාවිතය අවම කිරීම සහ ලිපි ගොනු කටයුතු, මූල්‍ය සම්බන්ධ සෑම කාර්යයක් ම ස්වයංක්‍රීය කිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා තත්‍ය කාලීන තොරතුරු ජනනය කිරීම, වාර්තාකරණය සහ සැලසුම් කිරීම වැඩිදියුණු කිරීම, විශ්වවිද්‍යාලයේ සියලුම මෙහෙයුම් ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීම, සහ මානව සහ ප්‍රාග්ධන සම්පත් අවශ්‍යතා අවම කිරීම මගින් සියලු සම්පත් ඵලදායී ව සහ කාර්යක්ෂම ව කළමනාකරණය කිරීම විශ්වවිද්‍යාලයේ බලාපොරොත්තුව වේ.

SAP Business One ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය 2022 වසරේ සිට විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කර ක්‍රියාත්මක කර ඇති අතර එ මඟින් විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ, අධ්‍යයනාංශ, අංශ, ඒකක සහ මධ්‍යස්ථාන ඒකාබද්ධ කරයි. විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් මොඩියුල මූලික ව හඳුන්වා දෙන ලදී.

- ප්‍රසම්පාදන
- භාණ්ඩ තොග කළමනාකරණය
- ගෙවීම්
- ලැබීම් ඇතුලු ව ආදායම.
- ස්ථාවර වත්කම් සහ සැකසුම්.
- පර්යේෂණ අරමුදල් සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්
- ගෙවීම් පද්ධතිය සහ ණය
- ගිණුම්කරණය සහ වාර්තා කිරීම
- විගණනය

එපමණක් නොව මානව සම්පත් කළමනාකරණ මොඩියුල මඟින් ඒකාබද්ධ පඩිපත් ක්‍රමය, කාර්ය මණ්ඩල ණය සහ සේවයට වාර්තා කිරීමේ කාල ක්‍රමය ආදිය යටතේ අධ්‍යයන සහ අනධ්‍යයන ආයතන දෙක විසින් සිදු කරනු ලබන මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා ද මෙම ස්වයංක්‍රීය පද්ධතිය ව්‍යාප්ත වේ.

දැනට, විශ්වවිද්‍යාලය SAP Business One පද්ධතියේ ජංගම අනුවාදය මිල දී ගැනීම සඳහා ශක්‍යතා සහ යටිතල පහසුකම් ඇගයීමට ලක් කරයි. එසේම, විශ්වවිද්‍යාලය ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට සමගාමී ව සියලුම මූල්‍ය ගනුදෙනු සඳහා මාර්ගගත ගෙවීම් පහසුකම් ආරම්භ කිරීමට සැලසුම් කරයි.

## මූල්‍ය කාර්ය සාධනය

### ආදායම

| ආදායම් වර්ගය | 2022 (රු. මිලි.) | 2021 (රු. මිලි.) | 2020 (රු. මිලි.) | 2019 (රු. මිලි.) | 2018 (රු. මිලි.) |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 7,790.0 | 7,531.0 | 7,372.0 | 6,799.0 | 5,352.0 |
| - ප්‍රාග්ධන | 238.5 | 982.5 | 988.7 | 799.0 | 1,532.7 |
| ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව | 217.8 | 229.7 | 364.9 | 356.0 | 325.0 |
| වෙනත් ආදායම් | 2,085.6 | 2,111.5 | 1,294.9 | 1,454.0 | **1,512.4** |







### වියදම්

| වියදම් වර්ගය | 2022 (රු. මිලි.) | 2021 (රු. මිලි.) | 2020 (රු. මිලි.) | 2019 (රු. මිලි.) | 2018 (රු. මිලි.) |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10,272.0 | 9,299.7 | 9,947.0 | 10,349.7 | 7,822.1 |
| - ප්‍රාග්ධන | 137.4 | 934.8 | 988.7 | 799.0 | 1,532.7 |
| **එකතුව** | **10,409.4** | **10,234.5** | **10,935.7** | **11,148.7** | **9,354.8** |






**අගය එකතු කිරීම**

| **ජංගම නොවන වත්කම් වර්ගය** | 2022 (රු. මිලි.) | 2021 (රු. මිලි.) | 2020 (රු. මිලි.) | 2019 (රු. මිලි.) | 2018 (රු. මිලි.) |
|---|---|---|---|---|---|
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 161.3 | 147.0 | 128.3 | 113.1 | 106.0 |
| දේපළ, පිරියත සහ උපකරණ | 26,317.9 | 21,910.4 | 22,052.8 | 22,051.5 | 22,181.7 |
| කෙරෙමින් පවතින වැඩ | 2,356.6 | 2,113.7 | 1,812.5 | 1,841.4 | 1,458.0 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 23.9 | 15.4 | 10.5 | 11.0 | 8.9 |
| අස්පෘශ්‍ය වත්කම් | 23.8 | 25.7 | 20.8 | 6.9 | 5.9 |
| **එකතුව** | **28,883.5** | **24,212.2** | **24,024.9** | **24,023.9** | **23,760.5** |

**මූල්‍ය තත්ත්වය**

**මුළු වත්කම්**

| **වත්කම් වර්ගය** | 2022 (රු. මිලි.) | 2021 (රු. මිලි.) | 2020 (රු. මිලි.) | 2019 (රු. මිලි.) | 2018 (රු. මිලි.) |
|---|---|---|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ස්පෘශ්‍ය | | | | | |
| - අස්පෘශ්‍ය | 23.8 | 25.6 | 20.8 | 6.9 | 5.9 |
| කෙරෙමින් පවතින වැඩ | 2,356.5 | 2,113.7 | 1,812.5 | 1,841.4 | 1,458.0 |
| ආයෝජන - දායාද අරමුදල් | 300.6 | 290.9 | 260.3 | 233.0 | 216.7 |
| - සීමිත අරමුදල් | 1,701.0 | 1,495.7 | 1,281.9 | 1,112.5 | 1079.5 |
| ගබඩා භාණ්ඩ | 302.2 | 279.0 | 276.9 | 265.9 | 250.0 |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල් | 240.9 | 132.9 | 144.3 | 155.6 | 162.7 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 185.3 | 162.4 | 138.8 | 124.1 | 114.9 |
| වෙනත් ජංගම වත්කම් | 1,054.0 | 1,196.9 | 657.7 | 907.7 | 661.8 |
| **එකතුව** | **32,482.2** | **27,607.6** | **26,646.0** | **26,698.6** | **26,131.2** |




1. ස්පෘශ්‍ය
2. අස්පෘශ්‍ය
3. කෙරෙමින් පවතින වැඩ
4. ආයෝජන - දායාද අරමුදල
5. ආයෝජන - සීමිත අරමුදල්
6. ගබඩා භාණ්ඩ
7. බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු
8. වෙනත් ජංගම නොවන වත්කම්
9. වෙනත් ජංගම වත්කම්
10. **එකතුව** – දේපළ, පිරියත සහ උපකරණ




1. ස්පෘශ්‍ය
2. අස්පෘශ්‍ය
3. කෙරෙමින් පවතින වැඩ
4. ආයෝජන - දායාද අරමුදල
5. ආයෝජන - සීමිත අරමුදල්
6. ගබඩා භාණ්ඩ
7. බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු
8. වෙනත් ජංගම නොවන වත්කම්
9. වෙනත් ජංගම වත්කම්
10. **එකතුව** – දේපළ, පිරියත සහ උපකරණ

**මුළු වත්කම්**

| | 2022 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2019 (රු.මිලි.) | 2018 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| මුළු ජංගම වත්කම් | 3,598.7 | 3,395.4 | 2,621.1 | 2,674.7 | 2,370.7 |
| මුළු ජංගම වගකීම් | 493.4 | 355.5 | 414.9 | 595.6 | 564.1 |
| ජංගම වත්කම් සහ ජංගම වගකීම් සංසන්දනය | 7.3 | 9.6 | 6.3 | 4.5 | 4.2 |

**මූල්‍ය තත්ත්වය (සුවිශේෂීතා)**

| වත්කම් වර්ගය | 2022 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2019 (රු.මිලි.) | 2018 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ස්පෘශ්‍ය | 26,317.9 | 21,910.5 | 22,052.8 | 22,051.5 | 22,181.7 |
| - අස්පෘශ්‍ය | 23.8 | 25.6 | 20.8 | 6.9 | 5.9 |
| කෙරෙමින් පවතින වැඩ | 2,356.5 | 2,113.7 | 1,812.5 | 1,841.4 | 1,458.0 |
| ආයෝජන - දායාද අරමුදල් | 300.6 | 290.9 | 260.3 | 233.0 | 216.7 |
| - සීමිත අරමුදල් | 1,701.0 | 1,495.7 | 1,281.9 | 1,112.5 | 1079.5 |
| ගබඩා භාණ්ඩ | 302.2 | 279.0 | 276.9 | 265.9 | 250.0 |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල් | 240.9 | 132.9 | 144.3 | 155.6 | 162.7 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 185.3 | 162.4 | 138.8 | 124.1 | 114.9 |
| වෙනත් ජංගම වත්කම් | 1,054.0 | 1,196.9 | 657.7 | 907.7 | 661.8 |
| එකතුව | **32,482.2** | **27,607.6** | **26,646.0** | **26,698.6** | **26,131.2** |

**මුළු ජංගම නොවන වත්කම්**

**ජංගම වත්කම් සංයුතිය**

| ජංගම වත්කම් වර්ගය | 2022 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2019 (රු.මිලි.) | 2018 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| මුදල් සහ මුදල් සමාන දෑ | 585.8 | 817.4 | 212.4 | 413.3 | 201.7 |
| ආයෝජන - දායාද අරමුදල් | 300.6 | 290.9 | 260.3 | 233.0 | 216.7 |
| ආයෝජනය - සීමිත අරමුදල | 1,701.0 | 1,495.7 | 1,281.9 | 1,112.5 | 1,079.5 |
| අත්තිකාරම් | 113.7 | 225.2 | 257.2 | 301.7 | 275.3 |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු මුදල් | 286.5 | 96.1 | 132.2 | 127.9 | 120.3 |
| ගබඩා භාණ්ඩ | 302.2 | 279.0 | 276.9 | 265.9 | 250.0 |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල් | 240.9 | 132.9 | 144.3 | 155.6 | 162.7 |
| වෙනත් ජංගම වත්කම් | 68.0 | 58.2 | 55.9 | 64.8 | 64.5 |
| එකතුව | **3598.7** | **3395.4** | **2621.1** | **2674.7** | **2370.7** |

**ජංගම වත්කම් සංයුතිය-2022**




**ජංගම වත්කම් සංයුතිය-2021**



**ජංගම වත්කම් සහ ජංගම වගකීම් සංසන්දනය**

| | 2022 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2019 (රු.මිලි.) | 2018 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| මුළු ආදායම | 10,331.9 | 10,854.7 | 9,031.8 | 8,609.0 | 7,189.4 |
| අඩු කළා - මෙහෙයුම් වියදම් | (10,409.4) | (10,234.5) | (9,947.0) | (10,349.7) | (7,822.1) |
| ශුද්ධ (හිගය)/අතිරික්තය | (77.5) | 620.2 | (915.2) | (1,740.7) | (632.7) |
| එකතු කළා: මූල්‍ය නොවන ගනුදෙනු | 1,310.4 | 711.6 | 1,311.9 | 1,859.8 | 774.0 |
| අගය එකතුකිරීම | **1,232.9** | **1,331.8** | **396.7** | **119.1** | **141.3** |

**ඒක ශිෂ්‍ය පිරිවැය**

| **පීඨය** | 2022 (රු.මිලි.) | 2021 (රු.මිලි.) | 2020 (රු.මිලි.) | 2019 (රු.මිලි.) | 2018 (රු.මිලි.) |
|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | 0.97 | 1.02 | 1.19 | 0.72 | 0.63 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 0.74 | 0.82 | 0.81 | 0.49 | 0.42 |
| ශාස්ත්‍ර පීඨය | 0.55 | 0.68 | 0.71 | 0.41 | 0.35 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 1.44 | 1.93 | 2.08 | 1.16 | 0.95 |
| ඉංජිනේරු පීඨය | 0.82 | 0.93 | 0.96 | 0.61 | 0.55 |
| කළමනාකරණ පීඨය | 0.58 | 0.67 | 0.66 | 0.44 | 0.36 |
| වෛද්‍ය පීඨය | 0.98 | 1.07 | 1.11 | 0.64 | 0.60 |
| විද්‍යා පීඨය | 0.69 | 0.80 | 0.85 | 0.49 | 0.42 |
| පශු වෛද්‍ය පීඨය | 1.02 | 1.35 | 1.45 | 0.85 | 0.69 |

## 3.16 විගණන කමිටු වාර්තාව



**ජේ.සී. වර්ණකුල මහතා**
**සභාපති**

### හැඳින්වීම

විගණන හා කළමනාකරණ කමිටුව 2020.02.16 දින පැවති 491 වන විශ්වවිද්‍යාල පාලක සභා රැස්වීමේ දී පත් කරන ලදී. මෙම කමිටුව යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයේ 7.4.1 ඡේදයේ දක්වා ඇති විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලයේ විධායක නොවන පාලක සභා සාමාජිකයින් තිදෙනෙකු සහ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජිකයෙකුගෙන් සමන්විත වේ. 2022 වර්ෂෙයේ දී විගණන හා කළමනාකරණ කමිටුවට නව සභා සාමාජිකයින් දෙදෙනෙකු සහ නව භාණ්ඩාගාර නියෝජිතයෙකු පත් කරන ලදී.

2022 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලයේ උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී යන අයගේ සහභාගීත්වයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස කටයුතු කරන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයින් ලෙස මෙම රැස්වීම් සඳහා සහභාගී වූහ. විගණන හා කළමනාකරණ කමිටුව යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් චක්‍රලේඛ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛවලට අනුකූල ව සිය රාජකාරී ඉටු කරනු ලබන අතර මූල්‍ය, අධ්‍යයන, අනධ්‍යයන මෙහෙයුම් කටයුතුවල අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම මෙන් ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම ද සිදු කරයි.

### ප්‍රගතිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර පාලනය සහ විගණනය වැඩිදියුණු කිරීමට සහ නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට මග පාදන ලද නිර්දේශ, උපදෙස් සහ යෝජනා බොහොමයක් ඉදිරිපත් කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා අඛණ්ඩ ව 07 වන වර්ෂයටත් විගණකාධිපතිවරයාගෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමත් විය.

### අභ්‍යන්තර විගණන අංශය

විගණන හා කළමනාකරණ කමිටුවේ මගපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද වැදගත් කාර්යයන් පහත පරිදි සාරාංශ කළ හැකිය.

- අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන හා කළමනාකරණ කමිටුව අනුමත කරන ලද වැඩසටහන් 17කින් විගණන වැඩසටහන් 15ක් 2022 වර්ෂය තුළ ආවරණය කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලන පද්ධති බලාත්මක කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් 39ක් මත පදනම් ව අභ්‍යන්තර විගණන වාර්තා 40ක් නිකුත් කරමින් අභ්‍යන්තර විගණන අංශය නිර්දේශ 300කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත.

- නිම කරන ලද සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති, පුනරුත්ථාපනය, ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් විගණනයක් පැවැත්වීම.

- ප්‍රධාන පුස්තකාලයේ සහ පීඨ පුස්තකාල වල පුස්තකාල පොත් සත්‍යාපනය කිරීමේ පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ශිෂ්‍යයන් සඳහා දායාද අරමුදල් ප්‍රදානය කිරීම සහ පරිහරණය කිරීම.

- පුහුණු වැඩසටහන්, පර්යේෂණ මෙහෙයුම් සහ ස්වයං-උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ විශේෂ විගණනය සිදු කිරීම.

- තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය, උද්‍යාන අංශය සහ පාරිසරික තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයේ මෙහෙයුම් පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- සායනික ලොකර් මිල දී ගැනීම පිළිබඳ ප්‍රසම්පාදන විගණනය සිදු කර මේ සම්බන්ධ පාඩු වාර්තා කිරීම.

- ගෙවීම් වවුචර, විශේෂයෙන් පුනරාවර්තන වියදම් සහ අත්තිකාරම් ලේඛන සමාලෝචනය කර විගණනය සිදු කිරීම.

- ස්වයං මූල්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති/මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම

සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් වන පද්ධතිය පිළිබඳ තොරතුරු තාක්ෂණ විගණනයක් පැවැත්වීම.

- විද්‍යා පීඨයට, සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අදාළ පර්යේෂණ ප්‍රදාන පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචන සිදු කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයට අදාළ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්, වෙනත් අරමුදල් සහ පර්යේෂණ ප්‍රදාන භාවිතය පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචන සිදු කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- විශ්වවිද්‍යාල සිසුන්ට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අධිශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ දී අත්සන් කළ යුතු බැඳුම්කර සහ ගිවිසුමේ ආදර්ශ ඉදිරිපත් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත් කිරීම සඳහා කළමනාකරණ ලිපි නිකුත් කිරීම.

- බාහිර විගණකවරයා සමඟ කටයුතු කර, විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සහ වාර්තාවල පෙන්වා දෙන ලද දෝෂ සහ අඩුපාඩු සම්බන්ධයෙන් පියවර ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට උපදෙස් දීම.

- විගණන විමසුම් සහ ඒවායේ පසු විපරම් ක්‍රියා සම්බන්ධයෙන් යොමු කරන ලද පිළිතුරු අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය, සේවකයින්ගේ පැමිණීම, දන්ත වෛද්‍ය පීඨයේ ගබඩා භාණ්ඩ සහ තොග සත්‍යාපනය, කොන්ත්‍රාත් පරිපාලනය, ආදායම්, වියදම්, ආයෝජන, ප්‍රසම්පාදන, වැටුප් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩිදියුණු කිරීම, කාර්ය මණ්ඩල නිල නිවාස කළමනාකරණය, බඳවා ගැනීම්, උසස්වීම්, විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම (වි.අ.අ. නිදහස් කිරීම), බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම, පාරිසරික කළමනාකරණය (උද්‍යාන අලංකරණය), මුදල් කළමනාකරණය යනාදිය සඳහා සමාලෝචන සිදු කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

මීට අමතර ව, අභ්‍යන්තර විගණන අංශය නියැදි විගණන ශිල්පීය ක්‍රම, පාලන පරීක්ෂණ, සැලකිය යුතු විශ්ලේෂණ ක්‍රියා පටිපාටි සහ සවිස්තරාත්මක සාරාංශ ක්‍රියා පටිපාටි භාවිත කරමින් එහි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කර ඇත.

අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය සඳහා පහත සාරාංශගත කර ඇති අනිවාර්ය සාමාන්‍ය පූර්ව විගණන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

| පූර්ව විගණන ක්‍රියාකාරකම් (ගොනු සංඛ්‍යාව) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | එකතුව |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (ස්ථිර) | 106 | 01 | 01 | - | 108 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (තාවකාලික) | 300 | - | - | - | 300 |
| විශ්‍රාම පාරිතෝෂිකය | 83 | 01 | - | - | 84 |
| විශ්‍රාම වැටුප් | 20 | - | - | - | 20 |
| බැඳුම්කර සහ ගිවිසුම් | 18 | - | - | - | 18 |
| ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගෙවීම | 33 | - | - | - | 33 |
| හිඟ වැටුප් | 12 | - | - | - | 12 |
| මුළු එකතුව | 572 | 02 | 01 | - | 575 |

2022 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය සඳහා පූර්ව විගණන කටයුතුවලට අදාළ ව රු. 2,361,386.53ක මුදලක් ඉතිරි කර ගන්නා ලදී.

- **ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම්**

විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කරමින් විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී ඇත. පසුගිය වසර හතර සඳහා පහත විස්තර ඉදිරිපත් කළ හැකිය.

| වර්ෂය | විගණන විමසුම් ගණන | පිළිතුරු ලබාදුන් විමසුම් ගණන | පිළිතුරු නොදුන්/ පිළිතුරු දිය යුතු ව පවතින විගණන විමසුම් ගණන |
|---|---|---|---|
| 2019 | 19 | 19 | - |
| 2020 | 26 | 26 | - |
| 2021 | 27 | 27 | - |
| 2022 | 39 | 25 | 14 |

# 4.

# තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වඩාත් පරිසර හිතකාමී සහ වගකීම් සහගත අනාගතයක් සඳහා වූ සිය දැක්ම බෙදා හදා ගැනීම සඳහා ක්‍රියාශීලී ව කටයුතු කරයි. පාරිසරික සංරක්ෂණය, නවෝත්පාදනය සහ ප්‍රජා සංවර්ධනය සඳහා එහි කැපවීම පෙන්නුම් කරන විභව මුලපිරීම් සහ යෝජනා ගෙන හැර දක්වමින් මෙම වාර්තාව විශ්වවිද්‍යාලයේ අභිප්‍රායන් සහ ඉලක්ක ඉස්මතු කර දක්වයි. විශ්වවිද්‍යාලය මෙන් ම ප්‍රජාව විෂයයෙහි හිතකර බලපෑමක් ඇති කිරීම සඳහා තිරසාරභාවය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් විශ්වවිද්‍යාලය ඉදිරියට යමින් සිටී.

පහත සඳහන් ව්‍යාපෘති සහ ඉලක්ක, ඒවායේ ඉකුත් වසරෙ හි සාර්ථකත්වය මත පදනම් ව, එහි අනාගත දියුණුව අපේක්ෂා කරයි.

**සේවක පිරිස් සංවර්ධනය සහ පුහුණුව:**

- සේවක මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හරහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා "Enact" ව්‍යාපෘතිය අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම.
- විස්තීරණ කාර්ය මණ්ඩල පුහුණුව තුළින් පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණය වැඩි දියුණු කිරීම.

**විෂයමාලා සංවර්ධනය:**

- හරිත මානව සම්පත් කළමනාකරණය සහ තිරසාර අලෙවිකරණය වැනි විෂයයන් පිරිනමමින් ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධි විෂය මාලාවට තිරසාර සංවර්ධනය ආශ්‍රිත පාඨමාලා ඒකාබද්ධ කිරීම.
- ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ තිරසාර පරිචයන් ඇති කිරීම සඳහා අවශ්‍ය දැනුමෙන් සහ කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීම.

**මාර්ගගත විභාග ක්‍රියාවලි:**

- මාර්ගගත විභාගවල දී පිළිතුරු පත්‍රවල මෘදු පිටපත් හි ඉලෙක්ට්‍රොනික ලකුණු කිරීම ක්‍රියාත්මක කිරීම.
- කඩදාසි භාවිතය අඩු කිරීම සහ විභාග ඇගයීම වඩාත් පරිසර හිතකාමී කිරීමට උපකාරී වන ක්‍රමවත් ශ්‍රේණිගත කිරීමේ ක්‍රියා පටිපාටි ඇති කිරීම.

**ISO ජාත්‍යන්තර ප්‍රමිතිය 14001 සමඟ අනුකූල වීම :**

- ISO ජාත්‍යන්තර ප්‍රමිත 14001 ප්‍රමිතීන්ට අනුකූල ව විශ්වවිද්‍යාලය පුරා කාර්යක්ෂම පාරිසරික කළමනාකරණ ක්‍රියා පටිපාටි සහතික කිරීම.

**පාරිසරික දැනුවත්භාවය සහ පුහුණුව:**

- අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයන් අතර දැනුවත්භාවය වැඩි කිරීම.
- ISO ජාත්‍යන්තර ප්‍රමිත 14001:2015 පාරිසරික කළමනාකරණ පද්ධතිය හා සම්බන්ධ කෙටි කාලීන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම.
- තිරසාර පරිචය සඳහා සහය වනු පිණිස විශ්වවිද්‍යාල ප්‍රජාවට විවිධ අනුබලතා සලසා දීම.

**කසළ කළමනාකරණය සහ තිරසාරභාවය:**

- විශ්වවිද්‍යාලය තුළ පොලිතින්වලින් තොර පරිසරයක් ඇති කිරීම.

- ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය ආරක්ෂිත ව පිළිස්සීම සඳහා දහන යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම.

- අපද්‍රව්‍ය වෙන් කිරීම, කොම්පෝස්ට් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහයෝගී ප්‍රයත්නයක් දැරීම.

- අන්තරායකර ද්‍රව්‍ය සහ ජෛව අන්තරායකර අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම සඳහා නිර්දේශ සංවර්ධනය කිරීම.

**රසායනාගාර ආරක්ෂාව සහ නඩත්තුව:**

- ආරක්ෂාව පිළිබඳ අවදානම් සහ උපද්‍රව අවම කිරීම පිණිස රසායනාගාරවල සාමාන්‍ය නඩත්තු කිරීම කෙරෙහි නිරන්තර කැපවීම.

- ආරක්ෂිත රසායනාගාර ක්‍රියා පටිපාටි සහ නඩත්තුව පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපනික මුලපිරීම් සැලසුම් කිරීම.

**විශ්වවිද්‍යාලීය වැඩිදියුණු කිරීම්:**

- විශ්වවිද්‍යාලය අවට ප්‍රදේශයේ උද්‍යාන අලංකරණය කිරීම සහ ආකර්ශනීය වූ හා ප්‍රායෝගික වූ පසුබිමක් සැපයීම සඳහා අභ්‍යන්තරික වශයෙන් ප්‍රතිනිර්මාණය කිරීම.

- සිසුන්, සේවකයින් සහ අමුත්තන් සඳහා සමස්ත විශ්වවිද්‍යාල පරිසරය වැඩි දියුණු කිරීම.

**ස්වයංක්‍රීයකරණය සහ කඩදාසි රහිත සන්නිවේදනය:**

- කඩදාසි භාවිතය අඩු කිරීම සහ ඩිජිටල් සන්නිවේදන මාර්ග භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

- කාර්යක්ෂම සන්නිවේදනය දියුණු කිරීම සහ අධ්‍යයන හා පරිපාලන ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

**නවෝත්පාදන වාණිජකරණය:**

- විශ්වවිද්‍යාල ව්‍යාපෘති හරහා සංවර්ධනය කරන ලද නව්‍ය නිෂ්පාදන වාණිජකරණය කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සීමිත වගකීම් සහිත සමාගමක් පිහිටුවීම.
- හවුල් ව්‍යාපාර හරහා ආදායම් උත්පාදනය සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 වසර සඳහා වූ අනාගත ප්‍රක්ෂේපණය, එහි ක්‍රියාකාරීත්වයේ සෑම ක්ෂේත්‍රයක ම තිරසර සංවර්ධන මූලධර්ම ඉදිරියට ගෙන යාම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ව්‍යාපෘති සඳහා සහය දැක්වීමෙන් විශ්වවිද්‍යාලය බලාපොරොත්තු වන්නේ, තම හාත්පස ප්‍රදේශයට සහ අවට පරිසරයට ප්‍රතිලාභ ලබා දෙන හරිතමය වූ ද, වඩාත් ඵලදායී වූ ද, සමාජ සවිඥානක ආයතනයක් ගොඩනැගීමටයි.



# 5. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාපිත වාර්තාව

**1. පොදු කරුණු**

1.1 විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (1) සහ 107 (ආ) වගන්ති සහ ඉන් පසු සංශෝධන ප්‍රකාර ව සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ව සකස් කර ඉදිරිපත් කර ඇත.

1.2 රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංකඃ PE/168/4/2003 හා 2003.10.15 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල ව, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කර නොමැත. මෙම ආයතන හතර විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ස්ථාපිත කර ඇති නමුත් වෙන වෙන ම සංස්ථාපිත කර ඇත. එබැවින් ඒවා වෙන ම ආයතන ලෙස සැලකේ.

1.3 පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (GAAP) සහ ප්‍රතිපත්ති සංගත ව අනුගමනය කර ඇති බව වෙනත් ආකාරයකින් ප්‍රකාශ කළහොත් මිස, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) ප්‍රකාර ව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

**2. මූල්‍ය සුවිශේෂීතා**

**2.1 රජයේ අරමුදල් ලැබීම්**

**2.1.1 පුනරාවර්තන ප්‍රදාන ලැබීම්**

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---:|---:|
| පුනරාවර්තන | 7,790,000,000 | 7,531,000,000 |
| මහපොළ ශිෂ්‍යත්ව | 171,966,000 | 179,659,200 |
| ශිෂ්‍යාධාර | 45,868,000 | 50,132,000 |
| **එකතුව** | **8,007,834,000** | **7,760,791,200** |

**2.1.2 ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්**

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---:|---:|
| ගොඩනැගිලි ඉදිකිරීම් | 110,000,000 | 236,500,000 |
| උපකරණ, පොත් සහ වාර සටහන් | 60,000,000 | 88,100,000 |
| ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම | 65,000,000 | 164,500,000 |
| මානව ප්‍රාග්ධන සංවර්ධනය ප්‍රදාන | - | 4,000,000 |
| පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | - | 3,000,000 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන | 3,500,000 | 270,000,000 |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රදාන | - | 6,000,000 |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | - | 210,405,605 |
| **එකතුව** | **238,500,000** | **982,505,605** |

**2.2 මෙහෙයුම් අතිරික්තය/(හිඟය)**

2021 වර්ෂයේ දී ලද රු. 620,220,963.57ක ශුද්ධ අතිරික්තයට සාපේක්ෂ ව 2022 වර්ෂයේ ශුද්ධ හිඟය රුපියල් 77,582,289.23කි. මූල්‍ය නොවන ගනුදෙනු ගැළපීමෙන් පසු විශ්වවිද්‍යාලයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---:|---:|
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | (77,582,289.23) | 620,220,963.57 |
| මූල්‍ය නොවන ගනුදෙනු | | |
| එකතු කළා - අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීමේ දීමනාව | 1,073,565,004.25 | 984,629,726.77 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 236,989,334.13 | 150,616,243.91 |
| අඩු කළා - රජයේ ප්‍රදාන සහ පරිත්‍යාගවලින් ලැබුණු වත්කම් ක්‍රමක්ෂ කිරීම | | (423,636,866.23) |
| සංකල්පීය වියදම් සඳහා ගැළපීමෙන් පසු ශුද්ධ මෙහෙයුම් අතිරික්තය/(හිඟය) | **1,232,972,049.15** | **1,331,830,068.02** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාපිත වාර්තාව

### 2.3 සේවකයින්ට ලබා දුන් ණය

විශ්වවිද්‍යාල සේවකයින්ට විවිධ ණය වර්ග හතරක් (ආපදා, පරිගණක, කාර්ය මණ්ඩලය සහ වාහන ණය) ලබා දෙන අතර එම ණය වසර හයක කාලයක් තුළ අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 70 ප්‍රකාර ව මාස 12ක් පුරා වසරක් ඇතුළත ආපසු අයකර ගත යුතු ණය ශේෂවල පොළිය සහ මාස 10ක් පුරා වසරක් ඇතුළත අය කර ගන්නා ලද ණය ප්‍රාග්ධනය ජංගම වත්කම් ලෙස පෙන්වා දී ඇති අතර ඉතිරිය ජංගම නොවන වත්කම් ලෙස දක්වා ඇත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් විශ්වවිද්‍යාල සේවකයන්ට ලබා දෙන ණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මඟින් පරිපාලනය කරනු ලබන අතර එම නිසා එය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවේ.

### 2.4 බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ගෙන් අය කර ගැනීම්

විශ්වවිද්‍යාලය 2021 වර්ෂයේ දී බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරනු ලැබූවන්ගෙන් අය කර ගත් රු. 37,817,024.39ට සාපේක්ෂ ව 2022 වර්ෂයේ දී රු.57,548,452.70ක මුදලක් අය කර ගන්නා ලදී. 2022 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරනු ලැබූවන්ගෙන් ලැබිය යුතු මුදල් සහ වගකීම් ශේෂයන් පහත දැක්වේ.

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ජනවාරි 1 වැනි දිනට ලැබිය යුතු ශේෂය | 132,924,047.80 | 144,320,685.57 |
| වර්ෂය තුළ එකතු කිරීම්/ගැළපීම් | 165,569,113.41 | 26,420,386.62 |
| වසර තුළ අය කර ගැනීම් | (57,548,452.70) | (37,817,024.39) |
| **දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | **240,944,708.51** | **132,924,047.80** |

### 2.5 ශිෂ්‍යත්ව අරමුදල

දේශීය හා විදේශීය පුද්ගලයින් සහ ආයතනික පරිත්‍යාගශීලීන් විසින් ප්‍රදානය කරනු ලබන සෑම ශිෂ්‍යත්වයක් සඳහා ම විශ්වවිද්‍යාලය වෙන ම කේවල ශිෂ්‍යත්ව අරමුදල් පවත්වා ගෙන යයි. එවැනි අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළී ආදායම ශිෂ්‍යත්ව කමිටුව විසින් අනුමත කරන ලද නිර්ණායකවලට අනුව ශිෂ්‍යත්ව ගෙවීම සඳහා යොදා ගැනේ.

### 2.6 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනුවෙන් අර්ථ දැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ වටිනාකමේ හි සැලකිය යුතු නොවන තරමේ වෙනස් වීමේ අවදානමකට යටත් ව දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනයි.

2022 දෙසැම්බර් 31 දිනට සාරාංශ ගත බැංකු ගිණුම් ශේෂයන් පහත පරිදි වේ.

| ගිණුම් වර්ගය | | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| ඉතුරුම් ගිණුම් | | 2,307,879.42 | 2,205,606.94 |
| ජංගම ගිණුම් | - පර්යේෂණ | 128,226,109.50 | 105,890,370.79 |
| | - පුනරාවර්තන | 178,456,154.85 | 229.876,351.75 |
| | - ප්‍රාග්ධනය | 64,596,085.29 | 294,530,305.71 |
| නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම් | | 212,246,461.03 | 184,862,869.99 |
| එකතුව | | **585,832,690.09** | **817,365,505.18** |

### 3. භාණ්ඩ තොග

2022 දෙසැම්බර් 31 දිනට බඩු තොගවල භෞතික සත්‍යාපනය විශ්වවිද්‍යාලය විසින් එක් එක් පීඨය, අධ්‍යයනාංශය, මධ්‍යස්ථාන, ඒකකය, විශ්වවිද්‍යාල අංශය සඳහා පත් කරන ලද ස්වාධීන සත්‍යාපන මණ්ඩල මඟින් සිදු කරන ලද අතර සත්‍යාපිත ශේෂයන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගළපා ඇත.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාපිත වාර්තාව

### 4. දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම් (PPE)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 649 සහ ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 07 හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත. පොත් සහ වාර සඟරා, ගොඩනැගිලි, පිරියත යන්ත්‍රෝපකරණ සහ මෙවලම්, ගෘහ භාණ්ඩ සහ සවිකෘත, උපාධි කබා, ඉගැන්වීම් උපකරණ සහ කාර්යාල උපකරණ හැර දේපළ, පිරියත සහ උපකරණවල සියලුම කාණ්ඩ 2022 ජනවාරි 01 වන දිනට ප්‍රත්‍යාගණනය කර ඇති අතර චක්‍රලේඛයේ දක්වා ඇති ප්‍රමාණයන්ට අනුව ප්‍රත්‍යාගණනය කරන ලද ප්‍රමාණයන් සඳහා ක්ෂයවීම් ප්‍රතිපාදන සලසනු ලැබේ.

### 5. ජීව විද්‍යාත්මක වත්කම්

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය සහ කෘෂි විද්‍යා පීඨය මගින් ක්‍රියාත්මක වන දොඩම්ගොල්ල ගොවිපළේ, මාවලවත්ත ගොවිපළේ සහ උඩපේරාදෙණිය ගොවිපළේ පවත්වාගෙන යනු ලබන පශු සම්පත් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 18 හි ප්‍රතිපාදනවලට අනුව මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ගණනය කර දක්වා ඇත.

### 6. පාරිතෝෂික ප්‍රතිපාදන

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ විධිවිධාන අනුව විශ්වවිද්‍යාල සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සේවක වර්ගීකරණයට අනුව 2022 දෙසැම්බර් 31 වැනි දිනට පාරිතෝෂික ප්‍රතිපාදනවල සාරාංශය පහත පරිදි වේ.

| සේවක වර්ගය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---:|---:|
| අධ්‍යයන | 1,589,683,252 | 1,574,534,154 |
| අනධ්‍යයන | 824,156,972 | 796,280,775 |
| එකතුව | **2,413,840,224** | **2,370,814,929** |

### 7. අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද සහ විශ්වවිද්‍යාලයට එරෙහි ව ගොනු කරන ලද නීතිමය නඩු වලින් පැන නගින අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 08 හි දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛනවල අනාවරණය කර ඇත.

### 8. ඒක ශිෂ්‍ය පිරිවැය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එක් සිසුවෙකු සඳහා අදාළ වන පිරිවැය සහ පසුගිය වසර 5 සඳහා සංසන්දනය පහත දක්වා ඇත.

| වර්ෂය | ශිෂ්‍යයින් සංඛ්‍යාව | ක්ෂයවීම් සහිත ව ඒක ශිෂ්‍ය පිරිවැය රු. | ක්ෂයවීම් රහිත ව ඒක ශිෂ්‍ය පිරිවැය රු. | එක් සිසුවෙකුට පුනරාවර්තන ප්‍රදාන රු. |
|---|---:|---:|---:|---:|
| 2022 | 13731 | 742,977 | 664,791 | 567,329 |
| 2021 | 12265 | 754,952 | 674,678 | 614,024 |
| 2020 | 11280 | 876,716 | 767,947 | 653,546 |
| 2019 | 10951 | 939,547 | 837,555 | 632,523 |
| 2018 | 12756 | 609,450 | 531,352 | 419,686 |

### 9. පූර්ව කාල දෝෂ

ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 03ට අනුකූල ව ඉදිරිපත් කරන ලද පූර්ව කාල පරිච්ඡේදය සඳහා වත්කම්, බැරකම් සහ ශුද්ධ වත්කම්/හිමිකම්වල ආරම්භක ශේෂවල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සටහන් කිරීම මගින් නිවැරදි කරන ලද 2021 වර්ෂයට අදාළ පූර්ව කාල පරිච්ඡේද දෝෂ 2022 වර්ෂයේ දී හඳුනාගෙන ඇත.

### 10. පොදු කරුණු

පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ආයතනික සැලැස්මේ හඳුනාගෙන ඇති ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබ ඇත. මෙරට පුරෝගාමී විශ්වවිද්‍යාලයක් වශයෙන් උසස් අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවල සමාජ වගකීම් ඉටු කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමත් වී ඇත.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2022<br>රු. | 2021 (යළි ප්‍රකාශිත)<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | 585,832,690.09 | 817,365,505.18 | 817,365,505.18 |
| ආයෝජන - දායාද අරමුදල් | 2 | 300,632,401.08 | 290,947,138.26 | 290,947,138.26 |
| ආයෝජනය - සීමිත අරමුදල් | 3 | 1,700,972,660.31 | 1,495,707,521.84 | 1,495,707,521.84 |
| විවිධ ණය ගැතියෝ සහ ලැබිය යුතු දෑ | 4 | 286,507,698.08 | 96,114,338.94 | 96,114,338.94 |
| වෙනත් ආයතනවලින් අයවිය යුතු මුදල් | 5 | 2,637,691.35 | 175,565.41 | 175,565.41 |
| අත්තිකාරම් | 6 | 113,684ල184.77 | 225,193,433.12 | 225,193,433.12 |
| ඉන්ධන තැන්පතු | 7 | 1,639,950.00 | 1,464,950.00 | 1,464,950.00 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 8 | 62,309,619.58 | 55,674,685.50 | 55,674,685.50 |
| ගබඩා භාණ්ඩ | 9 | 302,154,294.04 | 279,034,842.71 | 279,034,842.71 |
| පෙර ගෙවීම් | 10 | 1,427,294.08 | 752,230.40 | 752,230.40 |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු | 11 | 240,944,708.51 | 132,924,047.80 | 132,924,047.80 |
| | | **3,598,743,191.89** | **3,395,354,259.16** | **3,395,354,259.16** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 8 | 161,319,028.59 | 147,006,121.50 | 147,006,121,50 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 12 | 23,994,710.00 | 15,387,977.00 | 15,387,977.00 |
| දේපළ, පිරියත සහ උපකරණ - ස්පෘෂ්‍ය | 13 | 26,317,937,181.89 | 21,910,487,794.95 | 21,910,487,794.95 |
| අස්පෘෂ්‍ය | 13 | 23,768,148.86 | 25,654,570.18 | 25,654,570.18 |
| කෙරෙමින් පවතින වැඩ | 14 | 2,356,535,532.69 | 2,113,746,459.64 | 2,113,746,459.64 |
| | | **28,883,554,602.03** | **24,212,282,923.27** | **24,212,282,923.27** |
| **මුළු වත්කම්** | | **32,482,297,793.92** | **27,607,637,182.43** | **27,607,637,182.43** |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| විවිධ තැන්පතු | 15 | 6,083,798.02 | 4,930,233.52 | 4,930,233.52 |
| විවිධ ගෙවිය යුතු මුදල් සහ පූර්ව ලැබීම් | 16 | 267,553,733.96 | 195,397,352.37 | 195,397,352.37 |
| උපචිත වියදම් | 17 | 219,832,514.95 | 155,127,711.59 | 155,127,711.59 |
| **ජංගම නොවන වගකීම්** | | **493,470,046.93** | **355,455,297.48** | **355,455,297.48** |
| පාරිතෝෂික දීමනාව | 18 | 2,413,840,224.00 | 2,370,814,929.00 | 2,370,814,929.00 |
| | | **2,413,840,224.00** | **2,370,814,929.00** | **2,370,814,929.00** |
| **මුළු වගකීම්** | | **2,907,310,270.93** | **2,726,270,226.48** | **2,726,270,226.48** |
| | | | | |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | **29,574,987,522.99** | **24,881,366,955.95** | **29,574,987,522.99** |
| **හිමිකම්** | | | | |
| ප්‍රාග්ධන දීමනාව - වියදම් කළ | 19 | | - | 6,797,979,950.02 |
| ප්‍රාග්ධන දීමනාව - වියදම් නොකළ | 20 | 64,596,085.29 | 294,530,305.71 | 294,530,305.71 |
| පරිත්‍යාග වලින් ලද වත්කම් | 21 | | - | 4,120,773,064.93 |
| සමුච්චිත අරමුදල් - ප්‍රාග්ධනය | | 5,473,630,988.21 | 3,988,984,881.34 | 3,427,992,020.80 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | | **15,513,561,205.31** | **14,641,275,341.46** | **14,641,275,341.46** |
| **සංචිත සහ සීමිත අරමුදල්** | | | | |
| බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීමේ අරමුදල | 22 | 747,751,823.80 | 585,914,782.35 | 585,914,782.35 |
| දායාද අරමුදල් | 23 | 310,249,847.91 | 277,029,215.78 | 277,029,215.78 |
| පර්යේෂණ ආධාර | 24 | 396,408,814.73 | 397,306,828.92 | 397,306,828.92 |
| විවිධ ව්‍යාපෘති | 25 | 152,531,091.46 | 107,476,193.35 | 107,476,193.35 |
| විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් | 26 | 394,725,182.78 | 357,650,259.99 | 357,650,259.99 |
| වෙනත් අරමුදල් | 27 | 243,814,138.58 | 223,356,814.75 | 223,356,814.75 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 28 | 11,815,945,418.42 | 8,291,357,519.35 | 8,291,357,519.35 |
| | | **14,061,426,317.68** | **10,240,091,614.49** | **10,240,091,614.49** |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | **29,574,987,522.99** | **24,881,366,955.95** | **24,881,366,955.95** |

We certify that the financial statements comply with the requirements of the Finance Act No 38 of 1971

CJ Ponnamperuma
DEPUTY BURSAR/ Accounts

AMNB Arampath
BURSAR
University of Peradeniya
Peradeniya

The members of the council is responsible for the preparation and presentation of these financial statements.

MD Lamawansa
VICE- CHANCELOR
Vice - Chancellor
University of Peradeniya
Peradeniya - Sri Lanka

MGJ. Dharmasiri
REGISTRAR (ACTING)
Acting Registrar
University of Peradeniya
PERADENIYA.

# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2022<br>රු. | 2021 (යළි ප්‍රකාශිත)<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| **පුනරාවර්තන** | | | | |
| හුවමාරු නොවන ගණුදෙනුවෙන් ලද ආදායම - ජංගම | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | 7,790,000,000.00 | 7,531,000,000.00 | 7,531,000,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය - පුනරාවර්තන ස්වභාවයේ | | 101,080,536.47 | 47,734,096.15 | 47,734,096.15 |
| රජයේ ප්‍රදාන - මානව ප්‍රාග්ධන සංවර්ධනය පුනරාවර්තන ස්වභාවයේ | | 720,770.00 | 121,095.43 | 121,095.43 |
| ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 45,868,000.00 | 50,132,000.00 | 50,132,000.00 |
| ප්‍රදාන - මහපොළ | | 171,966,000.00 | 179,659,200.00 | 179,659,200.00 |
| අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම | **29** | 636,097.44 | 92,626.00 | 92,626.00 |
| පර්යේෂණ ප්‍රදාන, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වෙනත් ක්‍රම මඟින් ලැබෙන ආදායම | **30** | 738,745,959.69 | 599,063,020.25 | 599,063,020.25 |
| රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම | | - | - | 423,636,866.23 |
| **හුවමාරු නොවන ගනුදෙනුවෙන් ලද මුළු ආදායම - ජංගම** | | **8,849,017,363.60** | **8,407,802,037.83** | **8,831,438,904.06** |
| **හුවමාරු ගනුදෙනුවෙන් ලද ආදායම - ජංගම** | | | | |
| පොළී ආදායම | | 231,610,676.53 | 75,826,646.45 | 75,826,646.45 |
| අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම | **29** | 422,732,716.86 | 193,759,048.49 | 193,759,048.49 |
| **හුවමාරු ගනුදෙනුවෙන් ලද මුළු ආදායම - ජංගම** | | **654,343,393.39** | **269,585,694.94** | **269,585,694.94** |
| **ආදායම - ජංගම** | | **9,503,360,756.99** | **8,677,387,732.77** | **9,101,024,599.00** |
| ප්‍රාග්ධනය | | | | |
| හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම - ප්‍රාග්ධනය | | | | |
| ප්‍රාග්ධන හුවමාරුව | | 338,883,477.00 | 744,663,673.28 | - |
| ත්‍යාග, පරිත්‍යාග, භාණ්ඩ වර්ග - දේශීය සහ විදේශ | | 352,255,504.73 | 497,880,799.75 | - |
| මුළු ආදායම ප්‍රාග්ධනය | | **691,138,981.73** | **1,242,544,473.03** | - |
| මුළු ආදායම | | **10,194,499,738.72** | **9,919,932,205.80** | **9,101,024,599.00** |
| වියදම් | | | | |
| ජංගම | | | | |
| පුද්ගල පඩිනඩි | | 7,217,472,020.75 | 6,769,534,293.63 | 6,769,534,293.63 |
| ගමන් වියදම් | | 12,110,520.10 | 6,620,601.55 | 6,620,601.55 |
| සැපයුම් | | 249,146,753.27 | 163,094,343.98 | 163,094,343.98 |
| නඩත්තු වියදම් | | 41,399,450.42 | 28,574,312.28 | 28,574,312.28 |
| කොන්ත්‍රාත් සේවා | | 433,956,675.83 | 347,407,160.28 | 347,407,160.28 |
| සිසුන් සඳහා මූල්‍ය ආධාර | | 45,868,000.00 | 229,791,200.00 | 229,791,200.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 1,198,563,603.33 | 770,059,603.74 | 770,059,603.74 |
| මුළු වියදම් (ප්‍රාග්ධන ස්වභාවයේ නොවන) | | **9,198,517,023.70** | **8,315,081,515.46** | **8,315,081,515.46** |
| | | | | |
| ප්‍රාග්ධනය | | | | |
| ක්ෂය වීම | | 1,070,978,881.86 | 982,633,917.70 | 982,633,917.70 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | | 2,586,122.39 | 1,995,809.07 | 1,995,809.07 |
| මුළු මෙහෙයුම් නොවන වියදම් | | **1,073,565,004.25** | **984,629,726.77** | **984,629,726.77** |
| මුළු වියදම් | | **10,272,082,027.95** | **9,299,711,242.23** | **9,299,711,242.23** |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය). | | **(77,582,289.23)** | **620,220,963.57** | **(198,686,643.23)** |
| | | | | |
| කාල පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය) | | **304,843,733.29** | **362,306,217.31** | **(198,686,643.23)** |
| කාල පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධනය අතිරික්තය/(හිඟය) | | **(382,426,022.52)** | **257,914,746.26** | - |
| | | **(77,582,289.23)** | **620,220,963.57** | **(198,686,643.23)** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සටහන | සමුච්චිත අතිරික්තය/(හිඟය) රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | ප්‍රාග්ධන ප්‍රදාන රු. | ප්‍රාග්ධන ප්‍රදාන වියදම් නොකළ රු. | පරිත්‍යාග සහ වෙනත් ප්‍රදාන රු. | වෙනත් සංචිත සහ සීමිත අරමුදල් රු. | සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | | **2,560,486,512.66** | **9,212,619,465.94** | **6,427,073,372.90** | **(169,665,787.78)** | **4,080,582,043.72** | **1,649,714,398.33** | **-** | **23,760,810,005.77** |
| වර්ෂය තුළ වියදම් කළ/ගැළපුම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | | | | 1,208,042,001.31 | (1,404,264,967.12) | | | | (196,222,965.81) |
| වර්ෂය තුළ ලද/ ගැළපුම් කළ අරමුදල් | | | | | 1,868,461,060.61 | | | | 1,868,461,060.61 |
| වසර තුළ ලද පරිත්‍යාග | | | | | | 497,880,799.75 | | | 497,880,799.75 |
| ක්‍රමක්ෂය - ප්‍රදාන සහ පරිත්‍යාග | | | | (373,757,096.25) | | (49,879,769.98) | | | (423,636,866.23) |
| අරමුදල් / ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ සංචලනය | | - | - | | | | 292,426,729.93 | | 292,426,729.93 |
| විදේශ මුදල් ගනුදෙනු වලින් ලාභ/(අලාභය) - RFC | | (6,592,966.88) | - | | | | 6,592,966.88 | | - |
| පරිත්‍යාග වලින් ලද වත්කම් ක්‍රමක්ෂය සඳහා ගැලපුම් | | 407,810,008.56 | - | | | (407,810,008.56) | - | | - |
| ප්‍රත්‍යාගණන සංචිතය ක්ෂය කිරීම සඳහා ගැලපුම් | | 921,261,946.59 | (921,261,946.59) | | | | - | | - |
| විද්‍යා පීඨයෙන් ලැබුණු දෝෂ නිවැරදි කිරීමේ අරමුදල් සහ පසු ව නැවත පියවීම | | (4,669,597.11) | - | | | - | | | (4,669,597.11) |
| පෙර වසරේ වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදානවල දෝෂ නිවැරදි කිරීම | | (241,409,232.23) | - | | | - | | | (241,409,232.23) |
| ශාස්ත්‍ර පීඨයෙන් ලැබී පසුව ආපසු ලබා දෙන ලද අරමුදල්වල දෝෂ නිවැරදි කිරීම | | (10,208,007.56) | - | | | - | | | (10,208,007.56) |
| කාලසීමාව තුළ අතිරික්තය/(හිඟය) | | (198,686,643.23) | - | | | - | | | (198,686,643.23) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 3,427,992,020.80 | 8,291,357,519.35 | 6,797,979,950.02 | 294,530,305.71 | 4,120,773,064.93 | 1,948,734,095.14 | - | 24,881,366,955.95 |
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | | 3,427,992,020.80 | 8,291,357,519.35 | 6,797,979,950.02 | 294,530,305.71 | 4,120,773,064.93 | 1,948,734,095.14 | - | 24,881,366,955.95 |
| ශ්‍රී.ලං.රා.අං.ගි.ප්‍ර 11ට අනුව නැවත වර්ගීකරණය | | | | | | | | | |
| රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග වලින් ලද වත්කම් ක්‍රමක්ෂය කිරීම | | (423,636,866.23) | | 373,757,096.25 | | 49,879,769.98 | | | |
| පසුගිය වසරේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග | | 1,242,544,473.03 | | (744,663,673.28) | | (497,880,799.75) | | | |
| පසුගිය වසරේ ගැළපීම | | | | | | | | | |
| පසුගිය වසරේ ආරම්භක ශේෂයන් ගැලපීම | | | | (6,427,073,372.99) | | (3,672,772,035.16) | | 10,099,845,408.15 | |
| ප්‍රාග්ධන අතිරික්තය - පෙර වර්ෂය | | (257,914,746.26) | | | | | | 257,914,746.26 | |
| **2021 ජනවාරි 01 වන දිනට ගලපන ලද ශේෂය** | | **3,988,984,881.34** | **8,291,357,519.35** | **-** | **294,530,305.71** | **-** | **1,948,734,095.14** | **10,357,760,154.41** | **24,881,366,955.95** |
| අරමුදල්/ ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ සංචලනය | | | | | (422,058,806.85) | | 163,771,293.45 | | (258,287,513.40) |
| පෙර වර්ෂ ගැළපුම් | | | | | 192,124,586.43 | | | 192,124,586.43 | |
| ණය ගැළපීම | | (104,940.00) | | | | | | | (104,940.00) |
| විදේශ මුදල් ගනුදෙනු වලින් ලාභ/(අලාභය) - RFC | | (132,975,510.67) | | | | | 132,975,510.67 | | - |
| ප්‍රත්‍යාගණන සංචිතය ක්ෂය සඳහා ගැළපීම | | 1,312,882,824.27 | (1,312,882,824.27) | | | | | | - |
| අතිරික්තය/ (හිඟය) ප්‍රත්‍යාගණන සංචිතය | | | 4,837,470,723.34 | | | | | | 4,837,470,723.34 |
| කාල පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය) | | 304,843,733.29 | | | | | | | 304,843,733.29 |
| කාල පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය). | | | | | | | | (190,301,436.17) | (190,301,436.17) |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | | **5,473,630,988.21** | **11,815,945,418.42** | **-** | **64,596,085.29** | **-** | **2,245,480,899.26** | **9,975,334,131.81** | **29,574,987,522.99** |
| | | | | | | | | | |
| | | | | | | | | | |

# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය** | | |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/හිගය** | (77,582,289.23) | (198,686,643.23) |
| **මුදල් නොවන චලනයන්/ගැලපීම්** | | |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීම | 1,073,565,004.25 | 984,629,726.77 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 236,989,334.13 | 150,616,243.91 |
| ආයෝජනයෙන් ලද පොළී | (231,610,676.53) | (75,826,646.45) |
| රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග වත්කම් ක්‍රමක්ෂය කිරීම | - | (423,636,866.23) |
| පශු සම්පත් වලින් ලද ලාභය/අලාභය | (8,606,733.00) | (4,844,197.00) |
| විදේශ විනිමය ගනුදෙනුවලින් ලද ලාභය | (132,975,510.67) | (6,592,966.88) |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රදාන | (720,770.00) | (121,095.43) |
| පුනරුත්ථාපනය සහ නඩත්තුව සඳහා රජයේ ප්‍රදාන | (101,080,536.47) | (47,734,096.15) |
| ආදායම් - ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග | (691,138,981.73) | - |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිගය) | **66,838,840.75** | **377,803,459.31** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | |
| අත්තිකාරම් (වැඩි වීම්)/ අඩු වීම් | 111,509,248.35 | (4,039,234.64) |
| අනෙකුත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් (වැඩි වීම්)/අඩු වීම් | (2,462,125.94) | 200,587.33 |
| විවිධ ණය ගැතියන්/ ලැබිය යුතු මුදල් (වැඩි වීම්)/ අඩු වීම් | (190,393,359.14) | 29,489,075.91 |
| ඉන්ධන තැන්පතු (වැඩි වීම්)/ අඩු වීම් | (175,000.00) | (30,000.00) |
| ඉන්වෙන්ටරි (වැඩි වීම්)/ අඩු වීම් | (23,119,451) | (2,113,534.86) |
| පෙර ගෙවුම් (වැඩි වීම්)/ අඩු වීම් | (675,063.68) | 1,491,730.91 |
| බැඳුම්කර උල්ලංඝනය මත ලැබිය යුතු (වැඩි වීම්)/ අඩු වීම් | (108,020,660.71) | 11,396,637.77 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය (වැඩි වීම්)/ අඩු වීම් | (20,947,841.17) | (22,611,675.99) |
| විවිධ තැන්පතු (වැඩි වීම්)/ අඩු වීම් | 1,153,564.50 | 50,885.15 |
| විවිධ ගෙවිය යුතු (වැඩි වීම්)/ අඩු වීම් | 72,156,381.59 | (110,424,441.46) |
| උපචිත වියදම් (වැඩි වීම්)/ අඩු වීම් | 64,704,803.36 | 50,835,542.67 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(29,430,663.42)** | **332,049,032.10** |
| පාරිතෝෂික ගෙවීම | (168,067,268.99) | (250,053,383.91) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(197,497,932.41)** | **81,995,648.19** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් වලට එකතු කිරීම් | (160,832,377.09) | (228,632,263.80) |
| කෙරෙමින් පවතින වැඩවලට එකතු කිරීම් | (275,360,991.25) | (398,340,917.93) |
| නව ආයෝජන | (2,590,441,396.34) | (958,667,624.00) |
| ආයෝජන ආපසු ගැනීම | 2,375,490,995.05 | 714,151,147.52 |
| ආයෝජනයෙන් ලද පොළිය | 81,810,651.25 | 82,440,550.58 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **(569,333,118.38)** | **(789,049,107.63)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් ජනිත මුදල් ප්‍රවාහය** | | |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | - | 210,405,605.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 235,000,000.00 | 496,100,000.00 |
| වි.ප්‍ර.කො.ස ප්‍රදාන | 3,500,000.00 | 270,000,000.00 |
| අමාත්‍යාංශ ප්‍රදාන | - | 6,000,000.00 |
| බැඳුම්කර උල්ලංඝනය කිරීමේ අරමුදල | 161,837,041.45 | 12,474,240.24 |
| දායාද අරමුදල | 33,220,632.13 | 32,817,277.74 |
| පර්යේෂණ ආධාර | (898,014.19) | 130,750,561.93 |
| විවිධ ව්‍යාපෘති, වෙනත් ප්‍රදාන සහ විලම්භිත ආදායම | 102,638,576.31 | 153,431,708.10 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **535,298,235.70** | **1,311,979,393.01** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩි වීම (අඩු වීම) | (231,532,815.09) | 604,925,933.57 |
| වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 817,365,505.18 | 212,439,571.61 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **585,832,690.09** | **817,365,505.18** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ

**1. ආයතනික මූල්‍ය තොරතුරු**

**1.1 ආයතනික තොරතුරු**

**1.1.1. වාර්තාකරණ අස්ථිත්වය**

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණියෙහි පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1978 අංක 16 විශ්වවිද්‍යාල පනත සහ එයට පසු ව කරන ලද සංශෝධන යටතේ පිහිටුවන ලද රජයේ පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයකි. ශිෂ්‍ය ප්‍රජාව, අරමුදල් වෙන් කිරීම, පීඨ සංඛ්‍යාව සහ සේවකයින් සංඛ්‍යාව යනා දී වශයෙන් ගත් කළ එය ශ්‍රී ලංකාවේ විශාලත ම විශ්වවිද්‍යාලය වේ.

**1.1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය**

විශ්වවිද්‍යාල පාලක සභාව විසින් 2023 පෙබරවාරි 25 වන දින පැවති එහි 525 වන රැස්වීමේ දී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දී ඇත.

**1.1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වේ.

**1.1.4 මූල්‍ය ප්‍රකාශන**

මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අය වැය ගත හා තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත වේ.

**1.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

**1.2.1 අනුකූලතා ප්‍රකාශය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූල ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුගමනය කර ඇත.

**1.2.2 මිනුම්කිරීමේ පදනම**

සාධාරණ අගය මත මිනුම් කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ (PPE) හැර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය මත පිළියෙල කර ඇත.

**1.2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (SLR) ඉදිරිපත් කර ඇත.

**1.2.4 ප්‍රමාණවත් බව හා රාශීකරණය**

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙන ම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම සැළකිය යුතු තරමේ නොවේ නම් මිස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

ගනුදෙනු හෝ වෙනත් සිදුවීම් විශාල සංඛ්‍යාවක් සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඒවායේ ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අනුව පන්තිවලට එකතු කරනු ලැබේ.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ

### 1.2.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කරනු ලැබ හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම්, ආදායම සහ වියදම් එකිනෙක හිලව් කර නොමැත.

### 1.2.6 අඛණ්ඩ පැවැත්ම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇති අතර අපේක්ෂිත අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩ ව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් විශ්වවිද්‍යාලය සතුව ඇතැයි සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගත් කළ, මෙහෙයුම් ඇවර කිරීම හෝ නතර කිරීම අවශ්‍ය වන බව සභාව පුරෝකථනය නොකරයි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පැවැත්ම පිළිබඳ පදනම අඛණ්ඩ ව අනුගමනය කරයි.

### 1.2.7 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කළ විට, එය ප්‍රායෝගික ව කළ නොහැකි නම් මිස සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ගීකරණය කර ඇත. සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ගීකරණය කිරීම ප්‍රායෝගික නොවන විට, එම ප්‍රමාණය නැවත වර්ගීකරණය කර ඇත්නම් සිදු කළ යුතු ගැළපුම්වල ස්වභාවය විශ්වවිද්‍යාලය විසින් අනාවරණය කර තිබේ.

### 1.2.8 ජංගම හා ජංගම නොවන අයිතම වර්ගීකරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම් ව විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා වගකීම් ඉදිරිපත් කරනු ලැබේ.

## 1.3 අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම

වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කර ඇති අතර 2022.01.01 සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා ද දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනත් සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත.

### 1.3.3 ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණයට අවශ්‍ය වේ.

### 1.3.4 ආදායම් හඳුනා ගැනීම

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ පර්යේෂණ ප්‍රදාන ආදායම්, විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන, අධ්‍යයන පැවරුම් ඇතුලු ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලුම ආදායම් ලැබුණු පසු හඳුනාගෙන ඇති අතර උචිත පරිදි සහ ප්‍රායෝගික ව ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කර ඇති අතර ප්‍රාග්ධන ප්‍රදාන වලින් ලැබෙන ආදායම ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන

## ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ

### 1.3.5 රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වන රජයේ ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි විධිවිධානවලට අනුකූල ව විශ්වවිද්‍යාලයට ලැබුණු විට පමණක් හඳුනාගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) ආයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග පරිත්‍යාග කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන වලින් දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගත් විට ඒවා හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම යටතේ පෙන්වනු ලැබේ. ප්‍රාග්ධනය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වනු ලැබේ. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය හුවමාරු ගනුදෙනුවලින් ලැබෙන ආදායම ලෙස හඳුනාගෙන ඇත. තව ද විශ්වවිද්‍යාලයට ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන, වියදම් කරන ලද සහ වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් මඟින් ගිණුම්ගත කර ඇති අතර එහි බලපෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සෘජුව ම අන්තර්ගත කර තිබේ.

### 1.3.6 දේපළ, පිරියත සහ උපකරණ

#### 1.3.6.1 හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාව තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීය ව මිනුම් කළ හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනී.

#### 1.3.6.2 මිනුම් පදනම

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසුකම් ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලික ව එහි පිරිවැයට මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සහ ඊට පසු දරන ලද වියදම සෘජුව ම පිරිවැයට ඇතුළත් වේ. ස්වයං-සාදිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියා කරන තත්වයකට ගෙන ඒමට සෘජුව ම අදාළ වන වෙනත් වියදම්, අයිතම කොටස්වලට වෙන් කර ඉවත් කිරීම සහ ඒවා තබන ස්ථාන ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන වියදම් ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිල දී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

මූලික වශයෙන් පිරිවැයට හඳුනාගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සමස්ත පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරයි. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පංතියක ධාරණ අගය වැඩි වේ නම්, එම වැඩි වීම සෘජුව ම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පංතියක ධාරණ අගය අඩු වුවහොත් එම මුදල අතිරික්තය හෝ හිගය ලෙස හඳුනාගනී.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 01 දිනට විශ්වවිද්‍යාලයට අයත් සියලු ම ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන නැවත තක්සේරු කරන ලද අතර පුස්තකාල පොත් සහ වාර සඟරා, කාර්යාල සහ අනෙකුත් උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හැර අනෙකුත් වත්කම් කාණ්ඩ අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් විසින් නැවත තක්සේරු කර ඇත. ඉහත ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස අදාළ ගැළපීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 649 සහ ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 07හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සියලු ම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩයන් ඊළඟ වසර ආරම්භයේ දී ප්‍රත්‍යාගණනය කර ඇත. එමෙන් ම චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයන් මත ක්ෂයවීම් ප්‍රතිපාදන සපයනු ලැබේ. අදාළ වර්ෂයේ නැවත ඇගයීමෙන් පසුව මිල දී ගන්නා ලද/ඉදි කරන ලද සියලු ම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිරිවැයට දක්වනු ලබන අතර එම චක්‍රලේඛයේ දක්වා ඇති ප්‍රමාණයන් අනුව ක්ෂය ප්‍රතිපාදන සලසනු ලැබේ.

**1.3.6.3 වත්කම් හඳුනා නොගැනීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇති වන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වත්කම් හඳුනා නොගත් වර්ෂයේ අතිරික්තය හෝ හිඟය තුළ හඳුනා ගැනේ.

**1.3.6.4 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිරිවැයට දක්වා ඇති අතර විශ්වවිද්‍යාලය අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකියාව ඇති ස්ථානයේ හා තත්වයේ පවතින විට අදාළ වත්කම් වෙත මාරු කරනු ලැබේ.

**1.3.6.5 උරුම වත්කම්**

පුරා විද්‍යා අධ්‍යයනාංශයේ සහ ප්‍රධාන පුස්තකාලයේ උරුම වත්කම් වෙන වෙන ම දක්වා ඇත.

**1.3.6.6 දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම**

පහත සඳහන් අනුපාතයන්ට අනුව ඉඩම් සඳහා ක්ෂය කිරීම් සිදු කර ඇති අවස්ථාවන්හි දී හැර විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුගමනය කරනු ලබන අතර ක්ෂය කිරීමේ වියදම් වි.වි.ප්‍ර.කො.චක්‍රලේඛ 649 අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

| වත්කම් පන්තිය | % |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍රෝපකරණ සහ මෙවලම් | 10% |
| මෝටර් වාහන | 20% |
| ගෘහ භාණ්ඩ සහ සවිකෘත | 10% |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 20% |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ | 20% |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 20% |
| උපාධි කබා | 20% |

වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ලබා ගත හැකි දින සිට හෝ ස්වයං-සාදිත වත්කම් සම්බන්ධයෙන් වන කල් හි වත්කම් සම්පූර්ණ වී භාවිතයට සූදානම් වූ දින සිට ය. වත්කම් විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති දින හෝ වත්කම හඳුනා නොගැනීම ඇරඹි දින යන දින දෙකෙන් කලින් එළැඹි දින සිට ක්ෂයකිරීම් නතර වේ.

**1.3.6.7 දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03ට අනුකූල ව පරිත්‍යාග වත්කම් ගිණුමේ බැර වටිනාකමට 10%ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් 2021.12.31 දක්වා විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම තවදුරටත් අනුගමනය නොකරයි.

2018 වර්ෂයේ සිට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂයෙන් 10%ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල ව එය සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03හි දක්වා ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය හා ඓතිහාසික පිරිවැය අතර වෙනස මත පදනම් ව අදාළ වත්කම් පන්තිය ප්‍රත්‍යාගණනය කරන ලද දිනෙන් පසු මිල දී ගත් වත්කම් මත හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අතිරික්තය පොදු සංචිතයට මාරු කරනු ලැබේ.

**1.3.6.8 බාහිර පාර්ශවයන් සඳහා කුලියට ලබා දී ඇති ගොඩනැගිලි**

විශ්වවිද්‍යාලය එහි ඇතැම් ගොඩනැගිලි රාජ්‍ය බැංකු, රාජ්‍ය ඖෂධ සංස්ථාව වැනි ආයතන සඳහා

නාමික කුලී වටිනාකමකට කුලියට දී ඇත. මෙම දේපළ කුලී උපයා ගැනීමට හෝ ප්‍රාග්ධන වැඩිකිරීමකට තබා නොමැති හෙයින් ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය නොකෙරේ. ඒ අනුව, මෙම දේපළ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

#### 1.3.6.9 විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනවල ඉඩම් හා ගොඩනැගිලි

විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන 03ක ගොඩනැගිලි ඉදි කර ඇති ඉඩම් හා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිල්ල සඳහා ශාස්ත්‍ර පීඨයේ අරමුදල් සහ භාණ්ඩාගාර අරමුදල් යොදා ඇති බැවින් ඒවා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

## 1.4 ජීව විද්‍යාත්මක වත්කම් සහ කෘෂිකාර්මික නිෂ්පාදන

### 1.4.1 අර්ථ දැක්වීම

කෘෂිකාර්මික නිෂ්පාදන යනු ආයතනයේ ජීව විද්‍යාත්මක වත්කම්වලින් නෙළාගන්නා ලද අස්වනු නිෂ්පාදනයකි. ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවී සත්ත්වයකු හෝ ශාකයකි. ජීව විද්‍යාත්මක වත්කම් සමූහයක් යනු සමාන ජීවීන් හෝ ශාක විශේෂවල එකතුවකි. අස්වැන්න යනු ජීව විද්‍යාත්මක වත්කමකින් නිෂ්පාදන වෙන් කර ලබා ගැනීම හෝ ජීව විද්‍යාත්මක වත්කමක ජීවන ක්‍රියාවලිය නතර වීම වේ.

### 1.4.2 ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂිකාර්මික නිෂ්පාදන හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලය ජීව විද්‍යාත්මක වත්කමක් හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයක් හඳුනාගනු ලබන්නේ (I) අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම පාලනය කරනු ලබන විට (II) වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය ආයතනයට ගලා ඒමට ඉඩ ඇති විට සහ (III) වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි විට පමණි.

ජෛව විද්‍යාත්මක වත්කමක් මනිනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීම මත සහ සෑම වාර්තාකරණ දිනයකදී ම විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද එහි සාධාරණ වටිනාකම මත ය.

ආයතනයක ජීව විද්‍යාත්මක වත්කම් වලින් අස්වනු නෙළන කෘෂිකාර්මික නිෂ්පාදන, අස්වැන්න නෙළන අවස්ථාවේ එහි පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මනිනු ලැබේ.

### 1.4.3 ලාභ සහ අලාභ

ජීව විද්‍යාත්මක වත්කමක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් සහ ජීව විද්‍යාත්මක වත්කමක විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකමේ වෙනසක් හේතුවෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 18ට අනුකූල ව එය ඇතිවන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ.

කෘෂිකාර්මික නිෂ්පාදනයක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් එය ඇතිවන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ.

### 1.4.4 අස්පෘශ්‍ය වත්කම්

#### 1.4.4.1 හඳුනා ගැනීමේ පදනම

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා යා හැකි නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි නම් විශ්වවිද්‍යාලය අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

#### 1.4.4.2 මිනුම් පදනම

වෙන වෙන ම අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් මූලික ව පිරිවැයට හඳුනා ගනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් පසු, පිරිවැය අඩු කරන ලද ක්‍රමක්ෂය හෝ හානිකර පාඩු කිසිවක් ඇත්නම් අස්පෘශ්‍ය වත්කම් එයට අනුව ගණනය කරනු ලැබේ.

#### 1.4.4.3 පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එය සම්බන්ධිත නිශ්චිත වත්කමේ හි අන්තර්ගත

අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන විට පමණි. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදම් බවට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 1.4.4.4 ඵලදායී ආර්ථික ආයු කාලය, ක්‍රමක්ෂය හා හානිකරණය

නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලයට පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය කරනු ලබන අතර එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සාමාන්‍යයෙන් හඳුනාගැනේ. නිශ්චිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂික ව හා හානි විය හැකි බවට ඇඟවීමක් තිබේ නම් හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ.

නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වසර 10කට වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ අගයන් එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලබන අතර උචිත නම් ගැළපුම් කරනු ලැබේ.

### 1.4.5 ගබඩා භාණ්ඩ

2022 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලයේ ගබඩා භාණ්ඩ භෞතික ව සත්‍යාපනය කර ඇති අතර පළමු ගැනුම්, පළමු නිකුත් පදනම (FIFO) මත පිරිවැයට තක්සේරු කර ඇත.

පර්යේෂණ ප්‍රදානවලින් මිල දී ගන්නා රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩවල පිරිවැය ඒවා මිල දී ගැනීමේ දී අදාළ පර්යේෂණ ප්‍රදාන වෙත වියදම් වශයෙන් සම්පූර්ණයෙන් ගිණුම්ගත කෙරේ. කෙසේ වෙතත්, වර්ෂය අවසානයේ ඉතිරි ව ඇති ගබඩා භාණ්ඩ ශේෂයන් භෞතික ව සත්‍යාපනය කර අදාළ ගිණුම් වලට ගැලපනු ලැබේ.

ඉන්වෙන්ටරි පිළිබඳ වැඩිදුර විස්තර ගිණුම් සටහන් අංක 9 හි දක්වා ඇත.

### 1.4.6 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01ට අනුව වාර්තා කළ දින සිට මාස දොළහක් ඇතුළත ලැබීමට නියමිත වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇස්තමේන්තුගත ප්‍රමාණයට දක්වනු ලැබේ. අයහපත් සහ අවිනිශ්චිත ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 1.4.7 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් වලින් සහ ජංගම නේවාසික විදේශ මුදල් (RFC), ඉතිරිකිරීම් සහ කෙටිකාලීන ඉල්ලුම් තැන්පතු ගිණුම්වල පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ. තව ද, මුදල් හා මුදල් සමාන දෑ පිළිබඳ විස්තර ගිණුම් ප්‍රකාශයේ සටහන් අංක 1හි අනාවරණය කර ඇත.

### 1.4.8 ආයෝජන

බැංකු ගිණුම්වල කාලීන තැන්පතු මත බැරට තබා ඇති තාවකාලික අතිරික්ත අරමුදල් විශ්වවිද්‍යාලය විසින් රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කර ඇත. ඒ සඳහා එකතුවන පොළිය අදාළ ලෙජර ගිණුම්වලට ගලපා ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පුනරාවර්තන/හුවමාරු ආදායමක් ලෙස දක්වා ඇත. එමෙන් ම, ශිෂ්‍යත්ව සඳහා ලද අරමුදල් ද රාජ්‍ය බැංකුවල කාලීන තැන්පතුවල ආයෝජනය කර ඇත. ආයෝජන සහ ආයෝජන මත වන පොළී ආදායම පිළිබඳ වැඩිදුර විස්තර සටහන 02 සහ 03හි ඉදිරිපත් කර ඇත.

### 1.4.9 වියදම් හඳුනා ගැනීම

පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ දී සහ දේපළ කාර්යක්ෂම ව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

### 1.4.10 පර්යේෂණ ප්‍රදාන

පර්යේෂණ ප්‍රදාන ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත වන වියදම් ලෙස පෙන්වන අතර පර්යේෂණ ප්‍රදාන ලාභ

නොලබන පදනමක් මත ක්‍රියාත්මක වන බැවින් වියදමට සමාන මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත ආදායමක් ලෙස දැක්වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ පර්යේෂණ ප්‍රදාන වලින් මිල දී ගත් විට ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් (හුවමාරු නොවන) ලද ආදායම යටතේ දක්වනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම තනි පර්යේෂණ ප්‍රදාන ගිණුම්වල බැර සඳහා වන ශේෂයන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

### 1.4.11 විලම්බිත ආදායම් ස්වයං මූල්‍ය කටයුතු

උපදේශනය, පශ්චාත් උපාධි පාඨමාලා, කෙටි පාඨමාලා, අර්ධකාලීන පාඨමාලා, බාහිර උපාධි පාඨමාලා, පරීක්ෂණ පැවරුම්, සමීක්ෂණ, කොන්ත්‍රාත් පර්යේෂණ, කොන්ත්‍රාත් පරීක්ෂණ යනා දී ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වෙන වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යනු ලබයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කරන ලද වියදම්, ඍජු වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වක්‍ර වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මිල දී ගත් විට ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් (හුවමාරු නොවන) ලද ආදායම යටතේ දක්වනු ලැබේ. මෙම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ගිණුම්වල බැර සඳහා වන ශේෂයන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

### 1.4.12 විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන

විශ්වවිද්‍යාලය විසින් එහි ප්‍රධාන මෙහෙයුම් වලට අමතර ව මෙහෙයවනු ලබන විවිධ බාහිර අරමුදල් ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතිවල ආදායම සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විවිධ ව්‍යාපෘති හා වෙනත් ප්‍රදාන සඳහා වන වියදම් ලෙස පෙන්වන අතර ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලය විසින් ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක කරන බැවින් වියදම් හා සමාන මුදලක් ස්වයං මූල්‍යකරණය සහ වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායමක් ලෙස පෙන්වනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත සසස වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11 හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන වලින් දේපළ, පිරියත සහ උපකරණ මිලට ගන්නේ නම් සහ එසේ මිල දී ගන්නා විට ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් (හුවමාරු නොවන) ලද ආදායම යටතේ දක්වනු ලැබේ. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දැක්වේ.

### 1.4.13 වෙනත් අරමුදල්

විශ්වවිද්‍යාලය විසින් එහි ප්‍රධාන ක්‍රියාකාරකම් යටතට නොගැනෙන විවිධ ක්‍රියාකාරකම් තුළින් අරමුදල් උත්පාදනය කරන අතර මෙම ක්‍රියාකාරකම්වලට අදාළ ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් ව්‍යාපෘති සඳහා වන වියදම් යටතේ දක්වා ඇති අතර, වියදම්වලට සමාන මුදලක් ස්වයං මූල්‍ය සහ වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මයක් එනම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත III වන වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද (බදු සහ මාරු කිරීම්) අයභාරය යන ප්‍රමිතය 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ විවිධ ව්‍යාපෘති සහ වෙනත් අරමුදල්වලින් දේපළ, පිරියත සහ උපකරණ මිලට ගන්නේ නම් සහ එසේ මිල දී ගන්නා විට ඒවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් (හුවමාරු නොවන) ලද ආදායම යටතේ දක්වනු ලැබේ. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දැක්වේ.

### 1.4.14 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

අදාළ ගනුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුව සියලු ම විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් අනුව හඳුනා ගනු ලැබේ. වාර්තා කරන දිනට නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල ශේෂයන් එදිනට පවතින අනුපාතයන්ට අනුව ක්‍රියාකාරී මුදල්වලින් හඳුනා ගැනේ. පූර්ව මූල්‍ය ප්‍රකාශනවල සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල පැවති ශේෂයන් පරිවර්තනය කිරීමෙන් පැන නගින විනිමය ලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හුවමාරු ගනුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 1.4.15 බදු

#### 1.4.15.1 ආදායම් බදු

පවත්නා බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතුවලින් ජනිත ආදායම මත ආදායම් බදු ගෙවීමට විශ්වවිද්‍යාලය බැඳී නොමැත.

#### 1.4.15.2 එකතු කළ අගය මත බද්ද

පවත්නා බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් කර ඇත.

#### 1.4.15.3 උපයන විට ගෙවීම් බද්ද (PAYEE Tax)/ ඉහළ පුද්ගලික ආදායම් බද්ද (APIT)

ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරන ලද උපයන විට ගෙවීම් බදු/ ඉහළ පුද්ගලික ආදායම් බද්ද විශ්වවිද්‍යාලය විසින් ප්‍රේෂණය කරන අතර එය විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවේ. එබැවින් උපයන විට ගෙවීම් බදු ගෙවීම විශ්වවිද්‍යාලයේ ගිණුම්වලට ගෙන නොමැත.

### 1.4.16 සේවක ප්‍රතිලාභ

#### 1.4.16.1 අර්ථ දැක්වීම්

**කෙටිකාලීන සේවක ප්‍රතිලාභ**

අදාළ සේවාව සපයන බැවින් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වියදම් කරනු ලැබේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවයේ ප්‍රතිඵලයක් ලෙස මුදල් ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ වාස්තවික බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වසනීය ව තක්සේරු කළ හැකි නම් ගෙවීමට අපේක්ෂා කරන මුදල සඳහා වන වගකීම හඳුනාගනු ලැබේ.

**නිශ්චිත දායක සැලැස්ම**

අදාළ ප්‍රඥප්ති අනුව විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ (යූපීඑෆ්) සහ සේවක භාරකාර අරමුදලේ (ඊටීඑෆ්) දායක මුදල් සඳහා සුදුසුකම් ලබන අතර තාවකාලික/ කොන්ත්‍රාත්/ පැවරුම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයින් සේවක අර්ථසාධක අරමුදල (ඊපීඑෆ්) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා හිමිකම් ලබයි. අදාළ සේවාව සපයනු ලබන බැවින් නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායක මුදල් සඳහා වන වගකීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**නිශ්චිත ප්‍රතිලාභ බැඳීම**

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුකූල ව, සේවකයින්ට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් සඳහා වගකීමක් ඇති වේ. එබඳු නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් යනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19හි විෂය පථය යටතේ වන සේවක ප්‍රතිලාභ මත පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීමකි.

#### 1.4.16.2 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මිනුම් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු වාර්තා කරන දිනයේ දී නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල පවතින වර්තමාන වටිනාකමයි. සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිත කරමින් වාර්ෂික ව ගණනය කිරීම සිදු කෙරේ. ආයුගණක ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත නිශ්චිත ප්‍රතිලාභ වගකීම් නැවත මැනීම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වහා හඳුනා ගැනේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් සඳහා (වර්තමාන සේවා පිරිවැය) ආරෝපණය කළ හැකි නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වැඩි වීම විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය කාර්ය සාධන

ප්‍රකාශයේ හඳුනා ගනී. වට්ටම් අනුපාතය ව්‍යුත්පන්න කර ඇති අතර දළ වශයෙන් වාර්ෂික 18% (2021 - 11%) ක දිගු කාලීන පොළී අනුපාතයක් අනාගත වගකීම් වට්ටම් කිරීමට භාවිත කර ඇත. වගකීම් සඳහා බාහිර ව අරමුදල් සැපයීමක් සිදු නොකෙරේ.

### 1.4.16.3 ගිණුම්කරණ ඇස්තමේන්තුව

ආයුගණක තක්සේරුව සිදු කිරීමේ දී එයට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩි වීම් සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පනය අදාළ කර ගනී. තක්සේරුකරණයේ සංකීර්ණත්වය, විශේෂයෙන් දක්වනු ලබන උපකල්පන සහ එහි දිගුකාලීන ස්වභාවය සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම, උපකල්පනවල වෙනස්වීම්වලට ඉතා සංවේදී වේ. සෑම උපකල්පනයක් ම වාර්තා කරන දිනයේ දී සමාලෝචනය කෙරේ.

### 1.4.16.4 විශ්‍රාම පාරිතෝෂික ආයුගණක තක්සේරුව

වෘත්තීය ආයුගණක තක්සේරුකරණ ආයතනයක් වන ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. ආයුගණක තක්සේරුවේ සාරාංශගත වාර්තාව පහත පරිදි වේ.

| උපකල්පන | 2022 | 2021 |
|---|---|---|
| **මූල්‍ය** | | |
| වට්ටම් අනුපාතය | 18.00% වාර්ෂික | 11.50% වාර්ෂික |
| **වැටුප් වැඩි වීමේ අනුපාතය** | | |
| අධ්‍යයන | මූලික වැටුප් හා දීමනා: 16.00% වාර්ෂික | මූලික වැටුප් හා දීමනා: 10.00% වාර්ෂික |
| අනධ්‍යයන | මූලික වැටුප් හා දීමනා: 14.00% වාර්ෂික | මූලික වැටුප් හා දීමනා: 8.00% වාර්ෂික |
| **ප්‍රජා විද්‍යාත්මක** | | |
| මරණ අනුපාතය | 1967/70 ලන්ඩනයේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද මරණ අනුපාත වගුව | |
| **විශ්‍රාමික වයස** | | |
| අධ්‍යයන | අවුරුදු 65 | අවුරුදු 65 |
| අනධ්‍යයන | අවුරුදු 60 | අවුරුදු 62 |
| **කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය** | | |
| අධ්‍යයන | අධ්‍යයන: 2.00% වාර්ෂික | මණ්ඩලය හරහා වයස අවුරුදු 54 දක්වා වාර්ෂික ව 0.50% සහ පසුව ශුන්‍ය වේ. |
| අනධ්‍යයන | අනධ්‍යයන: 1.00% වාර්ෂික | |
| **ආබාධිත** | | |
| අධ්‍යයන සහ අනධ්‍යයන | මරණ අනුපාත වගුවෙන් 10% | මරණ අනුපාත වගුවෙන් 10% |

### 1.4.16.5 සංවේදීතා විශ්ලේෂණය

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමට අදාළ සංවේදීතා විශ්ලේෂණය (රු.)

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාතයේ එක් ප්‍රතිශතයක වැඩි වීමක් (+1%) | = | 2,277,735,570 |
| වට්ටම් අනුපාතයේ එක් ප්‍රතිශතයක අඩු වීමක් (-1%) | = | 2,619,226,649 |
| වැටුප් හා දීමනා වර්ධක අනුපාතයේ එක් ප්‍රතිශතයක වැඩිවීමක් (+1%) | = | 2,622,561,869 |
| වැටුප් හා දීමනා වර්ධක අනුපාතයේ එක් ප්‍රතිශතයක අඩුවීමක් (-1%) | = | 2,272,457,170 |

### 1.4.17 ප්‍රතිපාදන සහ වගකීම්

### 1.4.17.1 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමාන වගකීමක් ඇති විට හා බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් අවශ්‍ය වනු ඇති විට සහ වගකීම් ප්‍රමාණය පිළිබඳ ව විශ්වසනීය ව තක්සේරු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වනු ලැබේ. බොහෝ දුරට සිදු විය හැකි ප්‍රතිඵල ඇගයීමක පදනම මත විශ්වවිද්‍යාලය ඇස්තමේන්තුවක් වෙත පැමිණේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී දන්නා සියලුම ප්‍රතිපාදන අදාළ කරගෙන ඇත.

**1.4.17.2 අසම්භාව්‍ය වත්කම්**

2022 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නඩු සම්බන්ධ අසම්භාව්‍ය වත්කම් ප්‍රමාණය රුපියල් 17,406,674.94 (නඩු 07) කි.

**1.4.17.3 අසම්භාව්‍ය වගකීම්**

2022 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලයට එරෙහි ව පවරා ඇති නඩු 64ක් සම්බන්ධයෙන් වන අසම්භාව්‍ය වගකීම් ප්‍රමාණය රුපියල් 60,942,000.00කි. කෙසේ වෙතත්, වන්දි මුදල විශ්වසනීය ව තක්සේරු කළ නොහැකි හෙයින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

**1.14.18 ඒකකවල ගිණුම් තොරතුරු අනාවරණය කිරීම**

**1.14.18.1 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE)**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාණ්ඩයක් ලෙස සලකාබලා නොමැත.

**1.14.18.2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය**

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාණ්ඩයක් ලෙස සලකා බලා නොමැත.

**1.14.19 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම්**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මෙම ආයතනවල අධ්‍යයන ආයතනය ලෙස කටයුතු කරයි. සභාවේ සාමාජිකයින් ලෙස සේවය කරන කෘෂි විද්‍යා පීඨයේ, විද්‍යා පීඨයේ සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරු පිළිවෙලින් කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙ හි, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙ හි සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙ හි කළමනාකරණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයින් ලෙස සේවය කරති.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 ප්‍රකාර ව 2022 වර්ෂය තුළ දී පහත සඳහන් සම්බන්ධිත පාර්ශව සිදු වී ඇත.

- විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන 04ක ගොඩනැගිලි ඉදි කර ඇති ඉඩම් විශ්වවිද්‍යාලයට අයත් වන අතර ඒ සඳහා කුලිය අය නොකෙරේ.

- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ ශාස්ත්‍ර පීඨයේ පශ්චාත් උපාධි අරමුදල මඟින් උපයන අරමුදල් උපයෝගී කර ගෙන වන අතර එය විශ්වවිද්‍යාලයට අයත් වේ.

- ජලය, විදුලිය සහ අත්‍යාවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය විසින් අය කළ හැකි පදනමක් මත සපයනු ලබන අතර ගිණුම්කරණය සඳහා වෙන ම ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ.

- විශ්වවිද්‍යාලය විසින් උපරණ මිල දී ගැනීම සඳහා රුපියල් මිලියන 2ක පොළී රහිත ණය මුදලක් ප්‍රදානය කර ඇත.

2022 වර්ෂය තුළ පහත සඳහන් මුදල් අදාළ පශ්චාත් උපාධි ආයතන 04 වෙතින් අය කර ඇත.

| ආයතනය | 2022.01.01 දිනට ලැබිය යුතු ශේෂය | 2022 වර්ෂය තුළ දී ලබාගත් සේවාවල/ ණයවල වටිනාකම | 2022 වර්ෂය තුළ දී ගෙවන ලද මුදල | 2022.12.31 දිනට ලැබිය යුතු ශේෂය |
|---|---|---|---|---|
| | **(ශ්‍රී.ලං.රු.)** | (ශ්‍රී.ලං.රු.) | (ශ්‍රී.ලං.රු.) | (ශ්‍රී.ලං.රු.) |
| කෘ.ප.උ.ආ | 27,091.25 | 879,905.95 | 712,716.42 | 194,280.78 |
| වි.ප.උ.ආ | 97,117.15 | 1,703,294.73 | 1,459,647.28 | 340,764.60 |
| වෛ.වි.ප.උ.ආ | - | 2,000,000.00 | - | 2,000,000.00 |
| මා.ශා.ස.වි.ප.උ.ආ | 22,896.25 | 359,568.06 | 312,587.00 | 69,877.31 |

**1.4.20 අයවැය ඉදිරිපත් කිරීම**

ගිණුම්කරණයේ උපචිත පදනම මත පදනම් ව විශ්වවිද්‍යාලයේ අයවැය සකස් කරනු ලැබේ. අයවැයේ දී අනුගමනය කරනු ලබන වර්ගීකරණ පදනම වන්නේ වියදම්වල ස්වභාවය වන අතර එය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ද අනුගමනය කරනු ලැබේ. භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව විශ්වවිද්‍යාලය විසින් ආදායම් හා වියදම් වර්ගීකරණය සිදු කරනු ලැබේ. අයවැය සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනමක් මත සකස් කරනු ලබන හෙයින්, අයවැය හා සත්‍ය ප්‍රමාණයන් සංසන්ධනය කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී.

අයවැය මඟින් 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වන මූල්‍ය කාලපරිච්ඡේදය ආවරණය වන අතර එයට විශ්වවිද්‍යාලයේ සියලු ම පීඨ, මධ්‍යස්ථාන, අංශ සහ ඒකක ඇතුළත් වේ.

අයවැය හා තථ්‍ය ප්‍රමාණ අතර සංසන්දන ප්‍රකාශය සටහන 33හි දැක්වේ.

**1.4.21 වාර්තා කරන දිනට පසුව සිදුවීම්**

වාර්තා කළ දිනට පසුව සිදුවීම් කිසිවක් වාර්තා නොවේ.

**1.4.22 උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය**

උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීමේ ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලෝක බැංකුවේ අරමුදල් යටතේ මුදල් වෙන් කරනු ලැබේ. ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති අරමුදල් විශ්වවිද්‍යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු වලට ඇතුළත් කරනු නොලබන අතර ඒවා අමාත්‍යාංශය විසින් ඍජුව ම ව්‍යාපෘතිය වෙත ලබා දෙනු ලැබේ. එබැවින් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ නොවේ.

2022 දෙසැම්බර් 31 වන දින දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ලැබුණු මුළු ප්‍රදාන ප්‍රමාණය රුපියල් 1,745,586,376.36කි. 2022 වර්ෂය සඳහා ලැබුණු මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් 240,901,783.86ක් වන අතර ඉන් රුපියල් 245,600,012.53 ක් ලබා දී ඇත. උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීමේ ව්‍යාපෘතිය මඟින් රුපියල් 220,296,660ක් වටිනා වත්කම් විශ්වවිද්‍යාලයට මාරු කර ඇති අතර, එය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇත.

# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 01 | **මුදල් සහ මුදල් සමාන දෑ** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | ජංගම ගිණුම් - පර්යේෂණ/ අරමුදල් සහ වෙනත් | 128,226,109.50 | 145,208,364.12 |
| | - පුනරාවර්තන | 178,456,154.85 | 190,377,323.14 |
| | - ප්‍රාග්ධනය | 64,596,085.29 | 294,530,305.71 |
| | ඉතිරි කිරීමේ ගිණුම් | 2,307,879.42 | 2,386,642.22 |
| | නේවාසික විදේශ මුදල් ගිණුම් (RFC) | 212,246,461.03 | 184,862,869.99 |
| | **එකතුව** | **585,832,690.09** | **817,365,505.18** |

| 02 | **ආයෝජනය - දායාද අරමුදල්** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 290,947,138.26 | 260,286,536.23 |
| | එකතු කළා | | |
| | වසර තුළ නව ආයෝජන | 281,991,984.94 | 30,660,602.03 |
| | අඩු කළා | | |
| | වර්ෂය තුළ මුදල් ආපසු ගැනීම් | 272,306,722.12 | - |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **300,632,401.08** | **290,947,138.26** |

| 03 | **ආයෝජනය - සීමිත අරමුදල්** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 1,495,707,521.84 | 1,281,851,647.39 |
| | එකතු කළා | | |
| | වසර තුළ නව ආයෝජන | 2,308,449,411.40 | 927,617,021.97 |
| | ගැලපීම් | | 390,000.00 |
| | අඩු කළා | | |
| | වර්ෂය තුළ මුදල් ආපසු ගැනීම් | 2,103,184,272.93 | 714,151,147.52 |
| | දෝෂ නිවැරදි කිරීම | - | - |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **1,700,972,660.31** | **1,495,707,521.84** |

| 04 | **විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු දෑ** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | සාමාන්‍ය ආයෝජන සඳහා ලැබිය යුතු පොළී | 168,398,809.17 | 27,025,124.32 |
| | දායාද අරමුදල් ආයෝජන සඳහා ලැබිය යුතු පොළී | 19,781,313.24 | 2,156,610.25 |
| | නිවාස කුලී | 3,094,196.93 | 1,728,126.72 |
| | විදුලිය | 2,040,758.71 | 1,647,560.77 |
| | ජලය | 3,007,260.17 | 3,397,816.71 |
| | ශිෂ්‍යාධාර | 20,260,000.00 | 21,980,000.00 |
| | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 400,000.00 | 400,000.00 |
| | ශිෂ්‍ය දඩ මුදල් සහ ශාලා ගාස්තු | 1,419,396.00 | 1,325,849.50 |
| | දුරකථන | 48,690.04 | 48,690.04 |
| | ණය ගැලපීම | 311,560.40 | 314,896.94 |
| | ගාස්තු අයකරනු ලබන පාඨමාලා - පාඨමාලා හැර යාම් | 560,800.00 | 560,800.00 |
| | පර්යේෂණ - මූල්‍ය අංශය | 36,107,609.35 | - |
| | පර්යේෂණ සහ අරමුදල් - වෛද්‍ය පීඨය | - | 114,596.30 |
| | වි.වි.ප්‍ර.කො. සහ වෙනත් | 25,377,304.07 | 18,720,063.55 |
| | ශුද්ධ පෙර වර්ෂ ගැලපීම | - | 528,043.82 |
| | මාර්ගස්ථ මුදල් (ලංකා බැංකුවෙන් මහජන බැංකුව වෙත) | - | 10,899,160.02 |
| | දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය - CDCE | 5,700,000.00 | 5,267,000.00 |
| | **එකතුව** | **286,507,698.08** | **96,114,338.94** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 05 | වෙනත් ආයතනවලින් ලැබිය යුතු මුදල් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIA | 194,280.78 | 27,091.25 |
| | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIS | 340,764.60 | 97,117.15 |
| | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIHS | 69,877.31 | 22,896.25 |
| | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIMS | 2,000,000.00 | - |
| | ප්‍රදාන සඳහා ශාස්ත්‍ර පීඨ භාණ්ඩ සැපයුම් | 8,356.10 | 28,460.76 |
| | වෛද්‍ය පීඨයේ අනෙකුත් ඒකකයන්ට භාණ්ඩ සැපයුම් | 24,412.57 | - |
| | **එකතුව** | **2,637,691.35** | **175,565.41** |

| 06 | අත්තිකාරම් | | 2022 | 2021 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 6.1 | අත්තිකාරම් - සැපයුම් සහ සේවා | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 4,371,451.06 | | 2,096,939.76 |
| | එකතු කළා | | | |
| | වසර තුළ ලබා දී ඇති අත්තිකාරම් | 69,238,576.60 | | 29,353,321.53 |
| | අඩු කළා | | | |
| | වර්ෂය තුළ අත්තිකාරම් පියවීම | 66,092,172.00 | | 27,328,810.23 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | **7,517,855.66** | **4,121,451.06** |
| 6.2 | අත්තිකාරම් - විවිධ | | | |
| | රාශීකරණ සහ ප්‍රාග්ධන ව්‍යාපෘති | 103,524,943.80 | | 217,847,821.57 |
| | බැංකු යන්ත්‍රයේ තැපැල් ගාස්තු අත්තිකාරම් | 1,785.00 | | 101,065.00 |
| | පර්යේෂණ ආධාර | 222,146.95 | | 448,146.95 |
| | සුළු මුදල් | 2,499.50 | | 2,499.50 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | **103,751,375.25** | **218,399,533.02** |
| 6.3 | කාර්ය මණ්ඩලයට අත්තිකාරම් | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 2,672,449.04 | | 443,844.90 |
| | එකතු කළා | | | |
| | වසර තුළ ලබා දී ඇති අත්තිකාරම් | 36,788,156.42 | | 80,933,395.60 |
| | අඩු කළා | | | |
| | වර්ෂය තුළ අත්තිකාරම් පියවීම | 37,045,651.60 | | 78,704,791.46 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | **2,414,953.86** | **2,672,449.04** |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | **113,684,184.77** | **225,193,433.12** |

| 07 | ඉන්ධන තැන්පතු | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - ප්‍රධාන | 586,950.00 | 586,950.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - කෘෂි විද්‍යා පීඨය | 300,000.00 | 175,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - ශාස්ත්‍ර පීඨය | 75,000.00 | 75,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - ඉංජිනේරු පීඨය | 150,000.00 | 150,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - වෛද්‍ය පීඨය | 150,000.00 | 100,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - විද්‍යා පීඨය | 45,000.00 | 45,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - පශු වෛද්‍ය පීඨය | 150,000.00 | 150,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 50,000.00 | 50,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 50,000.00 | 50,000.00 |
| | යටිනුවර ගඟපළාත MPCS LTD - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනය | 83,000.00 | 83,000.00 |
| | එකතුව | **1,639,950.00** | **1,464,950.00** |

| 08 | කාර්ය මණ්ඩලය සඳහා ණය | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | ජංගම වත්කම් - වසරක් ඇතුළත ලැබිය යුතු | 62,309,619.58 | 55,674,685.50 |
| | ජංගම නොවන වත්කම් - වසරකට වැඩි කාලයකින් ලැබිය යුතු | 161,319,028.59 | 147,006,121.50 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **223,628,648.17** | **202,680,807.00** |

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

| 09 | **ගබඩා භාණ්ඩ** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | පොදු ගබඩා | 17,419,919.89 | 11,870,086.09 |
| | විදුලි ගබඩා | 14,007,171.11 | 12,105,332.23 |
| | සිවිල් නඩත්තු ගබඩා | 31,777,684.90 | 20,661,733.63 |
| | ඉංජිනේරු පීඨ ගබඩා | 5,372,572.85 | 3,912,942.11 |
| | දන්ත වෛද්‍ය පීඨ ගබඩා | 6,511,993.83 | 10,020,762.82 |
| | රසායනික තොග | 136,280,870.05 | 136,469,906.15 |
| | ලිපි ද්‍රව්‍ය තොග | 33,371,879.28 | 32,935,462.46 |
| | වෛද්‍ය පීඨ ගබඩා | 169,242.68 | 168,042.68 |
| | ජල සැපයුම් ගබඩා | 15,125,259.32 | 14,432,565.69 |
| | ඖෂධ තොග | 1,630,476.60 | 1,760,214.39 |
| | ඉන්ධන තොග | 278,847.38 | 363,437.21 |
| | සිහිවටන පළක තොග | 117,510.00 | 117,970.00 |
| | වෙනත් පරිභෝජ්‍ය භාණ්ඩ තොග | 27,079,714.44 | 23,636,986.67 |
| | පර්යේෂණ තොගය | 6,671,304.90 | 4,962,418.80 |
| | දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ තොග | 6,339,846.81 | 5,616,981.78 |
| | | **302,154,294.04** | **279,034,842.71** |

| 10 | **පෙර ගෙවීම්** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 752,230.40 | 2,243,961.31 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | 3,313,909.63 | 1,740,500.14 |
| | අඩු කළා | | |
| | වර්ෂය තුළ හිලව් කරන ලද ගෙවීම් | 2,638,845.95 | 3,232,231.05 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **1,427,294.08** | **752,230.40** |

| 11 | **බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල්** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | බැඳුම්කර උල්ලංඝනය කිරීම් වලින් ලැබිය යුතු මුදල් | 235,658,197.33 | 128,373,591.13 |
| | බැඳුම්කර උල්ලංඝනය කරන්නන් සඳහා වැඩිපුර ගෙවන ලද වැටුප් | 4,053,655.35 | 3,497,862.85 |
| | බැඳුම්කර උල්ලංඝණය කරන්නන්ගෙන් විවිධ ලැබිය යුතු | 1,232,855.83 | 1,052,593.82 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **240,944,708.51** | **132,924,047.80** |

| 12 | **ජීව විද්‍යාත්මක වත්කම්** | | | 2022 | 2021 |
|---|---|---|---|---|---|
| | | | | රු. | රු. |
| | | කෘෂි ගොවිපල | පශු ගොවිපල | | |
| | | | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 5,609,602.00 | 9,778,375.00 | 15,387,977.00 | 10,525,220.00 |
| | ගැලපීම | - | - | - | 18,560.00 |
| | පශු සම්පත් වලින් ලැබෙන ලාභ/අලාභ | 2,970,448.00 | 5,636,285.00 | 8,606,733.00 | 4,844,197.00 |
| | වර්ෂය අවසානයේ ශේෂය | **8,580,050.00** | **15,414,660.00** | **23,994,710.00** | **15,387,977.00** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 13 | දේපළ, පිරියත සහ උපකරණ | ඉඩම් | ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | මෝටර් රථ | ගෘහභාණ්ඩ සහ සවිකෘත | කාර්යාල සහ වෙනත් උපකරණ | රසායනාගාර සහ ඉගැන්වීම් | පුස්තකාල පොත් සහ වාර සඟරා | උපාධිකබා | අස්පෘශ්‍ය වත්කම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | වර්ෂය ආරම්භයේ දී පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය | 12,012,642,869.30 | 10,738,523,879.36 | 197,216,072.85 | 272,801,305.00 | 790,078,484.80 | 952,303,801.86 | 2,404,144,617.33 | 173,854,272.20 | 8,709,000.00 | 25,654,570.18 | 27,578,456,178.34 |
| | | | | | | | | | | | | |
| | වසර තුළ එකතු කිරීම් | 620,712.50 | 231,883,085.34 | 14,157,852.56 | - | 61,903,484.44 | 150,703,332.77 | 145,381,620.54 | 4,074,365.50 | 167,750.00 | 699,701.07 | 609,591,904.72 |
| | වසර ප්‍රත්‍යාගණනය | 16,469,440,000.00 | - | - | 389,125,000.00 | - | - | - | - | - | - | 16,858,565,000.00 |
| | වර්ෂය තුළ ගැලපීම් | 11,989,706,431.80 | 1,255,108.95 | 102,140.00 | 265,176,305.00 | 346,859.88 | 4,524,696.12 | 2,450,175.00 | 308,397.73 | 1,650.00 | - | 12,263,871,764.48 |
| | වසර අවසානයේ දී | 16,492,997,150.00 | 10,971,662,073.65 | 211,271,785.41 | 396,750,000.00 | 851,635,109.36 | 1,098,482,438.51 | 2,547,076,062.87 | 178,237,035.43 | 8,875,100.00 | 26,354,271.25 | 32,783,341,026.48 |
| | | | | | | | | | | | | |
| | ක්ෂය වීම | | | | | | | | | | | |
| | වසර ආරම්භයේ දී සමුච්චිත ක්ෂයවීම් | - | 2,817,786,386.90 | 76,951,743.36 | 272,130,740.95 | 364,772,307.06 | 550,473,777.52 | 1,450,687,497.13 | 100,219,791.17 | 6,684,612.44 | - | 5,642,234,161.99 |
| | වසර සඳහා ගාස්තු | - | 544,843,954.13 | 19,867,502.67 | 79,350,000.00 | 79,696,145.62 | 96,884,077.64 | 214,796,525.15 | 35,010,746.65 | 529,930.00 | 2,586,122.39 | 1,073,565,004.25 |
| | ගැලපීම් | - | 79,651.23 | 61,311.97 | 264,499,012.38 | 262,506.86 | 4,442,894.31 | 2,448,440.75 | - | 1,650.00 | - | 271,795,467.50 |
| | වසර අවසානයේ දී සමුච්චිත ක්ෂයවීම් | - | **3,362,709,992.26** | **96,757,934.06** | **86,981,728.57** | **444,205,945.82** | **642,914,960.85** | **1,663,035,581.53** | **135,230,537.82** | **7,212,892.44** | **2,586,122.39** | **6,441,635,695.74** |
| | | | | | | | | | | | | |
| | **ශුද්ධ පොත් අගය** | **16,492,997,150.00** | **7,608,952,081.39** | **114,513,851.35** | **309,768,271.43** | **407,429,163.54** | **455,567,477.66** | **884,040,481.34** | **43,006,497.61** | **1,662,207.56** | **23,768,148.86** | **26,341,705,330.75** |

**ඉඩම්**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA), විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS) සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) යන ආයතනවල ගොඩනැගිලි පිහිටි දේපළවල අයිතිය විශ්වවිද්‍යාලය විසින් දරනු ලබන බැවින් එම ඉඩම්වල වටිනාකම් විශ්වවිද්‍යාල ගිණුමේ දේපළ පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇත. තව ද, විශ්වවිද්‍යාලය විසින් එම දේපළ මෙම ආයතන වෙත පැවරීම හෝ බදු දීමක් සිදු කරනු නොලබයි.

**ගොඩනැගිලි**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉදිකරන ලද කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතන කාර්ය මණ්ඩල නිල නිවාස හැර අනෙකුත් ගොඩනැගිලි එම ආයතන විසින් අරමුදල් භාවිත කරන ලද බැවින් ආයතන දෙකෙහි ම ගිණුම් ප්‍රකාශයේ අනාවරණය කර ඇත.

| දේපළ, පිරියත සහ උපකරණ | |
|---|---|
| ස්පෘශ්‍ය වත්කම් | 26,317,937,181.89 |
| අස්පෘශ්‍ය වත්කම් | 23,768,148.86 |
| **එකතුව** | **26,341,705,330.75** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 14 | කෙරීගෙන යන වැඩ | වසරේ ආරම්භය | 2022 වියදම් | ගැළපීම් | ප්‍රාග්ධනීත කළ මුදල් | 2022 | 2021 |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | ප්‍රාග්ධන ව්‍යාපෘති 11-01-01-05 | | | | | | |
| | 2022 වසරේ වියදම් | | 396,288,699.00 | | 1,037,547.59 | 395,251,151.41 | - |
| | 2021 වසරේ වියදම් | 404,756,123.87 | - | - | 22,656,678.90 | 382,099,444.97 | 404,756,123.87 |
| | 2020 වසරේ වියදම් | 199,644,923.48 | - | - | 16,374,449.09 | 183,270,474.39 | 199,644,923.48 |
| | 2019 වසරේ වියදම් | 207,410,598.13 | - | - | 11,005,958.18 | 196,404,639.95 | 207,410,598.13 |
| | 2018 වසරේ වියදම් | 174,694,270.35 | - | - | 1,086,750.00 | 173,607,520.35 | 174,694,270.35 |
| | 2017 වසරේ වියදම් | 164,706,871.99 | - | - | - | 164,706,871.99 | 164,706,871.99 |
| | 2016 වසරේ වියදම් | 52,662,727.49 | - | - | - | 52,662,727.49 | 52,662,727.49 |
| | 2015 වසරේ වියදම් | 81,084,983.14 | - | - | - | 81,084,983.14 | 81,084,983.14 |
| | 2014 වසරේ වියදම් | 92,276,033.10 | - | - | 1,866,984.00 | 90,409,049.10 | 92,276,033.10 |
| | 2013 වසරේ වියදම් | 7,102,369.75 | - | - | - | 7,102,369.75 | 7,102,369.75 |
| | 2012 වසරේ වියදම් | 11,023,016.69 | - | - | 3,733,968.00 | 7,289,048.69 | 11,023,016.69 |
| | 2009 වසරේ වියදම් | 500,000.00 | - | - | - | 500,000.00 | 500,000.00 |
| | | **1,395,861,917.99** | **396,288,699.00** | - | **57,762,335.76** | **1,734,388,281.23** | **1,395,861,917.99** |
| | 2022 වසරේ වියදම් | | 83,413,409.80 | | 18,464,302.35 | 64,949,107.45 | - |
| | 2021 වසරේ වියදම් | 71,318,698.50 | | | 22,246,431.08 | 49,072,267.42 | 71,318,698.50 |
| | 2020 වසරේ වියදම් | 29,635,731.77 | | | 29,375,494.44 | 260,237.33 | 29,635,731.77 |
| | 2019 වසරේ වියදම් | 34,434,316.33 | | | 34,434,316.33 | - | 34,434,316.33 |
| | | **1,531,250,664.59** | **479,702,108.80** | - | **162,282,879.96** | **1,848,669,893.43** | **1,531,250,664.59** |
| | | | | | | | |
| | පුනරුත්තාපන ව්‍යාපෘති 11-03-19-01 | | | | | | |
| | 2022 වසරේ වියදම් | - | 20,076,588.42 | | 5,023,623.67 | 15,052,964.75 | - |
| | 2021 වසරේ වියදම් | 61,085,698.04 | - | 2,307,848.31 | 22,263,182.41 | 36,514,667.32 | 61,085,698.04 |
| | 2020 වසරේ වියදම් | 434,557,380.59 | - | - | 43,124,322.75 | 391,433,057.84 | 434,557,380.59 |
| | 2019 වසරේ වියදම් | 5,277,548.75 | - | - | - | 5,277,548.75 | 5,277,548.75 |
| | 2018 වසරේ වියදම් | 54,277,702.81 | - | - | 2,563,756.00 | 51,713,946.81 | 54,277,702.81 |
| | 2017 වසරේ වියදම් | 2,348,098.54 | - | - | - | 2,348,098.54 | 2,348,098.54 |
| | 2016 වසරේ වියදම් | 3,016,060.95 | - | - | 1,036,367.31 | 1,979,693.64 | 3,016,060.95 |
| | 2015 වසරේ වියදම් | 14,670,770.28 | - | - | 14,024,625.18 | 646,145.10 | 14,670,770.28 |
| | 2014 වසරේ වියදම් | 4,363,018.58 | - | - | 4,363,018.58 | - | 4,363,018.58 |
| | 2008 වසරේ වියදම | 345,000.00 | - | - | - | 345,000.00 | 345,000.00 |
| | 2007 වසරේ වියදම් | 909,201.63 | - | - | - | 909,201.63 | 909,201.63 |
| | 2005 වසරේ වියදම් | 1,142,639.38 | - | - | - | 1,142,639.38 | 1,142,639.38 |
| | 2004 වසරේ වියදම් | 292,675.50 | - | - | - | 292,675.50 | 292,675.50 |
| | 2003 වසරේ වියදම් | 210,000.00 | - | - | - | 210,000.00 | 210,000.00 |
| | | **582,372,051.89** | **20,076,588.42** | **2,307,848.31** | **92,398,895.90** | **507,865,639.26** | **582,495,795.05** |
| | | | | | | | |
| | එකතුව | **2,113,746,459.64** | **499,778,697.22** | **2,307,848.31** | **254,681,775.86** | **2,356,535,532.69** | **2,113,746,459.64** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 15 | **විවිධ තැන්පතු** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | නිවාස කුලී | 399,510.70 | 345,713.20 |
| | කාර්ය මණ්ඩල ඇප සුරැකුම් | 110,844.71 | 110,844.71 |
| | කාමර කුලී | 15,000.00 | 12,000.00 |
| | ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු | 27,500.00 | 27,500.00 |
| | ටෙන්ඩර් තැන්පතු | 1,807,902.00 | 1,965,435.00 |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ ඇප සුරැකුම් | 2,001,043.61 | 1,876,043.61 |
| | පුස්තකාල පොත් බදින්නන්ගේ තැන්පතු | 4,500.00 | 4,500.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතුව - ශාරීරික අධ්‍යාපන අංශය | 11,000.00 | 11,000.00 |
| | වෙනත් තැන්පතු | 1,586,497.00 | 557,197.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු - දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 120,000.00 | 20,000.00 |
| | එකතුව | **6,083,798.02** | **4,930,233.52** |

| 16 | **විවිධ ගෙවිය යුතු සහ පූර්ව ලැබීම්** | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | ගෙවිය යුතු සැපයුම් | 20,692,312.51 | 4,319,550.63 |
| | ලබා නොගත් වැටුප | - | - |
| | ගෙවිය යුතු පාරිතෝෂිකය | 277,308.37 | 1,267,605.74 |
| | ගෙවිය යුතු පාරිතෝෂික - එකතු නොකළ චෙක්පත් | 26,305,382.64 | 408,612.50 |
| | පූර්ව ලැබීම් - පොදු | 32,999.92 | 1,284,517.50 |
| | පූර්ව ලැබීම් - ශිෂ්‍ය | 1,214,915.75 | 787,079.79 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 58,225.00 | 50,275.00 |
| | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 67,432,754.66 | 8,786,900.10 |
| | ගෙවිය යුතු කොන්ත්‍රාත් මත රඳවා තබා ගැනීම් | 81,993,034.17 | 107,813,396.55 |
| | උපයනවිට ගෙවීම් බද්ද | 195,961.22 | 30,161.06 |
| | බැඳුම්කර මත ගෙවිය යුතු | 1,602,630.00 | 1,602,630.00 |
| | වෙනත් ණය මත ගෙවිය යුතු | 74,831.00 | 510,363.95 |
| | බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් වැඩිපුර ලැබීම් | 1,955,824.22 | 1,955,824.22 |
| | සේවකයින්ට ගෙවිය යුතු හිඟ ජීවන වියදම් සඳහා විශ්‍රාම වැටුප් දායකත්වය | - | - |
| | අනෙකුත් ගෙවිය යුතු | 72,137.50 | - |
| | අග්‍රහාර රක්ෂණය | 8,400.00 | 2,000.00 |
| | මුදල් හුවමාරු | | |
| | පූර්ව ලැබීම් - දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය - (CDCE) | 65,637,017.00 | 66,578,435.33 |
| | එකතුව | **267,553,733.96** | **195,397,352.37** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 17 | උපචිත වියදම් | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වැටුප් සහ වේතන - අධ්‍යයන | 8,481,051.47 | 15,917,102.97 |
| | වි.අ.අ. | 1,542,731.76 | 2,657,049.78 |
| | සේ.භා.අ. | 308,546.35 | 531,409.95 |
| | වෙනත් දීමනා | 176,265.91 | 139,268.05 |
| | රු.5000 දීමනාව - අයවැය අත්තිකාරම් | 1,110,109.86 | - |
| | ජීවන වියදම් දීමනාව | 1,803,826.88 | 1,796,562.26 |
| | මාසික අතුරු දීමනාව | 557,559.40 | 205,932.84 |
| | වැටුප් සහ වේතන - අනධ්‍යයන | 989,297.08 | 424,461.29 |
| | වි.අ.අ. | 100,032.58 | 8,329.84 |
| | සේ.භා.අ. | 20,811.13 | 1,665.97 |
| | රු.5000 දීමනාව - අයවැය අත්තිකාරම් | 48,958.60 | - |
| | අතිකාල | 13,608,511.92 | 9,808,184.56 |
| | නිවාඩු ගෙවීම් | 525,582.00 | 518,196.00 |
| | ජීවන වියදම් දීමනාව | 54,407.09 | 11,070.97 |
| | ගමන් වියදම් - දේශීය | 186,127.25 | 91,050.00 |
| | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 5,379,938.36 | 125,074.18 |
| | ඉන්ධන සහ ලිහිසි තෙල් | 2,274,717.22 | 1,852,210.90 |
| | මැහුම් ගාස්තු ඇතුළු නිල ඇඳුම් | 204,925.00 | 66,775.00 |
| | රසායනික සහ වීදුරු භාණ්ඩ | 2,617,162.42 | 694,276.27 |
| | වෙනත් සැපයුම් | 9,210,160.36 | 2,088,096.39 |
| | වෛද්‍ය සැපයුම් | 441,648.00 | 268,520.00 |
| | වාහන | 4,056,523.21 | 1,387,427.40 |
| | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 2,550,281.09 | 2,446,504.42 |
| | යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 9,250.00 | - |
| | විදුලි සංදේශ | 14,370,170.98 | 8,023,531.57 |
| | ප්‍රවාහන | 223,600.00 | 214,955.00 |
| | තැපැල් ගාස්තුව | - | 50,000.00 |
| | විදුලි ගාස්තු | 13,324,401.57 | 9,081,942.39 |
| | ඇප තැන්පතු ගාස්තු | 26,076,283.53 | 15,739,460.23 |
| | ජල ගාස්තු | 5,142,595.31 | 2,867,779.93 |
| | පිරිසිදු කිරීමේ සේවා | 11,673,903.63 | 16,078,932.67 |
| | කුලී සහ කුලීපිට ගැනුම් ගාස්තු | 2,135,157.10 | 1,248,000.00 |
| | වෙනත් කොන්ත්‍රාත් සේවා | 1,007,540.00 | 1,196,100.00 |
| | විශේෂ සේවා - පාලක සභා සහ කමිටු සාමාජික ගාස්තු | 111,000.00 | 266,260.00 |
| | විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් (විගණන ගාස්තු) | 5,717,500.00 | 6,950,250.00 |
| | මුද්‍රණය සහ ප්‍රචාරණය | 651,950.00 | 600,000.00 |
| | ශාස්ත්‍රීය පර්යේෂණ | 399,300.00 | 1,123,015.00 |
| | වැඩමුළු සහ රැස්වීම් | 97,803.00 | - |
| | කාර්ය මණ්ඩල සංවර්ධනය | - | 1,075,000.00 |
| | නිවාඩු දින අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත් | 4,333,065.00 | 1,184,150.00 |
| | විනෝදාස්වාද වියදම් | 1,126,385.64 | 1,205,442.49 |
| | දායකත්ව සහ සාමාජික ගාස්තු | 1,654,642.00 | 500,000.00 |
| | බැංකු ගාස්තු | 15,500.00 | 7,000.00 |
| | සම්මාන සහ වන්දි | 100,000.00 | 100,000.00 |
| | විභාග වියදම් | 13,352,703.08 | 6,371,081.82 |
| | ප්‍රවෘත්ති පත්‍ර, සඟරා ආදිය | 3,453,666.85 | 1,439,569.59 |
| | බාහිර දේශන ගාස්තු | 5,912,951.50 | 2,473,548.00 |
| | සංඛ්‍යාලේඛන සහ මෙහෙයුම් කාර්යය පර්යේෂණ උපාධිය | 2,545,011.00 | 1,978,335.00 |
| | විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු | 222,500.00 | 500,000.00 |
| | ශිෂ්‍යාධාර | 1,588,000.00 | 21,980,000.00 |
| | ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධනය | - | 50,000.00 |
| | ගාස්තු අයකිරීමේ පාඨමාලා | 89,204.55 | 232,495.98 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් ඒකකය | 16,307,658.12 | 5,735,647.28 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - කෘෂි විද්‍යා පීඨය | 3,648,635.75 | 1,831,132.58 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - ශාස්ත්‍ර පීඨය | 1,122,316.30 | 2,060,338.92 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - ඉංජිනේරු පීඨය | 4,524,021.30 | 6,457,657.64 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - කළමනාකරණ පීඨය | - | 2,121,886.00 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - විද්‍යා පීඨය | 639,388.16 | 432,279.09 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - පශු වෛද්‍ය විද්‍යා පීඨය | 13,603,170.27 | 3,554,083.76 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 1,181,494.58 | 1,476,713.50 |
| | උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 84,200.00 | 108,600.00 |
| | උපචිත වියදම් - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 7,138,370.79 | 7,740,650.19 |
| | ශුද්ධ පෙර වර්ෂ ගැලපීම | - | 19,967,296.08 |
| | එකතුව | **219,832,514.95** | **155,127,711.59** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 18 | විශ්‍රාම පාරිතෝෂිකය | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 2,370,814,929.00 | 2,470,252,069.00 |
| | | | |
| | එකතු කළා | | |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 236,989,334.13 | 150,616,243.91 |
| | අඩු කළා | | |
| | වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | 193,964,039.13 | 250,053,383.91 |
| | වර්ෂය තුළ ගැළපීම් | | - |
| | | | |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | **2,413,840,224.00** | **2,370,814,929.00** |

| 19 | ප්‍රාග්ධන වියදම් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | | | |
| | ප්‍රාග්ධන දීමනාව - වියදම් කර ඇත | - | 4,579,569,619.23 |
| | ප්‍රාග්ධන ප්‍රදානය - වියදම් කළ කෙරෙමින් පවතින වැඩ | - | 1,623,865,034.55 |
| | පුනරුත්තාපන ප්‍රදානය - වියදම් කළ ප්‍රාග්ධන ස්වභාවයේ කෙරෙමින් පවතින වැඩ | - | 594,545,296.24 |
| | | | |
| | එකතුව | - | **6,797,979,950.02** |

| 20 | ප්‍රාග්ධනය වියදම් නොකළ | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | ප්‍රාග්ධන ප්‍රදානය - වියදම් නොකළ ගොඩනැගිලි | | 159,577,461.83 |
| | ප්‍රාග්ධන ප්‍රදානය - වියදම් නොකළ උපකරණ, ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත් | 64,596,085.29 | 69,324,574.80 |
| | පුනරුත්තාපන ප්‍රදාන - වියදම් නොකළ | | 65,628,269.08 |
| | ප්‍රාග්ධන ප්‍රදානය - වියදම් නොකළ ගොඩනැගිලි | | |
| | | | |
| | එකතුව | **64,596,085.29** | **294,530,305.71** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 20.1 ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකළ ගොඩනැගිලි | වසරේ ශේෂය | වර්ෂය සඳහා ලැබුණු අරමුදල් සහ ගැලපීම් | භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් | වර්ෂයේ ගැලපීම | වර්ෂය තුළ වියදම් | වසර අවසානයේ දී වියදම් නොකළ ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| කෘෂි විද්‍යා පීඨයේ ප්‍රධාන සැලසුම් සංවර්ධන අදියර ll | - | 14,899,800.00 | - | - | 14,899,800.00 | - |
| භූගෝල විද්‍යා ගොඩනැගිල්ල - ශාස්ත්‍ර පීඨය | - | 7,179,364.80 | - | 2,541,442.00 | 4,637,922.80 | - |
| ශාස්ත්‍ර පීඨය සඳහා සත්මහල් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | - | 99,823,528.05 | - | 28,315,022.29 | 71,508,505.76 | - |
| පීඨ මධ්‍යස්ථානය ඉදිකිරීම - ඉංජිනේරු පීඨය | - | 8,300,000.00 | - | 8,300,000.00 | - | - |
| පරිගණක මධ්‍යස්ථානය සඳහා යෝජිත ගොඩනැගිල්ල - ඉංජිනේරු පීඨය | - | 3,000,000.00 | - | 3,000,000.00 | - | - |
| ඉංජිනේරු පීඨයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල පුළුල් කිරීම | | 118,282,367.49 | - | 25,000,000.00 | 93,282,367.49 | - |
| ඉංජිනේරු පීඨයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල පුළුල් කිරීම | 109,019,199.55 | 392,963,610.45 | 110,000,000.00 | 547,386,724.71 | - | 64,596,085.29 |
| මී වතුර නේවාසිකාගාර පරිශ්‍රය සඳහා නව ආපන ශාලාවක් ඉදිකිරීම | - | 10,046,052.22 | - | 4,969,413.08 | 5,076,639.14 | - |
| වෛද්‍ය පීඨයේ පැරා - සායනික ගොඩනැගිල්ල - අදියර 11 | | 171,767,648.62 | | 35,962,452.41 | 135,805,196.21 | - |
| වෛද්‍ය පීඨයේ පැරා - සායනික ගොඩනැගිල්ල - අදියර 11 | 50,558,262.28 | - | | 50,558,262.28 | | - |
| විද්‍යා පීඨයේ නව පරිපාලන ගොඩනැගිල්ල පුළුල් කිරීම - | - | 3,537,547.59 | - | 2,500,000.00 | 1,037,547.59 | - |
| විද්‍යා පීඨයේ අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ අධ්‍යයනාංශයේ දැනට පවතින ගොඩනැගිල්ල පුළුල් කිරීම | - | 84,204,416.01 | - | 20,200,000.00 | 64,004,416.01 | - |
| ගොවිපල සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍යය අධ්‍යයනාංශය පුළුල් කිරීම | - | 6,036,304.00 | - | - | 6,036,304.00 | - |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම | - | 4,899,873.32 | - | 4,899,873.32 | - | - |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ දේශන ශාලා දෙකක් | - | 4,000,000.00 | - | 4,000,000.00 | - | - |
| ප්‍රධාන පුස්තකාලයේ යෝජිත පුළුල් කිරීම් | - | 5,930,010.00 | - | 5,930,010.00 | - | - |
| ශාරීරික අධ්‍යාපනය සඳහා හොකී සහ මලල ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම | - | 94,547.01 | - | 94,547.01 | - | - |
| | **159,577,461.83** | **934,965,069.56** | **110,000,000.00** | **743,657,747.10** | **396,288,699.00** | **64,596,085.29** |
| වියදම් නොකළ වෙනත් | | | | | | |
| විශ්වවිද්‍යාල හයක් ජාත්‍යන්තර මට්ටමට පරිවර්තනය කිරීම | - | 4,000,000.00 | - | - | 4,000,000.00 | - |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | - | 915,804.43 | - | 141,125.50 | 774,678.93 | - |
| වියදම් නොකළ මුළු ප්‍රදානය | **159,577,461.83** | **939,880,873.99** | **110,000,000.00** | **743,798,872.60** | **401,063,377.93** | **64,596,085.29** |

| 20.2 ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකළ - උපකරණ, ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත් | වර්ෂය ආරම්භයේ ශේෂය | අරමුදල් මාරු කිරීම් සහ ගැලපීම් | ලැබුණු මුළු මුදල | වර්ෂයේ ගැලපීම් | වර්ෂය තුළ වියදම් | වසර අවසානයේ ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ උපකරණ | 69,324,574.80 | 65,743,046.00 | 135,067,620.80 | - | 135,067,620.80 | - |
| පොත් සහ වාර සඟරා | - | 6,505,783.15 | 6,505,783.15 | 4,997,000.00 | 1,508,783.15 | - |
| වියදම් නොකළ මුළු ප්‍රදානය | **69,324,574.80** | | **141,573,403.95** | **4,997,000.00** | **136,576,403.95** | **-** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 21 | **පරිත්‍යාග - වත්කම්** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | පරිත්‍යාග කරන ලද ගොඩනැගිලි - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | - | 803,788,779.22 |
| | පරිත්‍යාග කළ වත්කම් | - | 2,500,624,490.17 |
| | පරිත්‍යාග කළ වෙනත් ගොඩනැගිලි - විදේශීය සහ දේශීය ප්‍රදාන මඟින් අරමුදල් සපයන ලද | - | 814,799,757.45 |
| | සිංහ සමාජය මඟින් පරිත්‍යාග කරන ලද කසළ ට්‍රක් රථය | - | 1,560,038.09 |
| | එකතුව | - | **4,120,773,064.93** |

| 22 | **බැඳුම්කර උල්ලංඝනය කිරීම** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 585,914,782.35 | 573,440,542.11 |
| | එකතු කළා | | |
| | වර්ෂය සඳහා එකතු කිරීම් / ගැලපීම් | 221,094,835.49 | 60,729,566.34 |
| | අඩු කළා | | |
| | වසර තුළ බැඳුම්කර අයකර ගැනීම් | 59,257,794.04 | 48,255,326.10 |
| | වර්ෂය අවසානයේ ශේෂය | **747,751,823.80** | **585,914,782.35** |

| 23 | **දායාද අරමුදල** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 277,029,215.78 | 244,211,938.04 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ එකතු කිරීම | 46,543,042.46 | 40,525,745.32 |
| | අඩු කළා | | |
| | වර්ෂය තුළ ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සහ සම්මාන | 13,322,410.33 | 7,708,467.58 |
| | වර්ෂය අවසානයේ ශේෂය | **310,249,847.91** | **277,029,215.78** |

| 24 | **පර්යේෂණ ආධාර** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේදී ශේෂය | 397,306,828.92 | 266,556,416.99 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | 492,346,913.19 | 525,648,656.79 |
| | අඩු කළා | | |
| | වසර තුළ වියදම් කළ අරමුදල් | 493,244,927.38 | 394,898,244.86 |
| | ගැළපීම් | - | - |
| | වර්ෂය අවසානයේ ශේෂය | **396,408,814.73** | **397,306,828.92** |

| 25 | **විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 107,476,193.35 | 99,314,854.63 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | 130,255,197.47 | 21,982,809.19 |
| | අඩු කළා | | |
| | වසර තුළ වියදම් කළ අරමුදල් | 85,200,299.36 | 13,821,470.47 |
| | ගැළපීම් | - | - |
| | වර්ෂය අවසානයේ ශේෂය | **152,531,091.46** | **107,476,193.35** |

| 26 | **විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | | 357,650,259.99 | 269,828,670.90 |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | | |
| | එකතු කළා | 301,164,709.29 | 334,139,050.30 |
| | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | | |
| | අඩු කළා | 264,089,786.50 | 246,317,461.21 |
| | වසර තුළ වියදම් කළ අරමුදල් | - | - |
| | ගැළපීම් | **394,725,182.78** | **357,650,259.99** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 27 | **වෙනත් අරමුදල්** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 223,126,160.67 | 195,633,320.05 |
| | වර්ෂය සඳහා එකතු කිරීම් / ගැළපීම් | - | - |
| | | - | 195,633,320.05 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ ලද අරමුදල් | 251,443,502.14 | 205,261,536.39 |
| | අඩු කළා | | |
| | වසර තුළ වියදම් කළ අරමුදල් | 230,944,517.98 | 177,768,695.77 |
| | ගැළපීම් | - | - |
| | | 243,625,144.83 | 223,126,160.67 |
| | දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය - CDCE | 188,993.75 | 230,654.08 |
| | | | |
| | වර්ෂය අවසානයේ ශේෂය | **243,814,138.58** | **223,356,814.75** |

| 28 | **ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 8,291,357,519.35 | 9,212,619,465.94 |
| | එකතු කළා | | |
| | වර්ෂය තුළ එකතු කිරීම් | 17,123,061,037.38 | - |
| | අඩු කළා | | |
| | වර්ෂය සඳහා අය කිරීම් | 12,285,590,314.04 | 921,261,946.59 |
| | වර්ෂයේ ක්‍රමක්ෂය කිරීම් | 1,312,882,824.27 | - |
| | වර්ෂය අවසානයේ ශේෂය | **11,815,945,418.42** | **8,291,357,519.35** |

| 29 | **අභ්‍යන්තර ව උත්පාදිත ආදායම** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | | | |
| | හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම | | |
| | පුස්තකාල දඩ | 636,097.44 | 92,626.00 |
| | උප එකතුව | **636,097.44** | **92,626.00** |
| | හුවමාරු ගනුදෙනු වලින් ලද ආදායම | | |
| | කාර්ය මණ්ඩල ණය වලින් පොළිය | 8,431,817.76 | 7,489,504.43 |
| | දේපළ වලින් ලද කුලී | 15,835,009.89 | 14,798,013.96 |
| | පැරණි වත්කම් විකිණීම් | - | 619,980.00 |
| | විවිධ ආදායම් | 45,882,399.81 | 14,387,331.17 |
| | ලියාපදිංචි ගාස්තු (උපාධි) | 42,405,334.00 | 32,099,655.35 |
| | විභාග ගාස්තු (උපාධි) | 15,722,044.00 | 8,285,890.00 |
| | ප්‍රකාශන විකිණීම | 13,277.00 | 45,978.00 |
| | වෛද්‍ය ගාස්තු | 1,900,050.00 | 924,500.00 |
| | විදේශීය සිසුන්ගෙන් ලද ආදායම | 92,607,706.27 | 54,011,512.00 |
| | විදේශ මුදල් ලාභය | 132,975,510.67 | 6,592,966.88 |
| | පශු සම්පත් වලින් ලැබෙන ලාභය | 8,606,733.00 | 4,844,197.00 |
| | උපකාරක කටයුතු වලින් ලැබෙන ආදායම | 58,352,834.46 | 49,659,519.70 |
| | උප එකතුව | **422,732,716.86** | **193,759,048.49** |
| | එකතුව | **423,368,814.30** | **193,851,674.49** |

| 30 | **පර්යේෂණ ප්‍රදාන, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වෙනත් ආකාරයෙන් ලද ආදායම්** | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| | පර්යේෂණ ප්‍රදානවලින් ලැබෙන ආදායම | 486,287,851.89 | 391,299,117.43 |
| | ස්වයං මූල්‍යකරණය සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම | 252,458,107.80 | 207,763,902.82 |
| | වර්ෂය අවසානයේ ශේෂය | **738,745,959.69** | **599,063,020.25** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 31 | වියදම් | එකතුව | වැඩසටහන 1 | වැඩසටහන 2 | වැඩසටහන 3 | වැඩසටහන 4 | වැඩසටහන 5 | වැඩසටහන 7 | වැඩසටහන 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පුද්ගල පඩිනඩි - අධ්‍යයන** | | | | | | | | | |
| 4101 | වැටුප් සහ වේතන | 1,316,807,149 | 4,133,450.53 | 1,285,131,972.21 | 20,089,946.52 | - | - | - | 7,451,779.90 |
| 4102 | වි.අ.අ | 307,969,776 | 1,470,957 | 299,929,642 | 5,224,768 | - | - | - | 1,344,408 |
| 4103 | රජයේ විශ්‍රාම වැටුප් | 153,823,053 | - | 150,276,152 | 2,514,374 | - | - | - | 1,032,527 |
| 4104 | සේ.භා.අ | 92,941,237 | 294,191 | 90,640,038 | 1,547,828 | - | - | - | 459,179 |
| 4105 | වැඩබැලීමේ වැටුප | 544,261 | - | 544,261 | - | - | - | - | - |
| 4108 | අධ්‍යයන දීමනාව | 1,609,541,547 | 5,795,597 | 1,565,677,458 | 29,889,049 | - | - | - | 8,179,443 |
| 4110 | වෙනත් දීමනාවක් | 29,654,628 | 159,576 | 27,065,202 | 1,401,390 | - | - | 908,035 | 120,426 |
| 4112 | පාරිතෝෂිකය | 133,650,937 | 646,039 | 111,702,114 | 6,643,816 | - | - | - | 14,658,968 |
| 4117 | විනෝද්‍රාස්වාද දීමනා අධ්‍යයන (801 MCA හිඟ මුදල්) | 4,449,190 | 151,278 | 4,257,577 | 40,335 | - | - | - | - |
| 4120 | CIR 865 දීමනාව | 72,786,859 | 129,441 | 71,356,611 | 855,000 | - | - | - | 445,806 |
| 4122 | ජීවන වියදම් දීමනාව | 132,638,451 | 238,160 | 129,976,436 | 1,591,200 | - | - | - | 832,654 |
| 4125 | පර්යේෂණ දීමනාව | 363,331,095 | 1,214,682 | 353,181,350 | 7,039,165 | - | - | - | 1,895,897 |
| 4127 | දේපල ණය පොළී | 5,252,302 | 73,056 | 4,970,331 | 208,915 | - | - | - | - |
| 4129 | අමතර මාසික දීමනාව | 208,710,227 | 694,104 | 202,909,199 | 4,023,553 | - | - | - | 1,083,370 |
| 4130 | මාසික අතුරු දීමනාව | 6,049,747 | - | 6,049,747 | - | - | - | - | - |
| **එකතුව** | | **4,455,516,080** | **15,000,532** | **4,312,008,814** | **81,069,341** | **-** | **-** | **9,932,934** | **37,504,459** |
| **පුද්ගල පඩිනඩි - අනධ්‍යයන** | | | | | | | | | |
| 4201 | වැටුප් සහ වේතන | 1,110,660,632 | 212,002,478 | 545,267,618 | 56,636,056 | 65,644,422 | 124,813,891 | 15,515,657 | 90,780,509 |
| 4202 | වි.අ.අ | 172,276,910 | 31,435,748 | 82,082,169 | 9,183,290 | 10,294,765 | 20,853,243 | 2,090,597 | 16,337,097 |
| 4203 | රජයේ විශ්‍රාම වැටුප් | 97,500,724 | 21,104,552 | 47,802,248 | 4,824,590 | 5,152,222 | 10,577,913 | 1,642,623 | 6,396,577 |
| 4204 | සේ.භා.අ | 53,942,380 | 10,499,003 | 25,955,674 | 2,801,530 | 3,090,509 | 6,286,086 | 746,644 | 4,562,933 |
| 4205 | වැඩබැලීමේ වැටුප | 557,977 | 104,000 | 81,868 | - | 296,156 | - | 33,070 | 42,884 |
| 4208 | අතිකාල | 129,804,674 | 43,609,938 | 36,136,009 | 2,014,193 | 12,197,138 | 20,663,053 | 1,415,833 | 13,768,511 |
| 4209 | නිවාඩු දින ගෙවීම | 1,288,206 | 184,450 | 206,945 | - | 712,383 | 3,642 | 15,815 | 164,971 |
| 4210 | වෙනත් දීමනා | 30,439,748 | 8,413,217 | 12,193,144 | 1,186,386 | 1,725,300 | 3,040,101 | 45,742 | 3,835,858 |
| 4212 | පාරිතෝෂිකය | 103,338,397 | 27,645,956 | 46,122,082 | 7,753,132 | 9,572,405 | (4,968,686) | (2,323,943) | 19,537,451 |
| 4217 | විනෝද්‍රාස්වාද දීමනා අනධ්‍යයන (801 MCA හිඟ මුදල්) | 172,310 | 145,600 | - | 26,710 | - | - | - | - |
| 4220 | CIR 865 දීමනාව | 116,612,161 | 21,347,960 | 55,896,715 | 5,704,855 | 6,568,530 | 15,127,347 | 1,807,688 | 10,159,066 |
| 4221 | ගැලපුම් දීමනාව | 200,988 | 200,988 | - | - | - | - | | - |
| 4222 | ජීවන වියදම් දීමනාව | 217,205,467 | 42,014,365 | 102,101,552 | 10,662,374 | 12,237,644 | 28,430,221 | 2,827,794 | 18,931,519 |
| 4225 | පර්යේෂණ දීමනාව | 14,165,059 | 8,666,055 | 2,065,180 | 251,748 | 1,390,887 | 310,150 | 642,838 | 838,201 |
| 4227 | දේපල ණය පොළී | 5,327,802 | 1,417,455 | 2,791,117 | 256,329 | 371,902 | 180,952 | - | 310,048 |
| 4229 | අමතර මාසික දීමනාව | 219,873,853 | 42,805,053 | 107,122,013 | 11,340,992 | 12,446,687 | 24,951,977 | 3,032,276 | 18,174,856 |
| 4231 | මාසික වන්දි දීමනාව | 488,588,653 | 96,290,990 | 235,260,967 | 25,152,331 | 28,004,905 | 56,132,547 | 6,822,620 | 40,924,292 |
| **එකතුව** | | **2,761,955,941** | **567,887,808** | **1,301,085,300** | **137,794,516** | **169,705,856** | **306,402,435** | **34,315,253** | **244,764,774** |
| **එකතුව** | | **7,217,472,021** | **582,888,340** | **5,613,094,113** | **218,863,856** | **169,705,856** | **306,402,435** | **44,248,187** | **282,269,233** |
| **ගමන් වියදම්** | | | | | | | | | |
| 0501 | ගමන් වියදම් - දේශීය | 2,106,610 | 292,116 | 1,595,282 | 134 | 68,875 | 3,994 | 12,645 | 133,564 |
| 0502 | ගමන් වියදම් - විදේශීය | 10,003,910 | 10,003,910 | - | - | - | - | - | - |
| **එකතුව** | | **12,110,520** | **10,296,026** | **1,595,282** | **134** | **68,875** | **3,994** | **12,645** | **133,564** |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සැපයුම්** | | | | | | | | | |
| 0601 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 30,402,001 | 7,740,249 | 19,106,951 | 380,316 | 2,094,445 | 433,586 | 376,215 | 270,239 |
| 0602 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 43,590,481 | 12,040,885 | 22,226,239 | 57,750 | 3,852,414 | 3,509,091 | 442,432 | 1,461,670 |
| 0603 | මැහුම් ගාස්තු ඇතුළුව නිල ඇඳුම් | 27,948,748 | 6,933,816 | 11,612,571 | 720,575 | 1,118,025 | 5,369,653 | 51,635 | 2,142,473 |
| 0604 | යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 550,073 | 48,240 | 493,987 | - | - | 7,846 | - | - |
| 0605 | රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ | 24,792,831 | - | 21,571,811 | - | 3,099,619 | - | - | 121,401 |
| 0606 | වෛද්‍ය සැපයුම් | 10,010,638 | 12,270 | 7,362,447 | - | 2,635,921 | - | - | - |
| 0607 | වෙනත් සැපයුම් | 111,851,981 | 14,297,789 | 20,073,356 | 407,714 | 4,916,141 | 40,983,651 | 53,803 | 31,119,527 |
| **එකතුව** | | **249,146,753** | **41,073,249** | **102,447,362** | **1,566,355** | **17,716,565** | **50,303,827** | **924,085** | **35,115,311** |
| **නඩත්තු වියදම්** | | | | | | | | | |
| 0701 | වාහන | 20,147,687 | 7,770,901 | 10,157,959 | 21,500 | 773,621 | 443,148 | 114,371 | 866,188 |
| 0702 | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 20,066,393 | 5,592,067 | 13,158,219 | 204,574 | 32,000 | 314,802 | 552,326 | 212,405 |
| 0703 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 477,815 | - | 456,560 | - | - | - | 21,255 | - |
| 0704 | ගෘහභාණ්ඩ | 80,305 | - | 80,305 | - | - | - | - | - |
| 0705 | වෙනත් | 627,251 | - | 529,022 | - | - | - | 98,229 | - |
| **එකතුව** | | **41,399,450** | **13,362,968** | **24,382,065** | **226,074** | **805,621** | **757,949** | **786,181** | **1,078,592** |
| **කොන්ත්‍රාත් සේවා** | | | | | | | | | |
| 0801 | ප්‍රවාහන | 723,061 | 72,102 | 392,544 | 39,000 | 209,855 | - | - | 9,560 |
| 0802 | විදුලි සංදේශ | 52,598,041 | 46,938,269 | 3,547,128 | - | 83,284 | - | 443,484 | 1,585,876 |
| 0803 | තැපැල් ගාස්තු | 3,644,455 | 3,319,713 | 174,689 | 2,953 | 13,710 | 19,740 | 113,500 | 150 |
| 0804 | විදුලි ගාස්තු | 133,531,421 | 22,395 | - | - | - | 132,985,730 | 523,296 | - |
| 0805 | ආරක්ෂක ගාස්තු | 98,433,567 | 96,357,024 | - | - | - | - | 2,076,543 | - |
| 0806 | ජල ගාස්තු | 36,131,467 | - | - | - | - | 36,111,759 | 19,709 | - |
| 0807 | පිරිසිදු කිරීමේ සේවා | 73,493,092 | 16,978,412 | - | 289,979 | 29,922,543 | 1,654,447 | - | 24,647,711 |
| 0808 | කුලී සහ කුලී පිට ගැනුම් ගාස්තු | 11,026,440 | 4,053,544 | 795,973 | - | - | 324,575 | 5,200 | 5,847,148 |
| 0809 | පළාත් පාලන ආයතන සඳහා ගාස්තු සහ බදු | 5,126,486 | 5,126,486 | - | - | - | - | - | - |
| 0810 | මුද්‍රණය, ප්‍රචාරණය යනාදිය | 7,246,940 | 1,729,786 | 4,843,270 | 21,750 | - | - | 652,134 | - |
| 0811 | වෙනත් | 12,001,707 | - | 1,302,321 | - | - | - | - | 10,699,386 |
| **එකතුව** | | **433,956,676** | **174,597,731** | **11,055,925** | **353,682** | **30,229,391** | **171,096,250** | **3,833,864** | **42,789,832** |
| **අනෙකුත් පුනරාවර්තන වියදම්** | | | | | | | | | |
| 0902 | විශේෂ සේවා - සභා සහ කමිටු සාමාජික ගාස්තු | 838,517 | 162,000 | 141,467 | - | - | - | 535,050 | - |
| 0903 | විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් | 12,602,514 | 11,396,009 | 1,206,505 | - | - | - | - | - |
| 0904 | වැඩමුළු, සම්මන්ත්‍රණ සහ රැස්වීම් | 4,953,026 | 48,650 | 3,048,199 | 21,670 | - | - | 1,804,507 | 30,000 |
| 0905 | ශාස්ත්‍රීය පර්යේෂණ | 7,154,583 | 7,084,494 | 70,089 | - | - | - | - | - |
| 0906 | කාර්ය මණ්ඩල සංවර්ධනය | 2,751,482 | 964,648 | 1,202,674 | - | - | - | 584,160 | - |
| 0907 | වෙනත් සංවිධානවලට ප්‍රදාන | 886,276 | - | - | - | - | - | 886,276 | - |
| 0908 | නිවාඩු දින අවසර පත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර | 7,884,139 | 6,891,829 | 992,310 | - | - | - | - | - |

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන
## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0909 | විනෝදාස්වාද සඳහා වියදම් | 11,802,533 | 3,138,100 | 7,868,351 | 74,195 | 528,199 | 12,336 | 175,984 | 5,368 |
| 0910 | බැංකු ගාස්තු | 454,321 | 284,468 | 124,402 | - | 45,450 | - | - | - |
| 0911 | සම්මානය සහ වන්දි | 456,635 | 187,500 | 142,680 | - | - | 7,500 | 118,955 | - |
| 0912 | දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු | 2,899,994 | 754,430 | 2,145,564 | - | - | - | - | - |
| 0913 | උපාධි ප්‍රදානෝත්සව | 21,873,878 | - | 20,483,097 | - | - | - | 1,390,780 | - |
| 0914 | විභාග වියදම් | 56,098,325 | - | 44,775,215 | - | - | - | 11,323,109 | - |
| 0915 | වෙනත්, ප්‍රවෘත්ති පත්‍ර, සඟරා ආදිය | 22,828,571 | 15,365,763 | 3,588,049 | 35,199 | 309,950 | 21,065 | 3,067,332 | 441,212 |
| 0916 | අග්‍රහාර දායක ගිණුම | 21,717,085 | 14,874,000 | 6,685,885 | - | - | - | 157,200 | - |
| 0922 | කර්මාන්ත සීමාවාසික, ප්‍රායෝගික සහ වෘත්තීය මාර්ගෝපදේශන | 4,401,623 | - | 4,401,623 | - | - | - | - | - |
| 0924 | විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | 2,479,835 | 46,800 | - | - | 2,433,035 | - | - | - |
| | පුනරුත්තාපන වියදම් | 101,080,536 | 101,080,536 | | | | | | |
| | මානව ප්‍රාග්ධන සංවර්ධනය | 720,770 | 720,770 | | | | | | |
| | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ අනෙකුත් ප්‍රදාන සඳහා වියදම් | 252,458,108 | 252,458,108 | | | | | | |
| | වෙනත් ප්‍රදාන සඳහා වියදම් | 486,287,852 | 486,287,852 | | | | | | |
| **එකතුව** | | **1,026,597,603** | **905,290,971** | **96,876,112** | **131,064** | **3,316,634** | **40,901** | **20,465,341** | **476,580** |
| **ශිෂ්‍යයින් සඳහා මූල්‍යාධාර** | | | | | | | | | |
| 1001 | මහපොළ ශිෂ්‍යත්වය | 171,966,000 | - | - | - | 171,966,000 | - | - | - |
| 1002 | ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය | 45,868,000 | | | | 45,868,000 | | | |
| **එකතුව** | | **217,834,000** | **-** | **-** | **-** | **217,834,000** | **-** | **-** | **-** |
| **ක්ෂය** | | | | | | | | | |
| 3010102 | ගොඩනැගිලි ක්ෂයවීම් | 544,843,954 | 544,843,954 | - | - | - | - | - | - |
| 3010103 | පිරියත හා යන්ත්‍රෝපකරණ ක්ෂය වීම් | 19,867,503 | 19,867,503 | - | - | - | - | - | - |
| 3010104 | මෝටර් රථ ක්ෂය වීම් | 79,350,000 | 79,350,000 | - | - | - | - | - | - |
| 3010105 | ගෘහ භාණ්ඩ සහ උපාංග ක්ෂය වීම් | 79,696,146 | 79,696,146 | - | - | - | - | - | - |
| 3010106 | කාර්යාල උපකරණ ක්ෂය වීම් | 96,884,078 | 96,884,078 | - | - | - | - | - | - |
| 3010107 | රසායනාගාර ඉගැන්වීමේ උපකරණ ක්ෂය වීම් | 214,796,525 | 214,796,525 | - | - | - | - | - | - |
| 3010108 | පුස්තකාල පොත් සහ වාරසඟරා ක්ෂය වීම් | 35,010,747 | 35,010,747 | - | - | - | - | - | - |
| 3010110 | උපාධි කබා ක්ෂය වීම් | 529,930 | 529,930 | - | - | - | - | - | - |
| 3010111 | අස්පෘශ්‍ය වත්කම් ගිණුම් ක්‍රමක්ෂය කිරීම | 2,586,122 | 2,586,122 | - | - | - | - | - | - |
| **එකතුව** | | **1,073,565,004** | **1,073,565,004** | **-** | **-** | **-** | **-** | **-** | **-** |
| **එකතුව** | | **10,272,082,028** | **2,801,074,290** | **5,849,450,859** | **221,141,165** | **439,676,943** | **528,605,356** | **70,270,303.21** | **361,863,112** |

වැඩසටහන 1 සාමාන්‍ය පරිපාලනය, මූල්‍ය පරිපාලනය, ගබඩා සහ සැපයුම්, ආරක්ෂක සේවය, ප්‍රවාහන සේවය

වැඩසටහන 2 කෘෂි විද්‍යා පීඨය, ශාස්ත්‍ර පීඨය, ඉංජිනේරු පීඨය, කළමනාකරණ පීඨය, වෛද්‍ය පීඨය, විද්‍යා පීඨය, පශු වෛද්‍ය පීඨය, විභාග, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, විද්‍යා අධ්‍යාපනය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය, තොරතුරු තාක්ෂණ

වැඩසටහන 3 පුස්තකාලය සහ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

වැඩසටහන 4 සෞඛ්‍ය සේවය, ශාරීරික අධ්‍යාපනය, ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධනය

වැඩසටහන 5 ඉඩම් සහ ගොඩනැගිලි, විදුලිබල සැපයුම

වැඩසටහන 7 දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, ජල සම්පාදනය

වැඩසටහන 8 නේවාසිකාගාර, දොඩංගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය, මාවල පශු ගොවිපල, මහඉලුප්පල්ලම ඉගැන්වීම් ඒකකය, මී වතුර ක්ෂේත්‍ර ස්ථානය, කුකුළු නිෂ්පාදන ඒකකය, ඌරු නිෂ්පාදන, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, පශු සම්පත් ක්ෂේත්‍ර ස්ථානය මාවල.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

### 32 විදේශ මුදල් ලාභය / පාඩුව

| ගිණුම් අංකය | හුවමාරු ලාභය/ (පාඩුව) රු. |
|---|---|
| 2RFC40 | 3,167,997.98 |
| 2RFC69 | 40,256,936.83 |
| 2RFC70 | 3,142,259.35 |
| 2RFC79 | 65,035,494.82 |
| 2RFC71 | 21,372,821.69 |
| **Total** | **132,975,510.67** |

නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම් මත සිදු වූ විදේශ මුදල් ගනුදෙනු, අදාළ ගනුදෙනු ව සිදු වූ දිනයේ පැවති අනුපාතයට විදේශ මුදල් රුපියල් අගයන් බවට පරිවර්තනය කර ලෙජර් ගිණුම්වල සටහන් කරනු ලැබේ. ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 10හි ප්‍රතිපාදනයට අනුව නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල අවසන් ශේෂයන් ශේෂ පත්‍ර දිනයේ පැවැති අනුපාතයට රුපියල් අගයන් බවට පරිවර්තනය කරන ලදී. විදේශ මුදල්වල ශුද්ධ ප්‍රතිඵලය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත.

### 1.) පුනරාවර්තන අයවැය

| තත්‍ය 2022 (රු.) | විස්තරය | අයවැයගත 2022 (රු.) | තත්‍ය 2022 (රු.) |
|---|---|---|---|
| | ආදායම | | |
| 7,531,000,000 | රජයේ ප්‍රදාන පුනරාවර්තන | 8,130,000,000 | 7,790,000,000.00 |
| 198,646,608 | අභ්‍යන්තර ව උත්පාදිත ආදායම් | 235,650,000 | 423,317,382.71 |
| | දීමනා - ශිෂ්‍යාධාර | | 45,868,000.00 |
| **7,729,646,608** | මුළු ආදායම | **8,365,650,000** | **8,259,185,383** |
| | වියදම් | | |
| 4,274,319,473 | පුද්ගල පඩිනඩි අධ්‍යයන | 4,736,415,000 | 4,455,516,080.00 |
| 2,493,062,748 | පුද්ගල පඩිනඩි අනධ්‍යයන | 2,843,585,000 | 2,761,955,941.00 |
| 6,364,960 | ගමන් වියදම් | 8,182,179 | 12,110,520.10 |
| 164,374,930 | සැපයුම් | 126,956,346 | 249,146,753.27 |
| 31,020,897 | නඩත්තු වියදම් | 39,666,283 | 41,399,450.42 |
| 353,800,822 | කොන්ත්‍රාත් සේවා | 278,321,730 | 433,956,676.00 |
| | ශිෂ්‍යයින් සඳහා මූල්‍ය ආධාර | | 217,834,000.00 |
| 135,872,692 | වෙනත් පුනරාවර්තන වියදම් | 96,873,462 | 1,026,597,603.00 |
| **7,458,816,522** | මුළු වියදම් | **8,130,000,000** | **9,198,517,024** |

### 2.) ප්‍රාග්ධන අයවැය

| තත්‍ය 2021 (රු.) | විස්තරය | අයවැයගත 2022 (රු.) | තත්‍ය 2022 (රු.) |
|---|---|---|---|
| | ආදායම | | |
| 496,100,000 | රජයේ ප්‍රදාන ප්‍රාග්ධන | 300,000,000 | 235,000,000 |
| 270,000,000 | වි.වි.ප්‍ර.කො ප්‍රදාන | | 3,500,000 |
| 6,000,000 | අමාත්‍යාංශ ප්‍රදාන | | - |
| 210,405,605 | AHEAD දීමනාව | | - |
| 3,000,000 | අභ්‍යන්තර ව උත්පාදිත ආදායම | 235,650,000 | - |
| **985,505,605** | මුළු ආදායම | **535,650,000** | **238,500,000** |
| | වියදම් | | |
| 515,820,315 | ප්‍රාග්ධන- ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි | 175,000,000 | 257,669,995 |
| 127,553,842 | ගොඩනැගිලි පුනරුත්ථාපන සහ ප්‍රාග්ධන වත්කම් | 65,000,000 | 80,918,154 |
| 94,596,193 | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 60,000,000 | |
| 273,338 | මානව ප්‍රාග්ධන සංවර්ධනය | - | 82,650,997 |
| - | පර්යේෂණ සහ සංවර්ධනය | | |
| **738,243,688** | මුළු වියදම් | **300,000,000** | **421,239,146** |

# 6. විගණන වාර්තා

## 6.1 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. සීපීසීජී/කේඩී/ඩී/යූපී/2023/10   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date

2023 මැයි 29 දින

උපකුලපති,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

-------------------------------------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,871,888,168 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ

ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකර ඇති මාර්ග පද්ධති, මළ ප්‍රවාහන පද්ධති, ජල නල හා සන්නිවේදන පද්ධති හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව පශු වෛද්‍ය පීඨයේ හා කෘෂි විද්‍යා පීඨයේ ගොවිපළවලින් ලැබී තිබුණු රු.48,465,125 ක අලෙවි ආදායම් හා ඒ සඳහා වැය කළ රු.58,617,005 ක් විශ්වවිද්‍යාලයේ ආදායම් හා වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට වැඩ අවසන් කර තිබුණු ගිවිසුම්ගත වටිනාකම රු.1,793,659,427 ක් වූ ප්‍රාග්ධන සහ පුනරුත්තාපන ව්‍යාපෘති 14 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක පමණ ඉඩමක් 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා වසර 30 ක කාලයකට බදු පදනම මත දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු අතර ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,200,000 ක හිඟ බදු මුදල හා 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 05 කාලයකට අදාළව ලැබිය යුතු බදු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය හදාරන විදේශීය සිසුන් 22දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.61,825,532 ක (USD 169,500) පාඨමාලා ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5.2.1 හා 5.2.2 යන ඡේදවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලින් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු.66,579,267 ක් හඳුනාගෙන විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවන ලද රු.98,104,100 ක ශිෂ්‍ය මහපොල ආධාර ගිණුම්ගත කර නොතිබුණි.

(එ) 2022 මැයි 05 දිනැති අංක 09/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2022 මැයි 10 දින සිට පරිගණක මෘදුකාංග සියයට 20ක ක්ෂය අනුපාතයක් යටතේ ක්‍රමක්ෂය කළ යුතු වුවත්, සියයට 10 ක ක්ෂය අනුපාතයක් යටතේ ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අස්පෘශ්‍ය වත්කම් රු.2,081,956 ක් අඩුවෙන් ක්ෂය කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය හා අස්පෘශ්‍ය වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------------

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(සසස) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(සඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අ) සහ (ඉ) නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| **(අ)** | **පනත්** | |
| 1971 | අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා අදාල විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පශු වෛද්‍ය පීඨයේ ගොවිපල ව්‍යාපෘතිය තුළින් ලැබී තිබුණු රු.14,097,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. |
| **(ආ)** | **චක්‍රලේඛ** | |
| (i). | 1989 ජූලි 24 දිනැති අංක 09/1989 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතනික චක්‍රලේඛය මගින් අනුමත කර තිබුණු අංක 24/89 හා 1989 මාර්තු 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.7 ඡේදය | යම් නිලධාරියෙකු සේවයේ ස්ථිර කිරීම සඳහා අධ්‍යාපන හෝ වෙනත් සහතික සනාථ කර ගැනීම අවශ්‍ය වන කල්හි, ඔහුගේ පරිවාස කාලය අවසන් වන තෙක් නොසිට පත් කිරීමෙන් පසු හැකි තාක් ඉක්මණින් එම කටයුතු නිම කළ යුතු බවට දක්වා තිබුණද, ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් දෙදෙනෙකුගේ සුදුසුකම් මාස 06 ක කාල සීමාව තුළ සනාථ කර නොගෙන එකී මාස 06 ඉක්මවා වසර 04 ක් දක්වා එකතුව රු.4,904,233 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| ii. | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් තොරව හා කිසිදු අන්තර් පර්යේෂණ වාර්තාවක් හෝ අවසන් පර්යේෂණ වාර්තාවක් හෝ ලබා ගැනීමකින් තොරව අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිළධාරීන් 59 දෙනෙකු සඳහා 2014 නොවැම්බර් 01 දින සිට 2022 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ රු.83,739,907 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. |
| iii. | 2022 අප්‍රේල් 26 දිනැති අංක BD/CBP/01/01/04-2022 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 වෙනි ඡේදය හා 2022 අගෝස්තු 09 දිනැති අංක 07/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මුදල් චක්‍රලේඛය මගින් අනුගතවන ලද 2022 අගෝස්තු 08 දිනැති අංක PED/COP/POLI/Circulars දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.9 ඡේදය | දේශීය අරමුදල් යොදාගෙන සිදු කරනු ලබන විදේශ අධ්‍යයන චාරිකා හා පුහුණු වැඩසටහන්වලට සහභාගී විය නොහැකි බව දක්වා තිබියදී අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිළධාරීන් 09 දෙනෙකු සඳහා 2023 ජනවාරි මාසයේදී ජර්මනිය හා ඉතාලි රටවල පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම වෙනුවෙන් රු. 6,698,000 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. |
| iv. | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට බැදුම්කර හා ගිවිසුම් කඩ කරන්නන්ගෙන් අය කර තිබුණු |

එකතුව රු.747,751,824 ක් භාණ්ඩාගාරයට මාරු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| | බලතල, කර්තව්‍ය සහ කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|---|
| **(අ)** | **1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත** | |
| i. | 45(XV) වගන්තිය හා 34(3) වගන්තිය | පාලක සභාවේ අනුමැතිය මත විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමට උපකුලපතිවරයාට බලය ලබාදී ඇතත්,සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව රු.7,525,000 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබුණි. |
| ii. | 99(ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී විවිධ අරමුදල් 56 ක් සඳහා ලැබී තිබුණු රු.184,707,847 ක්, සත්ව විද්‍යා හා කෘෂි විද්‍යා ගොවිපල ව්‍යාපෘතිවලින් 2019 - 2021 කාල පරිච්ඡේදය තුළ පිළිවෙලින් ලැබී තිබුණු රු.55,573,606 ක් හා රු.46,398,334 ක් වශයෙන් එකතුව රු.286,679,787 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකර විවිධ අරමුදල් ගිණුම්වල රඳවාගෙන තිබුණි. |
| **(ආ)** | **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය** | |
| i. | XX වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය හා 2017 ජුලි 10 දිනැති 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රයකින් තහවුරු කර ගැනීමකින් තොරව අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ නිළධාරීන් 963 දෙනෙකු සඳහා 2021/2022 වර්ෂවලදී රු.6,362,499,051 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| ii. | XXVII වැනි පරිච්ඡේදයේ 1.2.1 ඡේදය | ඉංජිනේරු පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගේ ලිඛිත අනුමැතියකින් තොරව පීඨයේ වාහන භාර නිළධාරීවරයා විසින් සමාලෝචිත වර්ෂයේ ජුනි 11 දින රියදුරු සහ රිය සහයකවරයෙකු සහිතව වාහනයක් සති අන්ත දිනයක රාජකාරියෙහි යොදවා එම වාහනය ඇතුළුව තවත් වාහන 04 ක් අනතුරකට ලක්කර රු.5,443,615 ක පමණ අලාභයක් සිදු කර තිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 සහ 13.7 ඡේදයන්ද, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ෂෂෂ වන පරිච්ඡේදයේ 23.3.7 ඡේදය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 09/2015 හා 06/2014 දරන චක්‍රලේඛ** | විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීමේ පදනමින් පත් කර තිබුණු නියෝජ්‍ය ලේඛකාධිකාරීවරියට ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කරමින් 2021 ජනවාරි සිට 2023 පෙබරවාරි දක්වා ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස රු.1,364,670 ක මුදලක්ද, විනෝදාස්වාද දීමනා (Entertainment Allowances) ලෙස රු.270,400 ක මුදලක්ද ගෙවා තිබුණි. |

**(ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය**

| | | |
|---|---|---|
| i. | 4.5 ඡේදය | විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු අයවැයගත වටිනාකම රු.354,379,267 ක ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 225 ක් හා විගණනයට ඉදිරිපත් නොකරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 142 ක් නිම කළ යුතු අවම කාල සීමාව ඉක්මවා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| ii. | 5.1.4 ඡේදය | 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළ රු.21,794,855 ක මුදලක් විශ්වවිද්‍යාලයේ සංවර්ධන වැය ශීර්ෂයට බැර නොකර පීඨ හා දෙපාර්තමේන්තුවල විවිධ අවශ්‍යතාවන් සඳහා අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. |
| iii | 5.1.4, 5.2.1 හා 5.2.2 යන ඡේද | සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කරන ලද දායක මුදල් විශ්වවිද්‍යාල අරමුදළට බැර කළ යුතු බවට දක්වා ඇතත්, විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 213 කට අදාළව රු.196,103,699 ක දායක මුදලක් 2022 ජූලි 31 දිනය වන විටත් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2022 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ඡායාරූප ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (b), 7.2.1 හා 7.6.1(a) මාර්ගෝපදේශ වලට අනුගත නොවී විශේෂඥ දැනුම ඇති පුද්ගලයකු තාක්ෂණික ඇගැයීම් කමිටුවට පත් නොකර වඩාත් සුදුසුකම් ලැබූ ටෙන්ඩර්කරු තාක්ෂණික ඇගයීම් කමිටුවට බලපෑම්කළ බව දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත්කර විනිවිධභාවයකින් හා රහස්‍යභාවයකින් තොරව වෙනත් තෝරාගත් ටෙන්ඩර්කරුවන් දෙදෙනෙකු වෙත ටෙන්ඩරය පිරිනමා රු.3,458,980 ක් ගෙවා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව නවක වදය සම්බන්ධ සිසුන් අතර හට ගත් ආරවුලක් හේතුවෙන් ශාස්ත්‍ර පීඨයේ භෝජනාගාරය සහ ඒ අවට සීසීටීවී (CCTV) කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් සාමාන්‍ය ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කටයුතු කර ඒ සඳහා රු.1,122,400 ක් ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සතත්ව ආහාර මිලදී ගැනීමේදී එම සත්ව ආහාරවල පෝෂ්‍ය පදාර්ථ සංයුතිය පිළිබඳව විස්තරාත්මකව ලංසු ඇගැයීමකට ලක් නොකර තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශ මත සත්ත්ව ආහාර මිලදී ගැනීම සඳහා සැපැයුම්කරුවන් දෙදෙනෙකුට රු.15,568,000 ක් ගෙවා තිබුණි.

(ඈ) ඇස්තමේන්තු වටිනාකම රු.85,105,000 ක් වූ පශු වෛද්‍ය පීඨයේ ගොවිපළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමේ කර්මාන්තය ගිවිසුම් ප්‍රකාරව 2019 නොවැම්බර් 01 දින වන විට අවසන් කළයුතු වුවත්, 2022 මාර්තු 31 දක්වා අවස්ථා 06 කදී කාලය දීර්ඝ කිරීම් ලබාගෙන සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ඉදිකිරීම් කාර්යය අවසන් කර නොතිබුණි.

(ඉ) පුනරුත්තාපන ව්‍යාපෘති 08 කට අදාළව වැඩ ආරම්භ කිරීමට ගෙවා තිබුණු රු.33,827,177ක් හා ප්‍රාග්ධන ව්‍යාපෘති 04 කට ගෙවා තිබුණු රු.11,982,808ක් සංචලන අත්තිකාරම් මුදල් ගෙවා වසර 02 සිට වසර 10 ක කාලයක් ගත වී තිබුණද, එම අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ මී වතුර නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් රු.36,815,177ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2021 ඔක්තෝබර් 01 දින කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 සැප්තැම්බර් 30 දින වන විට මෙම කර්මාන්තය නිම කර භාරදිය යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතුවලින් සියයට 19 ක් පමණක් නිමකර තිබුණ අතර රු.4,874,908ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබියදී කොන්ත්‍රාත්කරු විසින් ඒක පාර්ශවිකව කොන්ත්‍රාත්තුවේ වැඩ තාවකාලිකව නතර කර දමා තිබුණි.

## 2.3 වෙනත් කරුණු
----------------

(අ) මූලික විමර්ශන වාර්තාව අනුව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය යටතේ ගැනෙන වරදක් බැලූ බැල්මට සිදු කර තිබුණු හෙයින් හිටපු රෙජිස්ට්‍රාර්වරයාගේ වැඩ තහනමට ලක් කළ හැකිව තිබියදී එසේ නොකර අනිවාර්යය නිවාඩු යවා පසුව නීතිපතිවරයාගේ මතය විමසා ඒ අනුව විධිමත් පරීක්ෂණයක් නොකර ඔහුගේ සේවය අවසන් කිරීම යන නොසැලකිලිමත් හා වැරදි කළමනාකරණ තීරණ හේතුවෙන් විශ්වවිද්‍යාලය වෙත කිසිදු සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබියදී රු.6,393,354 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) බැඳුම්කර හා ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් හා අනිකුත් නිලධාරීන් 122 දෙනෙකුගෙන් වසර 02 සිට වසර 52 දක්වා කාලයකට අදාළව සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට අයවිය යුතු රු. 240,944,708 ක් එම ආචාර්යවරුන්ගෙන් හා නිලධාරීන්ගෙන් අය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) ගිවිසුම්ගත කාල සීමාව වූ 2010 ඔක්තෝබර් 11 දින සිට 2016 ජූලි 27 දක්වා වූ කාලය තුළ ආචාර්ය උපාධිය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් කථිකාචාර්යවරියක් විසින් රු.14,115,666 ක බැඳුම්කරය කඩ කර වසර 06 කට වැඩි කාලයක් ගතවී තිබුණද එය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වැටුප් රහිත නිවාඩු ලබා සිට හා සේවය හැර ගොස් සිටි පරිවාස කාලයේ පසුවන බැඳුම්කර කඩ කරන ලද කථිකාචාර්යවරුන් 04 දෙනෙකු සඳහා රු.2,125,975 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයෙන් උපදේශන සේවා කටයුතු ඉටු කරවා නොගෙන 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක උපදේශන සේවා බාහිර ආයතනවලින් ලබාගෙන රු.4,539,029 ක් ගෙවා තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් අය විය යුතු රු. 1,372,636 ක ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටද අය කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.40,467,077ක් වූ පර්යේෂණ අරමුදල් 35කින් පර්යේෂණ අරමුදල් 01 කට අදාළ රු.14,963,744 ක් වසර 05 කට වැඩි කාලයක සිටද, පර්යේෂණ අරමුදල් 19 කට අදාළ රු.14,004,909 ක් වසර 01 සිට වසර 05 දක්වා කාලයක සිටද, පර්යේෂණ අරමුදල් 15 කට අදාළ රු.11,498,424 ක් වසරක කාලයක සිටද ඌන උපයෝජිතව තිබුණි.

(ඔෟ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 ව්‍යවස්ථාව ප්‍රකාරව මූල්‍ය පාලනය පිළිබඳ උත්තරීතර බලය පිළිබඳ වගවීමේ කාර්යභාර්ය සම්බන්ධයෙන් කටයුතු කරණු ලබන විගණන හා කළමනාකරණ කමිටු වෙත නිසි හා නියමිත පරිදි කැඳවා තිබියදීත් 2022 හා 2023 වර්ෂයන්වලදී විශ්වවිද්‍යාලය පවත්වන ලද 98,99 හා 100 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ විධායක නිලධාරීන් පිළිවෙලින් 17 දෙනෙක්, 11 දෙනෙක් සහ 13 දෙනෙක් සහභාගීවීම පැහැර හැර තිබුණි.

(එ) විශ්වවිද්‍යාලයේ දේපල පරිහරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු රු.6,879,318 ක් වසර තුනකට වැඩි කාලයක් ගත වී ඇතත්, අය කරගෙන නොතිබුණි.

(ඒ) විශ්වවිද්‍යාලයේ පීඨ 09 කින් 1980 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු. 1,419,396 ක ශාලා ගාස්තු හා දඩ මුදල් වසර 04 ක සිට වසර 42 දක්වා කාලයක් ගත වී තිබුණද, අය කර නොතිබුණි.

(ඔ) 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පුනරුත්තාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර තිබුණු එකතුව රු.411,628,504කට අදාල ව්‍යාපෘති වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණද ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල් අය කිරීමට හෝ පොත්වලින් ලියා හැරීමට හෝ කටයුතු නොකර අඛණ්ඩව නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයකින් තොරව හා අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැළකිල්ලෙන් තොරව ඉංජිනේරු පීඨයේ පීඨ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පාදම ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.15,995,157 ක් වැය කර වසර 05 ක කාලයක සිට ඉදිකිරීම් අත්හැර දමා තිබීම හේතුවෙන් ඊට අදාළ වැය කිරීම් අනාර්ථික වියදමක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 6.2 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර ව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

| | |
|---|---|
| 1 | **මූල්‍ය ප්‍රකාශන** |
| 1.1 | **තත්ත්වාගණනය කළ මතය** |
| 1.2 | **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** |

**(අ)** විගණන ඡේදයේ සඳහන් ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය පරිදි සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වාර්ෂික ව සමාලෝචනය කර නැවත ප්‍රත්‍යාගණනය කළ යුතු වේ. නමුත් වත්කම්වල ඒකක විශාලත්වය මත එය 2022 වර්ෂය තුළ සම්පූර්ණ කල නොහැකි විය. කෙසේ වුවත් පහත පරිදි වත්කම් 2022 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත.

මේ වන විට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වලට අදාල විස්තර පහත දැක්වේ.

| ස්ථාවර වත්කම් | ප්‍රත්‍යාගණනය කළ යුතු මුළු වත්කම් ප්‍රමාණය (ඒකක) | දැනට ප්‍රත්‍යාගණනය කර ඇති ප්‍රමාණය (ඒකක) | නිම කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| Office and Other Equipments | 29,075 | 10,152 | 65% |
| Lab and Teaching Equipments | 42,151 | 18,363 | 56% |
| Cloaks | 10,614 | 10,614 | 100% |

කෙසේ වුව ද මෙසේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකල යුතු වන්නේ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව විශ්වවිද්‍යාලය විසින් Reveluation Modle භාවිතා කිරීම නිසාය. මෙය ඉතාමත් දුෂ්කර කාර්යයක් බැවින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සමග සාකච්ඡා කර ඉහත සඳහන් පරිදි පිරිවැය මොඩලය (CEt Model) භාවිත කිරීමට හා 2023 වර්ෂයේ දී නිවැරදි පරිදි වත්කම් ගිණුම් වල ගැලපීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් වර්ෂ 70 කට පෙර කාලයක් තුල ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් බැවින් ප්‍රමිතියේ සඳහන් පරිදි මාර්ග පද්ධතිණි ජලනල පද්ධති, නල ප්‍රවාහන පද්ධති, වෙන ම හඳුනාගෙන ගිණුම්ගත කිරීම් හෝ ඉදිකිරීම් සිදු වී නොමැත. ඒ අනුව පැරණි ඉදිකිරීම් සඳහා ගිණුම් ප්‍රමිතියේ සඳහන් පරිදි වෙන ම හඳුනා ගත නොහැකි අතර මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක වන බව දන්වා පසු ව කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් වූ විට වෙන ම හඳුනාගත හැකි පරිදි කරන ලද ඉදිකිරීම් මෙසේ වෙන ම හඳුනාගෙන ගිණුම්ගත කරනු ලබයි. උදා: ඉදිකරමින් පවතින නවීකරණය කරනු ලබන ජල නල පද්ධතිය දැක්විය හැක. තව ද සන්නිවේදන පද්ධති වෙන ම හඳුනා ගෙන ගිණුම් තැබීම සිදු කරයි.

**(ඇ)** පවතින ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මෙසේ ආදායම් හා වියදම් මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ස්කන්ධය ලෙස අරමුදල් වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ. කෙසේ වුවත් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි 2023 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේ දී මෙම ආදායම් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ ආදායම හා වියදම ලෙසත් ගිණුම්වල ගැලපීම කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඈ)** මෙම ව්‍යාපෘති දැනට වැඩ අවසන්කර අවසන් බිල්පතද 2023 වර්ෂය තුල ගෙවීමට නියමිත බැවින් 2023 වර්ෂයේ ගිණුම් සමග ප්‍රාග්ධනිත කරන බව දන්වමි.

| | |
|---|---|
| CW/CON/2019/1428 | Rs.5,920,459.00 |
| CW/CON/2020/1438 | Rs.6,578,520.00 |
| CW/CON/2019/1426 | Rs. 3,360,744.00 |
| CW/CON/2020/1446 | Rs. 2,581,880.00 |
| | **Rs.18,441,603.00** |

පහත සඳහන් ව්‍යාපෘති 2022.12.31 දිනටත් වැඩ අවසන් නොවී ඇති බැවින් තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතීම නිවැරදි වේ.

| | |
|---|---|
| CW/CON/2011/910 | Rs.528,248,425.00 |
| CW/CON/2013/1040 | Rs.379,953,000.00 |
| CW/CON/2015/1139 | Rs. 97,870,750.00 |
| CW/CON/2015/1151 | Rs.456,928,796.00 |
| CW/CON/2016/1219 | Rs. 74,697,223.00 |
| CW/CON/2018/1384 | Rs. 9,025,130.00 |

| | |
|---|---|
| | CW/CON/2019/1417 Rs. 6,930,846.00<br>CW/CON/2019/1418 Rs. 13,241,880.00<br>CW/CON/2019/1421 Rs. 3,852,900.00<br>CW/CON/2016/1263 Rs.204,468,871.00<br>**Rs.1,775,217,821.01** |
| **(ඉ)** | දිවිනැගුම දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලබන විශ්වවිද්‍යාල දේපළ කොටස සඳහා වූ බදු ගිවිසුම 2017.12.31 දිනෙන් අවසන් වූ අතර දිවිනැගුම දෙපාර්තමේන්තුව බදු මුදල් ගෙවීම පැහැරහැර ඇති බැවින් එම දේපළ නැවත විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමේ කටයුතු සිදුකරන ලදී. එහි ප්‍රතිපලයක් ලෙස දැනට එම දේපළෙන් 75%ක පමණ කොටසක් මේ වන විට විශ්වවිද්‍යාලයේ පරිහරණ කටයුතු සඳහා යොදාගෙන ඇත. ඊට අමතර ව හිඟ බදු මුදල් අයකර ගැනීමට මැදිහත් වී අවශ්‍ය කටයුතු සඳහා සහයෝගය ලබාදෙන ලෙසට ගඟවට කොරළය ප්‍රාදේශීය ලේකම් වෙත ද ඉල්ලීම් කරන ලදී.<br><br>විශ්වවිද්‍යාලය වෙත නිදහස් කර නොමැති දේපළ කොටස සඳහා 2018.01.01 දින සිට මේ දක්වා කාල සීමාවට නැවතත් බදු මුදල් අයකර ගැනීමට 2022.09.24 වන දින පැවති 520 වන පාලක සභා වාරයේදී උපදෙස් ලබාදෙන ලදී.<br><br>ඒ අනුව අයකරගත යුතු බදු මුදල් අයකර ගැනීමේ ඉදිරි කටයුතු ක්‍රියාවට නැංවීම පිණිස පලාත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වාර්තා ලබාගැනීමට ඉල්ලීම් ලිපියක් යොමුකර ඇත. තක්සේරු වාර්තාව ලබාගැනීමෙන් අනතුරු ව දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙතින් අයකරගත යුතු බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>ඊට අමතර ව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ලේකම්ගේ 2023.03.28 දිනැති ලිපියට අනුව දේපළ විශ්වවිද්‍යාලය වෙත භාරදීමට සහ හිඟ මුදල් ගෙවීම් කරන ලෙසට නියෝජ්‍ය අධ්‍යක්ෂක, දිවිනැගුම වෙත ද දැනුවත් කරන ලදී.<br><br>දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. මිලියන 7.2ක මුදල ලැබීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වල ලැබිය යුතු මුදලක් වශයෙන් ගලපා නැත. |
| **(ඊ)** | 2023 ගිණුම් සමග මෙය නිවැරදි කොට ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(උ)** | චක්‍රලේඛ අංක 04/2016 අනුව 5.2.1 හා 5.2.2 සංවර්ධන වැය විෂයයන්ට අරමුදල් වෙන් කිරීම සිදු කරනුයේ අදාළ ස්වයං මූල්‍ය ක්‍රියාකාරම් අවසන් වී ඒවායේ මූල්‍ය ප්‍රකාශන සඳහා මුදල් කමිටු අනුමැතිය ලබාගැනීමෙන් පසුව ය.<br><br>නිරීක්ෂණය කර ඇති සියලු ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 2022 වසරේදී ආරම්භ කරන ලද ඒවා වේ. ඒවායින් කොටසක කටයුතු මෙතෙක් අවසන් ව නොමැති අතර තවත් කොටසක කටයුතු අවසන් ව ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒවායේ මූල්‍ය ප්‍රකාශන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු ව තිබුණි.<br><br>2023 වර්ෂයේ මූල්‍ය කමිටුව මෙම නව සියලුම ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව 2023 වර්ෂයේ දී ගිණුම්වල ගැලපීමට කටයුතු කර ඇත. |
| **(ඌ)** | 2019/2020 අධ්‍යයන වර්ෂ සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය කණ්ඩායමට අදාල මහපොළ ආධාර වන රු. 98,104,100.00 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ශිෂ්‍ය මහපොළ ආධාර වටිනාකම් ලැබීම් හා ගෙවීම් දක්වීමේ දී ගලපා නොමැත.<br><br>ශිෂ්‍ය මහපොළ ආධාර වටිනාකම් ලැබීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙන ම දක්වන නමුත්, එයින් වර්ෂයේ ශුද්ධ අතිරික්තය හා ඌණතාවයට බලපෑමක් ඇති නොවේ, මහපොළ ලැබීම් හා ගෙවීම් විශ්වවිද්‍යාලයේ ගිණුම් ප්‍රකාශන වල ගැලපීම් කටයුතු කර ඇත. |
| **(එ)** | මෙම ක්‍රමක්ෂය හි නිවැරදි මුදල අස්පෘශ්‍ය වත්කම් ජර්නල් අංක A0002/2023 යටතේ 2023 අවසාන ගිණුම් වල ගලපා ඇත. |
| **2.** | **නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** |
| **2.2.2** | **<u>නීතිරීති / විධානයට යොමුව</u>** |
| **(අ)** | **<u>පනත්</u>** |
| | <u>1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය</u> |

| | |
|---|---|
| | මෙම ස්ථාවර තැන්පතු 2021 වර්ෂයේ ආරම්භ කරන ලද ඒවා වන අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය 2021 වර්ෂයේ ආරම්භ කරන ලද සහ අලුත් කරන ලද ස්ථාවර තැන්පතු සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| **(ආ)** | **<u>චක්‍රලේඛ</u>** |
| **(i)** | • විභාග දෙපාර්තමේන්තුව විසින් අදාළ ප්‍රතිඵල සටහන පරික්ෂා කර 2022.07.20 දිනැති ලිපිය මගින් විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම සහතික පත්‍රය ව්‍යාජ ලෙස ඔප්පුවීම නිසා සිංහතිලක මයාගේ සේවය 2021.03.01 දින සිට අවසන් කර ඇත. තව ද තනතුරක් සඳහා බඳවා ගැනීමේ දී අදාළ තනතුර අදාළ උ/පෙළ, සා/පෙළ ප්‍රතිඵල බඳවා ගැනීමේ දී ම Online මගින් තහවුරු කර ගැනීම සඳහා 2022.11.27 වැනි දින පැවති 522 වැනි පාලක සභාවේ දී අනුමැතිය ලබා දී ඇත.<br>•<br>නවරත්න මහතාගේ සම්බන්ධ ව විදුහල්පතිගෙන් විභාග ප්‍රතිඵල සටහනක් ලබා ගැනීමට කටයුතු කල අතර එම ප්‍රතිඵල සටහන සනාථ කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත 2022.02.25, 2022.03.22 හා 2022.03.31 යන දිනවල ලිපි යොමු කල ද මෙතෙක් පිලිතුරක් ලැබී නොමැත.<br><br>අනතුරු ව නවරත්න මහතා 2022.03.25 දින සිට සේවයට වාර්තා නොකරන බව වැඩ ඉංජිනේරු විසින් 2022.04.04 දිනැති ලිපියෙන් දන්වා සිටි අතර ඒ අනුව නවරත්න මහතා 2022.03.25 දින සිට සේවය අතහැර ගියා සේ සැලකීමට කටයුතු කරන ලදී. |
| **(ii)** | ඒ අනුව 2014.01.01 දින සිට 2016.12.31 දින දක්වා සනාතන සභාවේ නිර්දේශය මත පත්කරන ලද කමිටුවේ නිර්දේශය අනුව පර්යේෂණ දීමනාව ගෙවා ඇත. 2017.01.01 දින සිට උපකුලපති අනුමැතිය මත මාණ්ඩලික නිලධාරීන්ගේ පර්යේෂණ දීමනාව ගෙවා ඇත. එහෙත් 2022.03.01 දින පර්යේෂණ කළමනාකරණ කමිටුවක් පත්කරන ලද අතර ඉන් පසු පර්යේෂණ දීමනා ගෙවීම පර්යේෂණ කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත සිදු කර ගෙන යනු ලබයි.<br><br>• මෙම පර්යේෂණ දීමනා ලබා දී ඇත්තේ මූලික වැටුපට එකතු කරන ලද ප්‍රතිශතයක් මත වැටුප් වැඩි කිරීමේ අරමුණ සහ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය පර්යේෂණ වලට උනන්දු කිරීමටත් ය. මෙම දීමනා පර්යේෂණ සඳහා දරණ වියදම පියවා ගැනීම අරමුණු කරගෙන ලබා දී නැත. මෙම ගෙවීම පිළිබඳ ව නිකුත් කෙරුණ චක්‍රලේඛ වල පර්යේෂණ වාර්ථාවක් ලබා දීමේ අවශ්‍යතාවයක් පෙන්වා දී නොමැති වුවද, ආයතනික දියුණු සඳහා පර්යේෂණ වාර්ථා ඉදිරිපත් කිරීමේ ඇති වැදගත්කම අවතක්සේරුවට ලක් කළ නොහැක.<br><br>• විගණන විමසුමට අදාල කාල සීමාව තුළ පර්යේෂණ දීමනා ගෙවන ලද සේවකයන්ගේ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට මාස 06ක කාලයක් දීමට කටයුතු කර ඇත.<br><br>• 2022.03.01 දින සිට නැවත පර්යේෂණ කළමනාකරණ කමිටුවක් පත්කරන ලද අතර ඉන් පසු පර්යේෂණ දීමනා ගෙවීම පර්යේෂණ කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත සිදු කර ගෙන යනු ලබයි. ඒ අනුව පර්යේෂණ යෝජනාව විශ්ලේෂකයෙකු මගින් විශ්ලේෂණය කොට එම නිර්දේශය නැවත පර්යේෂණ කමිටුවට යොමු කොට පර්යේෂණ දීමනා ගෙවීමට කටයුතු කරනු ලබයි.<br>පර්යේෂණ දීමනා සඳහා ලබාදෙන යෝජනා නිසි පරිදි විශ්ලේෂණය කරනු ලබන අතර වාර්ෂික ව එහි ප්‍රගතිය නිරීක්ෂණය කරනු ලබයි.<br><br>• ඉහත සඳහන් පරිදි පර්යේෂණ කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත එක්වරකට වසරක උපරිමයකට යටත් ව විධායක නිලධාරීන් සඳහා පර්යේෂණ දීමනාව ලබා දීම පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.<br><br>• ගෙවමින් පවතින පර්යේෂණ දීමනා වලට අදාළ පර්යේෂණයන් හි ප්‍රගතිය වසර අවසානයේ සමාලෝචනය කරමින් ඉදිරි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීමට සලකා බලනු ලැබේ.<br><br>• ඒ අනුව එම චක්‍රලේඛයෙ හි ප්‍රතිපාදන පරිදි පර්යේෂණ වාර්තාවක් ලබා දීමේ අවශ්‍යතාවය පෙන්වා දී නොමැත. කෙසේ නමුත් පර්යේෂණ කමිටු අනුමැතිය නොමැති 2017 සිට 2023 දක්වා කාල පරිච්ඡේදයේ පර්යේෂණ යෝජනා කමිටුවක් මගින් ඇගයීම කිරීමට ද අදාළ පර්යේෂණ යෝජනා වල ප්‍රගතිය ඇගයීමකට ලක් කිරීමට ද 2023.06.14 දින පැවති පර්යේෂණ කමිටුව මගින් නිර්දේශ කොට ඇත.<br><br>• අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික පර්යේෂණ සැසිවාරයක් පැවැත්වීමට මානව සම්පත් සංවර්ධන ඒකකයට (HRDU) උපදෙස් ලබා දී ඇත. මේ සඳහා පාලක සභාවේ අනුමැතියට පත්‍රිකාවක් ද ඉදිරිපත් කර ඇත. |

| | |
|---|---|
| | නිලධාරීන්ගේ පර්යේෂණ වාර්තා හා ප්‍රතිඵල යොදාගෙන ඉදිරියේ දී පර්යේෂණ සැසි පැවැත්වීමටත්, එමගින් ඔවුන්ගේ පර්යේෂණ සඳහා සක්‍රීය දායකත්වයක් ලබා ගැනීමටත්, තීරණය කර ඇත. |
| **(iii)** | පොදු ව්‍යාපාර කාරක සභාවේ දී විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශ කළ පරිදි උක්ත විදේශ පුහුණු වැඩසටහන් වලට අනධ්‍යයන හා ආචාර්යවරුන් සහභාගී වීම සම්බන්ධයෙන් රුපියල් මිලියන 6.69කට ආසන්න මුදලක් භාණ්ඩාගාර මුදල් හෝ දේශීය අරමුදල් භාවිත කර නොමැති බව කාරුණික ව දන්වා සිටිමු.<br><br>මෙම පුහුණු වැඩසටහන යුරෝපා සංගමයේ ආධාර යටතේ නැගෙනහිර විශ්වවිද්‍යාලය ප්‍රධාන සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියාත්මක වන, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල වන රුහුණු, මොරටුව, රජරට, පේරාදෙණිය, නැගෙනහිර විශ්වවිද්‍යාලයන් යන විශ්වවිද්‍යාල 05 සහ Sri Lanka Technological Campus (SLTC) යන රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලය මෙන් ම යුරෝපයේ තවත් විශ්වවිද්‍යාල 04ක් යුරෝපා සංගමය සමග ඇති කරගත් ගිවිසුමකට අනුව ක්‍රියාත්මක වේ.<br><br>මෙම ව්‍යාපෘතිය සඳහා Euro 721,326 වටිනාකමට අදාළ ව ගිවිසුම් ගත වී ඇති අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වල අනධ්‍යයන කාර්යය මණ්ඩලවල පුහුණුව මඟින් කලමනාකරණ හා පාලනය වැඩිදියුණු කිරීම සඳහා වූ Enhancing Governance and Reform in Sri Lanka University Through Non Academic Staff Training (ENACT) ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය 2021 ජනවාරි මස ආරම්භ විය. 2024 ජනවාරි මස දක්වා වසර තුනක් ක්‍රියාත්මක වන අතර ක්‍රියාත්මක භාවය අනුව තව වසරක් දීර්ඝ කිරීමට හැකියාව ඇත.<br><br>ව්‍යාපෘතියේ මුලු වටිනාකමින් පලමු වාරිකය වන 50%ක වටිනාකම වන Euro 360,603ක් 2021 වර්ෂයේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගිණුමට බැර කර තිබූ අතර ඉන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මුලු වාරිකය වන Euro 41,308ක් 2021.11.23 වන දින විශ්වවිද්‍යාල ගිණුමට ලැබී ඇත.<br><br>මෙම ව්‍යාපෘතියට අදාළ දෙවන වාරිකය වන ගිවිසුම් ගත වටිනාකමෙන් 40%ක ප්‍රමාණයක් වන EURO 288,530.40ක මුදලක් 2023.03.22 දින නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුවේ ගිණුමට බැර වී ඇත.<br><br>ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රුපියල් මිලියන 4.45ක මුදල සඳහා යුරෝපා සංගමයේ වූ ENACT ව්‍යාපෘතිය යටතේ මහාභාණ්ඩාගාරය මඟින් අධ්‍යාපන අමාත්‍යංශය හරහා නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් රු.5,000,000.00ක් 2023.05.08 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුමට ලැබී ඇත. තව ද මෙම ව්‍යාපෘතිය සඳහා වූ ඉතිරි නිදහස් කිරීම වන රු.6,616,372.69ක් 2023.06.19 දින නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුමට බැර කර ඇත.<br><br>ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා පුහුණු වැඩ සටහන් වලට සහභාගී වීම අනධ්‍යයන හා ආචාර්යවරුන් සහභාගී වීමට මහා භාණ්ඩාගාරයේ මුදල් හෝ දේශීය අරමුදල් භාවිත කර නොමැති බව දන්වා සිටිමි. |
| **(iv)** | 2022 වර්ෂයට අදාළ ව බැඳුම්කර හා ගිවිසුම් කඩ කරන්නන්ගෙන් රු.56,652,435.27/-ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත.<br><br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන අතර මෙම බැඳුම්කර හා ගිවිසුම් කඩ කරන්නන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 පරිදි බැඳුම්කර හා ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ලැබෙන සියලුම මුදල් ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වැනි පොළී උපයන වත්කම් වල ආයෝජනය කළ යුතු අතර එයින් ලැබෙන පොළී ආදායම එම චක්‍රලේඛයෙ හි නිර්දේශ කර ඇති කටයුතු සඳහා පමණක් භාවිතා කරනු ලබයි. මෙසේ බැඳුම්කර කඩ කරන්නන්ගෙන් අයවිය යුතු මුදල් භාවිතා කර යුතු ආකාරය සඳහා නිර්දේශ සඳහන් චක්‍රලේඛය විශ්වවිද්‍යාලයන් සඳහා නිකුත් කර නොමැත. |
| **2.2.3** | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව. |
| (අ) | **<u>බලතල, කර්තව්‍ය සහ කාර්යයන්</u>**<br><br>**<u>1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත</u>** |
| (i)<br>. | <u>45(XV) වගන්තිය හා 34(3) වගන්තිය</u><br><br>අභ්‍යන්තර විගණන අංශය විසින් ද මෙම තත්වය වාර්තා කොට තිබුණ අතර ඒ අනුව මෙම ව්‍යාපෘති ගිවිසුමකින් තොර ව අත්සන් කිරීම සම්බන්ධ ව විමර්ෂණයක් පැවැත්වෙමින් පවතී. ඉදිරියේ දී මෙම තත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය තීරණයන් හා ක්‍රියාමාර්ග මේ වන විටත් ක්‍රියාත්මක කොට ඇත. |
| (ii). | භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් පරිබාහිර ව, වෙනත් ප්‍රභවයන්ගෙන් අරමුදල් ලද, එහෙත් නිශ්චිත අරමුණක් සඳහා පමණක් අදාළ අරමුදල් වැයකළ යුතු වන අවස්ථාවල දී: (උදා. ජාත්‍යන්තර සමුළු, වැඩමුළු, |

| | |
|---|---|
| | සම්මන්ත්‍රණ) එම අරමුදල් ලැබීම් හා ඒවායෙන් වැය දැරීම් පිළිබඳ ව නිරවුල් ව ගිණුම් පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව, එක් එක් අරමුදල සඳහා වෙන වෙන ම ලෙජර් ගිණුම් වශයෙන් මෙම ගිණුම් අරඹා ඇත.<br><br>මෙම අරමුදල් වලට අදාළ ලැබීම් හා ඒවායෙන් ගෙවීම්, ඒවායේ ආදායම හා වියදම් ලෙස ගිණුම් ගත කල ද, භාණ්ඩාගාරය මඟින් ලබා දෙනු ලබන ප්‍රතිපාදන ගිණුම් ගත කිරීමට අදාළ නිසි ක්‍රමවේදය අනුව ම ගිණුම් ගත කර ඇති අතර විශ්වවිද්‍යාලයේ මුල්‍ය ප්‍රකාශනයන් හි නිවැරදි ව ගිණුම් ගත කිරීම හා ඒවායේ ආදායම් හා වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිසි ලෙස හෙළිදරව් කිරීම ද සිදු කර ඇත. ඒ අනුව, නිරීක්ෂණය කර ඇති මුදල්, විශ්වවිද්‍යාල අරමුදල් යටතේ ගිණුම්ගත කර ඇත. එනම් මෙම විවිධ වූ අරමුදල් ගිණුම්වල එකතු වූ අගයන් විශ්වවිද්‍යාල අරමුදල් වශයෙන් ගිණුම් මඟින් නිරූපණය වේ. |
| (ආ) | <u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය</u> |
| (i). | • ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම පිටවීම සටහන් කිරීම අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය සඳහා අනිවාර්ය කොට නව අභ්‍යන්තර චක්‍රලේඛයක් 2023.04.04 නිකුත් කරන ලදී.<br><br>• වර්තමානයේ දී අධයන සහයක කාර්ය මණ්ඩලයේ 58 දෙනෙකුගෙන් 34 දෙනෙකු දැනටමත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම පිටවීම වාර්තා කිරීම සිදු කරනු ලබයි.<br><br>• ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම සහ පිටවීම සටහන් නොකරන අනෙකුත් අධ්‍යයන සහයක කාර්ය මණ්ඩල සාමාජිකයින් 24 දෙනාගෙන් නිදහසට කරුණු විමසීමට පියවර ගන්නා ලෙස 529 (විශේෂ) පාලක සභාව මඟින් තීරණය කර ඇත. ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. |
| (ii). | මෙම වාහන අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ අවසන් කර ඇති අතර, විධිමත් පරීක්ෂණයක් පැවැත්වෙමින් පවතී. |
| (ඇ) | • 2021.01.04 දින සිට හිටපු ලේඛකාධිකාරිවරයා මූලික විමර්ෂණයකට යටත් ව අනිවාර්ය නිවාඩු යැවීම හේතුවෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 23.2.5, 23.3.5 හා 23.3.6 ඡේදයන් හි පවතින ප්‍රතිපාදන මත නියෝජ්‍ය ලේඛකාධිකාරි තනතුරක කටයුතු කරන එවකට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨත ම නිළධාරිනිය වූ M.G.J. ධර්මසිරි මහත්මිය 505 වන පාලක සභාවේ අනුමැතිය මත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි තනතුරේ වැඩ ආවරණය කිරීම පිණිස පත් කිරීම කරන ලදී.<br><br>• විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුරේ වැඩ ආවරණය කරන ලද නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත 06/2014 චක්‍රලේඛය පරිදි 10%ක සංග්‍රහ වියදම් දීමනාවක් ද විශ්වවිද්‍යාල ආයතනික චක්‍රලේඛ අංක 13/2015 හි පවතින ප්‍රතිපාදන මත ලේඛකාධිකාරී වෙත හිමි ඉන්ධන දීමනාව ලෙස පෙට්‍රල් ලීටර 140කට සමාන දීමනාවක් ද හා 13/2015 (i) හි ප්‍රතිපාදන මත හා ප්‍රවාහන දීමනාව ලෙස මාසික ව රු.50,000/=ක මුදලක් එම තනතුරේ වැඩ ආවරණය කිරීමට පත් කළ අදාළ නිලධාරිනිය වෙත 528 හා 514 පාලක සභා අනුමැතිය මත ගෙවීමට කටයුතු කොට ඇත. තනතුරට හිමි දීමනා පවතින චක්‍රලේඛ ප්‍රතිපාදන ඉහත දක්වා ඇති පරිදි පාලක සභා අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත. |
| (ඈ) | **2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය** |
| (i). | පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් දැනටමත් පවත්වාගෙන යනු ලබන ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව දත්ත සමුදාය මඟින් ඉහත ක්‍රියාකාරකම් වල ප්‍රමාදයක් සිදුවීමේ දී ඒ පිළිබඳව පසු විපරම් කිරීමටත්, ඉදිරියේ දී නැවත මෙවන් තත්වයක් උද්ගත නොවන පරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| (ii). | මේ වන විට මෙම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් සංවර්ධන වැය විෂයන්ට මාරුකල යුතු අගයන් නිවැරදි සංවර්ධන වැය විෂයන්ට මාරු කර ඇත. |
| (iii). | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 109ක් යටතේ සංවර්ධන වැය විෂයයන්ට වෙන් කර තිබූ මුදල් මාරු කර නොමැති බවට නිරීක්ෂණය කර තිබුන ද, එම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ගණන 205ක් වශයෙන් නිවැරදි විය යුතුය.<br><br>එම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 205න් 153කට අදාළ ව රු. 35,467,956.21ක් මේ වන විට සංවර්ධන වැය විෂයයන්ට මාරු කර ඇත.<br><br>ඉතිරි ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 52න් 48ක කටයුතු මෙතෙක් අවසන් ව නොමැති අතර, ඒවායේ කටයුතු අවසන් වීමෙන් පසු ව ඊට අදාල රු. 148,342,407.00ක මුදල සංවර්ධන වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>ඉතිරි ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 04 හි කටයුතු අවසන් ව ඇති අතර, ඒවායේ මූල්‍ය ප්‍රකාශන 2023 ජූලි මස මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ව රු.12,293,336.00 මුදල සංවර්ධන වැය විෂයයන්ට මාරු කරනු ලැබේ. |

ඒ අනුව විගණන විමසුම අයත් විය යුතු ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 205ක් තුලින් සංවර්ධන වැය ශීර්ෂයන් සඳහා මාරුකළ, තහවුරු කිරීමට පවතින ක්‍රියාකාරකම් සංඛ්‍යාව සහ මූල්‍ය ප්‍රකාශනයන් පහත පරිදි සංක්ෂිප්ත ව දැක්විය හැක.

| | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ගණන | සංවර්ධන වැය විෂයයන්ට මාරු කිරීමට අදාළ වටිනාකම |
|---|---|---|
| මේ වන විට සංවර්ධන වැය විෂයයන්ට මාරු කර ඇත. | 153 | රු.35,467,956.21 |
| කටයුතු මෙතෙක් අවසන් ව නොමැත. | 48 | රු.148,342,407.00 |
| කටයුතු අවසන් ව ඇති නමුත් ඒවායේ මූල්‍ය ප්‍රකාශන 2023 මුදල් කමිටුව වෙත දැනට ඉදිරිපත් කර නොමැත. | 04 | රු.12,293,336.00 |

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූල ව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

(අ) රටේ පැවති ආර්ථික අර්බුදයත් සමඟ සැපයුම්කරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුව සහ එමගින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් හට නියමිත වේලාවට නියමිත පරිදි සේවය සැපයීමේ අපහසුවක් ඇති නොකිරීමේ අරමුණින් එම අවස්ථාවේ පැණනැගුනු සියලු කරුණු සලකා බලා අවම මිල ගණන් තෝරා ගැනීමෙන් ගතයුතු ව තිබූ හොඳ ම තීරණය විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මඟින් ගෙන ඇති අතර එමගින් ශිෂ්‍යයින්ට හෝ රාජ්‍ය මුදල් සම්බන්ධ ව කිසිදු අලාභයක් විශ්වවිද්‍යාලයට සිදු නොවී ඇති බව දන්වා සිටින අතර ශිෂ්‍යයන්ට අවශ්‍ය වේලාවට ගුණාත්මක සේවයක් ලබා දීමට හැකි වු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

(ආ) නවක වදය සම්බන්ධයෙන් සිසුන් දෙපිරිසකගේ ඇති වූ කලහකාරී තත්ත්වය මත සිසුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා ශාස්ත්‍ර පීඨයේ භෝජනාගාරයේ සහ ඒ අවට සීසීටීවී කැමරා පද්ධතියක් සවි කිරීමට කඩිනමින් පියවර ගත් බව දන්වා සිටිමි. ඒ අනුව මේ සඳහා ටෙලිපික්ස් ටෙක්නොලොජි ආයතනයට මෙම කර්තව්‍යය සිදු කිරීමට භාර දෙන ලදී. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 35 අනුව රාජ්‍ය භාණ්ඩාගාරයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අනුව විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මඟින් අනුමැතිය ලබා ගත් අතර ජාතික විගණන කාර්යාලයට ද දන්වා ඇත.

(ඇ) කෘෂි විද්‍යා පීඨයේ සහ පශු වෛද්‍ය පීඨයේ සත්ත්ව ආහාර අවශ්‍යතාව පදනම් කරගෙන ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම යටතේ පුවත්පත් දැන්වීමක් පල කිරීම මඟින් ටෙන්ඩර් කැඳවන ලදී. එහි දී එක් කොන්දේසියක් ලෙස සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ඇති සත්ත්ව ආහාර පිළිබඳ ලේඛකාධිකාරීගෙන් (Feed Registrar) බලපත්‍රයක් ගෙන තිබීම අත්‍යවශ්‍ය විය.

එබැවින් තාක්ෂණ කමිටුව ලංසු ඇගයීමේ දී මේ පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක් වූ අතර ඔවුන්ගේ තාක්ෂණික දැනුම ද භාවිතා කරමින් ලංසු ඇගයීම සිදු කරන ලදී.

සත්ත්ව ආහාර වල කල් ඉකුත්වීමේ කාලය මාසයකට ආසන්න වන බැවින් අවශ්‍යතාව මත සත්ත්ව ආහාර ඇණවුම් කරනු ලබයි. ලැබුණු ඇණවුම් වල ආහාර සාම්පල පරීක්ෂා කිරීම ප්‍රායෝගික ව අපහසු කටයුත්තක් වනුයේ එවැනි පරීක්ෂාවන් සිදු කිරීමේ පහසුකම් විශ්වවිද්‍යාලය තුල නොමැති වීමයි. ඒ සඳහා පිටස්තර ආයතනයකින් එම සේවාව ලබා ගත යුතු වන අතර ඊට ඉහළ මුදලක් හා කාලයක් ගත වේ. එබැවින් එසේ පෝෂ්‍ය පදාර්ථ සංයුතිය පරීක්ෂා කිරීමෙන් ලැබුණු ඇණවුම් කල් ඉකුත්වීමට ආසන්න වනු ඇත. එබැවින් මෙම සංයුතිය පිළිබඳ අධ්‍යනය කරනු ලබන්නේ සතුන් සඳහා ලැබුණු ඇණවුම් ලබා දීමෙන් ඔවුනගේ වර්ධනය හා ඵලදායීතාවය මැන බැලීමෙනි. මෙවන් දර්ශක වල යම්කිසි පසුබෑමක් වේ නම් ගෙවීම් සිදු කිරීමේ දී භාණ්ඩ භාරගන්නා කමිටුව (Goods Acceptance Committee) විසින් විශේෂ තීරණයකට එළඹ ඉන්වොයිස් පතෙහි වටිනාකමෙන් යම්කිසි සාධාරණ අගයක් අඩු කිරීමට කටයුතු කරනු ලබයි.

එබැවින් සත්ත්ව ආහාර සඳහා ගෙවීම් කිරීමේ දී අනිවාර්යෙන් ම එහි පෝෂ්‍ය පදාර්ථ සංයුතිය ගැන විශේෂ කමිටුවකින් සලකා බැලීමෙන් පසුව එය සිදු කරනු ලබයි.

(ඈ) 2019.04.21 දින සිට රට තුල පැවති කලබලකාරී වාතාවරණය, වසංගත තත්ත්වය, රට වසා තැබිම, සෞඛ්‍ය මාර්ගෝපදේශ, සංචරණ සීමා, වෙළඳපොළ අමුද්‍රව්‍ය හිඟය, ඉන්ධන හිඟය වැනි අර්බුධකාරී ආර්ථික වාතාවරණය හේතුවෙන් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට හේතු වී ඇති අතර කොන්ත්‍රාකරු විසින් ඉදිරිපත් කර ඇති හේතු විශ්වවිද්‍යාලය විසින් පිළිගෙන, 2022.11.30 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර ව නිසි පරිදි අනුමැතිය ලබා ගෙන ඇත.

(ඉ) පුනරුත්ථාපන ව්‍යාපෘති

| | කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතිය | අත්තිකාරම් වටිනාකම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1. | CW/CON/ 2014/1058 | Design and Construction of Proposed Closed House Broiler Shed, Dept. of Animal Science, Faculty of Agriculture University of Peradeniya | 4,118,873.00 | මෙම ව්‍යාපෘතිය 2022.05.21 දින නිම කිරීමට නියමිත වුවත් රට තුල පැවති වසංගත තත්ත්වය, සංචරණ සීමා, දේශපාලන ව්‍යාකූලත්වය, අරගල, ඉන්ධන අර්බුධ, වෙළඳපොළ අමුද්‍රව්‍ය හිගය, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම වැනි විවිධ හේතු මත 2023.05.21 දක්වා කොන්ත්‍රාත් කාලසීමාව දිර්ඝ කිරීමට සිදු ව ඇත. ඒ අනුව ගෙවා ඇති රු. 4,118,872.50 වන සංචලන අත්තිකාරම් මුදලින් රු. 3,401,496.90ක මුදලක් අය කර ඇත. ඉතිරි මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 iii *(supplement 29 )* අනුව ඉදිරි බිල්පත් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 2. | CW/CON/ 2014/1057 | Proposed Semi Permanent Building For Students Common Room , Faculty of Arts, University of Peradeniya. | 2,179,024.00 | මේ වන විට අවසන් බිල්පතෙන් රු. 2,179,024.00ක් වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත. |
| 3. | CW/CON/ 2017/1347 | Construction of Timber Stage for Administration Building of the Faculty of Allied Health Science, University of Peradeniya | 906,096.00 | මේ වන විට අවසන් බිල්පතෙන් රු. 906,096.45 වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත. |
| 4. | CW/CON/ 2019/1429 | Landscaping the Premises of China – Sri Lanka Joint Research and Demonstration Centre, University of Peradeniya | 3,885,355.00 | මේ වන විට අවසන් බිල්පතෙන් රු. 3,597,550.68 වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත. |
| 5. | CW/CON/ 2019/1418 | Rewiring of the Main Library, University of Peradeniya | 3,678,300.00 | 2022.03.02 දින වන විට මෙම ව්‍යාපෘතියේ තුන් වන අන්තර් බිල්පතෙන් රු. 3,678,300.00ක් වූ සම්පූර්ණ අත්තිකාරම් මුදල අය කර ඇත. |
| 6. | CW/CON/ 2016/1257 | Proposed Renovation for Jayathilake Hall, UoP | 14,034,397.00 | මේ වන විට අවසන් බිල්පතෙන් රු. 2,179,024.00 වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත. |
| 7. | CW/CON/ 2016/1263 | Proposed Renovation for Heritage Buildings (Wijewardena Hall), University of Peradeniya. | 40,017,474.00 | මෙම ව්‍යාපෘති 2022.12.10 දින අවසන් කර ඇත. සම්පූර්ණ අත්තිකාරම් මුදල වන රු. 34,797,803.23න් රු. 23,598,596.82ක් 16 වන අන්තර් බිල්පතෙන් අයකර ඇති අතර ඉතිරි අත්තිකාරම් මුදල අවසන් බිල්පතෙන් අය කර සියලුම ගෙවීම් නිරවුල් කිරීමට නියමිත ව ඇත. |
| 8. | CW/CON/ 2016/1256 | Rehabilitation for Arunachalam Hall, University of Peradeniya | 7,102,351.00 | මේ වන විට පළමු අන්තර් බිල්පතෙන් රු. 6,175,957.50ක් වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත |

ප්‍රග්ධන ව්‍යාපෘති

| | කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතිය | අත්තිකාරම් වටිනාකම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1. | CW/CON/2008/786 | Construction of Faculty Centre, Faculty of Engineering, University of Peradeniya | 4,345,549.00 | මේ වන විට අවසන් බිල්පතෙන් රු. 3,778,738.00ක් වන සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවා අවසන් ගෙවීම් සහතිකය පිලියෙළ කොට ඇත. |
| 2. | CW/CON/2015/1139 | Design & Construction of PropÈed Extension to the Existing Building for the Dept. of Farm Animal Production and Health, Faculty of Veterinary Medicine & Animal Science, UoP | 19,574,150.00 | සම්පූර්ණ අත්තිකාරම් මුදල වන රු.17,021,000.00න් රු. 15,324,200.00ක් 12 වන අන්තර් බිල්පතෙන් අයකර ඉතිරි මුදල අවසන් බිල්පතෙන් අය කර සියලුම ගෙවීම් නිරවුල් කිරීමට නිමිත ව ඇත. |
| 3. | CW/CON/2011/898 | Proposed Five Storied Building for the Faculty of Dental Sciences. | 37,024,803.00 | මෙම ව්‍යාපෘතිය 2023.02.28 වැනි දින අවසන් වී ඇති අතර අවසන් බිල්පත සහ රැඳවුම් මුදලින් 50%ක මුදලක් නිදහස් කර ඇත. නමුත් සංචලන අත්තිකාරම් මුදලින් රු. 3,966,943.16ක මුදලක් අය වී නොමැති බව අනාවරණය විය. ඒ අනුව ව්‍යාපෘතියේ වගකීම් කාලසීමාව ඉකුත් වී වසර 05කට ආසන්න |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කාලයක් ගත වී ඇති බැවින් ඉතිරි 50%ක රැඳවුම් මුදල වන රු. 4,628,00.35ක මුදලින් හිඟ අත්තිකාරම් මුදල පියවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා මූල්‍යාධිකාරී වෙත දන්වා ඇත. |
| 4. | CW/CON/2007/743 | Construction of Building for the Faculty of AHS | 7,476,393.00 | මෙම ව්‍යාපෘතිය ප්‍රදානය කළ අදාල කොන්ත්‍රාත්කරු විසින් නිසි ආකාරයට හා ගිවිසුම් ප්‍රකාර ව වැඩ නොකරන බව වාර්තා වීමෙන් අනතුරු ව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ව කොන්ත්‍රාත්කරු සතු රු. 3,885,832.00ක් වටිනා ඉදිකිරීම් යන්ත්‍ර, උපකරණ සහ අමුද්‍රව්‍ය විශ්වවිද්‍යාලය භාරයට ගෙන වැඩ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.<br>කොන්ත්‍රාත්කරු වන Waterman Engineering Pvt Ltd අසාදු ලේඛණගත කිරීමට පියවර ගෙන ඇත. ඉන් අනතුරු ව ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා නැවත ටෙන්ඩර් කැඳවා එම කාර්යය 2018.06.30 දින වන විට නිම කර ඇත. |

(ඊ) මෙම ව්‍යාපෘතියේ අමුද්‍රව්‍ය මිළ සීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි බැවින් කොන්ත්‍රාත්කරු විසින් දෙපාර්ශවයේ එකඟතාවය මත ව්‍යාපෘතිය නතර කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති අතර නියෝජ්‍ය උපකුලපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සකච්ඡාවේදි එම ඉල්ලීම පිළිගත හැකි යැයි සලකා එම ව්‍යාපෘතිය අනාර්ථික වියදමක් නොවන පරිදි නිම කිරීමට අවශ්‍ය උපදෙස් කොන්ත්‍රාත්කරු වෙත ලබා දි ඇත.

## 2.3 වෙනත් කරුණු

(අ)

i. මෙම අයව අනිවාර්ය නිවාඩු යැවීම සම්බන්ධ රෙගුලාසි ප්‍රකාර ව මෙම අයට වැටුප් ගෙවීම සම්බන්ධ ප්‍රතිපාදන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ 18.7 සහ X වන පරිච්ඡේදයේ 14.2 වගන්තීන් ප්‍රකාර ව දක්වා ඇති බැවින් එම අයට එකී අනිවාර්ය නිවාඩු කාලය තුළ වැටුප් ගෙවීමට කටයුතු කර ඇත.

ii. තව ද, මෙම අයට එම අනිවාර්ය නිවාඩු කාලය තුළ ගෙවිය යුතු වැටුප වනුයේ ඔහුගේ මුලික වැටුප සහ ජීවන වියදම් දීමනාව පමණක් බැවින් 2022 නොවැම්බර් මස සිට මේ දක්වා එලෙස ගෙවීමට කටයුතු කර ඇත. 2021 ජනවාරි මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා වැඩිපුර ගෙවා ඇති වැටුප ගෙවන ලෙස රාජපක්ෂ මහතා වෙත ලිපියකින් දන්වා ඇත.

iii. කෙසේ වුව ද, ගරු අභියාචනාධිකරණයේ දී 2023 මාර්තු 30 වන දින වු එකගතාවය පරිදි මෙම නඩුව අසා අවසන් වනතෙක් එලෙස වැඩිපුර ගෙවන ලද වැටුප අයකිරීම තාවකාලික ව අත්හිටුවා ඇත.

iv. තව ද, මෙම අභියාචනාධිකරණ නඩුව විවාදයට ගැනීම අවස්ථා ගණනාවකදී ම සිදු නොවීම හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විශ්වවිද්‍යාලය විසින් කරන ලද ඉල්ලීම මත ගරු අභියාචනාධිකරණයේ මෝසමක් ගොනු කරමින් මෙම නඩුව හැකි ඉක්මනින් අසා නිම කිරීමේ අවශ්‍යතාවය පෙන්වාදෙන ලද අතර, ඒ අනුව ගරු අධිකරණය මෙම නඩුව 2023 ජුලි 19 වන දින විවාදයට ගැනීමට තිරණය කරන ලද අතර ඒ සම්බන්ධයෙන් සියලු පාර්ශවයන් වෙත දැනුම් දෙන ලදී.

(ආ) ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල 2022.12.31 දිනට බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් සංඛ්‍යාව 122 වු අතර 2023.04.24 දිනට එම සංඛ්‍යාව 111 දක්වා අඩු වී ඇත. එදිනට බැඳුම්කර වටිනාකම රු.223,034,121.67ක් විය. මෙම බැඳුම්කර ඉතා පැරණි සහ ක්‍රියාකාරී ලෙස වර්ග කර ඇති අතර ආචාර්යවරුන් 48 දෙනෙකු ක්‍රියාකාරී බැඳුම්කර කඩකිරීම් වන අතර එම වටිනාකම රු.197,236,321.78 කි. 2023.01.01 දින සිට 2024.04.24 දින දක්වා කාලය තුල ක්‍රියාකාරී බැඳුම්කර වටිනාකමින් රු.16,677,730.99ක් අයකර ගෙන ඇත. පැරණි බැඳුම්කර කඩකිරීම් සංඛ්‍යාව 63ක් වන අතර එම බැඳුම්කර වටිනාකම රු.25,797,799.89 කි.

**<u>නිළධාරීන්ගෙන් අය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් පහත පරිදි ඉදිරිපත් කර ඇත</u>**

1. අධ්‍යයන නිවාඩු ගිවිසුම් උල්ලංඝනය කරන ලද ආචාර්යවරුන්ගෙන් අය විය යුතු මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018.12.17 දිනැති ව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 02/2018 මඟින් උසස් අධ්‍යාපන ආයතනවල බැඳුම්කර මුදල් අයකර ගැනීම සඳහා සමාලෝචන කමිටු පිහිටුවීමට උපදෙස් ලබා දී ඇත.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2021.11.11 දින පැවති සභා වාරයේ දී, සේවය අතහැර ගිය සේවකයින්ගේ හිඟ බැඳුම්කර ශේෂ අයකර ගැනීමට ගතයුතු උපරිම පියවර සලකා බැලීමෙන් පසු බැඳුම්කර ශේෂයන් සහ ඇපකරුවන්ගේ විස්තර වෙබ් අඩවියේ පලකිරීමට සියලුම උසස් අධ්‍යාපන ආයතන වලට දැනුම් දීමට අනුමැතිය ලබා දුන් අතර එම තීරණය 2022.01.19 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 01/2022 මඟින් සියලුම උසස් අධ්‍යාපන ආයතන වෙත දන්වා යවා ඇත.

3. 2022.12.12 දිනැති ව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 03/2022 මගින් උසස් අධ්‍යාපන ආයතන වල බැඳුම්කර ශේෂයන් අයකර ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පිහිටුවා ඇති බැඳුම්කර අයකර ගැනීම සමාලෝචනය කිරීමේ කමිටු (Bond Recovery Review Committee) සඳහා වූ මාර්ගෝපදේශයන් (Terms of Reference) හඳුන්වා දෙන ලදී.

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020.03.12 දින පැවති 1028 වන සභා වාරයේ දී දැනට පවතින ගිවිසුම් සහ චක්‍රලේඛ අධ්‍යයනය කර යාවත්කාලීන කිරීමට නිර්දේශ ලබා ගැනීම සඳහා වූ කමිටුවක් පිහිටුවන ලද අතර එම කමිටුව මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇති අතර එම නිර්දේශයන් ඇතුලත් නව චක්‍රලේඛයක් ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

5. මීට අවුරුදු 25කට ඉපැරණි මෙම බැඳුම්කර අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය වශයෙන් කටයුතු කිරීමේ කාලය (බැඳුම්කර කඩ කළ දින සිට වසර 06ක කාලය) ඉකුත් වී ගොස් ඇති බැවින් පාලක සභාව වෙත මෙමෝ පතක් ඉදිරිපත් කොට අයකර ගත නොහැකි මෙම බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සහ එලෙස අයකර ගත නොහැකි වන්නේ නම් මුල්‍ය රෙගුලාසි ප්‍රකාර ව එම වටිනාකම් පොත්වලින් කපා හැරීම සදහා නියෝගයක් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් මගින් කමිටුවක් පත්කරවා ගන්නා ලදී.

6. ඒ අනුව, මෙම කමිටුව ඉතා පැරණි බැඳුම්කර කඩකිරීම් සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයෙන් අනතුරු ව ඔවුන්ගේ වාර්තාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා වෙත 2022.03.22 දිනැති ව ලබා දෙන ලදී.

එකී කමිටු නිර්දේශය වනුයේ,

1. මෙම අයවලුන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ සහ විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ පවතින යම් වත්කමක් වේ නම්, එම වත්කම් මෙම බැදුම්කර අයකරගැනීම සඳහා යොදා ගැනීමට වේ. ඒ අනුව ඔවුන්ගේ අර්ථසාධක අරමුදලේ යම් ශේෂයක් පවතීනම්, එම ප්‍රමාණය ද ඔවුන් වෙත නොගෙවන ලද පාරිතෝෂික පවතීනම් එම ප්‍රමාණයද වේ.

2. මෙම වාර්තාව සලකා බැලූ 2023.03.07 වන දින පැවති විශ්වවිද්‍යාල විගණන හා කළමණාකරණ කමිටුව විසින් තීරණය කරන ලද්දේ, මෙම සියලු දෙනාගේ අර්ථ සාධක අරමුදල්වල ශේෂයන් සහ බැඳුම්කර වටිනාකම් වල ශේෂයන් සමුචිත ලෙස ගණනය කොට අදාල අයකිරීම් සිදුකිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් සිදු කිරීමට වේ.

**(ඇ)** අදාළ කථිකාචාර්යවරිය 2016.07.27 වන දින පශ්චාත් උපාධි පාඨමාලාව අවසන් කොට සේවයට වාර්තා කර ඇති අතර 2017.06.27 සහ 2018.10.29 වන දිනැති ලිපි මගින් ඇයට පශ්චාත් උපාධි පාඨමාලා සහතික පත්‍රය ලබාදෙන ලෙසට දක්වා ඇති අතර එලෙස අදාළ සහතික පත්‍රය ලබානොදීම මත ඇගේ බැඳුම්කර වටිනාකම වන රු. 14,115,666ක මුදල අයකරගැනීමට අදාළ ව මූලික වශයෙන් ඇය බැඳුම්කර ගිවිසුම් කඩ කළ කථිකාචාර්යවරියක වශයෙන් බැඳුම්කර කමිටු අනුමැතිය සහ විශ්වවිද්‍යාල පාලක සභා අනුමැතිය පිළිවෙලින් 2019.09.06 (19 වන බැඳුම්කර කමිටුව) සහ 2020.09.19 (497 වන පාලක සභාව) ලබා ගෙන ඇත.

අදාළ අනුමැතිය පරිදි එම මුදල මූල්‍ය රෙගුලාසි 119 හි විධිවිධාන පරිදි සමාන වාරික 60කින් අයකරගැනීමට කටයුතු කරන ලෙසට මාසික වැටුප් ගෙවීම් පත්‍රිකා අංක 346 (2021.02.11) යටතේ මූල්‍යාධිකාරී වෙත දැනුම් දීමෙන් අනතුරු ව ඇයගේ මාසික වැටුප් මුදල අදාල බැඳුම්කර මුදලෙහි මාසික වාරිකය සදහා ප්‍රමාණවත් නොවන බැවින් මූල්‍ය රෙගුලාසි 119 හි විධිවිධාන පරිදි අදාළ බැඳුම්කර වටිනාකම සමාන වාරික 60ට වැඩි ප්‍රමාණයකින් අය කර ගැනීම සඳහා 2022.06.30 දිනැති 517 වන පාලක සභාව මගින් නිර්දේශ කර ඇති අතර ඊට අදාළ භාණ්ඩාගාර අනුමැතිය සඳහා 19.12.2022 වන දින ඉදිරිපත් කර ඇත.

අදාළ භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තෙක් 01.01.2023 දින සිට එම බැඳුම්කර මුදල මාසික ව රු. 79,903.67 බැගින් 2023.01.01 දින සිට අය කර ගැනීමට කටයුතු කර ඇත.

**(ඈ)**

| නිලධාරියාගේ නම | මුදල |
|---|---|
| එම්.ජී.සී.එම් ජයසිංහ මහත්මිය, ආධුනික කථිකාචාර්ය, පශු සායනික විද්‍යා දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 408,971.00 |
| ජේ බ්‍රසාදි මහත්මිය, ආධුනික කථිකාචාර්ය, ආහාර විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂි විද්‍යා පීඨය | 1,168,724.00 |
| පී.ඒ.ඩී පෙරේරා මහත්මිය, ආධුනික කථිකාචාර්ය, හෙද දෙපාර්තමේන්තුව, සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 249,282.00 |
| වෛද්‍ය ඒ.එම්.යූ අතපත්තු මහත්මිය, ආධුනික කථිකාචාර්ය, මූලික පශු වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය විද්‍යා පීඨය | 298,998.00 |
| | **2,125,975.00** |

කාර්ය මණ්ඩලයේ ඉල්ලා අස්වීමේ ලිපි මාස තුනකට පෙර ආයතන අංශයට යවා නොතිබුන බැවින් වැටුප් නතර කරන ලෙස වැටුප් අංශයට දැනුම් දීමට නොහැකි වී ඇත. මෙම වැඩිපුර ගෙවන ලද මුදල් අර්ථ සාධක ගෙවීමේ දී අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් එවන ලද ඉල්ලීම් ලිපියෙන් පසු වැටුප් නතර කරන ලෙස වැටුප් අංශයට දැනුම් දීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත.

**(ඉ)** (Design) Building Consultancy සඳහා වන කොන්ත්‍රාත් ව්‍යාපෘති සඳහා EDC ආයතනයෙන් උපදේශන සේවා ලබා ගැනීම කල නොහැක.

**(ඊ)** මෙම ණය වාරික අයකර ගැනීම ප්‍රමාද වී ඇත්තේ සේවය අතහැර ගිය නිළධාරීන්ගෙන් වන අතර ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී සියලු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(උ)** මෙම අරමුදල් ඉදිරියටත් අනුකූල වන පරිදි උපයෝජනය කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි.

**(ඌ)** මෙම නිලධාරීන් සහභාගි නොවූ 98, 99 හා 100 විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි නොවීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ මූලික ක්‍රියාමාර්ගය ලෙස එම නිලධාරීන් වෙත කරුණු විමසීමේ ලිපියක් (Explanation Letter) 2023.04.04 දින නිකුත් කර ඇත.

එම කරුණු විමසීමේ ලිපි යැවූ නිලධාරින් 19 දෙනාගෙන් 2023.05.03 දින ප්‍රතිචාර ලැබුණු අතර එම නිලධාරින් 19 දෙනාගෙන් 03 දෙනෙකු ආරාධිතයන් නොවන අතර එම නිලධාරින් 03 දෙනෙකු ඉදිරිපත් කළ නිදහසට කරුණු පිළිගෙන ඇති අතර අනිකුත් නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට 2023.06.18 දින පැවැති 529 වෙනි පාලක සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1. විගණන සහ කළමනාකරණ කාරක සභා රැස්වීම් වර්ජනය කිරීම සම්බන්ධ ලිපියට අත්සන් කළ නිලධාරීන්ගෙන් සමාව ඉල්ලීමේ ලිපි ලබා ගැනීමට,
2. පාලක සභාව සහ එහි ව්‍යවස්ථාපිත කොමිෂන් සභාව සම්බන්ධයෙන් නිලධාරියාගේ කාර්යභාරය පැහැදිලි කරමින් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීමට සහ එම චක්‍රලේඛ කෙටුම්පත මීළඟ සභා රැස්වීමට ඉදිරිපත් කිරීමටත් තීරණය විය.

එමෙන් ම 2023.06.06 දින පැවැති 101 වන විගණන හා කළමණාකරණ කමිටුව සඳහා ආරාධිත සියලුම නිලධාරීන් සහභාගි වෙන ලදී.

**(එ)** බාහිර පාර්ශවයන්ගෙන් අය විය යුතු මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත.

**(ඒ)** 1980-2018 දක්වා ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් ලෙස විගණන විමසුමේ දක්වා ඇති රු. 1,419,396.00 ක ශේෂය තුළ 1980 - 2000 කාලසීමාව ට අදාළ ඉංජිනේරු පීඨ ශිෂ්‍යයන්ගෙන් අයකරගත යුතු රු 238,812.00ක මුදලක් ඇතුළත් වේ. එම පීඨයේ ශිෂ්‍ය ලියාපදිංචියට අදාළ ව පවතින පීඨ රෙගුලාසි අනුව 2000 වර්ෂය දක්වා උපාධි පාඨමාලාව සම්පූර්ණ නොකළ ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු නොවන බැවින් එම ගාස්තු තව දුරටත් අය විය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් ලෙස දැක්වීමට සිදු වී ඇත.

ඒ අනුව 2022.12.31 දිනට රු.1,419,396.00 ක් වූ ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් වලින් 2023.01.01 දින සිට 2023.05.31 දින දක්වා රු. 306,657.50 මුදලක් අය කර ගෙන ඇති අතර පහත පරිදි තවදුරටත් අය කර ගත යුතු මුදල රු. 1,112,738.50 ක් වේ.

**(ඔ)** විගණන ඡේදයේ දක්වා ඇති පිළිවෙලින් රු. 403,755,050ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති හා රු. 7,873,454ක් වූ පුනරාවර්ථන ව්‍යාපෘති ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීමට පාදක වූ හේතු පහත පරිදි ය.

## Work in Progress-Construction Projects as at - 31/12/2022

| Contract No/ Indent No | Total | |
|---|---|---|
| CW/CON/2011/910 | 145,238,34  1.17 | මෙම ව්‍යාපෘති 2022-12-31 දින වනවිටත් කෙරීගෙන යන ව්‍යාපෘති වන බැවින් නොනිම් වැඩ යටතේ පවතී. අවසන් බිල්පත ලැබුන පසු ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| CW/CON/2013/1040 | 186,425,322.72 | |
| CW/CON/2012/931 | 1,336,065.29 | මෙම ව්‍යාපෘති අවසන් බිල්පත් නොගෙවීම, ව්‍යාපෘති අතරමැද නවතා දැමීම, නිමකර ඇති වැඩ කොටස් සතුටුදායක නොවීම වැනි කරුණු මත ලිපිගොනු වසා ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම උදෙසා |
| CW/CON/2007/743 | 20,399,815.45 | |
| CW/CON/2007/743A | 2,155,958.00 | |
| CW/CON/2014/1097 | 4,904,892.20 | |

| | | |
|---|---|---|
| Kosala Construction and Suppliers | 3,024,120.00 | කමිටුවක් පත් කර ඇති අතර එකී කමිටුවේ නිර්දේශ ප්‍රකාර ව 2023 වර්ෂයේ දී අවශ්‍ය ගැලපුම් ගිණුම් වල සිදු කිරීමට කටයුතු කරනු ඇත. |
| CW/CON/2014/1048 | 39,770,535.33 | |
| CW/CON/2007/758 | 500,000.00 | |
| **Total** | **403,755,050.16** | |

| **Contract No/ Indent No** | **Total** | |
|---|---|---|
| CW/CON/2015/1171 | 1,397,477.23 | මෙම ව්‍යාපෘති අවසන් බිල්පත් නොගෙවීම, ව්‍යාපෘති අතරමැද නවතා දැමීම, නිම කර ඇති වැඩ කොටස් සතුටුදායක නොවීම වැනි කරුණු මත ලිපිගොනු වසා ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම උදෙසා කමිටුවක් පත් කර ඇති අතර එකී කමිටුවේ නිර්දේශ ප්‍රකාර ව 2023 වර්ෂයේ දී අවශ්‍ය ගැලපුම් ගිණුම් වල සිදු කිරීමට කටයුතු කරණු ඇත. |
| CW/CON/2014/1057 | 3,208,785.05 | |
| CW/CON/2016/1236 | 367,675.00 | |
| CW/CON/2006/706 | 909,201.63 | |
| CW/CON/2008/777A | 345,000.00 | |
| SAR/CW/CON/564 | 502,675.50 | |
| SAR/CW/CON/656 | 1,142,639.38 | |
| **Total W.I.P** | **7,873,453.79** | |

**(ඕ)**

- II වන අදියරේ ඉදිකිරීම් නිමවීමෙන් පසු මෙම ශිෂ්‍ය කේන්ද්‍රය අදාල අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගත හැකි බැවින් මෙය අනාර්ථික වියදමක් ලෙස සැලකිය නොහැක.

- මෙම කොන්ත්‍රාත් කාර්යය අදියර I සහ II ක යටතේ නිම කිරීමට යෝජිත අතර පළමු අදියර යටතේ ගොඩනැගිල්ලේ පාදම ඉදිකිරීම නිමකර ඇත.

- II වන අදියර යටතේ ගොඩනැගිල්ලලේ ආරක්ෂිත රැඳවුම් බැම්ම ඉදිකිරීමට නියමිත ව ඇත. II වන අදියර ඉදිකිරීමට අදාළ අනුමැතිය සඳහා මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.

- II වන අදියර ඉදිකිරීමට අදාළ අනුමැතිය ලැබෙනතෙක් ආරක්ෂිත රැඳවුම් බැම්ම පමණක් නව ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීමට අදාළ සැලසුම් සහ ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස උපදේශන ආයතනය වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

- මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපෘතියේ උපදේශන සේවා කටයුතු කළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන ආචාර්ය උදේනි අමරසිංහ මහතා සහ ව්‍යාපෘති කළමණාකරු යන නිළධාරීන් අතර 2022.12.29 දින පැවති සාකච්ඡාවේ දී සැලසුම් කර ඇති පරිදි මෙම ව්‍යාපෘතිය II අදියර ක්‍රියාත්මක කර ගොඩනැගිල්ල නිමකිරීමේ හානියක් නොමැති බව තීරණය කරන ලදී.

- නමුත් අනපේක්ෂිත කාලගුණ විපර්යාස හේතුවෙන් සිදු වියහැකි ස්වාභාවික හානි අවම කිරීම පිණිස කඩිනමින් ආරක්ෂිත රැඳවුම් බැම්ම ඉදිකිරීම සුදුසු බව නිර්දේශ විය.

- ඒ සඳහා භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන ආචාර්ය උදේනි අමරසිංහ මහතාගේ අධීක්ෂණය යටතේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අදාළ සැලසුම් යෝජනා ඉදිරිපත් කිරීමට තීරණය විය.

- නව ඉදිකිරීම් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව කටයුතු කිරීමටත් අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ සැලකිල්ලෙන් කටයුතු කරනු ඇත.

**මහාචාර්ය එම්.ඩී ළමාවංශ**
**උපකුලපති**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**